*සැ. යු.* —2014.03.21 දින පළ වූ අංක 1,855 දරන ගැසට් පත්‍රයේ II සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,856 - 2014 මාර්තු මස 28 වැනි සිකුරාදා - 2014.03.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 468 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 470 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 472 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අප්‍රේල් මස 17 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 අප්‍රේල් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|
| 02. | රියදුරු | 02 | (රා.ප.ච. 6/2006 iv) PL 3-2006A රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,860 | 1. අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 ක් වත් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයන් හැර).<br>2. දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාල ආයතනයක ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම ප්‍රමාණවත් වේ.<br>3. තාර බර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි.<br>4. වාහන රියදුරෙකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුයි. (සේවා සහතික මගින් සනාථ කළ යුතු වේ.) |
| 02. | පුස්තකාල සහායක | 02 | (රා.ප.ච. 6/2006 iv) PL-1- 2006A - රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | 1. අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් වත් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයන් හැර) |
| 05. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | (රා.ප.ච. 6/2006 iv) PL1 - 2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160 - රු. 17,600 | 1. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයන් හැර) |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතුයි.)
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි, (දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වෙච්ඡා තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදාල නොවේ.)
4. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුයි.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුයි.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

1. සේවා අවශ්‍යතාවයට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
2. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම මත සේවයේ නියුතු අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
3. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
4. සුදුස්සන් තෝරා ගැනීම පිළිබඳව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

1. සියළුම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය,
2. අදාළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුයි.
3. බඳවා ගනු ලබන තැනැත්තන් වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, ශ්‍රේණිගත උසස්වීමක් නම් එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත් වේ.
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධායන්ට එකඟව ක්‍රියා කළ යුතුයි.
5. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලට ද, වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටියි.

05. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :-*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2014.04.10 වැනි දින හෝ ඊට ප්‍රථම "ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.
2. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතුයි.
3. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි.
   (i) උප්පැන්න සහතිකය,
   (ii) අධ්‍යාපන සහතික,
   (iii) තම පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය,
   (iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුයි.),
   (v) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික. (රජයේ/පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි.

ඒ. බී. නිමල් රත්නායක,
ලේකම්,
ගල්ගමුව ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 05 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ.......................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (i) අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————.
    (ii) මුලකුරුවලින් හඳින්වෙන නම් :——————.
02. ස්ථිර ලිපිනය :——————.
03. (i) උපන් දිනය: අවුරුද්ද :——————. මාසය:——————.: දිනය :——————.
    (ii) 2014.04.10 දිනට වයස : අවුරුදු :——————. මාස :——————. දින :——————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
06. විවාහක/අවිවාහක බව :——————.
07. ජාතිය :——————.
08. වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කාලය :——————.
09. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————.
10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :——————.
    (i) සමත් වූ වසර/ශ්‍රේණිය :——————. වර්ෂය :——————.
    (ii) අ.පො.ස. (සා. පෙළ.) විභාගය :——————.

විභාග අංකය :—————. වර්ෂය :—————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

(iii) අ.පො.ස. (උ.පෙළ) විභාගය ඃ

විභාග අංකය :—————. වර්ෂය :—————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |

11. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :—————.

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර :—————.

13. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද? :—————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් මුදාහැරීමට එකඟ වන බවත් දැනට........................ වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි).

දිනය :—————.

03-884

---

# පළාත් පාලන නිවේදන

## බිංගිරිය ප්‍රාදේශීය සභාව - බිංගිරිය

මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් තල්ගහපිටිය කුරේවත්ත ජනපදයට පිවිසෙන ජුබිලි මාවත යනුවෙන් නම්කර තිබූ මාර්ගයේ එම නාමය වෙනස් කර "සාන්ත සේවියර් ජුබිලි මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2013.04.11 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ අංක 04-2 දරන යෝජනාව පරිදි වයඹ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින් 2013.12.18 වැනි දින සිට ඉහත සඳහන් මාර්ගය "සාන්ත සේවියර් ජුබිලි මාවත" යනුවෙන් නම්කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඊ. එම්. දිමුත් තුෂාර ඒකනායක,
සභාපති,
බිංගිරිය ප්‍රාදේශීය සභාව,
බිංගිරිය.

2013 දෙසැම්බර් මස 20 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලය,
බිංගිරිය.

03-740

**සම්මත අතුරු ව්‍යවස්ථා**

පස්සර ප්‍රාදේශීය සභාව

261 අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පස්සර ප්‍රාදේශීය සභාව විසින් 2014.01.30 දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 2.2 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ඒ. කාදර්,
සභාපති,
පස්සර ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 11 වැනි වැනි දින,
පස්සර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

**යෝජනාව**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වගන්තියේ (1) වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ පස්සර ප්‍රාදේශීය සභා සම්මත අතුරු ව්‍යවස්ථා 23 ක් *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පස්සර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය "

03-883/1

**සම්මත අතුරු ව්‍යවස්ථා**

**පස්සර ප්‍රාදේශීය සභාව**

261 අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පස්සර ප්‍රාදේශීය සභාව විසින් 2013.11.29 දින පවත්වන ලද සභා රැස්වීමේ දී පහත උපලේඛනයේ සඳහන් අංක 5.1 දරන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. ඒ. කාදර්,
සභාපති,
පස්සර ප්‍රාදේශීය සභාව.

2014 මාර්තු මස 11 වැනි දින,
පස්සර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වගන්තියේ (1) වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.08.16 වැනි දින අංක 1824 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ පස්සර ප්‍රාදේශීය සභා ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා, මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ(1) වන උප වගන්තිය යටතේ පස්සර ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය"

03-883/2

---

**මහරගම නගර සභාව**

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 50 හා 52 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරියේ 50 හා 52 වැනි වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට මහ සභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපළ හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

කාන්ති කොඩිකාර,
සභාපති,
මහරගම නගර සභාව.

2014 ක් වූ මාර්තු මස 11 වැනි දින,
මහරගම නගර සභා කාර්යාලයේදී ය.

| *පාරේ නම* | *දිග අඩි* | *පළල* | *ආරම්භය* | *අවසානය* |
|---|---|---|---|---|
| තලවතුගොඩ වැලි පාර, බෝධිරාජ මාවත, අංක 90 සිට 688/39, දක්වා අතුරු මාර්ගය | 70 | 15 | 688/39 | 90 |
| මහරගම වත්තෙගෙදර පාරේ. ව. අ. 18 සිට 16/7 දක්වා නිවාස පිහිටි මාර්ගය | 355 | 20 | 18 (වම් පැත්ත) | 18/7 (වම් පැත්ත) |
| | | | 16 (දකුණ පැත්ත) | 16/7 (දකුණු පැත්ත) |
| කොට්ටාව නැගෙනහිර කටුකුරුන්ද මාලඹේ පාරේ අංක 1529/2, 1529/6, 1529/7, 1529/4 දක්වා නිවෙස් වලට යන මාර්ගය | 300 | 10 | - | 400/2 |


පන්නිපිටිය, රුක්මලේ, නඩුදෙණිය මාර්ගයේ අවසාන කොටසෙහි අංක 121/102 සිට 121/67 දක්වා මාර්ගය

දිග මී. 97 පළල මී. 3.6
මී. 80 මී. 10

K . N . A . Alwis,F.S.I.(SL),
Regd.Licensed Surveyor & Leveller,
Court Commissioner,
30 / 2A, Obahena Road,
Madiwela,
Kotte.
Tel : 0714018702.

**Plan No.MISC/4981**

REFERENCE
G : Gate
LF : Live Fence
CP : Concrete Post
MW : Masonry Wall
RW : Retaining Wall
WLF : Wire on Live Fence




Scale, 1 : 1 0 0 0

# PLAN

**showing proposed construction Road in Brown Colour called "NADUDENIYA ROAD" at Rukmale off Pasal Mawatha in Grama Niladhari Division No.497,Rukmale West of Maharagama Divisional Secretariat within the Urban Council Limits of Maharagama in the Palle Pattu of Hewagam Korale**

## COLOMBO DISTRICT
## WESTERN PROVINCE

Length of proposed construction Road is 201 Meters (659 Ft.)
Width of proposed construction Road is 3.05M - 4.6M (10ft. - 15ft.)

Surveyed on : 18th December 2013.

NOTE : This Plan is prepared by me as request of under signed Mr.A.P.Wilson, No.100,Rukmale,Panipitiya.

18th December 2013

Regd.Licensed Surveyor & Leveller
16th December 2013

03-913

---

# අතුරු ව්‍යවස්ථා

## නාරම්මල ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත අතුරු ව්‍යවස්ථාව - මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනත සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ වයඹ පළාතේ, පළාත් සභාවේ පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වර්ෂ 2007 ක් වූ මැයි මස 18 වෙනි දින අංක 1498 දරන ගැසට් පත්‍රයේ IV (අ) පළාත් සභා කොටසේ පළ කරවා ප්‍රසිද්ධ කරන ලද ප්‍රාදේශීය සභාවන්හි මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාවේ අංක 01 සිට 28 දක්වා වූ විධිවිධානවල අඩංගු සියලුම කරුණු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තිය සමග කියවිය යුතු 122 වගන්තිය මගින් ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලය අනුව එම අතුරු ව්‍යවස්ථාව ඉහත කී දෙවන වගන්තියේ සඳහන් විධිවිධානවලට යටත්ව වයඹ පළාතේ පිහිටි නාරම්මල ප්‍රාදේශීය සභාව මගින් පිළිගෙන මෙම ගැසට් පත්‍රයේ පළවන දිනයේ සිට ක්‍රියාත්මක කරන බව නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවාසී සියලු දෙනා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. සුමනසිරි,
සභාපති,
නාරම්මල ප්‍රාදේශීය සභාව,

2014 මාර්තු මස 10 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය සභාවේදීය.

03-873

## බදුල්ල මහ නගර සභාව

අතුරු ව්‍යවස්ථා

252 වන අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 267(1) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 272 වන වගන්තිය යටතේ මහ නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව බදුල්ල මහ නගර සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු ඉහත කී මහ නගර සභාව ආඥාපනතේ 268 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍ය ශෂීන්ද්‍ර රාජපක්ෂ වන මා විසින් අනුමත කරනු ලැබූ බවත්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට එකී අතුරු ව්‍යවස්ථා බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත බලාත්මක වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

පළාත් පාලන විෂයය භාර අමාත්‍ය,
ඌව පළාත් සභාව.

2014ක් වූ මාර්තු මස 04 වැනි දින,
ඌව පළාත, බදුල්ල.

### I වැනි කොටස

*සියලු අතුරු ව්‍යවස්ථාවලට අදාළ අර්ථ නිරූපණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

1. බදුල්ල මහ නගර සභාව විසින් මේ අතුරු ව්‍යවස්ථා යථා පරිදි පිළිගනු ලැබීමෙන් අනතුරුව, මේ අතුරු ව්‍යවස්ථාවල 02 වන කොටසේ සිට 30 වන කොටස දක්වා වන කොටස්වල ඇතුළත් අතුරු ව්‍යවස්ථාවන්හි සඳහන් පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

"කොමසාරිස්වරයා" යන්නෙන්, අදාළ බදුල්ල මහ නගර සභාවේ කොමසාරිස්වරයා ද,

"ලේකම්වරයා" යන්නෙන්, අදාළ බදුල්ල මහ නගර සභාවේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයාගේ බලතල, කාර්යය හා කර්තව්‍ය පැවරී ඇති යම් නිලධාරියකු ද,

"බදුල්ල මහ නගර සභා ප්‍රදේශය" යන්නෙන්, බදුල්ල මහ නගර සභාව සංයුක්තවන බල ප්‍රදේශය ද,

"බදුල්ල මහා නගර සභාව" යන්නෙන්, බදුල්ල මහ නගර සභාව ද,

"පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය " යන්නෙන්, කවර හෝ දිනයක පෙරවරු 06.00 සිට පස්වරු 06.00 දක්වා කාලය අදහස් වන අතර මේ අතුරු ව්‍යවස්ථාවල කිසියම් කොටසක ඊට පටහැනි වෙනත් යම් සාධාරණ වේලාවක් එකී කොටසේ විශේෂයෙන් සඳහන් කර නියම කරනු ලැබ ඇත්නම්, එකී කොටසේ සඳහන් නියමයන් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට එසේ විශේෂයෙන් සඳහන් කළ කාලය අදහස් විය යුතු ය.

"පොදු ජල මාර්ගය" යන්නෙන්, ගඟක්, ඇළක්, දොළක්, දිය පාරක්, ළිඳක්, වැවක්, පොකුණක් කාණුවක් හා අදහස් වන අතර බලපත්‍ර ලත් ස්ථානය ඇතුළත අප ජලය ගලා යාමට ඉදිකර ඇති යම් කාණුවක් ඇතුළත් නොවිය යුතු ය.

"පොදු ස්ථානය" යන්නෙන්, කිසියම් මාර්ගයක්, මං මාවතක්, වීථියක්, පටු මඟක්, දෙවැටක්, පදික වේදිකාවක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිට්ටනියක්, පොදු ගොඩනැගිල්ලක්, පොදු සුසාන භූමියක්, බස් නැවතුම් පොළක්, දුම්රිය ස්ථානයක්, ගංගාවක්, ඇලක්, දොළක් වැවක්, පොකුණක්, කලපුවක්, දිය කඩිත්තක්, දිය පහරක්, වැසි ජල කාණුවක්, බස් නැවතුම් පොළක්, සභාව සතු යම් ඉඩමක්, මහජනයාගේ පරිහරණය සඳහා වෙන් කර ඇති රජය සතු යම් ඉඩමක් හෝ මහජනතාවගේ පොදු පරිහරණයට ලක්වන වෙනත් ඕනෑම පොදු ස්ථානයක් ද,

"සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා" යන්නෙන්, බදුල්ල මහ නගර සභා ප්‍රදේශය ආවරණය වනසේ පත්කර ඇති සහකාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙක් හා සේවා අධ්‍යක්ෂවරයා ද, ඒ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා හෝ ඒ සහකාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා වශයෙන් ක්‍රියාකිරීම සඳහා පත්කරන ලද යම් තැනැත්තකු ඊට අදාළ වේ.

"බලපත්‍රලාභියා" යන්නෙන් මෙහි කවර හෝ කොටසක අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ලබාගෙන ඇති යම් තැනැත්තකු අදහස් වන අතර එකී බලපත්‍රලත් ස්ථානයේ භාරකරු හෝ කළමනාකරු හෝ තත්කාලයේ එකී ස්ථානයේ කාර්යයන් හි පාලනය භාරව සිටින යම් තැනැත්තකු ද,

"බලපත්‍රලත් ස්ථානය" යන්නෙන්, මෙහි කවර හෝ කොටසක අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ කිසියම් ස්ථානයක් පාවිච්චි කිරීමට ද, එකී ස්ථානය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන්, තත්කාර්යය සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති මහා නගර සභාවේ යම් නිලධාරියකු ද,

අදහස් වේ.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නොවන එහෙත් මේ අතුරු ව්‍යවස්ථාවල කිසියම් කොටසක සඳහන් වන වෙනත් කිසියම් පදයක් හෝ පද සම්බන්ධයෙන් අර්ථ නිරූපණයක් අවශ්‍ය වන අවස්ථාවක, එකී පදය හෝ පද සම්බන්ධ අර්ථ නිරූපණය ඒ කොටස අවසානයේ විශේෂයෙන් සඳහන් කර ඇති අර්ථ නිරූපණය ඒ කොටසට පමණක් අදාළව බලපැවැත්විය යුතු ය.

## *II වැනි කොටස*

### *සියලුම අතුරු ව්‍යවස්ථාවලට ම අදාළ පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

1. මේ අතුරු ව්‍යවස්ථාවල 2 වැනි කොටසේ සිට 30 වැනි කොටස දක්වා වන කවර හෝ කොටසක් යටතේ බදුල්ල මහා නගර සභාව විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ කිසියම් බලයලත් නිලධාරියකු විසින් කවර හෝ යම් තැනැත්තකු වෙත නිකුත් කරනු ලබන දැන්වීමක් :-

(අ) එකී දැන්වීම ලැබිය යුතු වන තැනැත්තා වෙත තැපෑලෙන් යොමු කිරීම සඳහා, තහවුරු කළ බව සනාථ කළ හැකි ආකාරයෙන් තැපැලට භාරදෙනු ලැබුවහොත් ; හෝ

(ආ) ඔහුට හෝ ඔහුගේ ලිපිනයෙහි තත්කාලයේ පදිංචිව සිටින කවර හෝ තැනැත්තකු වෙත භාරදෙනු ලැබ ඇත්නම්; හෝ

(ඇ) ඔහු පදිංචි ස්ථානයෙහි හෝ ඔහු විසින් ස්වකීය කාර්යයන් කරනු ලබන ස්ථානයේ කවර හෝ ස්ථානයක අලවා තබනු ලැබ ඇත්නම්; හෝ

එකී දැන්වීම නිසි ආකාරයෙන් භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ කවර ආකාරයකින් හෝ භාරදීම නීත්‍යානුකූල විය යුතු ය.

2. මේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ කොටසක විධිවිධාන යටතේ කොමසාරිස්වරයා වෙත පවරා දී ඇති කිසියම් කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඔහු විසින් බදුල්ල මහ නගර සභාවේ කවර හෝ නිලධාරියකු වෙත ලියවිල්ලකින් නියම කරනු ලබන නියමයන්ට යටත් ව පවරා දිය හැකි අතර එසේ බලය ලැබූ යම් තැනැත්තකු විසින් ඒ පැවරීමේ ලියවිල්ලේ නියමකර ඇති නියමයන්ට යටත් ව ඉටු කරනු ලැබීම නීත්‍යානුකූල වන අතර එකී කාර්යය හෝ කර්තව්‍ය මේ අතුරු ව්‍යවස්ථාවලින් නාගරික කොමසාරිස්වරයාට පැවරී ඇති බලය යටතේ ඔහු විසින් කරනු ලැබූ කාර්යයක් හෝ කර්තව්‍යයක් සේ සැලකිය යුතු ය.

3. මේ අතුරු ව්‍යවස්ථාවල කිසියම් කොටසක නියමයක් හෝ නියමයන් යටතේ බලපත්‍රලත් ස්ථානයක් පරීක්ෂා කිරීමට කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකුට බලය තිබිය යුතු අතර කවර හෝ බලපත්‍රලාභියකු විසින් පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය ඇතුළත කෙරෙන පරීක්ෂා කිරීම් සඳහා සහාය වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. එසේ ම එවැනි කිසියම් පරීක්ෂා කිරීමක් වැළැක්වීම හෝ බාධා කිරීම නොකළ යුතු ය.

## *II වැනි කොටස*

### *සභාවේ රැස්වීම්*

252 වන අධිකාරියවන මහා සගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තිය සමග කියවිය යුතු 01 වැනි උපවගන්තියේ (ඊ) ඡේදයට අනුව මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභාවේ සභා කටයුතු සහ කමිටු රැස්වීමේ විධිමත් කිරීම පිළබඳ අතුරු ව්‍යවස්ථා බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහ නගර සභාවල රැස්වීම් කටයුතු කරගෙන යාම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. (1) එක් එක් මාසයේ කලින් නියම කරගත් දිනයක හා වේලාවක දී බදුල්ල මහ නගර සභාවක සාමාන්‍ය රැස්වීමක් බදුල්ල සයිමන් පීරිස් අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විය යුතු ය. එසේ කලින් නියම කරගත් දිනය 1971 අංක 29 දරන නිවාඩු පනත යටතේ රජයේ නිවාඩු දිනයක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති අවස්ථාවක එකී රැස්වීම ඊළඟ වැඩ කරන දිනයෙහි පැවැත්වීමට තීරණය කරන ලද සේ සලකා එළඹෙන වැඩකරන දිනයෙහි පැවැත්විය යුතු ය.

(2) බදුල්ල මහ නගර සභාවක සාමාන්‍ය රැස්වීමක් හෝ විශේෂ රැස්වීමක් කැඳවන දැන්වීම සිංහලෙන් හෝ දෙමළෙන් හෝ ඒ භාෂා දෙකෙන් ම විය යුතු ය.

(3) සෑම සාමාන්‍ය රැස්වීමක් පිළිබඳව ද ඒ ඒ රැස්වීමේ දී කිරීමට ඇති කටයුතු පිළිබඳව ද වූ දැන්වීමක් සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින හැර එකී රැස්වීම පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින හතරකට කලින් එක් එක් සභිකයා වෙත භාරදිය යුතු ය.

(4) (2) සහ (3) ඡේදවල සඳහන් දැන්වීම යම් හේතුවක් නිසා පෞද්ගලිකව භාරදිය නොහැකි යම් අවස්ථාවක දී එම දැන්වීම යොමු කරනු ලැබ ඇති සභිකයා සාමාන්‍යයෙන් පදිංචි ස්ථානයේ තැබුවහොත් එය නිසි ලෙස භාරදෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

3. (1) යම් රැස්වීමක ගණපූරණය නැත්නම් එම රැස්වීමේ දී කටයුතු කිසිවක් නොකළ යුතු ය. බදුල්ල මහා නගර සභාවක සාමාන්‍ය රැස්වීමක ගණපූරණය එම රැස්වීමේ දිනයේ දී ධුර දරන සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක් පංගුවක් විය යුතු ය. එම සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක් පංගුව පූර්ණ සංඛ්‍යාවක් හා භාගයක් වන අවස්ථාවක එම පූර්ණ සංඛ්‍යාව හා භාගයට වැඩි ඊළඟ පූර්ණ සංඛ්‍යාව මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා තුනෙන් එක් පංගුව වශයෙන් සැලකිය යුතු ය.

(2) යම් රැස්වීමකට නියමිත වේලාවෙන් පසු පැය භාගයක් ඉකුත් වූ විට හෝ රැස්වීම ආරම්භ වීමෙන් පසු කවර වේලාවක හෝ ගණපූරණය නොමැති වන අවස්ථාවක එම රැස්වීමේ නගරාධිපතිවරයා විසින් එම රැස්වීම එම දිනයට පසු දින පහළොවකට පසු නොවන්නා වූ ද ඔහු විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන්නාවූ ද දිනයකට අඩාලව කල් තැබිය යුතු ය. එසේ අඩාලව කල් තබනු ලැබූ රැස්වීමේ දී ගණපූරණයක් තිබුණි නම් එම රැස්වීමේ දී ඉදිරිපත් කළ හැකිව තිබූ කටයුතු පසුව පවත්වන රැස්වීමේ දී ඉදිරිපත් කර ඒ සම්බන්ධව සුදුසුසක් කළ හැකි වන්නේ ය.

4. (1) බදුල්ල මහා නගර සභාවේ ගණපූරණයක් ඇති යම් සාමාන්‍ය හෝ විශේෂ රැස්වීමක ගරු නගරාධිපතිවරයා විසින් බදුල්ල මහා නගර සභාවේ කැමැත්ත ඇතිව කලින් කල රැස්වීම අඩාලව කල් තැබිය හැකි ය. එසේ අඩාලව කල් තැබීමට භාජනය වූ රැස්වීමේ න්‍යාය පත්‍රයේ සඳහන් නමුත් නිම නොවී ඉතිරි වී ඇති කටයුතු හැර වෙනත් කිසිම කටයුත්තක් එසේ පසුව පවත්වනු ලබන යම් රැස්වීමක දී මහා නගර සභාවේ අවසරය නොමැතිව නොකළ යුතු ය.

(2) අඩාලව කල් තබන රැස්වීම පැය විසිහතරක් ඇතුළත පැවැත්වීමට මුල් රැස්වීමේ දී තීරණය කළ හොත් මිස අඩාලව කල් තබන ලද රැස්වීමක් පිළිබඳ දැන්වීම එම රැස්වීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් දින තුනකට කලින් සභිකයන්ට භාරදිය යුතු ය.

5. පුවත්පත් වාර්තාකරුවන් ඇතුළුව අමුත්තන්ට සභා රැස්වීමක් පවත්වන ස්ථානයෙහි ඒ ඒ තැනැත්තන් සඳහා වෙන්කොට තිබෙන ස්ථානවල සිටිය හැකි ය. එහෙත් මහජනයා සභා ගර්භයෙන් ඉවත් කිරීම මහජන යහපත සඳහා සුදුසු බව රැස්වීමට පැමිණ සිටින බදුල්ල මහා නගර සභාවේ සභිකයන් බහුතර සංඛ්‍යාවක් විසින් යෝජනා සම්මුතියකින් ප්‍රකාශිත මතය වේ නම් ඒ අනුව රැස්වීමේ සභාපතිවරයා විසින් ඉල්ලා සිටිනු ලැබූ විට ඔවුන් සභා ගර්භයෙන් ඉවත්ව යා යුතු ය.

6. බදුල්ල මහා නගර සභා රැස්වීමේ කටයුතු අනුපිළිවෙල -

*(අ)* පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ;
*(ආ)* ගරු නගරාධිපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන ;
*(ඇ)* බදුල් මහා නගර සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම ;
*(ඈ)* යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ;
*(ඉ)* යථා පරිදි කල් දී ඇති යෝජනා ;
*(ඊ)* කාරක සභාවල වාර්තා සභාව ඉදිරියේ තැබීම. එම වාර්තා එවෙලේ ම සලකා බැලීමට බසුල්ල මහා නගර සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම සභාව විසින් කළ යුතු ය ;
*(උ)* ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ බදුල්ල මහා නගර සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ;
(ඌ) රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම් ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා බදුල්ල මහා නගර සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට ; යන අනුපිළිවෙලින් කරගෙන යා යුතු ය.

7. *(අ)* බදුල්ල මහා නගර සභාවේ සභිකයන්ගේ ප්‍රමුඛත්වය හා ජ්‍යෙෂ්ඨත්වය පිළිවෙලින් -

(i) ගරු නගරාධිපතිවරයා ;
(ii) ගරු නියෝජ්‍ය නගරාධිපතිවරයා ;
(iii) නැවත තෝරා පත්කර ගනු ලැබූ හිටපු සභිකයන් සම්බන්ධයෙන් වන විට මහා නගර සභාවේ ඔවුන්ගේ අඛණ්ඩ සභිකත්වයේ අනුපිළිවෙල අනුව; සහ
(iv) සෙසු සභිකයන් සම්බන්ධයෙන් වන විට ඔවුන් තෝරා පත් කර ගැනීම පිළිබඳව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් *ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව ද ; විය යුතු ය.

*(ආ)* *(අ)* ඡේදයේ (iii) අනුඡේදයේ සඳහන් කිසියම් සභිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකුගේ අඛණ්ඩ සභිකත්වය සමාන වන අවස්ථාවක දී එකී සභිකයන් අවසන්වරට තෝරා පත්කර ගැනීම පිළිබඳව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් *ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව ප්‍රමුඛතාව හා ජ්‍යෙෂ්ඨත්වය සැලකිල්ලට ගත යුතු ය.

(ඇ) කිසියම් මහා නගර සභා ඡන්ද විමසීමකට පසුව එකී මහා නගර සභාවට සභිකයන් තෝරා පත්කර ගැනීම පිළිබඳව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති ගැසට් නිවේදනයේ ප්‍රකාශිත ආකාරයට තෝරා පත්කර ගත් සභික සංඛ්‍යාවේ අනුපිළිවෙල අයත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා අදාළ නොවිය යුතු ය.

8. (1) ලේකම්වරයා විසින් මහා නගර සභාවේ රැස්වීම්වල කටයුතු, නියමයන් සහ තීරණ පිළිබඳ වාර්තා සිංහලෙන් හෝ දෙමළෙන් තබා ගත යුතු ය.

(2) කිසියම් රැස්වීමක කටයුතු පිළිබඳව ගනු ලැබූ තීරණ හෝ සම්මතයන් සම්බන්ධයෙන් ඃ

(අ) යෝජනාවක් සම්බන්ධයෙන් වනවිට එකී යෝජනාව කුමක් ද යන වග;

(ආ) යෝජනාව ඉදිරිපත් කළ සභිකයා සහ යෝජනාව ස්ථිර කළ සභිකයා කවරෙක් ද යන වග;

(ඇ) යෝජනාවට පක්ෂව හා විපක්ෂව අදහස් ඉදිරිපත් කළ සභිකයන් කවුරුන් ද යන වග;

(ඈ) යෝජනාව සම්මත වීම හෝ ප්‍රතික්ෂේප වීම ඒකමතිකව සිදුවූයේ ද; නැතහොත්,

(ඉ) යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලා ඇති අවස්ථාවක දී එකී යෝජනාවට ;

(i) පක්ෂව ඡන්දය දුන් සභිකයන් සංඛ්‍යාව සහ ඔවුන් කවුරුන් ද යන වග ;
(ii) විපක්ෂව ඡන්දය දුන් සභිකයන් සංඛ්‍යාව සහ ඔවුන් කවුරුන් ද යන වග ;
(iii) ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සභිකයන් සංඛ්‍යාව සහ ඔවුන් කවුරුන් ද යන වග ; සහ
(iv) රැස්වීමට පැමිණ ඇති සහ ඡන්දය විමසන අවස්ථාවේ දී සභා ගර්භයේ නොසිටි සභිකයන් සංඛ්‍යාව සහ ඔවුන් කවුරුන් ද වන වග ;

(ඊ) මහා නගර සභා රැස්වීමේ කටයුතු අනුපිළිවෙළෙහි වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් වන විට එකී කරුණ පිළිබඳව සභාව විසින් ගනු ලැබූ තීරණය කුමක් ද යන වග; එක් එක් යෝජනාව හෝ කරුණ සමග වාර්තාවට ඇතුළත් කළ යුතු ය.

(3) එක් එක් රැස්වීමේ වාර්තාව සභිකයන් අතර බෙදා හැරිය යුතු අතර ඊළඟ රැස්වීමේ දී වාර්තාව කියවන ලදැයි සලකා ස්ථිර කළ යුතු බවට රැස්වීමේ සභාපතිපතිවරයා විසින් ප්‍රශ්නය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. විරෝධතා හෝ නිවැරදි කිරීම් නොමැති නම් වාර්තා ගත කර ඇති පරිදි වූ වාර්තාව ස්ථිර කළ යුතු ය. නැතහොත් විරෝධතා හෝ නිවැරදි කිරීම් ඇත්නම් ඒ නිවැරදි කිරීම් කවරේද යන්න වාර්තාවට ඇතුළත් කළ යුතු ය. අදාළ වාර්තාවේ අවසානයේ නිවැරදි කිරීම් නැත්නම් ඒ බව ද නැතහොත් එකී නිවැරදි කිරීම් සටහන් කර ඒ නිවැරදි කිරීම්වලට යටත්ව වාර්තාව ස්ථිර කළ බවට සහතිකයක් රැස්වීමේ සභාපතිවරයා විසින් ස්වකීය අත්සන තබා තහවුරු කරනු ලැබිය යුතු ය.

(4) සභා රැස්වීමේ දී සභිකයන් විසින් ප්‍රකාශ කරන ලද කරුණු සහ ප්‍රකාශයන් සභා වාර්තාවට ඇතුළත් නොකළ යුතු ය. එසේ වුව ද කිසියම් සභිකයෙකු විසින් සභාවේ දී ඉදිරිපත් කරන ලද කරුණු හෝ ප්‍රකාශ පසුව දැනගැනීමට අවශ්‍ය වන්නේ යැයි මහා නගර සභාව අදහස් කරන්නේ නම් එකී සභා රැස්වීමේ හෝ රැස්වීම්වල කාර්යය පවත්වාගෙන යාම පිළිබඳ හඬ පට වෙනම පිළියෙල කර මහා නගර සභාවේ ආරක්ෂිතව තබා ගැනීම සහ සභිකයන් අතර බෙදා දීමට සැලැස්වීම කළ හැකි ය.

9. (1) පෙත්සමක් හෝ සංදේශයක් බදුල්ල මහා නගර සභාව වෙත ඉරිපත් කරන යම් සභිකයෙකු විසින් ඒ පෙත්සමේ හෝ සංදේශයේ හෝ අරමුණ ලුහුඬින් ප්‍රකාශ කළ හැකි ය.

(2) කිසියම් සභිකයකු සමස්ථ වශයෙන් ගෞරව පූර්වක ස්වරයකින් නොවන්නාවූ ද ලියූ තැනැත්තාගේ නම සහ ලිපිනය ඇතුළත් නොවන්නා වූ ද කිසිම පෙත්සමක් හෝ සංදේශයක් හෝ වෙනත් සංනිවේදනයක් හෝ මහා නගර සභාවට ඉදිරිපත් නොකළ යුතු ය.

(3) පෙත්සමක් හෝ සංදේශයක් හෝ කියවිය යුතු යැයි කවර හෝ සභිකයකු විසින් යෝජනා කරනු ලැබිය හැකි ය. යෝජනාව ඉදිරිපත් කරන විට එය කියවිය යුතු යැයි අපේක්ෂා කරන්නේ කුමන හේතු නිසාදැයි ලුහුඬින් ප්‍රකාශ කළ යුතු ය.

(4) ඒ යෝජනාව පිළිබඳ විවාදයකට ඉඩ නොදිය යුතු අතර යෝජනාව විධිමත්ව ස්ථිර කිරීම හැර පෙත්සම හෝ සංදේශය හෝ විෂය කොට ගෙන හෝ ඒ පිළිබඳව හෝ වෙනත් කිසියම් සභිකයකු කථා නොකළ යුතු ය.

(5) එම යෝජනාව ස්ථිර කරනු ලැබූ විට අදාළ පෙත්සම හෝ සංදේශය හෝ කියවිය යුතු ද යන ප්‍රශ්නය විමසිය යුතු ය.

(6) මහා නගර සභාවට ඉදිරිපත් කරන ලද පෙත්සමක් හෝ සංදේශයක් පිළිබඳව සුදුසු කටයුතු කිරීම සඳහා ගරු නගරාධිපතිවරයාට හෝ ඒ පිළිබඳව අවසාන වශයෙන් කටයුතු කිරීම සඳහා වාර්තා කිරීමට කාරක සභාවකට හෝ යොමු කිරීමට සභිකයකු විසින් යෝජනා කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(7) යම් සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි විභාග කිරීමට අදහස් කරනු ලැබ ඇති අවස්ථාවක දී එම සාක්ෂි විභාගයට නියමිත දිනයට යටත් පිරිසෙයින් දින තුනකට පෙර එම සාක්ෂිකරුවන් අවශ්‍ය වන පෙත්සම්කරු හෝ සභිකයා විසින් එම සාක්ෂිකරුවන්ගේ නම්,

පදිංචි ස්ථාන හා වෘත්තීන් ඇතුළත් ලැයිස්තුවක් ලේකම්වරයාට භාරදිය යුතු අතර, ඒ සාක්ෂි විභාග කිරීමට පැමිණ සිටින ලෙස ලේකම්වරයා විසින් එම සාක්ෂිකරුවන්ට ලිඛිතව දැනුම් දිය යුතු ය.

10. (1) මහා නගර සභාවේ කටයුතුවලට අදාළ ප්‍රශ්න ගරු නගරාධිපතිවරයාගෙන් අසනු ලැබිය හැකි ය.

(2) යම් ප්‍රශ්නයක් පිළිබඳව, ඉරිදා දින සහ රජයේ නිවාඩු දින හැර යටත් පිරිසෙයින් සම්පූර්ණ දවස් හතක කල් දීමක් කළ යුතු ය.

(3) එක් එක් ප්‍රශ්නයට ලිඛිත පිළිතුරක් රැස්වීමක දී, රැස්වීමේ සභාපතිවරයා විසින් කියවිය යුතු ය.

(4) යම් ප්‍රශ්නයක් මත කිසියම් සභිකයකු බඳුල්ල මහ නගර සභාව අමතා කථා නොකළ යුතු අතර, යම් ප්‍රශ්නයක දී පද මාලාවෙහි එම ප්‍රශ්නය පැහැදිලි කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයට විනා කිසියම් තර්කයක් හෝ යම් චේතනාවක් ආරෝපණය කිරීමක් හෝ මත ප්‍රකාශයක් හෝ කරුණු කියා පෑමක් හෝ අන්තර්ගත නොවිය යුතු ය.

(5) රැස්වීමක දී පිළිතුරක් දී තිබෙන කාරණයක් හෝ සිද්ධියක් හෝ තවදුරටත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා කවර හෝ සභිකයකු විසින් පරිපූරක ප්‍රශ්නයක් නැගිය හැකි ය. එසේ වුව ද තමාගේ මතය අනුව යම් පරිපූරක ප්‍රශ්නයකින් එකී ප්‍රශ්නවල විෂය කරුණුවලට අදාළව මේ අතුරු ව්‍යවස්ථාවේ මීට ඉහතින් ඇති විධිවිධාන උල්ලංඝනය වේ නම් ඒ ප්‍රශ්නය නැගීමට ඉඩ නොදීමට රැස්වීමේ නගරාධිපතිවරයාට හැකි අතර, එවැනි කවර අවස්ථාවක වුව ද අදාළ පරිපූරක ප්‍රශ්නය මහ නගර සභාවේ රැස්වීම් වාර්තාවෙහි සඳහන් නොවිය යුතු ය.

11. (1) යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ සෑම දැන්වීමක්ම ලිඛිත විය යුතු අතර ඒ දැන්වීම කරන සභිකයා විසින් එය අත්සන් කර තිබිය යුතු ය. සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර මහා නගර සභාවේ රැස්වීමට කලින් දවස් හතක් ඒ දැන්වීම ලේකම්වරයා භාරයේ තිබුණහොත් මිස ඒ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුතු ය.

(2) යෝජනා පිළිබඳ සියලු දැන්වීම් ලැබෙන පරිදි දිනය සහ අංක යොදා ඒවා ලැබුණු අනුපිළිවෙලට ලේකම්වරයා විසින් න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

(3) යෝජනාවක් පිළිබඳ යම් දැන්වීමක් න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට පෙර නගරාධිපතිවරයා වෙත එය ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය රීති විරෝධී බව ඔහුගේ මතය වේ නම්, ඒ යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුතු යැයි ඔහු විසින් නියම කර, ඒ දැන්වීම කළ සභිකයාට ඒ බව දැනුම් දීමට සැලැස්විය යුතු ය.

(4) දැන්වීමක් මගින් කරනු ලබන සෑම යෝජනාවක්ම මහ නගර සභාවේ කටයුතු පරිපාලනය කෙරෙහි බලපාන යම් ප්‍රශ්නයකට අදාළ විය යුතු ය.

(5) ඉහතින් වූ මාස හය තුළ සම්මත කරන ලද කිසිම යෝජනාවක් පරිච්ඡින්න කිරීම සඳහා වූ යෝජනාවක් හෝ ඉහතින් වූ මාස හය තුළ ප්‍රතික්ෂේප කරන ලද යෝජනාවකට සමාන ප්‍රතිඵල ගෙන දෙන වෙනත් යෝජනාවක් හෝ ඉදිරිපත් කිරීම, එය ඉදිරිපත් කරන බවට යෝජනා කරන සභිකයාගේ අත්සනට අමතරව තවත් සභිකයන් හතර දෙනෙකුගේ අත්සන් යෙදූ දැන්වීමක් කර න්‍යාය පත්‍රයෙහි ඒ බව නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇත්තේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ යැයි සලකනු නොලැබිය යුතු ය. ඒ යෝජනාව සම්බන්ධයෙන් සුදුසු කටයුතු කරනු ලැබීමෙන් පසු ඊළඟ මාස හයක කාලසීමාව තුළ ඒ හා සමාන යෝජනාවක් ඉදිරිපත් කිරීමට කවර හෝ සභිකයෙකුට බලය නොමැති විය යුතු ය.

(6) කිසිම යෝජනාවක්, යෝජනා කර ස්ථිර කරනු ලබන තුරු විවාදය සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(7) කවර හෝ සභිකයෙකුට, සිය අසුනෙන් නැගී සිට මූලාසනයට හිස නමා ආචාර කිරීමෙන්, විවාදයේ පසු අවධියක දී කථා කිරීමට තමාට ඇති අයිතිවාසිකමට හානියක් නොමැතිව යම් යෝජනාවක් හෝ සංශෝධනයක් හෝ විධිමත්ව ස්ථිර කළ හැකි ය.

(8) කල්තබා දැනුම් දී ඇති යෝජනා සම්බන්ධයෙන් ක්‍රියාකොට අවසන් වූ විගසම කල් තබා දැනුම් දෙනු නොලැබූ කිසියම් යෝජනාවක් මහ නගර සභාවට ඉදිරිපත් කිරීමට සභාවේ අවසරය පතන යෝජනාවක් ඉදිරිපත් කිරීමට සභිකයෙකුට හැකියාව ඇත. එසේ වුව ද කලින් එය ලියා, යෝජක සභිකයා විසින් අත්සන් කරනු ලැබ, ලේකම්වරයා වෙත භාරදිය යුතු ය.

(9) යෝජනාවක් රැස්වීමකට ඉදිරිපත් කොට ස්ථිර කරනු ලැබ ඒ පිළිබඳ විවාදය අවසන් වූ පසු රැස්වීමේ සභාපතිවරයා විසින් ඒ යෝජනාව සම්මත කිරීම පිළිබඳව ප්‍රශ්නය විමසනු ලැබිය යුතු ය.

12. යම් සභිකයකු විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් හෝ සංශෝධනයක් මහ නගර සභාව විසින් දෙන ලද අවසරය ඇතිව ඒ සභිකයා විසින් ඉල්ලා අස්කර ගනු ලැබිය හැකි ය. එම අවසරය විවාදයකින් තොරව ලබා දිය යුතු ය. කිසියම් යෝජනාවක් ඉදිරිපත් කරන්නා විසින් එවැනි අවසරයක් ඉල්ලා සිටීමෙන් පසුව ඒ අවසරය ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් මිස ඒ යෝජනාව මත කථා කිරීමට කිසිම සභිකයකුට බලය නොතිබිය යුතු ය.

13. ඉල්ලා අස්කර ගනු ලැබූ යම් යෝජනාවක් පසුව පවත්වනු ලබන යම් රැස්වීමක දී නැවත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එහෙත් II වැනි වගන්තියෙහි සඳහන් මාස හයක කාල පරිච්ඡේදය තුළ පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරන ලද යම් යෝජනාවකට සාරානුකූලව සමාන වන කිසිම යෝජනාවක් ඉදිරිපත් කරනු නොලැබිය යුතු ය.

14 (1) යෝජනාවකට ගෙන එනු ලබන සෑම සංශෝධනයක්ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, යෝජනා කරන සභිකයා විසින් එකී ලිඛිත සංශෝධනය හෝ සංශෝධන ලේකම්වරයාට භාරදිය යුතු ය.

(2) යෝජනාවකට ගෙන එනු ලබන සෑම සංශෝධනයක්ම එය ඉදිරිපත් කරනු ලබන අවස්ථාවෙහි සාකච්ඡාවට භාජනව තිබෙන යෝජනාවට අදාළ වන්නක් විය යුතු ය.

(3) යෝජනාවකට ගෙන එනු ලබන සෑම සංශෝධනයක්ම එය ඉදිරිපත් කිරීමට පෙර සභාවට කියවනු ලැබිය යුතු ය.

(4) කිසිම සංශෝධනයක් ස්ථිර කරනු නොලැබුවහොත් සාකච්ඡාවට භාජනය කිරීම හෝ මහා නගර සභාවට ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

(5) සංශෝධනයක් විධිමත් ලෙසින් ස්ථිර කළ සභිකයෙකුට ඊට පසුව ඒ ගැන කථා කිරීමට හිමිකම තිබිය යුතු ය.

(6) සාකච්ඡාවට භාජනව පවතින යම් යෝජනාවකට සංශෝධනයක් යෝජනා කොට ස්ථිර කරනු ලැබ ඇති විට පළමුවන සංශෝධනය සම්බන්ධයෙන් සුදුස්සක් කොට නිම වන තුරු දෙවැනි හෝ ඊට පසුව කෙරෙන සංශෝධනයක් ඉදිරිපත් නොකළ යුතු ය. සංශෝධනයක් සම්මත වුවහොත් ඒ සංශෝධිත යෝජනාව මුල් යෝජනාවේ තැන ගත යුතු අතර තවදුරටත් කෙරෙන යම් සංශෝධන වේ නම්, ඒවා එම සංශෝධිත යෝජනාව සම්බන්ධයෙන් වන සංශෝධන විය යුතු ය.

15. සභාවට යොමු කරනු ලැබූ කිසියම් කාරණයක්, ප්‍රශ්නයක් හෝ යෝජනාවක් සම්බන්ධයෙන්, එකී කාරණය ප්‍රශ්නය හෝ යෝජනාව සම්මත කිරීම පිළිබඳ ප්‍රශ්නය රැස්වීමේ සභාපතිවරයා විසින් විමසනු ලැබීමෙන් පසුව කවර හෝ සභිකයකු විසින් එම ප්‍රශ්නය පිළිබඳව තව දුරටත් කථා නොකළ යුතු ය. එසේම කිසියම් කාරණයක්, ප්‍රශ්නයක් හෝ යෝජනාවක් සම්මත කිරීම පිළිබඳව රැස්වීමේ සභාපතිවරයා විසින් ප්‍රශ්නය විමසනු ලැබීමෙන් පසුව හා ඒකමතිකව සම්මත වීම හෝ ඡන්දය විමසීමෙන් පසුව එකී ප්‍රශ්නය සම්පූර්ණ වශයෙන් විමසූ ලෙස සැළකිය යුතු ය.

16. (1) කිසියම් කාරණයක්, ප්‍රශ්නයක් හෝ යෝජනාවක් සම්මත කිරීම පිළිබඳව රැස්වීමේ සභාපතිවරයා විසින් ප්‍රශ්නය විමසනු ලැබිය යුතු අතර, එසේ ප්‍රශ්නය විමසනු ලැබීමෙන් අනතුරුව කවර හෝ සභිකයෙකු විසින් ඒ පිළිබඳව බෙදීමක් ඉල්ලා නොසිටියහොත් ඒ යෝජනාව ඒකමතිකව සම්මත වූ ලෙස සැළකිය යුතු ය. එසේ වුව ද එවැනි යෝජනාවක් සම්බන්ධයෙන් කිසියම් සභිකයෙකු විසින් බෙදීමක් ඉල්ලා සිටින්නේ නම් හෝ රහස් ඡන්ද විමසීමක් ඉල්ලා සිටින්නේ නම් හෝ රැස්වීමේ සභාපතිවරයා විසින් ඡන්දය විමසීමට සලස්වනු ලැබිය යුතු ය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් ආකාරයෙන් කිසියම් කාරණයක්, ප්‍රශ්නයක් හෝ යෝජනාවක් සම්බන්ධයෙන් ඡන්දය විමසීමක් අවශ්‍ය වන විටක -

(ii) එකී ඡන්ද විමසීම රහස් ඡන්ද විමසීමක් නොවන විට, ලේකම්වරයා විසින් 7 වැනි වගන්තියේ සඳහන් සභිකයන්ගේ ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව එක් එක් සභිකයාගේ කැමැත්ත ඒ සභිකයාගෙන් වෙන් වෙන්ව අසා ඒ අනුව ඡන්දය සටහන් කිරීමෙන් ඡන්දය ගත යුතු ය ; නැතහොත්

(ii) එකී ඡන්ද විමසීම රහස් ඡන්ද විමසීමක් වන විට, ලේකම්වරයා විසින් එක් එක් සභිකයා වෙත වෙන් වෙන්ව නිකුත් කරනු ලබන ඡන්ද පත්‍රිකා මත ඒ සභිකයාගේ රහස් ඡන්දය සටහන් කරවාගෙන ඒ අනුව ඡන්දය ගණන් ගැනීම කළ යුතු ය.

(3) (2) වැනි ඡේදයේ සඳහන් යම් ආකාරයකින් ලේකම්වරයා විසින් ඡන්දය විමසීමෙන් අනතුරුව එකී කාරණය, ප්‍රශ්නය හෝ යෝජනාව සම්බන්ධයෙන් මහා නගර සභාව ගනු ලැබූ සම්මතය රැස්වීමේ සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(4) මහා නගර සභාවේ දී හෝ මුළු මහා නගර සභාවෙන්ම සමන්විත කාරක සභාවේ දී හෝ යම් ප්‍රශ්නයක් විමසූ විට පැමිණ සිටින සෑම සභිකයකුම තමන් ඡන්දය දීමෙන් වැළකී සිටින්නේ නම් මිස ස්වකීය ඡන්දය පක්ෂව හෝ විපක්ෂව දිය යුතු ය.

(5) බෙදීමක් ඉල්ලා සිටින ලද අවස්ථාවක දී කිසියම් සභිකයකු ඡන්දය දීමෙන් වැළකී සිටියහොත් ලේකම්වරයා විසින් එම සභිකයාගේ නම ඡන්දය දීමෙන් වැලකී සිටි සභිකයෙකු ලෙස වාර්තාවේ සටහන් කළ යුතු ය.

17. කිසියම් කාරණයක්, ප්‍රශ්නයක් හෝ යෝජනාවක් සම්බන්ධයෙන් මහා නගර සභාවේ හෝ මහා නගර සභාව මුළු මහා නගර සභාවේම කාරක සභාවක් බවට පත්ව ඇති විට හෝ අනෙකුත් සභිකයන් සමග පොදුවේ රැස්වීමේ සභාතිවරයාට ද මුල් ඡන්දයක් තිබිය යුතු අතර, යම් ප්‍රශ්නයක් මත ඡන්ද ගණන සමාන වුවහොත් තීරක ඡන්දයක් ද ඔහුට හිමි විය යුතු ය.

18. කිසියම් කාරණයක්, ප්‍රශ්නයක් හෝ යෝජනාවක් සම්බන්ධයෙන් එකඟ නොවන සභිකයෙකු එසේ එකඟ නොවීමට හේතු වාර්තාගත කිරීමට බලය තිබිය යුතු අතර, ලියවිල්ලක් විය යුතු එම එකඟ නොවීම අදාළ රැස්වීමෙන් එක් සතියක් ඇතුළත නාගරික ලේකම්වරයාට භාරදුනහොත් ලේකම්වරයා විසින් එකී රැස්වීමේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවේ එසේ එකඟ නොවීමට හේතු වූ කරුණු සටහන් කරනු ලැබිය යුතු ය.

19. 6 වැනි වගන්තියේ සඳහන් ආකාරයට පිළියෙල කළ රැස්වීමේ කටයුතු අනුපිළිවෙලට අදාළ සියලු කටයුතු ඇතුළත් විය යුතු ය. කිසියම් සභා රැස්වීමක දී වෙනත් අනුපිළිවෙලක් සම්මත කරගෙන ඇත්තේ නම් මිස, 6 වැනි වගන්තියේ සඳහන් අනුපිළිවෙල අනුව රැස්වීමේ කටයුතු කරනු ලැබිය යුතු ය.

20. (1) රැස්වීමේ විනය ආරක්ෂා කිරීම, රැස්වීමක සභාපතිවරයාගේ කාර්යය විය යුතු අතර මතභේදයට ලක්වන සියලුම රීති ප්‍රශ්න පිළිබඳව ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(2) රැස්වීමක දී මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට පටහැනිව ක්‍රියාකරන කවර හෝ සභිකයකු අතුරු ව්‍යවස්ථානුකූල විය යුතු යයි රැස්වීමේ සභාපතිවරයා විසින් ස්වකීය මෙහෙයවීමෙන් ම හෝ වෙනත් සභිකයකු විසින් රීති ප්‍රශ්නයක් මතු කිරීම මත අණ කළ හැකි ය.

21. රීති ප්‍රශ්නයක් නැගීමෙන් පසු එය නැගූ සභිකයා අසුන් ගත යුතු අතර රැස්වීමේ සභාපතිවරයා විසින් ඒ ප්‍රශ්නය විසඳන තෙක් රැස්වීමේ සභාපතිවරයාගේ අවසරය ඇතිව මිස වෙනත් කිසි ම සභිකයකු කථා නොකළ යුතු ය. ඊට පසු ප්‍රශ්නය මතු කළ වේලෙහි මහ නගර සභාව අමතමින් සිටි සභිකයාට තමා රැස්වීමේ සභාපතිවරයාගේ මහ නගර සභාවේ හෝ මහ නගර සභාවේ කාරක සභාවේ තීරණයට අනුකූල වන්නේ නම් ස්වකීය කථාව නැවත කරගෙන යාමේ අයිතිය තිබිය යුතු ය. ඔහු එසේ අනුකූල නොවන්නේ නම් ඔහුට කථාව නැවත කර ගෙන යාමට ඉඩදීම ප්‍රතික්ෂේප කරනු ලැබීමට රැස්වීමේ සභාපතිවරයාට හැකි ය.

22. තමා විසින් පාවිච්චි කරන ලද නොනිසි වචන සම්බන්ධයෙන් කරුණු දැක්වීම හෝ එම වචන ඉල්ලා අස්කර ගැනීම හෝ එම වචන පාවිච්චි කිරීම ගැන මහ නගර සභාව සෑහීමකට පත්වන ආකාරයට ස්වකීය කණගාටුව පළ කිරීම නොකළ සභිකයකුට දොස් පැවරීම හෝ සුදුසුයැයි මහ නගර සභාව අදහස් කරන ආකාරයට ඔහු සම්බන්ධයෙන් කටයුතු කිරීම මහ නගර සභාව විසින් කළ හැකි ය.

23. රැස්වීමක සභාපතිවරයා කථා කිරීමට කැමැත්ත පළකල විට එවේලෙහි කථා කරමින් සිටින යම් සභිකයකු වහාම සිය අසුනේ වාඩිවිය යුතු ය.

24. (1) මූලාසනයේ අධිකාරය නොතකන හෝ මහ නගර සභාවේ වැඩ කටයුතුවලට නැවත නැවතත් හා ඕනෑකමින් ම බාධා කිරීමෙන් මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට පටහැනිව ක්‍රියාකරන යම් සභිකයකු, රැස්වීමක සභාපතිවරයා විසින් නම් කරනු ලැබිය හැකි අතර යම් සභිකයකු විසින් හෝ රැස්වීමේ සභාපතිවරයා විසින් "එම සභිකයාගේ බදුල්ල මහ නගර සභා සේවය අත්හිටුවිය යුතු ය " යනුවෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මත රැස්වීමේ සභාපතිවරයා විසින් ප්‍රශ්නය වහාම විමසිය යුතු ය. එවැනි යෝජනාවකට සංශෝධනයක් කිරීම, කල් තැබීමකට හෝ විවාදයකට ඉඩ නොතිබිය යුතු ය.

(2) එවැනි යම් යෝජනාවක් සම්මත වී මේ අතුරු ව්‍යවස්ථාව යටතේ යම් සභිකයකුගේ සභා සේවය අත්හිටවනු ලැබුවේ නම් ප්‍රථම වාරයේ දී ඒ අත්හිටුවීම එක් මාසයක් සඳහා ද, දෙවන වර කෙරෙන අත්හිටුවීම මාස දෙකක් සඳහා ද, තෙවන වර හෝ ඊට පසු යම් වරක දී කෙරෙන අත්හිටුවීම මාස තුනක් සඳහා ද විය යුතු ය.

(3) පැමිණ සිටින සභිකයන් කීපදෙනෙකු එක්ව රැස්වීමේ සභාපතිවරයාගේ අධිකාරය නොතකා ඇතොත් මිස වරකට එක් සභිකයකුට වැඩි දෙනෙකු නම් කිරීම නොකළ යුතු ය.

(4) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ සභා සේවය අත්හිටුවන ලද යම් සභිකයකු හෝ එක්ව ක්‍රියාකරන සභිකයන් කීපදෙනෙකු සභා ගර්භයෙන් ඉවත්වීමට රැස්වීමක සභාපතිවරයා විසින් කරන ලද විධානවලට අනුකූලවීම එකී අත්හිටුවීමේ කාලය තුළ යම් අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරන්නේ නම් ස්වකීය තීරණය ක්‍රියාත්මක නොකළ සභිකයෙකු වශයෙන් නම්කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා අමාත්‍යවරයා වෙත වාර්තා කළ හැකි ය.

25. නැවත නැවතත් අදාළ නොවූ දේ කීමෙහි හෝ තමාම හෝ සභිකයන් විවාදයේ දී ඉදිරිපත් කළ තර්ක සභාව විඩාවට පත් කරමින් නැවත නැවතත් ප්‍රකාශ කිරීමෙහි යෙදෙන සභිකයකුගේ හැසිරීම කෙරෙහි අවධානය යොමු කරවීමෙන් පසු ඔහුගේ කථාව නවත්වන ලෙස රැස්වීමක සභාපතිවරයා විසින් විධාන කළ හැකි ය.

26. (1) බරපතල ලෙස විනය විරෝධීව හැසිරෙන සභිකයන්ට මහ නගර සභාවේ සභා ගර්භයෙන් වහාම ඉවත්ව එදින රැස්වීමේ ඉතිරි කොටස අවසන් වන තෙක් ඉන් බැහැරව සිටින ලෙසට රැස්වීමක සභාපතිවරයා විසින් විධාන කළ හැකි ය.

(2) මේ අතුරු ව්‍යවස්ථාව යටතේ තමාගේ බලතල ප්‍රමාණවත් නොවන්නේ යයි කිසියම් රැස්වීමක සභාපතිවරයා, යම් අවස්ථාවක දී අදහස් කරන්නේ නම් ඔහු විසින් 24 වැනි වගන්තියේ (4) වැනි ඡේදයේ නියමයන් අනුව ක්‍රියා කරනු ලැබිය හැකි ය.

27. 24 වැනි වගන්තියේ (1) ඡේදය යටතේ සේවය අත්හිටවනු ලැබූ හෝ 24 වැනි වගන්තියේ (4) වැනි ඡේදය යටතේ ඉවත්වන ලෙසට නියම කරනු ලැබූ සභිකයන් මහ නගර සභාවේ සභා ගර්භයෙන් වහාම ඉවත් විය යුතු ය.

28. යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කරනු ලබන සාකච්ඡාවක් අඩාලව කල් දැමීමට සභිකයකු විසින් කවර හෝ අවස්ථාවක යෝජනා කළ හැකි ය. එම යෝජනාව ස්ථිර කරනු ලැබුවහොත් ඒ පිළිබඳව වහා ම ඡන්දය විමසිය යුතු ය. රැස්වීමක බරපතල විනය කඩකිරීමක් ඇතිවූ විටෙක දී රැස්වීම අඩාලව කල් තැබීම අවශ්‍ය යැයි රැස්වීමේ සභාපතිවරයා විසින් අදහස් කරනු ලැබේ නම් අඩාලව කල් තැබීමේ ප්‍රශ්නය සභාවෙන් නොවිමසාම, රැස්වීම ඔහු විසින් නියම කරන කාලසීමාවකට අඩාලව කල්තැබීම හෝ රැස්වීම අත්හිටුවීම කරනු ලැබිය හැකි ය.

29. මහ නගර සභාව විසින් හෝ මුලු මහ නගර සභාවේ ම කාරක සභාවක් විසින් සලකා බලනු ලබන කාරණයක් සම්බන්ධයෙන් කථා කිරීමේ දී පහත දැක්වෙන නියමයන් තරයේ පිළිපදිනු ලැබිය යුතු ය. -

(අ) රැස්වීමක දී සෑම සභිකයකු ම රැස්වීමේ සභාපතිවරයා අමතා කථා කළ යුතු අතර කාරක සභා අවස්ථාවේ දී හැර නැගී සිට කථා කළ යුතු ය.

(ආ) කිසිම සභිකයකු කථා කරන විට මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පටහැනි වුවහොත් මිස ඔහුට බාධා කරනු නොලැබිය යුතු ය.

(ඇ) යම් සභිකයකු තම කථාව අවසන් වූ විට නැවත තම අසුනේ වාඩිවිය යුතු ය. එවිට සභාව ඇමතීමට කැමති වෙනත් සභිකයකු විසින් කථා කළ හැකි ය.

(ඈ) සභිකයකු විසින් ස්වකීය කථාව සටහන් කරගත් කථාවක් ලෙස නොකියවිය යුතු ය. එසේ වුව ද තමාගේ තර්ක සනාථ කිරීම පිණිස ලිඛිත හෝ මුද්‍රිත ලිපිවලින් උපුටාගත් කොටස් ඔහු විසින් කියවිය හැකි ය.

(ඉ) රැස්වීමක දී එකම වේලාවට සභිකයන් දෙදෙනෙකුට කථාකිරීමට අවශ්‍ය වුවහොත්, රැස්වීමේ සභාපතිවරයා විසින් සිය ඇස ගැටුණු පළමුවන සභිකයාට කථා කරන ලෙස දැනුම් දිය යුතු ය.

(ඊ) සෑම සභිකයෙකු විසින් ම සිය නිරීක්ෂණයන්, සැලකිල්ලට භාජනය වූ විෂයට පමණක් සීමා කළ යුතු ය.

(උ) කිසිදු සභිකයෙකු විසින් තවත් සභිකයෙකුට අනිසි චේතනා ආරෝපණය නොකළ යුතු ය.

(ඌ) පෞද්ගලික ස්වභාවයේ සියලු කථා වලින් වැළකී සිටිය යුතු ය.

(එ) සභිකයෙකු විසින් මහ නගර සභාව හමුවෙහි වූ ප්‍රශ්නය ගැන හෝ එහි යම් සංශෝධනයක් ගැන කථා කළ හැකි ය.

(ඒ) රීති ප්‍රශ්නය ගැන සිය නිදහසට කරුණු කීමට අවශ්‍ය වන යම් අවස්ථාවක හෝ මහ නගර සභාව කාරක සභාවක් බවට පරිවර්තනය වූ අවස්ථාවක හෝ විනා කිසිදු සභිකයෙක් මහ නගර සභාව ඉදිරියේ තිබෙන කාරණයක් ගැන එක් වරකට වඩා කථා නොකළ යුතු ය.

(ඔ) සභාව ඉදිරියේ ප්‍රශ්නයක් නොතිබුණේ වී වුව ද සභිකයෙකු විසින් මහ නගර සභාවේ කැමැත්ත ඇතිව පෞද්ගලික ස්වභාවයේ කරුණු පැහැදිලි කිරීමක් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද ඔහුගේ ක්‍රියාකලාපය නිදොස් කිරීම සඳහා පමණක් ම එකී කරුණු ඉදිරිපත් කිරීම සීමා කළ යුතු අතර ඒ කරුණු විවාදයට භාජනය නොකළ යුතු ය.

(ඕ) යම් යෝජනා සම්මතයක හෝ යෝජනාවක යෝජක විසින් පැමිණ සිටින සභිකයන් සියලු දෙනාට ම ඒ යෝජනා සම්මතය හෝ යෝජනාව ගැන මහ නගර සභාව ඇමතීමට අවස්ථාවක් ලබා දීමෙන් පසු සහ ප්‍රශ්නය සභාවට ඉදිරිපත් කිරීමට ප්‍රථම පිළිතුරු දීමක් කරනු ලැබිය හැකි ය. එසේ වුව ද ඔහුගේ කථාව කලින් කථා කළ කථිකයන්ට පිළිතුරු දීමට පමණක් සීමා කළ යුතු අතර විවාදයට අලුත් කරුණු ඉදිරිපත් කිරීමක් නොකළ යුතු ය. තවදුරටත් එසේම පිළිතුරු දීමේ අයිතිය සංශෝධනයට යෝජකයාට හිමි නොවිය යුතුය.

30. (1) බදුල්ල මහා නගර සභාව විසින් කවර හෝ අවස්ථාවක දී යෝජනා සම්මතයක් මගින් මුළු මහ නගර සභාවම කාරක සභාවක් බවට පරිවර්තනය විය හැකි ය. එසේ වුව ද ඒ ආකාරයෙන් ම වන යෝජනා සම්මතයකින් ඒ කාරක සභාව නැවත මහ සභා අවස්ථාවකට පත්වීමෙන් පසුව එකී කාරක සභා අවස්ථාවේ සාකච්ඡා වූ කරුණුවල ප්‍රතිඵල ගැන මහ නගර සභාව විසින් තීරණයක් ගනු ලැබිය යුතු ය.

(2) මුළු මහ නගර සභාවේ කාරක සභාවක යම් සාකච්ඡාවක් පවත්නා කවර හෝ අවස්ථාවක දී මහ නගර සභාව මහ සභාවක් බවට නැවත පත්විය යුතු බවට කවර හෝ සභිකයකු විසින් යෝජනා කිරීමට බලය ඇත්තේ ය. මුළු මහ නගර සභාවේ කාරක සභාවේ රැස්වීමේ සභාපතිවරයා විසින් ප්‍රශ්නය ගැන ඡන්දය විමසිය යුතු අතර, යෝජනාව සම්මත වුවහොත් මහ නගර සභාව වහාම කාරක සභා අවස්ථාවෙන් නැවත මහ සභාව බවට පත්විය යුතු ය.

31. (1) මහ නගර සභාවේ යම් කාර්යයක් සඳහා, සභාව විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන්නා වූ සභිකයන්ගෙන් සමන්විත වූ විශේෂ කමිටුවක් මහ නගර සභාව විසින් කලින් කළ පත් කරනු ලැබිය හැකි ය.

(2) ඉහත කී පරිදි පත් කරන ලද එවැනි විශේෂ කමිටුවක් සභාවක් විසින් එය පත්කිරීමට යෙදුණු වර්ෂය අවසන් වීමෙන් පසු එහි යම් කටයුතු ඉටු නොකළ යුතු ය.

(3) එවැනි විශේෂ කමිටුවක් සභාවක සෑම රැස්වීමකම ගණපූරණය එම රැස්වීම පැවැත්වෙන දින ධූර දරන විශේෂ කමිටුවක් සභාවේ සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක් පංගුවක් විය යුතු ය. එම සභික සංඛ්‍යාවෙන් තුනෙන් එක් පංගුවක් පූර්ණ සංඛ්‍යාවක් සහ භාගයක් වන අවස්ථාවක එම පූර්ණ සංඛ්‍යාව සහ භාගයට වැඩි ඊළඟ පූර්ණ සංඛ්‍යාව මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා තුනෙන් එක් පංගුව සැලකිය යුතු ය.

(4) යම් විශේෂ කමිටුවක් සභාවක සභාපතිවරයා රැස්වීමකට පැමිණී නොසිටින අවස්ථාවක පැමිණ සිටින සභිකයන් විසින් ඒ සභිකයන් අතුරින් එක් අයෙකු එකී සභාවේ සභාපතිවරයා ලෙස තෝරා ගත යුතු අතර ඒ සභිකයාට ඒ රැස්වීම සඳහා, ඒ විශේෂ කමිටුවක් සභාවේ නගරාධිපතිවරයා සතු සියලු බලතල තිබිය යුතු ය.

(5) විශේෂ කමිටුවක් සභාවක්, කිසියම් වාර්තාවකට එකඟවී ඇති විටෙක, ඒ වාර්තාවට සියලු කාරක සභිකයන් විසින් අත්සන් කරනු ලැබිය යුතු අතර එකී විශේෂ කමිටුවක් සභාවේ කටයුතු ඇතුළත් වාර්තාවද සමඟ මහ නගර සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) විශේෂ කමිටුවක් සහ රැස්වීම්වලට ඇතුල්වීමට පුවත්පත් වාර්තාකරුවන්ට ඉඩ නොතිබිය යුතුය.

32. මහ නගර සභාවේ මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ ස්ථාවර කමිටුවේ ලේකම්වරයා වශයෙන් මහ නගර සභාවේ ලේකම්වරයා කටයුතු කළ යුතු අතර සෙසු කමිටුවල ලේකම්වරයා වශයෙන් කටයුතු කිරීමට මහ නගර සභාවේ යම් නිලධාරියෙකු පත්කිරීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතුය.

33. මහ නගර සභාවේ එක් එක් කමිටුවේ කටයුතු පිළිබඳ වාර්තා පවත්වා ගැනීම එකී කමිටුවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු අතර එක් එක් කමිටු රැස්වීම් වාර්තාව ඊට පසුව එළැඹෙන මහ නගර සභාවේ සභා රැස්වීමට ඉදිරිත් කළ යුතුය.

34. මහ නගර සභාවේ රැස්වීම්වලට පැමිණි විට ලේකම්වරයා භාරයේ ඇති පැමිණීමේ ලේඛනයක සියලුම සභිකයන් විසින් පැමිණි අනුපිළිවෙලින් තම නම, පැමිණි වේලාව සහ අත්සන සටහන් කරනු ලැබිය යුතු අතර ඒ ලේඛනය ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු ය.

35. කිසියම් කමිටුවක රැස්වීම්වලට පැමිණි විට එකී කමිටුවේ ලේකම්වරයා භාරයේ ඇති ලේඛනයක සියලුම කමිටු සභා සාමාජිකයන් විසින් පැමිණි අනුපිළිවෙලින් තම නම, පැමිණි වේලාව සහ අත්සන සටහන් කරනු ලැබිය යුතු අතර ඒ ලේඛනය කමිටු වේ ලේකම්වරයාගේ භාරයේ තිබිය යුතු ය.

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

I. "මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන් මැතිවරණ කොමිෂන් සභාවේ කොමසාරිස් ජනරාල්වරයා අදහස් වන අතර කිසියම් බදුල්ල මහ නගර සභාවක තේරීම් භාර නිලධාරියා ද ඊට අතුළත් විය යුතු ය.

II. " රැස්වීමේ සභාපතිවරයා" යන්නෙන් තත් කාලයේ දී බදුල්ල මහ නගර සභාවේ රැස්වීමේ මූලාසනය දරන නගරාධිපතිවරයා හෝ ඔහු නොමැති යම් අවස්ථාවක රැස්වීමේ මූලාසනය දරන බදුල්ල මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපතිවරයා අදහස් වන අතර නගරාධිපතිවරයා හෝ නියෝජ්‍ය නගරාධිපතිවරයා නොමැති යම් අවස්ථාවක එදින රැස්වීමේ මූලාසනය සඳහා සභිකයන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලබන වෙනත් කිසියම් සභිකයෙකු ද විය යුතු ය.

III. "හඬ පට" යන්නෙන් යන්ත්‍රානුසාරයෙන් පටිගත කරනු ලැබූ යම් හඬ ගබඩා කිරීමේ පටියක් අදහස් වන අතර, හඬ ගබඩා කළ හැකි සංයුක්ත තැටියක් හෝ හඬ දත්ත ගබඩා කළ හැකි වෙනත් යම් ආකාරයක උපකරණයක් ද.

IV. "කමිටුව" යන්නෙන් මහ නගර සභා ආඥාපනතේ 26 වැනි වගන්තිය පරිදි පත් කරනු ලබන ස්ථාවර කමිටු සහ 27 වැනි වගන්තිය පරිදි පත්කරනු ලබන කමිටු ද අදහස් වේ.

## III වැනි කොටස

### *මහජන සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව*

252 වැනි අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 හා 272 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 05 වැනි උපවගන්තියට අනුව මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභාවේ මහජන සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ මහජන සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථායි.

2. (1) වසංගත හෝ ප්‍රාදේශීය හෝ ස්පර්ශක ස්වභාවයක වූ හෝ රෝගයකින් පෙළෙන තැනැත්තෙකු සිටින යම් නිවසක හෝ ගොඩැගිල්ලක හෝ පිටතින් ප්‍රකටව පෙනෙන කොටසක නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙන යම් තැනැත්තකු විසින් ලකුණක් තැබීම හෝ තැබීමට සැලැස්වීමට ඔහු විසින් අවශ්‍ය යැයි සළකණු ලබන කාලයක් එම සළකනු අළවා තැබීම ද නීත්‍යානුකුල විය යුතු ය.

(11) නාගරික කොමසාරිස්වරයාගේ අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ සඳහන් යම් ලකුණක් ඉරා දැමීම හෝ මකා දැමීම නොකළ යුතු ය.

3. 02 වන වගන්තියේ සඳහන් යම් රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තකු යම් පාරක අඩිපාරක හෝ ප්‍රසිද්ධ ස්ථානයක වුවමනාවෙන්ම නිදහසේ ගමන් නොකළ යුතු ය.

4. කිසිම තැනැත්තෙකු විසින් 02 වන වගන්තියේ සඳහන් යම් රෝගයකින් පෙළෙන යම් ළමයකු හෝ කිසියම් වෙනත් තැනැත්තෙකු යම් පාරක, අඩිපාරක හෝ ප්‍රසිද්ධ ස්ථානයක නිරාවරනව තබා ගැනීම හෝ එවැනි තැනකට යාම හෝ නොකළ යුතු ය.

5. නාගරික කොමසාරිස්වරයා විසින් පොදු නාන ස්ථානයක ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් එක් පක්ෂයකට ප්‍රයොජනය සඳහා සභාව විසින් නාන ස්ථානයක් වෙන්කොට ඇති එවැනි යම් පොදු ලිඳක් හෝ වෙනත් ස්ථානයක අනෙක් පක්‍ෂයට අයත් කිසිම තැනැත්තකු විසින් නෑම, සේදීම හෝ ජලය වෙනත් යම් ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතු ය.

6. (1) යම් ස්පර්ශක, චර්ම හෝ ආසාදක රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිට ඇති සෑම තැනැත්තකු නොදැන හෝ බිජෞෂාණ කාලසීමාවක් ඉක්මවන තුරු යම් පොදු නාන ස්ථානයක නෑම හෝ සේදීම නොකළ යුතු ය.

(11) මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වන ඡේදයේ සඳහන් යම් තැනැත්තෙකුගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ජලය නිරෝගී තැනැත්තෙකු විසින් නොදෙන යම් පොදු ළිඳකින් හෝ නාන ස්ථානයකින් යටත් පිරිසෙයින් මීටර් දහයකින්වත් (10) ඈතින් පිහිටි තැනකට ගෙන යා යුතු ය.

7. යම් පොදු ළිඳකින් හෝ නාන ස්ථානයකින් ජලය ගැනීමේ කාර්යය සඳහා කිසිම තැනැත්තකු විසින් යම් අපිරිසිදු භාජනයක් භාවිතා නොකළ යුතු ය.

8. කිසිම තැනැත්තකු විසින්,

(i) කවර අන්දමක හෝ භාණ්ඩයක් යම් පොදු ළිඳක හෝ ඒ අසල හෝ ඒ පොදු නාන ස්ථානයක් වශයෙන් වෙන් කර ඇති යම් ස්ථානයක දී හෝ සේදීම හෝ සේදීමට සැලැස්වීම නොකළ යුතු ය.

(ii) කවර හෝ කාර්යයක් සඳහා යම් සතෙකු යම් නාන ස්ථානයකට දක්කාගෙන යාම, එළවීම හෝ ගෙන යාම නොකළ යුතු ය.

(iii) යම් පොදු ළිඳක හෝ නාන ස්ථානයක ජලය හෝ ඒ අවට භූමිය කවර හෝ අන්දමකින් අපිරිසිදු නොකළ යුතු ය.

9. යම් පොදු ළිඳක හෝ පිහිල්ලක හෝ වෙනත් ජලය ලබාගන්නා ස්ථානය රෙදි සේදීම, නෑම, හෝ සභාව විසින් යෝජනා සම්මතයක් මගින් නියම කිරීම නීත්‍යානුකුල විය යුතුය.

10. (i) යම් වැවක හෝ පිහිල්ලක හෝ වෙනත් ජලය ලබා ගන්නා ස්ථානක රෙදි සේදීම, නෑම හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා ජලය ලබාගැනීම සහ ඒ සඳහා විශේෂ ස්ථාන සභාව විසින් තම අභිමතය පරිදි වෙන් කළ හැකි ය.

(ii) සභාව විසින් මේ අතුරු ව්‍යවස්ථාවේ (1) ඡේදය යටතේ වෙන් කර ඇති යම් ස්ථානයක් එය එසේ වෙන් කර ඇති කාර්යය හැර වෙනත් යම් කාර්යයක් සඳහා කිසිම තැනැත්තකු විසින් ප්‍රයෝජනයට නොගත යුතු ය.

11. (i) යම් පොදු ළිඳක, පිහිල්ලක, දිය උල්පතක හෝ ගෘහ කාර්යය සඳහා ජලය ලබා ගන්නා වෙනත් ස්ථානයක සිට මීටර් පහළොවක (15) දුරක් ඇතුළත කසළ වලක්, වසුරු වළක්, ඌරු කොටුවක්, ගාලක්, හරක් මඩුවක්, වළ වැසිකිසියක් හෝ දෝෂ සහිත කාණුවක් තිබෙන්නට හැරීම හෝ ගොවිතැන් කාර්යය සඳහා යම් ඉඩමකට නිතිපතා පොහොර යෙදීම නොකළ යුතු ය.

(ii) යම් කසළ වලක්, වසුරු වළක්, ඌරු කොටුවක්, ගාලක්, හරක් මඩුවක්, වළ වැසිකිළියක් හෝ දෝෂ සහිත කාණුවක් තිබෙන්නට හැරීම හෝ ගොවිතැන් කාර්යය සඳහා යම් ඉඩමකට නිතිපතා පොහොර යොදන යම් ඉඩමක සිට මීටර් දහසයක් (16) ඇතුළත ගෘහ කාර්යය සඳහා ජලය සැපයීමට කිසිම පුද්ගලික ළිඳක් කැපීම නොකල යුතු ය.

12. යම් කිසි තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකුට අයිති ඉඩමකට හෝ ප්‍රසිද්ධ ස්ථානයකට හෝ මාවතකට කැළිකසල හෝ දුගඳ හමන ද්‍රව්‍ය හෝ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ හෝ විසි නොකළ යුතු ය.

13. සතෙකු මැරුණු විට, ඒ සතා මැරුණු වේලාවේ සිට පැය දොලහක් (12) ඉක්මවීමට පෙර වළලා දැමීම, ඒ සතාගේ අයිතිකරුගේ හෝ අයිතිකරු නැති විටක නම් ඒ සතා මැරුණු ස්ථානයේ පදිංචිකරුගේ වගකීම වන්නේ ය.

14. නාගරික ප්‍රදේශය ඇතුළත වූ යම් නිවසක අයිතිකරු හෝ පදිංචිකරු/පදිංචිකරුවෙකු නැති විටක නම් අයිතිකරු එම නිවසට අදාළ ඉඩම පිරිසිදුව සහා සනීපාරක්ෂක තත්වයකින් ද, වල් පැළෑටි, ලඳු කැළෑ සහ කුණුරොඩුවලින් හා ජලය රැඳී තැබිය හැකි වෙනත් භාජන, ටයර්, ටින්, තැඹිලි කෝම්බ වැනි ද්‍රව්‍යවලින් තොරව ද නඩත්තු කළ යුතු ය.

15. මළපහ කිරීම සඳහා විශේෂයෙන් වෙන් කර නොමැති ස්ථානයක කිසිම තැනැත්තෙකු විසින් මළපහ නොකළ යුතු වන්නේ ය.

16. මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංගනය කරන කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරන අතර ඒ පුද්ගලයා හෝ පුද්ගලයන්ට විරුද්ධව බදුල්ල මහා නගර සභා සීමාව තුළ පිහිටි අධිකරණ බලය ඇති නිසි අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කරනු ලැබුවහොත් පහත සඳහන් පරිදි,

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,
ii. දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද,
iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේ ය.

## IV වන කොටස

### ගෙපත්වල අධික සංඛ්‍යාවක් වාසය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 සහ 272 වන වගන්තිය සමග කියවිය යුතු 07 වැනි උපවගන්තියට අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ ගෙපත්වල අධික ජන සංඛ්‍යාවක් වාසය කිරීම සම්බන්ධයෙන් කරදර වැළැක්වීම හා නතර කිරීම විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි ගෙපත්වල අධික සංඛ්‍යාවක් වාසය කිරීම, පාලනය කිරීම සහ එමගින් වන කරදර වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවයි.

2. යම් ගොඩනැගිල්ලක වාසය කළ යුතු යැයි සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී විසින් ඔහුගේ මතය අනුව තීරණය ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාවට වඩා වැඩි ගණනක් එම ගොඩනැගිල්ලේ වාසය කරන බව සොයාගනු ලබන කවර හෝ අවස්ථාවක දී සෞඛ්‍ය වෛද්‍ය නිළධාරියාගේ අභිමතය අනුව එහි වාසය කළ යුතු සංඛ්‍යාවට අතිරික්තව සිටින සංඛ්‍යාවට එම ගොඩනැගිල්ලෙන් හැර යන ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නියෝග කිරීම නීත්‍යානුකූල විය යුතු ය. එම නියෝගය කිරීමෙන් පසුව යම් අවස්ථාවක එවැනි යම් ගොඩනැගිල්ලක එහි වාසය කළ යුතු සංඛ්‍යාවට අතිරික්තව යම් තැනැත්තන් සංඛ්‍යාවක් සිටින බව සොයාගතහොත් එම ගොඩනැගිල්ලේ අයිතිකරු හෝ බදුකරු එම වරදට වරදකරු විය යුතු ය.

3. (i) වාසස්ථානයක් වශයෙන් භාවිතා කරන ගොඩනැගිල්ලක, එහි නේවාසිකය නේවාසිකයන්ගේ සෞඛ්‍යයට අන්තරාදායක වන තරමට, තැනැත්තන් අධික සංඛ්‍යාවක් සිටින බව, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයාට පෙනී ගියහොත් එසේ තැනැත්තන් අධික සංඛ්‍යාවක් වාසය කිරීම වලක්වන ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි විසින් නාගරික ප්‍රදේශය තුළ අධිකරණ බලය ඇති විනිසුරුවරයෙකු වෙත ඉල්ලීමක් කළහැකි අතර, එකී විනිසුරුවරයා සුදුසුයැයි ඔහු විසින් සළකනුලබන පරීක්ෂණයකින් පසුව එකී ගොඩනැගිල්ලේ නවාතැන්කරුවන්, කුලී නිවැසියන් හෝ වෙනත් නේවාසිකයන්ගේ සංඛ්‍යාව අඩුකිරීමෙන් එහි තැනැත්තන් අධික සංඛ්‍යාවක් වාසය කිරීම එකී නියෝගය නියම කරනු ලබන සති හයකට (06) නොවැඩි සාධාරණ කාලයක් ඇතුළත නතර කරන ලෙස ලිඛිත ආඥාවක් මගින් ආඥාකිරීම හෝ යුක්තිසහගත සහ නිසියයි බදුල්ල මහ නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති විනිසුරුවරයා විසින් සළකනු ලබන වෙනත් ආඥාවක් කිරීම කළ හැකි ය.

(ii) එකී ගොඩනැගිල්ලේ අයිතිකරු කුළියට දී ඇත්නම් හෝ එකී ගොඩනැගිල්ලේ කුළී නිවැසියා අතුරු කුළියට දී ඇත්නම් නවාතැන්කරුවන්ගේ , කුළීනිවැසියන්ගේ හෝ වෙනත් තථ්‍ය නේවාසිකයන්ගේ ගෙහිමියා මේ වගන්තියේ කාර්යය සඳහා ගොඩනැගිල්ලේ අයිතිකරු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(iii) එවැනි යම් ආඥාවක් අනුව ගොඩනැගිල්ලෙන් පිටවී යන ලෙස අයිතිකරු විසින් නියම කරනු ලැබූ විට ඉන් පිටවී යාම සෑම නේවාසිකයකුගේම, නවාතැන්කරුවෙකුගේම හෝ වෙනත් නේවාසිකයකුගේම යුතුකම විය යුතු ය.

4. මේ අතුරු ව්‍යවස්ථාවලින් කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝනය කරන ලද කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරන අතර ඒ පුද්ගලයා හෝ පුද්ගලයින්ට විරුද්ධව බදුල්ල මහා නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කරනු ලැබුවහොත් පහත සඳහන් දඬුවම්වලට යටත් වන්නේ ය.

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,
ii. දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද,

iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේ ය.

05. අර්ථ නිරූපනය -

i. මෙම අතුරු ව්‍යවස්ථාවල "සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී" යන්නෙන් අදහස් වන්නේ බදුල්ල මහා නගර සභාවේ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරියා හෝ ඔහුගේ කාර්යය හා කර්තව්‍ය පැවරී ඇති නිළධාරියා වේ.

ii. "බදුකරු" යන්නෙන් අදහස් වන්නේ යම් ගොඩනැගිල්ලක් බදුකරු, කුළී නිවැසියා හෝ අතුරු කුළී නිවැසියා ය.

## V වැනි කොටස

### පොදු මහජන වැසිකිළි භාවිතය විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යස්ථාව

252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 සහ 272 වන වගන්තිය සමග කියවිය යුතු 05 වන උපවගන්තියේ (ඇ) ඡේදයට අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන පොදු වැසිකිළි (මහජන වැසිකිළි) පාවිච්චිය විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. මෙම අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පොදු වැසිකිළි භාවිතය විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

2. මහා නගර සභා බල ප්‍රදේශයේ මහජනතාවට පිරිසිදුව හා සනීපාරක්ෂාව පාවිච්චිය සඳහා පොදු වැසිකිළි පද්දධතිය විධිමත් කිරීම, පවත්වාගෙනයාම හා පාලනය කිරීම උදෙසා මෙම අතුරු ව්‍යවස්ථාවේ අපේක්ෂා කරයි.

3. පොදු වැසිකිළි හඳුනා ගැනීම උදෙසා එකී වැසිකිළි ගොඩනැගිලිවල පිටත මනාව ප්‍රදර්ශනය වන සේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ලියන ලද "මහජන වැසිකිළිය" යන වචනය යෙදූ නාම පුවරුවක් මහා නගර සභාව විසින් සවිකළ යුතු ය.

4. පොදු වැසිකිළියක් (මහජන වැසිකිළියක්) තුළ දී මළපහ කිරීමේ දී කිසිදු තැනැත්තෙකු වැසිකිළි තැටියට හැර, වෙනත් ස්ථානයකට මළපහ නොකල යුතු අතර, මුත්‍රා කිරීමේ දී වැසිකිළියට හෝ ඒ සඳහා සලසා ඇති ස්ථානයට හැර වෙනත් කිසිම ස්ථානයට මුත්‍රා නොකළ යුතු ය.

5. වැසිකිළියට සපයා ඇති ජලය වැසිකිළියේ කටයුතු සඳහා හැර වෙනත් කිසිම කටයුත්තක් සඳහා කිසිම පුදුගලයකු විසින් භාවිතා නොකළ යුතු ය.

6. කිසිම තැනැත්තෙකු විසින් පොදු වැසිකිළියක (මහජන වැසිකිළියක) හෝ ඊට සම්බන්ධ වැසිකිළි තැටි තුළට හෝ කාණු තුළට හෝ වෙනත් විවර ස්ථාන තුළට ගඩොල්, පස් , ගල්, අලු හෝ එම නල මාර්ග සහ කාණු අවහිර වන වෙනත් කිසිම ද්‍රව්‍යයක් දැමීම හෝ තැබීම නොකළ යුතුයි.

7. පොදු වැසිකිළියක (මහජන වැසිකිළියක) අලුත්වැඩියාවක දී හැර වැසිකිළි තැටියක නලයක, කපාටයක, ටැංකියක හෝ වෙනත් සවි කිරීමක් සවිකර ඇති ආකාරය, පිහිටීම හෝ පිළිවල හෝ කිසිම තැනැත්තෙකු විසින් හානියට පත් කිරීම, ඉවත් කිරීම, අවහිර කිරීම් හෝ කිසිදු ආකාරයකින් වෙනස් කිරීම් හෝ එම වැසිකිළියේ යම් බිත්තියක්, බිමක්, වහලයක් හෝ ව්‍යුහයක් යන කොටසක් ඕනෑකමින් විනාශ කිරීම, විරූප කිරීම, හානියට පත් කිරීම හෝ පලුදු කිරීම කරනු නොලැබිය යුතුය.

8. ස්ත්‍රී පක්ෂයේ ප්‍රයෝජනය සඳහා වෙන්කර තිබෙන්නාවූ පොදු වැසිකිළියකට (මහජන වැසිකිළියකට) කාන්තාවන් පමණක් ද පුරුෂයන් සඳහා වෙන්කර ඇති වැසිකිළි සඳහා පිරිමින් පමණක් ද ඇතුළත් විය යුතු අතර, වැසිකිළි සුදු පවිත්‍ර කිරීම හෝ අලුත්වැඩියා කිරීම් සිදුකරන අවස්ථාවල දී දොරවල් වසා ඒ බව ඇතුල්වන ස්ථානයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රදර්ශනය කර කාර්යයන් ඉටු කිරීම පැවරී ඇති අය විසින් කල යුතු ය.

9. නගරය තුළ දී කිසිවකු විසින් වැසිකිළියක හැර වෙනත් ස්ථානයක මළපහ කිරීම හෝ මුත්‍රා කිරීම නොකළ යුතු ය.

10. පොදු වැසිකිළියක (මහජන වැසිකිළියක) උපස්ථායකයකු, මුරකරුවෙකු, සේවකයකු හෝ භාරකරුවෙකු විසින් තම රාජකාරි ඉටු කරන අතර තුරදී යම් අයෙකුට කරනු ලබන යම් දැනුම් දීමක් නිත්‍යානුකුල වන්නේ ය. එවැනි දැනුම් දීමක් පැහැර හැරීම, ඊට බාධා කිරීම නොකළ යුතු ය.

11. වැසිකිළියේ (මහජන වැසිකිළියේ) උපකරණ හා භාණ්ඩ ඊට අදාළ ගොඩනැගිලි සෑමවිටම සුරක්ෂිතව තබාගත යුතු ය.

12. වැසිකිළියේ (මහජන වැසිකිළිය) මළපහ කිරීමට, මුත්‍රා කිරීමට පමණක් භාවිතා කළ යුතු අතර, එහිදී දුම් පානය, මත් ද්‍රව්‍ය භාවිතය වැනි දේ නොකළ යුතු අතර නිකරුනේ රැඳී සිටීමද නොකළ යුතුය.

13. වැසිකිළියක (මහජන වැසිකිළියක) නඩත්තු හා භාරකාරිත්වය පෞද්ගලික අංශයට පවරා ඇති අවස්ථාවකදී එකී පැවරුම්ලාභියා විසින් නිරන්තරයෙන්ම වැසිකිළිය සෝදා පවිත්‍රකර තබාගත යුතුය. වැසිකිළිය නඩත්තු කටයුතු සඳහා ගාස්තුක් අයකරන්නේ නම් අදාළ මුදල දැන්වීමක් මගින් ඇතුළ් වීමට ඇති ස්ථානයේ ප්‍රදර්ශනය කර තිබිය යුතුය.

14. වැසිකිළිය පිරිසිදුව හා සනීපාරක්ෂාව නිරන්තරයෙන්ම තබාගත යුතු අතර, දිනකට උදේ, දහවල් සහ සවස විෂබීජ නාශක යොදා පිරිසිදු කර මනා තත්ත්වයකින් යුතුව පවත්වාගෙන යා යුතුය.

15. පොදු වැසිකිළියක (මහජන වැසිකිළියක) නඩත්තුව හා භාරකාරත්වය පුද්ගලයෙකුට හෝ වෙනත් ආයතනයකට මහා නගර සභාව විසින් පවරා ඇති විටදී වැසිකිළිය භාවිතා කරන්නන්ගෙන් අය කළ යුතු මුදල් ප්‍රමාණය වරින්වර සභාව විසින් තීරණය කළ හැකිය. එම ගාස්තුව පමණක් එකී පුද්ගලයා විසින් වැසිකිළිය පාවිච්චි කරන්නාගෙන් අය කළ යුතුය.

16. පොදු වැසිකිළි (මහජන වැසිකිළි) පද්ධති හා ගොඩනැගිලි පිළිබඳ සම්පූර්ණ වගකීම් දැරීම් එහි භාරකාරත්වය හා නඩත්තුව භාරගෙන ඇති අය විසින් කළ යුතුය.

17. මහජන පැමිණිලි සඳහා පොත් 02ක් (ස්ත්‍රී හා පුරුෂ වැසිකිළිවල) ගොඩනැගිල්ලේ ප්‍රදර්ශනය ලෙස තැබිය යුතුය.

18. පොදු වැසිකිළියේ සේවයට යොදවන සේවක මණ්ඩලය මහා නගර සභාව විසින් නියම කරන නිල ඇඳුම් පැළඳ සේවය ඉටු කළ යුතුය. එක්වරකට රු. 500 0 ක් නොඉක්මවන සුලු අළුත්වැඩියාවෙන් පමණක් වැසිකිළියේ භාරකාරත්වය හා නඩත්තුව භාරගත් අය විසින් කළ යුතු අතර, ප්‍රධාන අලුත්වැඩියාවන් මහා නගර සභාව වෙත වහාම දැන්විය යුතුය.

19. පොදු වැසිකිළියේ භාරකාරත්වය හා නඩත්තුව භාරගත් අය විසින් කාර්ය මණ්ඩලයේ හෝ කළමනාකාරිත්වයේ වෙනස් වීමක් සිදුකළ වහාම ඒ බව ලිඛිතව නාගරික කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය.

20. මහජන වැසිකිළියක් නඩත්තු කරනු ලබන සේවක මණ්ඩලය විනීතව හා කාර්යක්ෂමව එම කටයුතු ඉටුකළ යුතු අර එකී සේවකයින් මහා නගර සභාව අපකීර්තියට පත්වන අයුරින් කටයුතු සිදු නොකිරීමට වගබලා ගත යුතුය.

21. මහා නගර සභාව වෙතින් ලබාගත් අවසරයකින් හා පූර්ව දැනුම් දීමකින් තොරව කිසිදු හේතුවක් මත පොදු වැසිකිළිය වසා දැමීම නොකළ යුතුය.

22. පොදු වැසිකිළිය නඩත්තුව හා භාරකාරත්වය පැවරුනු අය විසින් මහජන සෞඛ්‍යයට අහිතකර ලෙස වැසිකිළිය පවත්වාගෙන යනු ලබන බව තහවුරු වන්නාවූ සෑම දිනකටම රු. 1,000 ක අතිරේක දඩයක් සභාව වෙත ගෙවිය යුතුය.

23. රාත්‍රී 10. 00 න් පසු මහජනයා වෙනුවෙන් සේවය අවසන් කළ යුතු අතර, කිසිදු පුද්ගලයකු ගොඩනැගිල්ල තුළ රැඳී සිටීම තහනම් වන අතර, වෙනත් කිසිදු කටයුත්තක් සඳහා වැසිකිළිය යොදා නොගත යුතුය.

24. මහා නගර සභාවේ බලය ලබාදී ඇති නිලධාරීන්ට පොදු වැසිකිළියට ඇතුළ්වීමට හා පරීක්ෂා කිරීමට හිමිකම් ඇති අතර, එයට බාධා නොකළ යුතුය.

25. දිනපතා පොදු වැසිකිළි පෙ. ව. 4.00 සිට ප.ව. 10.00 දක්වා විවෘතව තැබිය යුතුය.

26. එහෙත් මහා නගර සභාව විසින් නිශ්චිතව තීරණය කරනු ලබන්නාවූ දිනවල මහජන වැසිකිළිය පැය 24 පුරාවටම විවෘතව තැබිය යුතුය.

28. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියෙකු හෝ වෙනත් යම් අයෙකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය මගින් නියම කර ඇති දණ්ඩනයන්ට

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,

ii. දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද,

iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

29. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යස්ථාවල -

"වෙනත් යම් අයෙකු " යනුවෙන් හඳුන්වනු ලබන්නේ අදාළ බලපත්‍ර ලත් ස්ථානය භාවිතා කරන තැනැත්තෙකු වේ.

## VI වැනි කොටස

### පොදු නාන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 සහ 272 වැනි වගන්තිය සමග කියවිය යුතු 28 වැනි උපවගන්තියේ (ඉ) ඡේදයට අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන පොදු නාන ස්ථාන විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි පොදු නාන ස්ථාන විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. ජලය ස්නානය කිරීමේ කාර්යය සඳහා යොදා ගන්නා වූ ද, මහජනයාට විවෘතව ඇත්තාවූද, සෑම ළිඳක්ම සෙන්ටි මීටර් හැත්තෑපහකට (75) නොඅඩු උසකින් යුතු ආරක්‍ෂක තාප්පයකින් යුක්ත විය යුතු අර, එම තාප්පය පිටත පොළාව මට්ටමින් පහතට සෙන්ටි මීටර් හැටක් (60) ගැඹුරට සිමෙන්ති යොදා තිබිය යුතුය.

3. ඒ සෑම ළිඳක් වටා ආසන්නව ඇති භූමියට පතිත වන ජලය පොළවට උරා නොගෙන නිසි පිට වානකට ගලායන පරිදි ඉදිකර ඇති කාණුවකට බැස යා හැකිවන සේ බෑවුමක් සහිතව ගල් අල්ලා හෝ සිමෙන්ති කොන්ක්‍රීට් තිබිය යුතුය.

4. ස්ත්‍රී පුරුෂ දෙපක්‍ෂයෙන් එක් පක්‍ෂයකට ප්‍රයෝජනය සඳහා සභාව විසින් නාන ස්ථානයක් වෙන්කොට ඇති එවැනි යම් පොදු ළිඳක් හෝ වෙනත් ස්ථානයක් අනෙක් පක්‍ෂයට අයත් කිසිම තැනැත්තෙකු විසින් නෑම, සේදීම හෝ එහි ජලය වෙනත් යම් ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතුය.

5. ඉහත කී පරිදි වූ යම් පොදු ළිඳක නෑම සඳහා ප්‍රයෝජනයට ගන්නා බාල්දිවල සෑම හය (6) මාසයකට වරක්වත් තීන්ත ආලේප කළ යුතු අතර ඒවා දිනපතා පිරිසිදු කළ යුතුය.

6. බෝවන හෝ වෙනත් ආසාදක හෝ ස්පර්ශව රෝගයකින් පෙළෙන හෝ එවැනි රෝගයකින් මෑතදී සුවය ලැබූ කිසියම් තැනැත්තෙකු විසින් යම් පොදු ළිඳකින් හෝ නාන ස්ථානයක් වශයෙන් සභාව විසින් වෙන් කර ඇති යම් ස්ථානයක නෑම, සේදීම හෝ ජලය වෙනත් යම් ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතුය.

7. නාන ස්ථානයක් වශයෙන් වෙන් කර ඇති යම් ස්ථානයක හෝ ඒ ස්ථානයට ආසන්නයේ කිසිම තැනැත්තෙකු විසින් ගවයකු, මී ගවයකු, එළුවෙකු, සුනඛයෙකු හෝ වෙනත් යම් සතෙකු හෝ රෙදි, පැදුරු හෝ වාහන සේදීම හෝ වෙනත් දේ සේදීම හෝ සේදීමට සැලැස්වීම හෝ කවර වූ හෝ කාර්යයක් සඳහා එවැනි යම් ස්ථානයකට ඒ කිසිම සතෙකු දක්කාගෙන යාම හෝ ගෙන ඒම නීත්‍යානුකූල නොවන්නේය. එවැනි යම් පොදු ළිඳක ඒ ආසන්නයේ හෝ නාන ස්ථානයක් වශයෙන් සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක හෝ ශරීර කෘත්‍ය කිරීමෙන් කිසිම තැනැත්තකු විසින් පීඩාවක් සිදු නොකළ යුතුය.

8. යම් පොදු නාන ස්ථානයක් සභාවේ නිසි අවසරය නොමැතිව වසා දැමීම සිදු නොකළ යුතුය.

9. එවැනි යම් පොදු ළිඳක අයිතිකරු හෝ බදුකරු ද මෙම අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ක්‍රියා කළ යුතු අතර ඒවා කිසිම ආකාරයකින් උල්ලංඝනය කිරීමට ඉඩ නොතැබිය යුතුය.

10. පොදු ළිඳක ජලය කුමන හේතුක් මත හෝ කිසිම පුද්ගලයකු විසින් අපිරිසිදු නොකළ යුතුය.

11. මේ අතුරු ව්‍යවස්ථාවේ ඕනෑම වගන්තියක් උල්ලංඝනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වන අතර ඒ පුද්ගලයා හෝ පුද්ගලයින්ට විරුද්ධව බදුල්ල මහා නගර සභා සීමාව තුළ නිසි අධිකරණ බලය ඇති නිසි අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කරනු ලැබූ විට,

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,

ii. දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද,

iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු. 250) නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

## VII වැනි කොටස

### මාර්ග දෙපස කඩ පිල් හා මාර්ග මංතීරු පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

252 වැනි අධිකාරියේ මහා නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තිය අනුව පැවරී ඇති, බලතල ප්‍රකාරව 272 වැනි වගන්තියේ 6 වන උප වගන්තියේ (ආ) ඡේදය යටතේ වීථිවල පාරවල් වල සහ බාධක සහ ප්‍රසර්පණය වැලැක්වීම හා නතර කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා මෙයින් පනවනු ලැබේ.

1. මෙම අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාවේ මාර්ගය දෙපස කඩ පිල් හා මාර්ග මංතීරු පාලනය කිරීමේ අතුරු ව්‍යවස්ථාව ලෙස සලකනු ලැබේ.

2. වීථිවල මාර්ග දෙපස, කඩපිල් වල සහ මාර්ග මංතීරු මත වෙළඳ සැල් හිමියන් වෙළඳ ද්‍රව්‍ය අසුරා තැබීම, මඩු, කොටු සහ තට්ටු යොදාගෙන වෙළඳාම් කිරීම නොකළ යුතුය.

3. කඩපිල් වල මාර්ග මංතීරු මත තාවකාලිකව වෙළඳාමට අවසර දීමට, වෙළඳාමට ඉඩ හැරීම, වෙළඳසැල් සේවකයන් යොදවා වෙළඳාම් කිරීම සහ වීථිවල හා මාර්ග දෙපස වෙළඳාම් කිරීම නොකළ යුතුය.

4. කඩපිල් වල සහ මාර්ග මංතීරු මත පාපැදි යොදවා ගෙන හා ලොතරැයි රුඳවුම් භාවිතා කරමින් ලොතරැයි අලෙවි කිරීම හා ග්‍රැම්පෝන්, ශබ්ද විකාශන, ශබ්ද වර්ධන යන ස්වයංක්‍රියව හෝ යාන්ත්‍රිකව ශබ්ද ප්‍රතිජනනය කරන වෙනත් උපකරණ යොදාගෙන කිසියම් වූ වෙළඳාමක් කිරීම නොකළ යුතුය.

5. වීථිවල හා මාර්ග දෙපස කඩපිල් වලට හා මාර්ග මංතීරු මතට තිරස්ව සිටින සේ වෙළඳ භාණ්ඩ මාර්ග මංතීරුවේ හා කඩපිලේ සිට අඩි 07කට අඩු උසකින් එල්ලා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

6. වීථිවල හා මාර්ග දෙපස කඩපිල්වල මාර්ග මංතීරුවට මහජනයාට පිවිසීමට නොහැකි වන පරිදි හා කඩපිල් තුළ මාර්ග මංතීරු මත මහජනයාට ගමන් කිරීමට අපහසු වන පරිදි මෝටර් රථ, ත්‍රී රෝද රථ , යතුරු පැදි නවතා තැබීම නොකළ යුතුය.

7. වීථිවල හා මාර්ග දෙපස කඩපිල් වල හා මාර්ග මංතීරු මත රැඳී සිටීමෙන් පුවත්පත් කියවීමෙන් වැළකිය යුතු අතර. පුද්ගලයින් දෙදෙනෙකු හා ඊට වැඩි පිරිසක් රැඳී සිටීම නොකළ යුතුය.

8. වීථිවල හා මාර්ග දෙපස කඩපිල් ඉදිරියෙන් හා මාර්ග මංතීරුවේ සතුන් හා සුනඛයින් රැගෙන යාම නොකළ යුතුය.

9. වීථිවල හා මාර්ග දෙපස කඩපිල් වල හා මාර්ග මංතීරුවේ ඉදිරි පෙනුමට බාධාවන අයුරින් වෙළඳ ප්‍රචාරණ දැන්වීම් සිටුවා තැබීම නොකළ යුතුය.

10. වීථිවල හා මාර්ග දෙපස කඩපිල්වල මාර්ග මංතීරුවේ හරස් අතුරු මාර්ග ස්ථානයන්හි කරත්ත උපයෝගී කරගනිමින් යමක් වෙළඳාම් කිරීම නොකළ යුතුය.

11. වීථිවල හා මාර්ග දෙපස කඩපිල්වල හා මාර්ග මංතීරුවේ ගමන් කරන්නන්ට බාධා පමුණුවන අයුරින් බීමතින් ගමන් කිරීම නොකළ යුතුය.

12. වීථිවල හා මාර්ග දෙපස හා මාර්ග මංතීරුව අවහිර වන පරිදි විසිතුරු සතුන් වෙළඳාම් කිරීම නොකළ යුතුය.

13. වීථිවල හා මාර්ග දෙපස හා මාර්ග මංතීරු අවහිර වන පරිදි විසිතුරු පැල වර්ග, මල්පැල වෙනත් වෙළඳාම් නොකළ යුතුය.

14. වීථිවල හා මාර්ග දෙපස මාර්ග මංතීරු අවහිර වන ආකාරයෙන් පාවහන් මැසීම, රෙදිපිළි වෙළඳාම හෝ වෙනත් කිසිම වෙළඳාමක් නොකළ යුතුය.

15. මාර්ගයේ ගමන් කරන අයට හිරිහැර වෙන ආකාරයෙන් අත්වැල් අල්ලාගෙන ගමන් කිරීම නොකළ යුතුය.

16. කඩපිල් දෙපස හා මාර්ග මංතීරුවලට ගොඩනැගිලි ද්‍රව්‍ය ගොඩගැසීම, කසළ දැමීම, ජලය හෝ අපද්‍රව්‍ය දැමීම නොකළ යුතුය.

17. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියෙකු සහ වෙනත් කිසියම් අයකු විසින් යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහා නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ 03 වැනි උපවගන්තිය මගින් නියම කර ඇති දණ්ඩනයෙන්

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට යටත් වන්නේය.
ii. දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට යටත් වන්නේය.
iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

i. මෙම අර්ථ නිරූපණයේ වීථිවල, මාර්ග දෙපස කලපිල්වල හා මාර්ග මංතීරු යන්න මඟී ජනතාට පයින් ගමන් කිරීම සඳහා වෙන් කර ඇති මං තීරුව හෝ පදිකවේදිකාව අදහස්වේ.
ii. වීථි පාරවල් හෝ මංමාවත් යන්නට මහා නගර සභා ප්‍රදේශය තුළ පිහිටි ඕනෑම පාරක්, වීතියක්, මංමාවතක්, පඩිපෙළක්, පාලමක්, පටු මගක්, අඩි පාරක් හෝ යම් ස්ථානයකට යාමට තනා ඇති පිවිසුම් මගක් ද , අදහස්වේ.

VIII වැනි කොටස

**පදික මාරු ස්ථාන (වීථිවල රථවාහන ගමනාගමනය විධිමත් කිරීම)**

252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 හා 267 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 06(ඇ) වගන්තිය අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පදික මාරු ස්ථාන විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු පැනවීම හා අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ මාර්ගයන්හි වීථිවල රථවාහන ගමනාගමනය විධිමත් කිරීම පදික මාරු ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ මහා මාර්ග සහ මංමාවත්වල ගමන් කරන පදිකයන්ට පාර මාරු වීම සඳහා පදික මාරු ස්ථාන හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීම හා සලකුණු කිරීම බදුල්ල මහා නගර සභාව විසින් කරනු ලැබිය හැකිය.

3. 2 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද පදික මාරු ස්ථානවල කළ යුතු සලකුණු කිරීම් මෝටර් වාහන පනතේ 164 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987 මාර්තු මස 13 වැනි දිනැති අංක 444/18 දරන 1 වැනි කොටස (1) වැනි ඡේදය *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති නියෝගවල 16 වන නියෝගය සමග කියවිය යුතු 4.18 වැනි රූපයේ ආදර්ශයට අනුව විය යුතුවාක් හැර එකී නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට යටත් විය යුතු ය. එසේම එකී සළකුණු මැකී යාමට නොදී නැවත පින්තාරු කිරීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

4. කවර තැනැත්තෙකු විසින් හෝ 2 වැනි අතුරු වගන්තියේ සඳහන් කිසියම් පදික මාරු සලකුණක් විකෘති කිරීම හෝ මකා දැමීම හෝ නොකළ යුතු ය. එසේ වුව ද බදුල්ල මහා නගර සභාව විසින් කලින් කල කරනු ලබන තීරණයක් අනුව කිසියම් පදික මාරු ස්ථානයක් වෙනස් කිරීම හෝ ඉවත් කිරීමට බදුල්ල මහා නගර සභාවට බලය තිබිය යුතු ය.

5. කිසියම් පදිකයෙකු යම් පදික මාරු ස්ථානයක් මතින් පාර මාරුවීමට ඒ මතට පිවිසී ඇති අවස්ථාවක එකී පදික මාරු ස්ථානය පසු කර යාමට පැමිණෙන සෑම වාහනයකම රියදුරා විසින් එකී පදිකයා පාර මාරුවී අනෙක් පසට පිවිසෙන තෙක් තමා පදවාගෙන යන වාහනය, නතර කර තබා ගැනීම කළ යුතු ය.

6. කිසියම් වාහනයක් පදික මාරු ස්ථානයේ වාහන නතර කර තැබීමට සලකුණු කර ඇති සීමාව පසු කිරීමට ආසන්න අවස්ථාවක, පදික මාරු ස්ථානයක් මතින් පාර මාරු වීමට අදහස් කරන කවර හෝ පදිකයෙකු එකී පදික මාරු ස්ථානය මතට පිවිසීම නොකළ යුතු ය.

7. කවර හෝ පදිකයෙකු කිසියම් පදික මාරු ස්ථානයක් මත නතර වී සිටීම හෝ ඒ හරහා ගමන් ගන්නා වාහනයක ගමනා ගමනයට බාධාවන පරිදි රැඳී සිටීම නොකළ යුතු අතර, එකී පදික මාරු ස්ථානය මතින් ගමන් ගන්නා වෙනත් යම් පදිකයෙකුගේ ගමනට අනිසි ආකාරයෙන් බාධා කිරීම ද නොකළ යුතු ය.

8. පොලිස් නිලධාරියෙකු හෝ රිය නියාමකවරයෙකු හෝ ආලෝක සංඥා මගින් හෝ තත් කාලයෙහි පාලනය කරනු ලබන යම් පදික මාරු ස්ථානයක් හරහා ගමන් කිරීමට පැමිණෙන කවර හෝ වාහනයක් එකී පොලිස් නිලධාරියා හෝ රිය නියාමකවරයා හෝ ආලෝක සංඥාව මගින් දෙනු ලබන සංඥාව අනුව එකී වාහනය පදවන රියදුරා ක්‍රියා කළ යුතු ය.

9. කවර හෝ වාහනයක රියදුරෙකු විසින් තමා විසින් පදවාගෙන එනු ලබන වාහනය -

(අ) තමන්ගේ පාලනයෙන් පරිබාහිර වූ හේතු නිසා ඉදිරියට යාමෙන් තමා වළක්වනු ලැබ ඇත්නම්, හෝ

(ආ) අනතුරක් වැළැක්වීම පිණිස එකී වාහනය පදික මාරු ස්ථානයක් මත නතර කිරීමට අවශ්‍ය වන්නේ නම් මිස, එකී වාහනය කිසියම් පදික මාරු ස්ථානයක් මත හෝ එකී පදික මාරු ස්ථානයේ යම් කොටසක් මත කවර හෝ හේතුවක් නිසා නතර කර තැබීම නොකළ යුතු ය.

10. බදුල්ල මහා නගර සභා ප්‍රදේශයේ කිසියම් පාසලක් ඉදිරිපිට ඇති මාර්ගයේ සලකුණු කර ඇති පදික මාරු ස්ථානවල කාර්යයේ නියුතු රිය නියාමකවරුන් දිරි ගැන්වීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට බදුල්ල මහා නගර සභාවට හැකි විය යුතුය.

11. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියෙකු සහ වෙනත් කිසියම් අයෙකු විසින් යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහා නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය මගින් නියම කර ඇති දණ්ඩනයෙන්,

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට යටත් වන්නේය.
ii. දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට යටත් වන්නේය.
iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"රිය නියාමක" යන්නෙන්, පදික මාරු ස්ථානවල පදිකයන් සහ වාහන හැසිරවීමේ කාර්යය සඳහා මහා නගර සභාවේ නියෝජිතයන් හෝ කිසියම් පාසලක ප්‍රධානියා හෝ ඔහුගෙන් බලය ලත් යම් තැනැත්තෙකු විසින් නම් කරනු ලැබූ හා එම කාර්යයේ නියුක්ත පාසල් සිසුවෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු අදහස් වේ.

"වාහනය" යන්නෙන් මෝටර් රථ වාහන පනතේ සඳහන් කවර හෝ මෝටර් වාහනයක් අදහස් වන අතර කිසියම් කරත්තයක්, අත් කරත්තයක්, පාපැදියක් සහ මෝටරයක් මගින් ක්‍රියා කරවන බයිසිකලයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

"වෙනත් යම් අයෙකු " යනුවෙන් හඳුන්වනු ලබන අදාළබලපත්‍ර ලත් ස්ථානය භාවිතා කරන තැනැත්තෙකු වේ.

IX වැනි කොටස

**බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශයේ නිශ්චල දේපලවල හිමිකරුවන් ලියාපදිංචි කිරීම සහ වාර වාර්තා ලබාගැනීම**

252 වන අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන හා 267 වන වගන්තිය සමග කියවිය යුතු 07 වැනි උපවගන්තියේ (ඇ) ඡේදයට අනුව මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභාවේ පවත්වාගෙන යනු ලබන නිශ්චල දේපළවල හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් ලියාදිංචි කර ගැනීම සහ වරිපනම් හා බදු පැනවීමේ සහ බලපත්‍ර ගාස්තු අයකිරීමේ කාර්යය සඳහා වාර වාර්තා ලබාගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ නිශ්චල දේපළවල හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් ලියාපදිංචි කර ගැනීම සහ යම් බද්දක් සම්බන්ධයෙන් හෝ යම් බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය සඳහා වාර වාර්තා සහ තොරතුරු ලබාගැනීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථායි.

2. (අ) මහා නගර සභා ප්‍රදේශය තුළ පිහිටි කිසියම් නිශ්චල දේපළක් අත්පත් කර ගනු ලබන සෑම තැනැත්තකු ම විසින්, එකී නිශ්චල දේපළ අත්පත් කර ගනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත එකී නිශ්චල දේපළ පිළිබඳ තොරතුරු බදුල්ල මහා නගර සභාවේ ලියාදිංචි කරවා ගැනීම සඳහා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල පළමුවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ අයදුම්පත්‍රයක් නාගරික කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් ආකාරයෙන් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන කවර හෝ තැනැත්තකු විසින් එකී අයදුම්පත්‍රය සමග, නොතාරිස්වරයකු විසින් සහතික කරනු ලැබූ පහත සඳහන් ලේඛනවල ඡායාසහතික පිටපත් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

i. එකී දේපළෙහි හිමිකම් ඔප්පුව ;
ii. බලයලත් මිනින්දෝරුවකු විසින් අඳිනු ලැබූ එකී දේපළෙහි පිඹුරු පත;
iii. එකී නිශ්චල දේපළ මත කවර හෝ ගොඩනැගිල්ලක් හෝ සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් ඉදිකර තිබෙන විට, ගෘහ නිර්මාණ ශිල්පියෙකු විසින් අඳිනු ලැබූ එකී ගොඩනැගිල්ලේ හෝ සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ සැලැස්ම,
iv. එකී නිශ්චල දේපල ගොඩනැගිල්ලක් හෝ සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් වන විට ගෘහ නිර්මාණ ශිල්පියකු විසින් අඳිනු ලැබූ එකී ගොඩනැගිල්ලේ හෝ සහාධිපත්‍ය ගොඩනැගිල්ලේ සැලැස්ම.

3. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වන දිනය වන විටත් මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි කිසියම් නිශ්චල දේපළක් අත්පත් කර ගනු ලැබ ඇති සෑම තැනැත්තෙකු ම විසින්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වන දින සිට මාස හයක් ගත වීමට මත්තෙන් 2 වන වගන්තියෙහි නියමකර ඇති ආකාරයෙන් ක්‍රියාකරනු ලැබිය යුතු ය.

4.(අ) මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ කිසියම් නිශ්චල දේපළක් බදුල්ල මහ නගර සභාවේ ලියාපදිංචි කරවා ගනු ලැබීම සඳහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන සෑම නිශ්චල දේපළ හිමියෙකු විසින්ම බදුල්ල මහ නගර සභාව විසින් නියම කරනු ලබන ප්‍රමාණයේ ගාස්තුවක් මහ නගර සභාවට ගෙවනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ කිසියම් නිශ්චල දේපළක් මහ නගර සභාවේ ලියාපදිංචි කරවා ගැනීම සඳහා එකී නිශ්චල දේපළ හිමියා විසින් මහ නගර සභාවට ගෙවනු ලැබිය යුතු ගාස්තුව මහ නගර සභාව විසින් තීරණය කර රජයේ ගැසට් පත්‍රය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කර ඇති පරිදි විය යුතු අතර එකී ගාස්තුව වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මහ නගර සභාව විසින් කලින් කල කරනු ලැබිය හැකිය.

(ඇ) (ආ) ඡේදය යටතේ මහ නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන හෝ වෙනස් කරනු ලබන හෝ සංශෝධනය කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලැබූ දිනයේ සිට හෝ එකී නිවේදනයේ සඳහන් කරනු ලබන යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

5.(අ) මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමකර ඇති ආකාරයට මහ නගර සභාවේ ලියාපදිංචිය ලබා ඇති යම් නිශ්චල දේපළ හිමියකු විසින් තමා සතුව පවතින කවර හෝ නිශ්චල දේපළක අයිතිය -

(i) වෙනත් යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කිහිප දෙනෙකුට පවරා දී ඇත්නම් හෝ එකී දේපළ වෙනත් යම් තැනැත්තකුට උකසට තබා ඇත්නම්, හෝ බද්දට හෝ කුලියට දී ඇත්නම්,
(ii) ඇටෝර්නි බල පැවරුමක් මගින් වෙනත් යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කිහිප දෙනෙකුට පවරනු ලැබ ඇත්නම්,

එකී යම් සිද්ධිය සිදුවී මාසයක් ගත වීමට මත්තෙන් ඒ බව නාගරික කොමසාරිස්වරයාට ලිඛිත නිවේදනයක් මගින් දන්වනු ලැබීම එකී නිශ්චල දේපළ හිමියාගේ කාර්යය විය යුතු ය.

(ආ) මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියම කර ඇති ආකාරයට බදුල්ල මහා නගර සභාවේ ලියාදිංචිය ලබා ඇති යම් නිශ්චල දේපළ හිමියකු විසින් තමා සතුව පවතින කවර හෝ නිශ්චල දේපළක් වන ගොඩනැගිල්ලක් යොදවනු ලැබ ඇති කාර්යය වෙනස් කරනු ලැබ ඇත්නම් එකී වෙනස් කිරීම සිදුකර මාසයක් ගතවීමට මත්තෙන් ඒ බව නාගරික කොමසාරිස්වරයාට ලිඛිත නිවේදනයක් මගින් දන්වනු ලැබීම එකී නිශ්චල දේපළ හිමියාගේ කාර්යය විය යුතු ය.

(ඇ) මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියම කර ඇති ආකාරයට බදුල්ල මහ නගර සභාවේ ලියාපදිංචිය ලබා ඇති යම් නිශ්චල දේපළ හිමියකු විසින් තමා සතුව පවතින කවර හෝ -

(i) නිශ්චල දේපළක් අනු බෙදුමකට ලක් කිරීමට පෙර,
(ii) නිශ්චල දේපළක් වන කිසියම් ඉඩමක් මත අලුතෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පෙර,
(iii) නිශ්චල දේපළක් වන කිසියම් ගොඩනැගිල්ලක ආකෘතියේ වෙනසක් වන ආකාරයෙන් -

1. අලුතෙන් කොටසක් එකතු කරනු ලබන්නේ නම්, හෝ
2. පවතින කොටසක් කඩා ඉවත් කරනු ලබන්නේ නම්, හෝ
3. පවතින කොටසක් කඩා ඉවත්කර අලුතින් කොටසක් එකතු කරනු ලබන්නේ නම්, හෝ
4. සම්පූර්ණ ගොඩනැගිල්ලම කඩා ඉවත් කර වෙනත් ගොඩනැගිල්ලක් ඉදි කරනු ලබනනේ නම්, හෝ එකී කවර හෝ සිදුවීමක් සිදු කිරීමට පෙර, ඒ සඳහා වන අනුමැතියක් බදුල්ල මහ නගර සභාවෙන් ලබාගත යුතු ය.

(ඈ) මහ නගර සභාවේ ලියාපදිංචිය ලබා ඇති යම් නිශ්චල දේපළ හිමියකුගේ ලිපිනය වෙනස් වී ඇති විටක, එකී වෙනස් වීම සිදුවී දින හතක් ඇතුළත ඒ පිළිබඳව වන ලිඛිත දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා වෙත භාර දීම එකී නිශ්චල දේපළ හිමියාගේ කාර්යය විය යුතුවාක් හැර ඒ ලිඛිත දැන්වීම ලැබුණු වහාම නිශ්චල දේපළ හිමියන් ලියාපදිංචි කිරීමේ ලේඛනය, ඒ අනුව සංශෝධනය කිරීම සහ එසේ සංශෝධනය කරනු ලැබ ඇති බව එකී නිශ්චල දේපල හිමියාට ලිඛිතව දැනුම් දීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

6. 2 වන වගන්තියේ හෝ 3 වන වගන්තියේ නියමයන් යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයක්ම සම්බන්ධයෙන් වන නිශ්චල දේපළ හිමියන් හා ඔවුන් විසින් සතුව පවතින නිශ්චල දේපළ ලියාපදිංචි කිරීමේ ලේඛනයක්, මේ කොටසේ දෙවන උපලේඛනයේ ආකෘතියට සාරානුකූලව පිළියෙල කර පවත්වාගෙන යාම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

7. (අ) මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන නිශ්චල දේපළ හිමියන් සහ ඔවුන් සතුව පවතින නිශ්චල දේපළ ලියාපදිංචි කිරීමේ ලේඛනය පරීක්ෂා කර බැලීමට අවශ්‍ය යම් තැනැත්තකුට, සතියේ වැඩ කරන ඕනෑම දිනයක කාර්යාල වේලාවන් ඇතුළත එකී ලේඛනය පරීක්ෂා කර බැලීමට ඉඩ දීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(ආ) එසේ වුව ද, (අ) ඡේදයේ නියමයට අනුව නිශ්චල දේපළ හිමියන් සහ ඔවුන් සතුව පවතින නිශ්චල දේපළ ලියාපදිංචි කිරීමේ ලේඛනය පරීක්ෂා කර බැලීමට අවශ්‍ය කරන සෑම තැනැත්තකු ම විසින් මහ නගර සභාව විසින් නියම කරනු ලබන ගාස්තුවක් කලින් ගෙවා නාගරික කොමසාරිස්වරයාගෙන් ඒ සඳහා අවසරය ලබාගනු ලැබිය යුතුය. එසේ වුව ද කිසියම් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාතේ පළාත් සභාවේ යම් දෙපාර්තමේන්තුවක ප්‍රධානියකු හෝ එවැනි තැනැත්තකු විසින් ලිඛිතව බලය පවරනු ලැබ ඇති යම් නිලධාරියකු විසින් රාජකාරි කටයුත්තක් සඳහා එකී ලේඛනය පරීක්ෂා කරනු ලැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීමක් නොකළ යුතු ය.

(ඇ) නිශ්චල දේපළ හිමියන් සහ ඔවුන් සතුව පවතින නිශ්චල දේපළ ලියාපදිංචි කිරීමේ ලේඛනය පරීක්ෂා කර බැලීම සඳහා අයකරනු ලබන ගාස්තුව මහ නගර සභාව විසින් තීරණය කළ හැකි අතර, එකී ගාස්තුව වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මහ නගර සභාව විසින් කලින් කල කරනු ලැබිය හැකිය.

(ඈ) (ඇ) ඡේදය යටතේ බදුල්ල මහ නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන හෝ වෙනස් කරනු ලබන හෝ සංශෝධනය කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පිළිබඳ දැන්වීමක් වාර්ෂිකව ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලැබූ දිනයේ සිට හෝ එකී නිවේදනයේ සඳහන් කරනු ලබන යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

8. (අ) මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කවර හෝ ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් හෝ විකිණීමක් හෝ මත 252 වන අධිකාරය වූ මහ නගර සභා ආඥාපනත යටතේ මහ නගර සභාව විසින් පනවනු ලබන යම් බද්දක් හෝ මහ නගර සභාව විසින් නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත අයකරනු ලබන ගාස්තුවක් හෝ අයකර ගැනීමේ දී, මහ නගර සභාවට ගෙවිය යුතු එකී බද්ද හෝ බලපත්‍ර ගාස්තුව ගණන් බැලීම සඳහා අවශ්‍ය කරන්නා වූ එකී ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ හෝ විකිණීමේ කටයුතු කරගෙන යාමේ දී. -

(i) කිසියම් වර්ෂයක කාලයක් තුළ ලද ලැබීම් ප්‍රමාණය, හෝ
(ii) කිසියම් වර්ෂයක කාලයක් තුළ ව්‍යාපාර පිරිවැටුම, හෝ
(iii) කිසියම් වර්ෂයක කාලයක් තුළ උපයනු ලැබිය හැකි ලාභය, හෝ
(iv) කිසියම් විකිණීමක් මගින් ලැබුණු මුදල, හෝ

සහතික කළ වාර්තාවක් මගින් තහවුරු කරන ලෙස එකී කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ හිමිකරුගෙන් හෝ කළමනාකරුගෙන් නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඉල්ලා සිටිනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

(ආ) නාගරික කොමසාරිස්වරයා විසින් එවනු ලබන (අ) ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු විසින් එකී දැන්වීම තමාට ලැබුනු දින සිට දින සහ හතරක් ඇතුළත එකී දැන්වීම මගින් ඉල්ලා ඇති තොරතුරු නාගරික කොමසාරිස්වරයා වෙත සැපයීම කළ යුතු ය.

9. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහා නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 ක් නොඉක්මවන දඩයකට ද,
(ii) දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 ක් නොඉක්මවන දඩයකට ද,
(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු. 250) නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල —

(i) ‘නිශ්චල දේපළ’ යන්නෙන් කිසියම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හෝ කිසියම් සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් ද,
(ii) ‘දේපළ හිමකරු’ යන්නෙන්, කිසියම් නිශ්චල දේපළක තනි අයිතිකරු වන යම් තැනැත්තෙක් හෝ එකී නිශ්චල දේපළ තනි අයිතිකරුවෙකුට වැඩි ගණනක අයිතිකරුවන් සිටින විට ඒ එක් එක් අයිතිකරු වෙන් වෙන්ව හා සාමූහිකව එකී දේපළෙහි හිමිකරු වශයෙන් අදහස් විය යුතු අතර, තත් කාලයේ දී එකී දේපළෙහි පදිංචිව සිටින හෝ එකී දේපළෙහි භාරකාරත්වය දරන හෝ එකී දේපළ තුළ ව්‍යාපාරයක්, කර්මාන්තයක් හෝ වෙළෙඳාමක් කරගෙන යනු ලබන යම් තැනැත්තෙකු ද ඊට ඇතුළත් විය යුතු ය.

**පළමුවැනි උපලේඛනය**

2 වන වගන්තියේ (2) ඡේදය

***බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ පවතින නිශ්චල දේපළ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.***
***(එක් එක් දේපළ වෙනුවෙන් වෙන වෙනම ආකෘති පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ යුතුය.)***

1. (අ) දේපළ හිමිකරුගේ/ හිමිකරුවන්ගේ නම/නම් 1. ——— 2. ——— 3. ———

(ආ) දේපළ හිමිකරුගේ/ හිමිකරුවන්ගේ ලිපින(යන්) 1. ——— 2. ——— 3. ———

(ඇ) දේපළ පිහිටි වීථියේ හෝ ගමේ නම : ———

(ඈ) වරිපනම් අංකය : ———

(ඉ) දේපළ පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය හා නම : ———

(ඊ) භූමි ප්‍රමාණය : අක්කර .................. රූඩ්.................. පර්චස් ................(හෙක්ටයාර්:...........................)

උ) ඔප්පුවේ අංකය : ———

(ඌ) නොතාරිස්තැනගේ නම සහ ලිපිනය : ———

2. (අ) දේපළ ඉඩමක් වන විට එකී දේපළ මත කවර හෝ ගොඩනැගිල්ලක් ඉදිකර තිබේද ? ඔව්/නැත
(ආ) පිළිතුර ඔව් නම් එකී ගොඩනැගිල්ල, තනි ගොඩනැගිල්ලක් ද නැතහොත් සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් ද යන වග ? : ———

3. දේපළ අත්පත් කර ගනු ලැබූ දිනය : ———

4. දේපළ පාවිච්චි කරන කාරණය : නේවාසික/වෙළෙඳ හෝ වාණිජ කාර්යය : ———

5. කරගෙන යනු ලබන ව්‍යාපාරය/වෙළෙඳාම හෝ කර්මාන්තය : ———

6. ව්‍යාපාරය/වෙළෙඳාම හෝ කර්මාන්තය කරගෙන යනු ලබන හෝ පදිංචිව සිටින ගෘහමූලිකයන්ගේ නම ලිපිනය හා දුරකථන අංක: ———

———
දේපළ හිමියාගේ අත්සන

දිනය :———

**දෙවැනි උපලේඛනය**

6 වන වගන්තිය

බදුල්ල මහා නගර සභාව

***නිශ්චල දේපළවල හිමිකරුවන්ගේ නම් හා ලිපිනයන් ලියාපදිංචි කිරීමේ ලේඛනය***

| *ලියාපදිංචි කළ* | | *දේපළ හිමියාගේ* | | *උකස්කරුගේ/බදුකරුවන්ගේ* | | *දේපළ පිහිටි වීථිය/ගම* | *වරිපනම් අංකය* | *ග්‍රා. සේ. නි. වසමේ අංකය* |
|---|---|---|---|---|---|---|---|---|
| *වර්ෂය* | *අංකය* | *නම* | *ලිපිනය* | *නම/නම්* | *ලිපිනය* | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

සැ. යු. : මෙහි ඉහළ කොටස ලේඛනයේ වම් පසට ද පහළ කොටස දකුණු පසටද වනසේ ලේඛනය පිළියෙල කරගන්න.

| *ඉඩමේ ප්‍රමාණය (හෙක්.)* | *ඔප්පුවේ අංකය* | *නොතාරිස්තුමාගේ නම හා ලිපිනය* | *උකස ආරම්භවන දිනය* | *උකස අවසන් වන දිනය* | *උකස් ඔප්පුවේ අංකය* | *නොතාරිස්තුමාගේ නම හා ලිපිනය* | *වි. භා. නි. අත්සන* | *ලේකම්ගේ අත්සන* |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

X වන කොටස

**උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

252 වන අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන සහ 267 වන වගන්ති සමග කියවිය යුතු 07 වැනි උපවගන්තියේ (ඇ) ඡේදයට අනුව මහ නගර සභා බලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභාවේ පවත්වාගෙන යන උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. මේ අතුරු ව්‍යවස්ථා බදුල්ල මහ නගර සභා ප්‍රදේශයේ නිශ්චල දේපල පිළිබඳ උකස් සහ උකස් හිමියන්ගේ ලිපිනයන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ පවත්නා කිසියම් නිශ්චල දේපළක් උකසට තබා ගන්නා කවර හෝ උකස් හිමියකු ම විසින් එකී උකස ක්‍රියාත්මක වන දින සිට දින හතක් ගතවීමට මත්තෙන් මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ අයදුම්පත්‍රයක් නාගරික කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර බදුල්ල මහ නගර සභාවේ ලියාපදිංචි කරවා ගනු ලැබිය යුතු ය.

3. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වන දිනය වන විටත් බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ පවත්නා කිසියම් දේපළක් උකසට තබාගෙන ඇති සෑම උකස් හිමියකු ම විසින්, මේ කොටසේ අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක වන දින සිට මාසයක් ගත වීමට මත්තෙන් 2 වන අතුරු ව්‍යවස්ථාවේ නියමකර ඇති ආකාරයට ලියාපදිංචි කරවා ගනු ලැබිය යුතු ය.

4. *(අ)* මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ කිසියම් උකසක් බදුල්ල මහ නගර සභාවේ ලියාපදිංචි කරවා ගනු ලැබීම සඳහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන සෑම උකස් හිමියකු විසින් ම බදුල්ල මහ නගර සභාව විසින් නියම කරනු ලබන ප්‍රමාණයේ ගාස්තුවක් බදුල්ල මහ නගර සභාවට ගෙවනු ලැබිය යුතු ය.

*(ආ)* (අ) ඡේදය යටතේ කිසියම් උකසක් බදුල්ල මහ නගර සභාවේ ලියාපදිංචි කරවා ගැනීම සඳහා උකස් හිමියා විසින් බදුල්ල මහ නගර සභාවට ගෙවනු ලැබිය යුතු ගාස්තුව බදුල්ල මහ නගර සභාව විසින් තීරණය කළ හැකි අතර එකී ගාස්තුව වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම බදුල්ල මහ නගර සභාව විසින් කලින් කල කරනු ලැබිය හැකි ය.

*(ඇ)* (ආ) ඡේදය යටතේ බදුල්ල මහ නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන හෝ වෙනස් කරනු ලබන හෝ සංශෝධනය කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලැබූ දිනයේ සිට හෝ එකී නිවේදනයේ සඳහන් කරනු ලබන යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

5. (අ) 2 වන අතුරු ව්‍යවස්ථාවේ හා 3 වන අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයට බදුල්ල මහ නගර සභාවේ ලියාපදිංචිය ලබා ඇති යම් උකස් හිමියකු විසින් උකසට තබාගෙන ඇති කිසියම් දේපළක් -

(i) එකී උකස් හිමියා විසින් දේපළෙහි උකස්කරු වෙත නිදහස් කර දී ඇත්නම්,
(ii) එකී උකස් හිමියා විසින් සින්නක්කර අයිතියට පවරාගනු ලැබ ඇත්නම්,
(iii) එකී උකස් හිමියා සහ වෙනත් කවර හෝ තැනැත්තකු සමග හෝ තැනැත්තන් කිහිප දෙනෙකු සමග හවුල් අයිතියට පවරාගනු ලැබ ඇත්නම්,
(iv) එකී උකස් හිමියා විසින් වෙනත් යම් ආකාරයකින් එකී දේපළෙහි අයිතිය බැහැර කරනු ලැබ ඇත්නම්,

ඒ සිද්ධිය සිදුවී මාසයක් ගතවීමට මත්තෙන්, ඒ බව නාගරික කොමසාරිස්වරයාට ලිඛිත නිවේදනයක් මගින් දන්වනු ලැබීම එකී උකස් හිමියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* බදුල්ල මහ නගර සභාවේ ලියාපදිංචිය ලබා ඇති යම් උකස් හිමියකුගේ ලිපිනය වෙනස් වී ඇති විටක, එකී වෙනස්වීම සිදුවී දින හතක් ඇතුළත ඒ පිළිබඳව වන ලිඛිත දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා වෙත භාරදීම උකස් හිමියාගේ කාර්යය විය යුතුවාත් හැර ඒ ලිඛිත දැන්වීම ලැබුණු වහාම උකස් හිමියන් ලියාපදිංචි කිරීමේ ලේඛනය ඒ අනුව සංශෝධනය කිරීම සහ එසේ සංශෝධනය කරනු ලැබ ඇති බව උකස් හිමියාට ලිඛිතව දැනුම්දීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

6. 2 වන අතුරු ව්‍යවස්ථාවේ හෝ 3 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයක් ම සම්බන්ධයෙන් වන උකස් හිමියන් හා ඔවුන් විසින් උකසට තබා ගනු ලැබ ඇති දේපළ පිළිබඳ ලේඛනයක්, මේ කොටසේ දෙවන උපලේඛනයේ ආකෘතියට සාරානුකූලව පිළියෙල කර පවත්වාගෙන යාම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

7. *(අ)* බදුල්ල මහ නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන උකස් හිමියන් සහ ඔවුන් විසින් උකසට තබා ගනු ලැබ ඇති දේපළ පිළිබඳ ලියාපදිංචි කිරීමේ ලේඛනය පරීක්ෂා කර බැලීමට අවශ්‍ය යම් තැනැත්තකුට, සතියේ වැඩ කරන ඕනෑම දිනයක කාර්යාල වේලාවන් ඇතුළත එකී ලේඛනය පරීක්ෂා කර බැලීමට ඉඩදීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* (අ) ඡේදයේ නියමයට අනුව උකස් හිමියන් ලියාපදිංචි කිරීමේ ලේඛනය පරීක්ෂාකර බැලීමට අවශ්‍ය කරන සෑම තැනැත්තකු ම විසින් බදුල්ල මහ නගර සභාව විසින් නියම කරනු ලබන ගාස්තුවක් කලින් ගෙවා නාගරික කොමසාරිස්වරයාගෙන් ඒ සඳහා

අවසරය ලබා ගනු ලැබිය යුතු ය. එසේ වුව ද, කිසියම් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පළාතේ පළාත් සභාවේ දෙපාර්තමේන්තුවක ප්‍රධානියකු හෝ එවැනි තැනැත්තකු විසින් ලිඛිතව බලය පවරනු ලැබ ඇති යම් නිලධාරියකු විසින් රාජකාරි කටයුත්තක් සඳහා එකී ලේඛනය පරීක්ෂා කරනු ලැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීමක් නොකළ යුතු ය.

*(ඇ)* උකස් හිමියන් ලියාපදිංචි කිරීමේ ලේඛනය පරීක්ෂා කර බැලීම සඳහා අයකරනු ලබන ගාස්තුව බදුල්ල මහ නගර සභාව විසින් තීරණය කළ හැකි අතර එකී ගාස්තුව වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම බදුල්ල මහ නගර සභාව විසින් කලින් කල කරනු ලැබිය හැකි ය.

*(ඈ)* (ඇ) ඡේදය යටතේ බදුල්ල මහ නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන හෝ වෙනස් කරනු ලබන හෝ සංශෝධනය කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයේ නිවේදනය කරනු ලැබූ දිනයේ සිට හෝ එකී නිවේදනයේ සඳහන් කරනු ලබන යම් ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

8\. *(අ)* බදුල්ල මහ නගර සභා ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති දේපළ මත බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබ ඇති යම් වරිපනමක්, බද්දක් හෝ ගාස්තුවක් 2 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ ලියාපදිංචි කර ඇති කිසියම් දේපළක් හිමිකරුවකු විසින් නොගෙවා පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක -

(i) එකී දේපළ තහනමට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කිරීමට,

(ii) එකී දේපළ තහනමට ගැනීමට නිකුත් කළ වරෙන්තුවක් ක්‍රියාත්මක කිරීමට,

(iii) නිකුත් කළ වරෙන්තුවක් මත තහනමට ගනු ලැබූ එකී දේපළ විකිණීමට ,
දින දහ හතරකට පෙර ඒ පිළිබඳව වන ලිඛිත දැන්වීමක් එකී දේපළෙහි උකස් හිමියා වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* බදුල්ල මහ නගර සභා ප්‍රදේශය ඇතුළත පිහිටා ඇති දේපළ මත බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබ ඇති යම් වරිපනමක්, බද්දක් හෝ ගාස්තුවක් නොගෙවා පැහැර හැරීම හේතුවෙන් බදුල්ල මහ නගර සභාවේ ලියාපදිංචි කරගනු ලැබ ඇති උකස් හිමියන්ගේ ලේඛනයෙහි ඇතුළත් වන කිසියම් දේපළක් සම්බන්ධයෙන් -

(i) එකී දේපළ තහනමට ගැනීමේ වරෙන්තුවක් නිකුත් කිරීමට,

(ii) එකී දේපළ තහනමට ගැනීමට නිකුත් කළ වරෙන්තුවක් ක්‍රියාත්මක කිරීමට,

(iii) නිකුත් කළ වරෙන්තුවක් මත තහනමට ගනු ලැබූ එකී දේපළ විකිණීමට,

සිදුවී ඇති බවට එකී දේපළෙහි උකස් හිමියාට (අ) ඡේදය යටතේ දැන්වීමක් ලැබුණු අවස්ථාවක, තමා විසින් උකසට ගනු ලැබ ඇති එකී දේපළ වෙනුවෙන් අදාළ දේපළ හිමියා විසින් නොගෙවා පැහැර හැර ඇති එකී වරිපනම හෝ බද්ද හෝ ගාස්තුව හෝ එකී උකස් හිමියා විසින් බදුල්ල මහ නගර සභාවට ගෙවා එකී දේපළ තහනමට ගැනීමට වරෙන්තුවක් නිකුත් කිරීමෙන් හෝ එකී දේපළ මත එසේ නිකුත් කළ වරෙන්තුවක් ක්‍රියාත්මක කිරීමෙන් හෝ නිකුත් කළ වරෙන්තුවක් මත තහනමට ගනු ලැබූ එකී දේපළ විකිණීමෙන් හෝ වළක්වා ගනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

9\. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්, මහ නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ 03 වැනි උපවගන්තිය මගින් නියම කර ඇති දණ්ඩනයෙන්,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට යටත් වන්නේය.

(ii) දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට යටත් වන්නේය.

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේ ය.

10\. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"උකස් හිමියා" යන්නෙන්, බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ පිහිටි කිසියම් නිශ්චල දේපළක් උකසට තබාගෙන යම් මුදලක් හෝ වෙනත් යම් භාණ්ඩයක් හෝ සේවාවක් ණය පදනමින් හෝ වෙනත් යම් ආකාරයකින් සපයනු ලබන යම් තැනැත්තකු අදහස් වන අතර නිශ්චල දේපළ උකසට තබාගෙන, ණයට මුදල් නිකුත් කරනු ලබන කිසියම් වාණිජ බැංකුවක් ද ඊට ඇතුළත් විය යුතු ය.

## පළමුවැනි උපලේඛනය

2 වන අතුරු ව්‍යවස්ථාව

*බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ නිශ්චල දේපළ පිළිබඳ උකස් සහ උකස් හිමියන්ගේ ලිපිනයන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත්‍රය*
(එක් එක් දේපළ වෙනුවෙන් වෙන වෙනම අයදුම්පතක් බැගින් ඉදිරිපත් කළ යුතු ය)

1. උකස් කරන ලද නිශ්චල දේපළ
   (අ) උකස්කරුගේ නම/නම් : 1. ..............................................
   2. ..............................................
   3. ..............................................
   (ආ) උකස්කරුගේ ලිපිනයන් : 1. ..............................................
   2. ..............................................
   3. ..............................................

   (ඇ) පිහිටි වීදියේ හෝ ගමේ නම :..............................................
   (ඈ) වරිපනම් අංකය :..............................................
   (ඉ) පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය හා නම..............................................
   (ඊ) භූමි ප්‍රමාණය අක්කර.............................රූඩ්...............................පර්චස්............................... (හෙක්ටයාර්...............................)
   (උ) ඔප්පුවේ අංකය : ..............................................
   (ඌ) නොතාරිස් තැනගේ නම හා ලිපිනය : ..............................................
2. උකස් හිමියාගේ -
   (අ) නම : ..............................................
   (ආ) ලිපිනය : ..............................................
3. උකසේ වටිනාකම : රු...............................................
4. දේපළෙහි උකස ආරම්භ වන දිනය : ..............................................
5. දේපළෙහි උකස අවසන් වන දිනය : ..............................................
6. උකස් ඔප්පුව ලියාපදිංචි කළ අංකය : ..............................................
7. නොතාරිස් තැනගේ නම හා ලිපිනය ..............................................
   (උකස් ඔප්පුව පිළියෙල කළ නොතාරිස් තැන විසින් සහතික කළ උකස් ඔප්පුවේ පිටපතක් අමුණන්න)

..............................................
ඉල්ලුම්කරු/උකස් හිමියාගේ අත්සන.

දිනය : 20..................................................

## දෙවැනි උපලේඛනය

6 වන අතුරු ව්‍යවස්ථාව

බදුල්ල මහ නගර සභාව

නිශ්චල දේපළ පිළිබඳ උකස් සහ උකස් හිමියන්ගේ ලිපිනයන් ලියාපදිංචි කිරීමේ ලේඛනය

| ලියාපදිංචි කළ | | උකස් හිමියාගේ | | උකස්කරුගේ | | දේපළ පිහිටි වීදිය/ගම | වරිපනම් අංකය | ග්‍රා. සේ. නි. වසමේ අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | අංකය | නම | ලිපිනය | නම/නම් | ලිපිනය | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

සැ. යු.- මෙහි ඉහළ කොටස ලේඛනයේ වම් පසට ද පහළ කොටස දකුණු පසට ද වනසේ ලේඛනය පිළියෙල කර ගන්න.

| ඉඩමේ ප්‍රමාණය (හෙක්.) | ඔප්පුවේ අංකය | කොමසාරිස්තුමාගේ නම හා ලිපිනය | ලකුස ආරම්භ වන දිනය | ලකුස අවසන් වන දිනය | ලකුස් ඔප්පුවේ අංකය | කොමසාරිස්තුමාගේ නම හා ලිපිනය | වි.භා.නි. අත්සන | ලේකම්ගේ අත්සන |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

## XI වැනි කොටස

### බේකරි

252 වැනි අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වැනි වැනි වගන්තිය සමඟ කියවිය යුතු 08 වැනි උපවගන්තියේ (අ) ඡේදයට අනුව මහ නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභාව බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන බේකරිවලට, එහි සේවයේ නියුතු සේවකයින්ට බලපත්‍ර නිකුත් කිරීම සහ ඒවායේ නිෂ්පාදිත ආහාරවල තත්වයන් විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහ නගර සභා ප්‍රදේශයේ බේකරි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ බේකරියක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් විය යුතුය.

4. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණකර ඇත්තේ නම් මිස නාගරික කෙමාසාරිස්වරයා විසින් කවර හෝ බේකරියකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(අ) බේකරියේ නිෂ්පාදනය කරන කෑම වර්ග සඳහා තාපය ලබා ගන්නා මාධ්‍ය කවරක් වුව ද මේ ඡේදයේ සඳහන් නියමයන් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(i) බේකරිය මනා අලුත්වැඩියා තත්ත්වයකින් තිබිය යුතු ය.

(ii) බේකරියේ සෑම කාමරයකම පිටතට විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර, විවෘත කළ විට ජනේල කවුළුවල වර්ගඵලය කාමරයේ භූමියේ වර්ගඵලයෙන් පහලොවෙන් එකකට නොඅඩු විය යුතු ය.

(iii) සෑම කාමරයකම සිවිලිමක් සවිකර තිබිය යුතු අතර, සුදු පාටින් තීන්ත ආලේපකර තිබිය යුතු ය,

(iv) සෑම කාමරයකම බිම සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය,

(v) බේකරියේ උඳුන ස්ථානගත කරනු ලබන කාමරය පොළොව මට්ටමේ සිට සිවිලිම මට්ටම දක්වා අවම වශයෙන් මීටර් 3ක් උසට තිබිය යුතු අතර, ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ බිත්තිය දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේපකර තිබිය යුතු ය.

(vi) බේකරියේ උඳුන ස්ථානගත කළ කාමරය හැර සෙසු සෑම කාමරයක්ම පොළොව මට්ටමේ සිට සිවිලිම මට්ටම දක්වා අවම වශයෙන් මීටර් 2.75ක් උසට තිබිය යුතු අතර, ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් හෝ ඇළුමිනියම් සහ ලීයෙන් හෝ බැඳ දෙපැත්තම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(vii) බේකරිය තුළ ලීයෙන් කළ සියලුම සවිකිරීම් කොටස්වල තීන්ත ආලේපකර තිබිය යුතු ය.

(viii) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 1.8කට ඉහළින් තිබිය යුතුවාත් හැර අගු වාසිය අවම වශයෙන් මීටර් 1 විය යුතු ය.

(ix) නිෂ්පාදන කාර්යය සඳහා පානය කිරීමට සුදුසු තත්ත්වයේ ජලය පාවිච්චි කිරීමට විධිවිධාන සලසා තිබිය යුතු ය.

(x) නිෂ්පාදන කාර්යය සඳහා ජලය පාවිච්චි කරන සෑම කාමරයකටම ආරක්ෂිත ජල සැපයුමක් නළ මගින් සපයා තිබිය යුතු අතර බැහැර කරන අපවිත්‍ර ජලය ගලායාමට ප්‍රමාණවත් ජලාපවහන ක්‍රමයක් සකස්කර තිබිය යුතු ය.

(xi) බැහැර කෙරෙන අප ජලය උරාගන්නා වලකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය.

(xii) 8 වැනි වගන්තියේ නියම කර ඇති ආකාරයට අප ද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩපිළිවෙල ඇතිකර තිබිය යුතු ය.

*(ආ)* බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය දර පාවිච්චි කරන බේකරියක් වන විට -

(i) බේකරියේ උදුනේ දුම් කවුළුවේ ඉහළ කෙළවර අවම වශයෙන් පොළොව මට්ටමෙන් මීටර් 7.5 ක් උසට බැඳ තිබිය යුතු ය.

(ii) පිටි අනන සියලු ම මේස මතුපිට පළුදු නොතිබෙන සේ සුමට කර තිබිය යුතු අතර, ලී පිරිද්දුම් අතර හිඩැස් නොමැති වනසේ පුරුද්දා තිබිය යුතු ය. නැතහොත් මල නොබැඳෙන ලෝහ තහඩුවකින් පිරිද්දුම්වලින් තොරව ආවරණය කර තිබිය යුතු ය,

(iii) බේකරි උඳුනෙන් ඉවත් කරන දැවී ගිය අළු සහ ශේෂ දැව කොටස් ඉවත් කිරීමට ප්‍රමාණවත් එහා මෙහා ගෙන යා හැකි භාජනයක් සපයා තිබිය යුතු ය,

(iv) බේකරි උඳුනේ පිටත තීන්ත හෝ හුණු ගා තිබිය යුතු ය,

(v) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර, බේකරියට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

*(ඇ)* බලපත්‍රය ඉල්ලා සිටින බේකරිය විදුලි බලයෙන් ක්‍රියා කරන බේකරියක් වන විට -

(i) බේකරි උපකරණවලට විදුලිය සම්බන්ධ කරන විදුලි පේනු ආරක්ෂිත තත්ත්වයේ පැවතිය යුතු අතර, අධි වෝල්ටීයතාව ඇතිවන අවස්ථාවක දී හෝ විදුලිය කාන්දු වීමක දී විදුලිය ස්වයංක්‍රීයව විසන්ධි කෙරෙන උපකරණ සවිකර තිබිය යුතු ය.

(ii) බේකරි පරිශ්‍රය තුළ සවිකර ඇති විදුලි පරිපථවල විදුලි රැහැන් පිටතට විදුලිය කාන්දුවීම්වලින් තොර බට හෝ පෙට්ටි ඇතුළතින් ඇද තිබිය යුතු අතර, පිටතට නිරාවරණය වූ විදුලි රැහැන් කෙළවරවල් නොතිබිය යුතු ය.

(iii) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සහ විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

5. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි 4 වැනි වගන්තියෙහි නියමකර ඇති සෑම කොටසකම අවම වශයෙන් සෑම වර්ෂයකටම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතු ය.

6. පිටි ඇනීම සඳහා යොදා ගන්නා සෑම කාමරයක ම ගෙබිම, යටත් පිරිසෙයින් සෑම දිනයකම එක් වරක්වත් සේදීමට සැලැස්විය යුතු ය.

7. බේකරිය සහ එහි වටපිටාව ද, කාණු, ලී බඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගත යුතු ය.

8. බේකරි නිෂ්පාදන සඳහා යොදා ගන්නා පිටි සහ වෙනත් ද්‍රව්‍ය කල් ඉකුත් වීමේ දිනය ප්‍රමාණවත් කාලයක් ඉදිරියට පවතින්නේ නම් මිස කවර හෝ අවස්ථාවක එකී ද්‍රව්‍ය බේකරි නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීම නොකළ යුතු ය.

9. *(අ)* කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

*(ආ)* හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

*(ඇ)* බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

10. බේකරියේ සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් බේකරියේ සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවකම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවටත් බේකරියේ කාර්යයන්හි නියුක්ත වීමට පෙර හොඳින් ඇඟ සෝදා පිරිසිදු වී සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. *(අ)* බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස, එකී අප ද්‍රව්‍ය -

(i) ජෛවහායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,
(vii) අන්තරායාකර අප ද්‍රව්‍ය.

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

12. බේකරි නිෂ්පාදන සඳහා මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු ජලය යොදා ගැනීම නොකළ යුතු ය.

13. බේකරියේ පාවිච්චිය සඳහා තබාගන්නා පිටි සහ වෙනත් ද්‍රව්‍ය ගබඩා කිරීමට ඒ සඳහා ම වෙන් වූ වෙනම කාමරයක් යොදාගෙන තිබිය යුතු අතර, එකී කාමරය ප්‍රමාණවත් වාතාශ්‍රය සහිත වූ ද මැස්සන්ට හෝ වෙනත් කෘමි සතුන් සහ මීයන්ට ඇතුල්විය නොහැකි ලෙස ආරක්ෂා කර තිබිය යුතු ය.

14. 13 වැනි වගන්තියේ සඳහන් ගබඩා කාමරයේ පිටි ගබඩා කිරීමේ දී, අවම වශයෙන් පොළොව මට්ටමෙන් සෙන්ටි මීටර් 20ක් උස පාද මත තැනූ ලෑලි තට්ටුවක් යොදාගත යුතු අතර, එකී ලෑලි තට්ටුව හිස්ව තිබෙන විට පහසුවෙන් එහා මෙහා ගෙන යා හැකි ආකාරයෙන් නිම කර තිබිය යුතු ය. එසේ ම එකී ලෑලි තට්ටුව යටින් මීයන්ට සහ කවර හෝ වර්ගයක කෘමින්ට රැඳී සිටිය නොහැකි වන සේ ආවරණය කර තිබිය යුතුවාත් හැර අවම වශයෙන් බිත්තියෙන් සෙන්ටි මීටර් 23ක් ඈතින් තබා තිබිය යුතු ය.

15. 14 වන වගන්තියේ සඳහන් ලෑලි තට්ටු අවම වශයෙන් මාසයකට දෙවරක් බැගින් කාමරයෙන් පිටතට ගෙන පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

16. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් කවර හෝ ස්ථානයක, කවර හෝ තැනැත්තෙකු නිදා ගැනීම නොකළ යුතු අතර, බේකරියේ කාර්යය සඳහා පාවිච්චි කරන උපකරණ හෝ ද්‍රව්‍ය හෝ නොවන වෙනත් යම් ද්‍රව්‍යයක් තැබීම හෝ ගබඩා කර තැබීම හෝ නොකළ යුතු ය. එසේ වුව ද බේකරියේ සේවයේ නියුක්ත තැනැත්තන් සඳහා වෙනම වෙන්කර දී ඇති විවේක කාමරයක් හෝ ආහාර ගැනීමේ කාමරයක් මෙයට ඇතුළත් නොවිය යුතු ය.

17. බේකරියේ සේවයේ නියුක්ත සේවකයන් සඳහා යටත් පිරිසෙයින් සෑම දස දෙනෙකු වෙනුවෙන් එකක් බැගින් වනසේ වැසිකිළි සකස් කර තිබිය යුතුවාත් හැර කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙනම වැසිකිළි තිබිය යුතු ය. එසේ ම එකී වැසිකිළි බේකරියේ කාමරවල සිට අවම වශයෙන් මීටර් 15ක් දුරින් ස්ථානගත කර තිබිය යුතු ය.

18. බේකරියේ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ටැංකියේ සිට අවම වශයෙන් මීටර් 18කට අඩු දුරකින් කසළ වලක් හෝ පෝර වලක් හෝ අළු වලක් හෝ ස්ථානගත කර නොතිබිය යුතු ය.

19. බේකරියේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහාම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

20. කවර හෝ තැනැත්තෙකු විසින් බේකරිය ඇතුළත දුම්බීම හෝ බුලත් සැපීම හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් සැපීම හෝ ආහාර ගැනීම හෝ නොකළ යුතු ය.

21. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් සෑම ස්ථානයකම හොඳින් පෙනෙන තැනක සම්මත පඩි සහිත තරාදියක් හෝ වෙනත් කිසියම් වර්ගයක සම්මත තරාදියක් තැබීමට සැලැස්වීම සහ කිසියම් ගනුදෙනුකරුවෙකු විසින් ඉල්ලා සිටි විට විකුණන හෝ විකිණීමට ප්‍රදර්ශනය කර ඇති යම් බේකරි නිෂ්පාදනයක බර කිරා බැලීමට හෝ බර කිරා පෙන්වීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

22. කිසියම් බේකරියක නිෂ්පාදනය කරන බේකරි නිෂ්පාදන බලපත්‍රලාභියා විසින්ම ප්‍රවාහනය කිරීම කරනු ලබන්නේ නම් දූවිලි හෝ වෙනත් අපද්‍රව්‍ය හෝ ජලය ඇතුල්විය නොහැකි වන සේ ආවරණය කළ පෙට්ටි යොදා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

23. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

24. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බේකරියක නිෂ්පාදනය කෙරෙන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිල දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

25. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් බේකරියක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වැනි වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

26. 25 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

27. 26 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

28. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වැනි උපවගන්තය මගින් නියම කර ඇති පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකටද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු. 250 0) නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

29. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"බේකරි නිෂ්පාදන" යන්නෙන්, විකිණීම සඳහා හෝ වෙනත් කිසියම් තැනැත්තෙකුගේ ඇණවුමක් මත කිසියම් බේකරියක නිපදවන පාන්, කේක්, බනිස්, විස්කෝතු හෝ කිසියම් රස කැවිලි ද, හෝ පිටි ආශ්‍රිත සියළු නිෂ්පාදනද,

"බේකරිය" යන්නෙන් විකිණීම සඳහා හෝ වෙනත් කිසියම් තැනැත්තෙකුගේ ඇණවුමක් මත පාන්, කේක්, බනිස්, විස්කෝතු රස කැවිලි හෝ පිටි ආශ්‍රිත සියළු නිෂ්පාදන ද, සාදන යම් ස්ථානයක් අදහස් වන අතර එවැනි ආහාර පිළියෙල කරනු ලබන හෝ එවැනි ආහාර පිළියෙල කිරීම සඳහා ද්‍රව්‍ය ගබඩා කර තබන කිසියම් ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

## XII වැනි කොටස

### පොදු වෙළඳ පොළවල් හා පෞද්ගලික වෙළඳපලවල්

252 වැනි අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 වන සහ 272 වැනි වගන්ති සමග කියවිය යුතු 08 වැනි උපවගන්තියේ (ආ) ඡේදයට අනුව මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යන පොදු වෙළෙඳ පොළවල් හා පෞද්ගලික වෙළඳපලවල් විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පොදු වෙළඳ පොළවල් හා පෞද්ගලික වෙළඳපලවල් පවත්වාගෙන යාම විධිමත් කිරීම අධීක්ෂණය හා පාලනය පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. බදුල්ල මහා නගර සභාව විසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළඳ පොළක් සම්බන්ධයෙන් මේ අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් නියමයන් පිළිපැදීම බදුල්ල මහා නගර සභාව විසින් කළ යුතු ය. එනම්, එකී පොදු වෙළඳ පොළෙහි,

(1) ස්ථිර ගොඩනැගිලි සියල්ල ම ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තනා තිබිය යුතු අතර, බිත්තිවල උස අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 3 ක් උසින් යුක්ත විය යුතු ය.

(2) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා නිමකර තිබිය යුතු ය.

(3) ඇතුළත කඩ කාමරවල වහළයට සිවිලිමක් සවිකර තිබිය යුතුවාත් හැර එකී සිවිලිම පොළොව මට්ටමේ සිට මීටර් 2.85 ක් උසින් පිහිටා තිබිය යුතු ය.

(4) ගොඩනැගිල්ල ඇතුළත කඩ කාමරවල ඉදිරිපස අවම වශයෙන් මීටර් 2.5 ක පළලින් යුතු කොරිඩෝරයකින් යුක්ත විය යුතුවාත් හැර සෑම කඩ කාමරයක්ම කොරිඩෝරයට සම්බන්ධවන ස්ථානයේ අකුලන දොරකින් හෝ පළු වශයෙන් ගලවා විවෘත කළ හැකි දොරකින් යුක්ත විය යුතු ය.

(5) කඩ කාමර සහිත ගොඩනැගිල්ලේ බිත්තිවල පිටත මායිමේ සහ කොරිඩෝව පිටත මායිමේ අවම වශයෙන් මීටර් එකක පළලින් යුතු වේදිකා බැම් සහ වැසි ජලය යාමේ කාණු තනා තිබිය යුතු ය.

(6) ගොඩනැගිල්ලේ කඩ කාමරවලින් යුතු කොටසෙන් බැහැරව තාවකාලික වෙළෙඳුන් සඳහා වෙළඳ මැහි තනා තිබිය යුතු ය.

(7) ඇතුළත ඉදිකරනු ලබන සෑම වෙළඳ මැස්සක්ම ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් ඉදිකළ බැම්මක් මත කොන්ක්‍රීට් තහඩුවකින් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් නිමකළ තට්ටුවකින් යුක්ත විය යුතු ය. කෙසේ වුව ද කොන්ක්‍රීට් තහඩුවලින් තට්ටුව නිමකර ඇති විටක එකී තට්ටුව කපරාරු කර සිමෙන්තියෙන් ඔපදමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. ඒ ආකාරයෙන් වෙළඳ මැහි තැනීමට නොහැකිවන යම් අවස්ථාවක, පොළොව මත සමතලා ආකාරයෙන් වූ ඉඩ කොටස් තනා තිබිය යුතු අතර එකී කොටස් ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් නිමකර සිමෙන්තියෙන් කපරාරු කර තිබිය යුතු අතර එක් එක් කොටස වෙන් කෙරෙන ඉරි සලකුණු සුදු පාටින් ලකුණු කර තිබිය යුතු ය.

(8) සෑම වෙළඳ මැස්සකම වර්ගඵලය අවම වශයෙන් වර්ග මීටර් දෙකකට නොඅඩු විය යුතුය.

(9) සෑම වෙළඳ මැස්සක්ම ආවරණය වන සේ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් හෝ ගැල්වනයිස් කළ යකඩ බටවලින් හෝ වැර ගැන්වූ ඇළුමිනියම් බට යෙදූ කණු මත අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.25 ක උසකින් යුක්ත වහළයක් තනා තිබිය යුතු අතර අගුව අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.1 ක උසකින් යුක්ත විය යුතු ය.

එසේම එකී කණු ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තනා ඇත්තේ නම් කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු අතර ගැල්වනයිස් කළ යකඩයෙන් නිම කර ඇත්තේ නම් එකී කණුවල තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(10) සෑම වහළයක් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු අතර වැහිපීලි හා වැහිපීලිවල රැස්වන ජලය පහළට බැසයාමට ප්‍රමාණවත් බට සවිකර තිබිය යුතු ය.

(11) සෑම වෙළඳ මැස්සක වටා පොළොවේ අවම වශයෙන් මීටර් එකක පළලින් යුක්ත වේදිකා බැම් තනා තිබිය යුතු අතර වැසි ජලය ගලා යාමට ප්‍රමාණවත් කාණු තනා තිබිය යුතු ය.

(12) පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ස්ථානයේ පාවිච්චිය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(13) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(14) ස්ත්‍රී හා පුරුෂ පක්ෂයට වෙන වෙනම වෙන්වූ වැසිකිළි හා කැසිකිළි ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර එකී සෑම වැසිකිළියකම බිම ද අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් දෙකක් උසට බිත්තිවලට ද පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(15) සියලුම කඩ කාමරවලට, වෙළෙඳ මැහි අසළට, වැසිකිළි හා කැසිකිළි තුළට හා කොරිඩෝර ඇතුළුව සියළුම පොදු කොටස් ඇතුළත ප්‍රමාණවත් විදුලි අලෝකය සපයා දී තිබිය යුතු අතර සෑම විදුලි පරිපථයක්ම විදුලි කුසන්නායක ද්‍රව්‍යයකින් තැනූ ආවරණයකින් ආවරණය කර තිබිය යුතු ය.

(16) සෑම කඩ කාමරයකටම විදුලි මනුවක් බැගින් සවිකර තිබිය යුතු අතර පොදු ස්ථාන ආලෝකකරණය සඳහා වැය වන විදුලිය ඒකක ගණන මැනීම සඳහා වෙනම මනුවක් සවිකර තිබිය යුතු ය.

(17) පරිශ්‍රය ඇතුළත පොදු ජල කරාම සවිකර තිබිය යුතු ය.

(18) එළවළු හෝ පළතුරු සේදීම සඳහා වෙනම ස්ථානයක් වෙන්කර තිබිය යුතු ය.

(19) වෙළෙඳාමේ ස්වභාවය අනුව ජලය පාවිච්චි කිරීම අවශ්‍ය කරන සෑම කඩ කාමරයකට ම ජල සම්බන්ධතාවක් බැගින් ලබාදී තිබිය යුතු ය. එකී එක් එක් ජල සම්බන්ධතාව වෙනුවෙන් වෙන වෙනම වූ ජල මනුවක් බැගින් සවිකර තිබිය යුතු අතර පොදු ජල කරාමවල සහ එළවළු සහ පළතුරු සේදීම සඳහා වෙන්කළ ස්ථානයේ ජලපරිභෝජනය මැනීම සඳහා වෙනම ජල මනුවක් බැගින් සවිකර තිබිය යුතු ය.

(20) ඇතුළට එක එල්ලේ හා වහළය මතට පතිතවන වර්ෂා ජලය, එළවළු හා පළතුරු සේදීම සඳහා වෙන්කළ ස්ථානයෙන් බැහැර කෙරෙන ජලය නිසි ආකාරයෙන් ගලා යාමට ප්‍රමාණවත් කාණු පද්ධතියක් තනා තිබිය යුතු අතර එකී අප ජලය බාධාවකින් තොරව ගලා යාමට සලස්වා තිබිය යුතු ය.

(21) ඇතුළත ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ වැඩ පිළිවෙලක් සකස් කර තිබිය යුතු අතර විදුලි බලය හේතුවෙන් ඇතිවන ගිනි, ඉන්ධන මගින් ඇතිවන ගිනි හා වෙනත් ආකාරයකින් ඇතිවන ගිනි මැඩ පැවැත්වීම සඳහා අවශ්‍ය කරන වෙන් වෙන් වූ වර්ගයේ ගිනි නිවීමේ උපකරණ සවිකර තිබිය යුතු ය.

(22) පාරිභෝගිකයින් විසින් මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් හි බර කිරා තහවුරු කර ගැනීමට සම්මත පොදු තරාදියක් ඒ සඳහා වෙන් වූ සහ පැහැදිලිව පෙනෙන ස්ථානයක තබා තිබිය යුතු ය.

(23) පොදු වෙළඳ පොළෙහි කඩ කාමරවල පිහිටීම සැලකිල්ලට ගනිමින් බදුල්ල මහා නගර සභාව විසින් මස්, මාළු, එළවළු, පළතුරු, සිල්ලර බඩු හා වෙනත් වෙළඳ ද්‍රව්‍ය විකිණීම සඳහා වෙළඳ පොළ කොටස්වලට බෙදා වෙන් කිරීම ද ඒ ආකාරයෙන්ම වෙළෙඳ මැහි ද කොටස්වලට වෙන් කිරීම ද බදුල්ල මහා නගර සභාවේ කාර්යය විය යුතු ය.

(24) පරිශ්‍රය තුළ ජනනය වන අප ද්‍රව්‍ය;
(i) ජෛවභායන අපද්‍රව්‍ය;
(ii) වීදුරු;
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;
(iv) පොලිතීන් හෝ ප්ලාස්ටික් හෝ පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය සහ රිජිෆෝම්;
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ සම්මිශ්‍රණ කොටස්;
(vi) අන්තරායකර අපද්‍රව්‍ය.

වෙන වෙනම රැස්කළ හැකි බක්කි හෝ භාජන හෝ ටැංකි හෝ එකී පොදු වෙළඳ පොළෙහි වෙනම ස්ථානයක තනා තිබිය යුතු අතර ජෛවභායන අපද්‍රව්‍ය බහාලීම සඳහා තනනු ලැබූ බක්කිය හෝ භාජනය හෝ ටැංකිය මීයන්ට, මැස්සන්ට, වෙනත් කෘමීන්ට හෝ කවර හෝ පක්ෂියෙකුට ඇතුල්වීමට නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි පියනක් සවි කර තිබිය යුතු ය.

(25) පාපැදි හා යතුරුපැදි නතර කර තැබීමට ස්ථානයක් සකස්කර තිබිය යුතු ය.

(26) වෙළඳ පොළට පැමිණෙන පාරිභෝගිකයින්ගේ සහ භාණ්ඩ ප්‍රවාහන වාහන නතර කර තැබීමට ප්‍රමාණවත් ඉඩකඩක් වෙන් කර තිබිය යුතු ය.

3 (අ) පොදු වෙළඳ පොළෙහි ඇති කිසියම් කඩ කාමරයක බදුකරු හෝ කිසියම් වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ටිකට් පතක් ලබාගෙන ඇති කිසියම් තැනැත්තෙකු හෝ වෙළඳාමේ නියුක්ත කඩ කාමරය හා ඒ අසල හෝ වෙළඳ මැස්ස මත හෝ ඒ අසළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය-

(i) ජෛවභායන අපද්‍රව්‍ය;
(ii) වීදුරු;
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;
(iv) පොලිතීන් හෝ ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය සහ රිජිෆෝම් ;
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;
(vi) අන්තරායකර අප ද්‍රව්‍ය.

යන වර්ග යටතේ වර්ග කර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට මහා නගර සභාව විසින් තනා ඇති වෙන් වෙන් වූ බක්කිවලට හෝ භාජනවලට හෝ ටැංකිවලට දැමීම එකී බදුකරුගේ හෝ එකී වෙළඳ මැස්සේ ටිකට් පතක් ලබාගෙන ඇති තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(ආ) පොදු වෙළඳ පොළට පැමිණෙන තැනැත්තන් විසින් බැහැර කරනු ලබන අපද්‍රව්‍ය බහාලීම සඳහා *(අ)* ඡේදය යටතේ වර්ග කර බැහැරලීම පහසු කරවන කුඩා ප්‍රමාණයේ භාජන පොදු වෙළඳ පොළෙහි සුදුසු ස්ථානවල තැබීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු අතර එකී භාජන ප්‍රමාණවත් කාලාන්තරයෙන් *(අ)* ඡේදයේ සඳහන් අප ද්‍රව්‍යවලට අදාළ බක්කියට හෝ භාජනයට හෝ ටැංකියට දැමීමට සැලැස්විය යුතු ය.

(ඇ) පොදු වෙළඳ පොළෙහි තබා ඇති අපද්‍රව්‍ය රැස්කරන කවර හෝ භාජනයක, බක්කියක හෝ ටැංකියක බහාලීමට වෙන්කළ වර්ගයේ අපද්‍රව්‍ය හැර වෙනත් වර්ගයක අපද්‍රව්‍ය එකී භාජනයට, බක්කියට හෝ ටැංකියට දැමීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

(ඈ) 2 වැනි වගන්තියෙහි (24) වැනි ඡේදයේ නියමයන් යටතේ ජෛවභායන අපද්‍රව්‍ය බහාලීම සඳහා තනා ඇති බක්කියට හෝ භාජනයට හෝ ටැංකියට අපද්‍රව්‍ය බහාලන අවස්ථාවේ හෝ අපද්‍රව්‍ය ඉන් පිටතට ගන්න අවස්ථාවේ දී හැර වෙනත් සෑම අවස්ථාවකදීම එකී බක්කියේ හෝ භාජනයේ හෝ ටැංකියේ පියන හොඳින් වසා තැබීම කළ යුතු ය.

4. (අ) කවර හෝ පොදු වෙළඳ පොළක වෙළෙඳාම සඳහා වෙන්කළ ඉඩ ප්‍රමාණය යන්නෙන්,

(i) කඩ කාමරයක් වන විට, එකී කඩ කාමරයේ පිටුපස බිත්තියේ සිට දෙවන වගන්තියෙහි (4) වන ඡේදයේ සඳහන් දොර සවිකර ඇති සීමාව දක්වා කොටස ද,

(ii) වෙළඳ මැස්සක් වනවිට, එකී වෙළඳ මැස්සේ මතුපිට වර්ග ප්‍රමාණය සහ වෙළෙඳාමේ යෙදෙන තැනැත්තාට රැඳී සිටීමට ඉඩ දී තිබෙන එකී වෙළඳ මැස්ස පිටුපස භූමි ප්‍රමාණය ද,
අදහස් විය යුතු ය.

(ආ) විකිණීම සඳහා පොදු වෙළඳ පොළ වෙත රැගෙන එනු ලබන කවර හෝ ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් හෝ වෙළඳාම සඳහා යොදාගන්නා කිසියම් උපකරණයක් හෝ වෙනත් යම් කවර හෝ දෙයක් එකී ද්‍රව්‍ය හෝ භාණ්ඩ වෙළඳ පොළ තුළට රැගෙන එනු ලබන අවස්ථාවක දී හෝ ඉන් බැහැරට ගෙනයනු ලබන අවස්ථාවක දී හැර වෙනත් කවර හෝ අවස්ථාවක දී කිසියම් කොරිඩෝරයක හෝ වේදිකා බැම්මක හෝ රඳවා තැබීම හෝ එසේ කිරීමට ඉඩ දීම හෝ නොකළ යුතු ය.

(ඇ) පොදු වෙළඳ පොළ ඇතුළත කවර හෝ කොරිඩෝරයක් මත හෝ වේදිකා බැම්මක් මත හෝ කවර හෝ ආකාරයක වෙළඳාමක් නොකළ යුතු අතර එකී කොරිඩෝර හෝ වේදිකා බැම් මතින් ගමන් ගන්නා තැනැත්තන්ට බාධාවන කවර හෝ ක්‍රියාවක් නොකළ යුතු ය.

5. පොදු වෙළෙඳ පොළ ඇතුළත පිහිටි හෝටලයක්, බත්කඩයක්, ආපන ශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් නොවන වෙනත් කවර හෝ ස්ථානයක ඉවුම් පිහුම් කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

6. බදුල්ල මහා නගර සභාව සතු කිසියම් පොදු වෙළෙඳ පොළක -

(1) ඇතුළත අසංවරව හැසිරීම හෝ කළ කෝලාහල කිරීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ හිඟමන් ඉල්ලීම;

(2) දෛනික කටයුතු අවසානයේ වෙළඳ පොළ වසා දැමීමෙන් අනතුරුව එහි පරිශ්‍රය ඇතුළත රැඳී සිටීම;

(3) කිසියම් ගොඩනැගිල්ලකට, ඉදි කිරීමකට හෝ සවි කිරීමකට හෝ අලංකරණය පිණිස වවා ඇති හෝ තබා ඇති කිසියම් මල් පඳුරකට හෝ නාම පුවරුවකට හෝ වෙනත් ද්‍රව්‍යයකට හෝ හානි කිරීම හෝ අලාභ කිරීම හෝ විකෘති කිරීම හෝ විරූපි කිරීම;

(4) පාවිච්චිය සඳහා සපයා ඇති ජලය අපිරිසිදු කිරීම හෝ අපතේ යැවීම හෝ අපතේ යාමට ඉඩ හැරීම හෝ වෙනත් කිසියම් ආකාරයකින් නාස්ති කිරීම හෝ එකී ජලයෙන් ස්නානය කිරීම හෝ රෙදි හෝ සතුන් සේදීම සහ එළවළු සහ පළතුරු සේදීමට වෙන්කළ ස්ථානයේ හැර වෙනත් යම් ස්ථානයක එළවළු හෝ පළතුරු සේදීම;

(5) නාගරික කොමසාරිස්වරයා විසින් විධිමත් ආකාරයෙන් අවසරයක් දී ඇත්තේ නම් මිස තම කඩ කාමරයේ නාම පුවරුව නොවන වෙනත් කවර හෝ ආකාරයක ප්‍රචාරක දැන්වීම් පුවරු සවිකිරීම, බැනර් ඇද තැබීම හෝ වෙනත් කවර හෝ ආකාරයක ප්‍රචාරක කාර්යයක් කිරීම;

(6) විදුලිය සම්බන්ධතාව ලබා දී ඇති ප්‍රධාන යතුරු පුවරුව අසළට ළඟා වීමට බාධා කරන ආකාරයෙන් බඩු භාණ්ඩ තැබීම හෝ ප්‍රධාන යතුරු පුවරුවට හානි කිරීම;

(7) විදුලිය සම්බන්ධතාව ලබා දීම සඳහා ගොඩනැගිල්ල තුළ ඇද ඇති ප්‍රධාන විදුලි රැහැනෙන් හෝ වෙනත් කිසියම් විදුලි රැහැනකින් වංචනිකව විදුලිය සම්බන්ධතාවක් ලබා ගැනීම;

(8) ජල සම්බන්ධතාව ලබා දීම සඳහා ගොඩනැගිල්ල තුළ එළා ඇති ප්‍රධාන ජල නලයෙන් හෝ වෙනත් කිසියම් ජල නලයකින් වංචනිකව ජල සම්බන්ධතාවක් ලබා ගැනීම;

(9) ගොඩනැගිල්ලේ සවිකර ඇති ගිනි නිවීම් උපකරණ අසළට ළඟා වීමට බාධා කරන ආකාරයෙන් බඩු භාණ්ඩ තැබීම හෝ ප්‍රධාන යතුරු පුවරුවට හානි කිරීම;

(10) තත් කාර්යය සඳහා වෙන්කළ ස්ථානයක හැර කවර හෝ වර්ගයක එළවළු, මස් හෝ මාළු විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම;

(11) පරිශ්‍රය ඇතුළට පාපැදි හෝ යතුරු පැදි රැගෙන ඒම හෝ එසේ කිරීමට ඉඩදීම;

(12) කිසියම් වෙළඳ ස්ථානයකින් ඉවත් කරනු ලබන අපද්‍රව්‍ය 3 වන වගන්තියෙහි නියමයන්ට අනුකූලව මහා නගර සභාව විසින් සපයා දී ඇති යම් බක්කියකට හෝ ටැංකියකට හැර පොදු වෙළෙඳ පොළ ඇතුළත වෙනත් කවර හෝ ස්ථානයකට දැමීම

කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

7. (අ) කිසියම් අසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස පොදු වෙළඳ පොළෙහි කවර හෝ ආකාරයක වෙළෙඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත විම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළඳ පොළෙහි කවර හෝ ආකාරයක වෙළඳාමක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

8. පොදු වෙළඳ පොළෙහි කිසියම් කඩ කාමරයක් හෝ වෙළඳ මැස්සක් පාවිච්චි කරන හෝ පරිහරණය කරනු ලබන සෑම තැනැත්තෙකු ම දෛනික කටයුතු ආරම්භයේ සහ අවසානයේ ද අවශ්‍ය වන්නේ නම් ඒ අතර තුර අවස්ථා එකක දී හෝ ඊට වැඩි වාර ගණනක දී එකී කඩ කාමරය ඇතුළත සහ එහි ඉදිරිපස කොරිඩෝරය හා වේදිකා බැම්ම ද නැතහොත් වෙළඳ මැස්ස මත සහ ඒ අවට ද අතුගා පිරිසිදු කිරීම සහ එසේ අතු ගෑමෙන් පසු එකතු වන අප ද්‍රව්‍ය 3 වන වගන්තියෙහි සඳහන් ආකාරයට බඳුල්ල මහා නගර සභාව විසින් සපයා ඇති බක්කියකට හෝ ටැංකියකට දැමීම හෝ දැමීමට සැලැස්වීම සෑම කඩ කාමරයක ම බදු කරුගේ සහ වෙළඳ මැස්සකම පාවිච්චි කරන හෝ පරිහරණය කරන තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

9. පොදු වෙළඳ පොළෙහි එළවළු, පළතුරු, මස්, මාළු හෝ වෙනත් ආහාර හෝ පාන වර්ග විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන සෑම කඩ කාමරයක් ම හා වෙළඳ මැස්සක් ම සහ සෑම හෝටලයක්, බත් කඩයක්, ආපන ශාලාවක් ද ඇතුළුව සෑම තේ හෝ කෝපි කඩයක් ම දෛනික කටයුතු අවසානයේ එකී වෙළඳ ස්ථානයේ විකිණීම සඳහා ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන සෑම කඩ කාමරයක් ම, මේසයක් ම, බංකුවක් ම, භාණ්ඩ තබන ලෑල්ලක්, අල්මාරියක් ම අවස්ථාවෝචිත පරිදි සෝදා හෝ සූරා පිරිසිදු කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම එකී යම් ස්ථානයක වෙළඳ කාර්යයේ නියුක්ත වන තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

10. කවර හෝ පොදු වෙළඳ පොළක කිසියම් කඩ කාමරයක් හෝ යම් වෙළඳ මැස්සක් වෙන්කර දී ඇත්තේ යම් වර්ගයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙළෙඳාමක් සඳහා ද එසේ වෙන් කරන ලද වර්ගයේ භාණ්ඩ හෝ ද්‍රව්‍ය හැර වෙනත් කවර හෝ ආකාරයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

11. පොදු වෙළඳ පොළෙහි කඩ කාමරවලින් බැහැරව ඉදිකරනු ලැබූ කිසියම් වෙළඳ මැස්සක දෛනික කටයුතු අවසානයේ කිසිදු භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් හෝ අප ද්‍රව්‍ය රඳවා තැබීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

12. ගෝඝාතක ආඥාපනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබා ඇති ගෝ ඝාතකාගාරයක දී මරනු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස පොදු වෙළඳ පොළෙහි මස් වෙළඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

13. කවර හෝ ගෝඝාතකාගාරයක් තුළ කිසියම් දිනයක දී මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝ ඝාතක ආඥාපනතේ 17 වන වගන්තියේ බලතල ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක, පොදු වෙළඳ පොළ ඇතුළත පවත්වාගෙන යනු ලබන කවර හෝ මස් කඩයක වෙළඳාම් පිණිස මස් තබා ගැනීම හෝ වෙළඳාම පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

14. කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළඳ පොළ පරිශ්‍රය ඇතුළට සුනඛයෙකු හෝ බළලෙකු හෝ වෙනත් කවර හෝ සතෙකු හෝ පක්ෂියෙකු රැගෙන ඒම හෝ රැගෙන ඒමට ඉඩදීම හෝ නොකළ යුතු ය. මේ නියමය කිසියම් පරීක්ෂණ කාර්යයක් සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් පොලිස් නිල සුනඛයෙකු පොදු වෙළඳ පොළ ඇතුළට රැගෙන එනු ලැබීම වළක්වන නියමයක් ලෙස තේරුම් නොගත යුතු ය.

15. පොදු වෙළඳ පොළෙහි වෙළෙඳාම් අවසන් කර පොදු වෙළඳ පොළ සම්පූර්ණයෙන් ම වසා තබන අවස්ථාවක සහ පොදු වෙළඳ පොළෙහි කඩ කාමරයක් වසා දමා බැහැරට යන සෑම අවස්ථාවක දී ම එකී කඩ කාමරයේ සියලුම විදුලි පහන්, විදුලි පංකා සහ වෙනත් විදුලි උපකරණ අක්‍රිය කර දැමිය යුතු අතර දල්වා තිබෙන කිසියම් ගිනි හා පොල් තෙල් පහන් නිවා දැමීමට සැලැස්වීම

බදුකරුගේ කාර්යය වන්නේ ය. එසේ වුව ද ආහාර හෝ පාන වර්ග කල් තබා ගැනීමට පාවිච්චි කරන ශීතකරණ හෝ අධි ශීතකරණ මේ යටතට ඇතුළත් නොවිය යුතු ය. එසේම තව දුරටත් පොදු වෙළඳ පොළෙහි ආරක්ෂාවට තර්ජනයක් විය හැකි කවර හෝ ආකාරයේ ගිනි දැල්ලක් දැල්වීම හෝ දැල්වීමට සැලැස්වීම හෝ පොදු වෙළඳ පොළ පරිශ්‍රය ඇතුළත කවර හෝ ස්ථානයක රතිඤ්ඤා දැල්වීම හෝ දැල්වීමට සැලැස්වීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

16. කිසියම් පොදු වෙළඳ පොළකින් බැහැර ස්ථානයක තිබෙන කවර හෝ අප ද්‍රව්‍යයක් එකී පොදු වෙළඳ පොළෙහි ජනනය වන අප ද්‍රව්‍ය බහාලීමට තනා ඇති කිසියම් බක්කියකට, භාජනයකට හෝ ටැංකියකට දැමීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

17. පොදු වෙළෙඳ පොළෙහි ඇති සෑම වැසිකිළියක් හා කැසිකිළියක් ම අවම වශයෙන් දිනකට තුන් වතාවක් බැගින් විෂබීජ නාශක යොදා සෝදා හැරීමෙන් පිරිසිදු කිරීමටත් ජලය ගලා යාමට ඉදිකර ඇති සෑම කාණුවක්ම අවම වශයෙන් දිනකට දෙවතාවක් බැගින් සෝදා පිරිසිදු කිරීමටත් සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

18. 2 වන වගන්තියෙහි (24) වන ඡේදයේ නියමකර ඇති ආකාරයෙන් තනා ඇති සෑම බක්කියක, භාජනයක හෝ ටැංකියක ම රැස්කරනු ලබන අපද්‍රව්‍ය, අවම වශයෙන් දිනකට එක් වතාවක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් එකී ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය. එසේම එකී අප ද්‍රව්‍ය එකී ස්ථානයෙන් ඉවත් කිරීමේ දී අප ද්‍රව්‍ය පැටවූ කොටස සම්පූර්ණයෙන් ආවරණය කළ වාහනයකින් ප්‍රවාහනය කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

19. එළවළු හෝ පළතුරු සේදීම සඳහා වෙන්කළ ස්ථානයේ රැස්වන පස් හෝ වැලි හෝ වෙනත් ද්‍රව්‍ය අවම වශයෙන් දිනකට එක් වතාවක් බැගින් ඉවත් කිරීමටත් එම ස්ථානයේ ජලය ගලායාමට ඇතිවන බාධා වැළැක්වීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීමත් නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

20. පොදු වෙළඳ පොළෙහි සවිකර ඇති ගිනි නිවීම් උපකරණවල ක්‍රියාකාරීත්වය නිසි පරිදි පවතින්නේ ද යන්න අවම වශයෙන් සය (06) මසකට එක් වතාවක් බැගින් පරීක්ෂා කරවා ගැනීමත් අක්‍රිය වූ ගිනි නිවීමේ උපකරණ වෙනුවට අලුත් උපකරණ සවිකිරීමටත් සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

21. පොදු වෙළඳ පොළෙහි -

(අ) කඩ කාමරවල ඇතුළත බිත්ති හැර සෙසු බිත්ති, සෑම වෙළඳ මැස්සකම සිමෙන්තියෙන් කපරාරු කළ කොටස්, ගැල්වනයිස් කළ යකඩයෙන් නිම කර ඇති ඉදිකිරීම් සහ කඩ කාමරවල ඇතුළත සීලිම හැර සිලීමේ සෙසු කොටස් අවම වශයෙන් වර්ෂයකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(ආ) කඩ කාමරවල ඇතුළත බිත්ති හැර සෙසු බිත්ති, කඩ කාමරවල ඇතුළත ගැල්වනයිස් කළ යකඩයෙන් නිම කර ඇති ඉදිකිරීම් සහ කඩ කාමරවල ඇතුළත සිලීම අවම වශයෙන් වර්ෂයකට එක් වරක් තීන්ත ආලේප කිරීම එකී කඩකාමරයේ බදුකරුගේ කාර්යය විය යුතු ය.

22. පොදු වෙළඳ පොළෙහි කිසියම් වෙළඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට 27 වන වගන්තිය යටතේ ටිකට් පතක් ලබා ගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් එකී ටිකට් පත අන්සතු කිරීම හෝ එකී ටිකට් පත නිකුත් කරනු ලැබ ඇත්තේ කිනම් වෙළඳ මැස්සක් සඳහා ද එකී වෙළඳ මැස්ස නොවන වෙනත් කිසියම් ස්ථානයක වෙළඳාම් කිරීම හෝ නොකළ යුතු අතර කවර හෝ තැනැත්තෙකු එසේ ක්‍රියා කරන තිබෙන බවට නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා සෑහීමට පත්වී ඇති අවස්ථාවක ඔහු නියමිත ස්ථානයේ වෙළඳාම් සඳහා යොමු කිරීමට නැතහොත් එකී දිනයේ වෙළඳාම් කටයුතුවලින් වළක්වා පොදු වෙළඳ පොළෙන් ඉවත් කිරීම හෝ ඔහු වෙත නිකුත් කරනු ලැබූ ටිකට් පත අවලංගු කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතු ය.

23. කිසියම් පොදු වෙළඳ පොළක කඩ කාමරයක් බද්දට ගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් හෝ කිසියම් වෙළඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ටිකට් පතක් ලබාගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් තමාගේ වෙළඳ කාර්යය සඳහා වෙන්කර ගත් එකී කඩ කාමරයේ හෝ වෙළඳ මැස්සේ ඉඩ කඩ නැතහොත් ඉන් කිසියම් කොටසක්, කවර හෝ භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙළෙදාම් කිරීමට හෝ වෙළඳාම් කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීමට හෝ වෙනත් කවර හෝ කාර්යයකට වෙනත් යම් තැනැත්තෙකුට ඉඩ දීම නොකළ යුතු ය.

24. බදුල්ල මහ නගර සභාව විසින් කලින් තීරණය කර තත් කාර්යය සඳහා බලය දී ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළඳ පොළෙහි කිසියම් කඩ කාමරයක නිර්මිත සැලැස්ම වෙනස් කරන හෝ එකී සැලැස්මට හානි කරන හෝ ආකාරයේ කිසිදු ඉදිකිරීමක් හෝ සවි කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ කොටු කිරීමක් නොකළ යුතු ය.

25. බදුල්ල මහා නගර සභාව විසින් කලින් තීරණය කර තත් කාර්යය සඳහා බලය දී ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළඳ පොළෙහි කිසියම් වෙළඳ මැස්සක නිර්මිත සැලැස්ම වෙනස් කරන හෝ එකී සැලැස්මට හානි කරන හෝ ආකාරයේ කිසිදු ඉදිකිරීමක් හෝ සවි කිරීමක් හෝ වෙනස් කිරීමක් කිරීම සහ පොදු වෙළඳ පොළ ඇතුළත කවර හෝ ස්ථානයක වෙළෙඳ මැස්සක් ඉදිකිරීම හෝ කොටු කිරීමක් නොකළ යුතු ය.

26. බදුල්ල මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළඳ පොළක් විවෘතව තැබිය යුතු දිනයන් සහ වේලාවන් කලින් කල බදුල්ල මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ය. බදුල්ල මහ නගර සභාව විසින් එසේ තීරණය කරනු ලැබූ ආකාරයට පොදු වෙළඳ පොළ විවෘතව තබන දිනයන් සහ වේලාවන් කවරේද යන්න භාෂාත්‍රයෙන් ම වූ දැන්වීමක් හෝ දැන්වීම් ප්‍රකටව පෙනෙන ආකාරයෙන් පොදු වෙළඳ පොළට ඇතුල්වීමේ දොරටුව අසල ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

27. *(අ)* පොදු වෙළඳ පොළෙහි කඩ කාමරවලින් බැහැර කොටසේ තනා ඇති කිසියම් වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම අවශ්‍ය කරන සෑම තැනැත්තෙකු ම මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බදුල්ල මහා නගර සභාවේ අධිකාරය මත හෝ ඒ යටතේ නිකුත් කළ වලංගු ටිකට් පතක් ලබා ගත යුතු ය.

*(ආ)* (අ) ඡේදයේ නියමය යටතේ නිකුත් කරනු ලබන ටිකට් පත මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත යුතු ය.

28. 27 වන වගන්තියෙහි නියමය යටතේ නිකුත් කරනු ලැබූ වලංගු ටිකට් පතක් දරන්නෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු හෝ වන්නේ නම් හා මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට හා කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස පොදු වෙළඳ පොළෙහි ගොඩනැගිල්ලේ කඩ කාමරවලින් යුතු කොටසෙන් බැහැරව තනා ඇති වෙළෙඳ මැස්සක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නොකළ යුතු ය.

29. 27 වන වගන්තියෙහි නියමය යටතේ පොදු වෙළඳ පොළෙහි ගොඩනැගිල්ලේ කඩ කාමරවලින් යුතු කොටසෙන් බැහැරව තනා ඇති වෙළඳ මැහි සඳහා බදුල්ල මහා නගර සභාවට ගෙවිය යුතු ගාස්තුව මෙහි දෙවන උපලේඛනයේ සඳහන් වගුවේ ආකාරයට බදුල්ල මහා නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට නියම කළ හැකි ය. ඒ ආකාරයට ම එකී ගාස්තු ප්‍රමාණයන් බදුල්ල මහා නගර සභාව විසින් කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම ද කරනු ලැබිය හැකි ය.

30. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ බදුල්ල මහා නගර සභාව සමග අත්සන් කළ බදු ගිවිසුමකට එළැඹ ඇති තැනැත්තෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු හෝ වන්නේ නම් සහ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල සහ එකී බදු ගිවිසුමේ සඳහන් නියමයන්ට හා කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළඳ පොළෙහි ගොඩනැගිල්ලේ කවර හෝ කඩ කාමරයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කරනු නොලැබිය යුතු ය.

31. *(අ)* පොදු වෙළඳ පොළෙහි ගොඩනැගිල්ලේ මස් කඩයක් නොවන කිසියම් කඩ කාමරයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට බදුකරුවෙකු තෝරා එකී කඩ කාමරය තෝරාගනු ලැබූ බදුකරුට බද්දට දීමේ කාර්යය ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් සිදු කිරීම බදුල්ල මහා නගර සභාවේ කාර්යය විය යුතු ය.

*(ආ)* (අ) ඡේදය යටතේ කිසියම් කඩ කාමරයක් බද්දට දීම සඳහා ටෙන්ඩර් කැඳවීමේ දී එකී කඩ කාමරය සඳහා ගෙවිය යුතු මාසික බදු කුලිය තීරණය කිරීම, ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුවට අනුව විය යුතු ය.

*(ඇ)* (අ) ඡේදය යටතේ බදුකරුවෙකු තෝරා ගැනීමට ටෙන්ඩර් කැඳවිය යුතු අවස්ථා වශයෙන් -

(i) බදුකරු විසින් ස්වකීය කැමැත්තෙන් ම බදු ගිවිසුම අවලංගු කරවා ගනු ලැබ ඇති අවස්ථාවක් ; හෝ

(ii) මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් කඩ කිරීම හෝ බදු ගිවිසුමේ කොන්දේසි කඩ කිරීම හේතුවෙන් බදු ගිවිසුම අවලංගු කර ඇති හෝ අවලංගු වී ඇතැයි සැලකෙන අවස්ථාවක් ; හෝ

(iii) කිසියම් බදුකරුවෙකුගේ කලත්‍රයා හෝ දරුවෙකු නොමැතිව සිටියදී බදුකරු මියගිය අවස්ථාවක් ; හෝ

(iv) නව වෙළඳපලක කඩ කාමර ප්‍රථම වරට බදු දෙන අවස්ථාවක් ; හෝ

සැලකිය යුතු අතර 35 වන වගන්තියෙහි සඳහන් නියමය පරිදි කිසියම් බදුකරුවෙකු විසින් යම් ඉදිරි වර්ෂයක් සඳහා එකී බදු ගිවිසුම වලංගු කරවා ගනු ලැබීම ප්‍රතික්ෂේප කර ඇත්තේ නම් හෝ එකී වලංගු කරවා ගැනීම උවමනාවෙන් ම මගහැර සිටින්නේ නම් මිස බදුල්ල මහා නගර සභාව සහ එකී බදුකරු එකඟ වී අත්සන් කරනු ලැබූ බදු ගිවිසුම අවලංගු වී ඇති සේ නොසැලකිය යුතු ය.

32. 31 වන වගන්තියෙහි නියමයන් යටතේ ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් කිසියම් කඩ කාමරයක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා තෝරා ගනු ලැබූ බදුකරු බදුල්ල මහා නගර සභාව සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

33. 31 වන අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණේ වුව ද මේ කොටසේ අතුරු ව්‍යවස්ථා බලාත්මක වන දිනය වනවිට බදුල්ල මහා නගර සභාව සතුව තිබෙන කිසියම් පොදු වෙළඳ පොළක එක් එක් කඩ කාමරය සම්බන්ධයෙන් මහා නගර සභාව සමග අවසන් වරට අත්සන් කරන ලද බදු ගිවිසුමේ සඳහන්, බදුකරු, එකී බලාත්මක දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි 31 වන වගන්තිය යටතේ එකී කඩ කාමරය පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට තෝරාගනු ලැබූ බදුකරු වශයෙන් සැලකීම නීත්‍යානුකූල වන්නේ ය. එසේම තවදුරටත් මේ අතුරු ව්‍යවස්ථාව අදාළ වන කවර හෝ බදුකරුවෙකු මේ කොටසේ අතුරු ව්‍යවස්ථා

බලාත්මක වන දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත 32 වැනි වගන්තියෙහි සඳහන් නියමයට අනුව නව බදු ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

34. *(අ)* 32 වැනි සහ 33 වැනි වගන්තිවල නියමයන් යටතේ බදුල්ල මහා නගර සභාව සමග අත්සන් කරනු ලැබූ යම් ගිවිසුමක් එක් වර්ෂයක කාලයක් සඳහා පමණක් වලංගු විය යුතු අතර එකී වර්ෂයක කාලය අවසන් වීමට මාසයකට පෙර ඉදිරි වර්ෂය සඳහා බදුල්ල මහා නගර සභාව සමග අලුත් ගිවිසුමකට එළැඹීමෙන් පසුව තවත් එක් වර්ෂයක කාලයක් සඳහා එකී කඩ කාමරයේ බදු කාලය වලංගු කරවා ගනු ලැබිය හැකි ය. ඒ ආකාරයෙන් ම යම් අනුගාමී වර්ෂයක් සඳහා එකී කඩ කාමරයේ බදු කාලය වාර්ෂිකව වලංගු කරවාගෙන එකී කඩ කාමරය පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට එකී බදුකරුට හිමිකම තිබිය යුතු ය.

*(ආ)* කෙසේ වුව ද (අ) ඡේදය යටතේ කිසියම් බදුකරුවෙකු විසින් අනුගාමී වර්ෂය සඳහා බදු කාලය වලංගු කරවාගෙන එකී කඩ කාමරය පාවිච්චි කරන හෝ පරිහරණය කිරීම සඳහා එකී අනුගාමී වර්ෂය තුළ ගෙවිය යුතු මාසික බදු කුලිය ප්‍රධාන තක්සේරුකරුගේ හෝ සභාව විසින් බලය දෙන ලද තක්සේරුකරුවකුගේ තක්සේරුව අනුව තීරණය කිරීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

35. කිසියම් කඩ කාමරයක බදු කාලය අවසන් වන දින සිට එක් මාසයක කාලයක් ගත වීමට මත්තෙන් 34 වැනි වගන්තිය යටතේ ඉදිරි වර්ෂය සඳහා බදු කාලය වලංගු කරවාගෙන ඇත්තේ නම් මිස කවර හෝ බදු කරුවෙකුට, පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට දී ඇති එකී කඩ කාමරය එකී මාසය අවසන් වන දිනෙන් පසුව පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට හිමිකමක් නොතිබිය යුතුය.

36. පොදු වෙළඳ පොළෙහි කිසියම් කඩ කාමරයක් අතුරු බදු ගැනීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය. කිසියම් තැනැත්තෙකු විසින් කිසියම් කඩකාමරයක් අතුරු බදු ගනු ලැබීම හේතුවෙන් එකී කඩ කාමරයේ බදුකරු සමග බදුල්ල මහා නගර සභාව එළැඹ ඇති ගිවිසුම අවලංගු කිරීම හේතුවෙන් හා එකී කඩ කාමරය ආපසු බදුල්ල මහා නගර සභාවට පවරා ගැනීම හේතුවෙන් එකී අතුරු බදුකරුට සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ පාඩුවක් එකී අතුරු බදුකරු වෙත ම පැවරෙන අතර බදුල්ල මහා නගර සභාව හෝ නාගරික කොමසාරිස්වරයා හෝ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ ඒ පිළිබඳව වගකීමට යටත් නොවනු ඇත.

37. බදුල්ල මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළඳ පොළක යම් කඩ කාමරයක බදුකරු විසින් එකී කඩ කාමරය අතුරු බදු දීම හෝ කුලියට දීම හෝ නොකළ යුතු අතර යම් බදුකරුවෙකු විසින් එකී කඩ කාමරය අතුරු බදු දීමකට හෝ කුලියට දීමකට ලක්කර ඇති බවට හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් හෝ එකී කාමරය බදු දීමට අදාළ බදු ගිවිසුමේ සඳහන් නියමයන් හෝ කඩකර ඇති බවට සෑහීමට පත්වන තරම් ප්‍රමාණවත් කරුණු ඇතැයි නාගරික කොමසාරිස්වරයාගේ මතය වන විට අදාළ බදුකරුට ඒ පිළිබඳව ලිඛිතව කරුණු දක්වමින් එකී අතුරු බදු දීම හෝ කුලියට දීම අවසන් කරන ලෙස දන්වා යැවීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ ය.

38. 37 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු විසින් එකී දැන්වීමේ සඳහන් කරුණුවලට එරෙහිව යම් විරෝධතාවක් හෝ විරෝධතා ඉදිරිපත් කිරීමට තමා වෙත කරුණු ඇත්නම් එකී දැන්වීමේ දින සිට දින 14 ක කාලයක් ඇතුළත, එකී විරෝධතාව හෝ විරෝධතා පිළිබඳව තමාට ඉදිරිපත් කිරීමට ඇති කරුණු ලිඛිතව සඳහන් කරමින් නාගරික කොමසාරිස්වරයාට අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා එකී බදුකරුට හිමිකම ඇත්තේ ය. එසේම එකී බදුකරු විසින් ලිඛිතව ඉදිරිපත් කරනු ලැබූ විරෝධතාව හෝ විරෝධතා ඇතුළත් කරුණු සඳහන් දැන්වීම නාගරික කොමසාරිස්වරයාට ලැබුණු දින සිට දින 14 ක කාලයක් ඇතුළත එකී විරෝධතාව හෝ විරෝධතා පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

39. 38 වැනි වගන්තියෙහි අනුව නාගරික කොමසාරිස්වරයා විසින් පවත්වනු ලැබූ විරෝධතා පරීක්ෂණයකදී 37 වැනි වගන්තියෙහි නියමයන් පරිදි නාගරික කොමසාරිස්වරයා විසින් යවනු ලැබූ ලිපියේ සඳහන් කරුණු නිවැරදි බවට තහවුරු වී ඇති අවස්ථාවක හෝ එකී විරෝධතා පරීක්ෂණ දිනය වනතෙක් ම එකී අතුරු බදු දීම හෝ කුලියට දීම නිවැරදි කිරීමට බදුකරු අපොහොසත්ව ඇති අවස්ථාවක බදුල්ල මහා නගර සභාව සමග එකී බදුකරු අත්සන් කරනු ලැබ ඇති බදු ගිවිසුම අවලංගු වී ඇති ලෙස සැලකිය යුතුවාත් හැර එකී විරෝධතා පරීක්ෂණය පැවැත්වූ දිනයේ සිට දින 7 ක් ඇතුළත එකී කඩ කාමරය බදුල්ල මහා නගර සභාව වෙත පවරා ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය. එසේම තවදුරටත් ආපසු පවරා ගනු ලැබූ කිසියම් කඩ කාමරයක් නැවත බදු දීම සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් 31 වැනි වගන්තියෙහි නියමයන් අනුගමනය කළ යුතු ය.

40. 36 වැනි වගන්තියෙහි සිට 39 වැනි වගන්තිය දක්වා වන වගන්තිවල කුමක් සඳහන්ව තිබුණ ද බදුල්ල මහා නගර සභාව සතු කිසියම් කඩ කාමරයක බදුකරුවෙකුගේ ඉල්ලීමක් මත හෝ බදුකරුවෙකු මියගිය අවස්ථාවක හෝ එකී බදුකරුගේ කලත්‍රයා හෝ දරුවෙකුට එකී කඩ කාමරයේ බදු අයිතිය පවරා දීමට එකී අතුරු ව්‍යවස්ථාවල නියමයන් බාධාවක් නොවිය යුතු ය.

41. *(අ)* බදුල්ල මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කවර හෝ පොදු වෙළඳ පොළක කඩ කාමරයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට තෝරා ගනු ලැබූ සෑම බදුකරුවකු විසින්ම -

(i) බදුකරුවන් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවන අවස්ථාව වන විට මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති වටිනාකමින් යුතු හා ආපසු ගෙවනු ලැබිය හැකි ඇප තැන්පත් මුදලක්,

(ii) 32 වැනි වගන්තියෙහි හෝ 33 වැනි වගන්තියෙහි නියමය යටතේ අත්සන් කරනු ලැබූ ගිවිසුමේ සඳහන් මාසික බදු කුලිය මෙන් තුන් ගුණයකට සමාන තැන්පත් මුදලක්,

බදුල්ල මහා නගර සභාවේ තැන්පත් කළ යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකුට බදුල්ල මහා නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළඳ පොළක කඩ කාමරයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ඉඩ දීම නොකළ යුතු ය.

(ඇ) 33 වැනි වගන්තිය අදාළ වන කිසියම් බදුකරුවකු එකී අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයෙන් බදුල්ල මහා නගර සභාව සමග ගිවිසුම් අත්සන් කළ දිනයේ සිට මාස හයක කාලයක් ගතවීමට මත්තෙන් (අ) ඡේදයේ නියමයන් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස එකී මාස හයක කාලය ඉකුත් වීමෙන් අනතුරුව එකී කඩ කාමරය පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය.

42\. *(අ)* පොදු වෙළඳ පොළෙහි කිසියම් කඩ කාමරයක් සඳහා බදුකරු විසින් බදුල්ල මහා නගර සභාවට ගෙවනු ලැබිය යුතු එක් එක් මාසයේ බදු කුලිය ගෙවිය යුතු දිනය එකී කඩ කාමරය බදු දීමට අදාළ ගිවිසුමෙහි නිශ්චිතව සඳහන් කර තිබිය යුතුවාත් හැර එකී දින හෝ එදිනට පෙර එකී බදු මුදල බදුල්ල මහා නගර සභාවට ගෙවීම බදුකරුගේ කාර්යය වන්නේ ය.

(ආ) කවර හෝ බදුකරුවකු විසින් (අ) ඡේදයේ නියම කර ඇති ආකාරයෙන් අත්සන් කළ ගිවිසුමට අනුව එකඟ වූ දිනයේ හෝ ඊට පෙර අදාළ මාසික බදු කුලිය බදුල්ල මහා නගර සභාවට ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක ගතවන සෑම මාසයකට හෝ ඉන් කොටසක් සඳහා අදාළ මාසික කුලියෙන් සියයට දහයක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට බදුකරු යටත් විය යුතුවාත් හැර මෙකී නියමය අදාළ ගිවිසුමෙහි ඇතුළත් කර තිබිය යුතු ය.

*(ඇ)* කිසියම් බදුකරුවෙකු විසින් බදුල්ල මහා නගර සභාවට ගෙවිය යුතු වන මාසික බදු කුලිය නොගෙවා පැහැර හැර ඇති හා එකී හිඟ බදු කුලිය මාස තුනක කාලයකට වඩා වැඩි වන යම් අවස්ථාවක, මෙහි (ඈ) ඡේදයේ සහ (ඉ) ඡේදයේ සඳහන් ප්‍රතිවිපාකයන් ද සඳහන් කරමින් එකී හිඟ මුදල සහ (ආ) ඡේදයේ සඳහන් ප්‍රමාද ගාස්තුව ගෙවන ලෙස බදුකරුට ලියවිල්ලකින් වන දැන්වීමක් භාරදීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය. එසේම මේ දැන්වීමට අනුව හිඟ බදු මුදල හා ප්‍රමාද ගාස්තු ගෙවීම තවදුරටත් පැහැර හරින්නේ නම් කඩ කාමරය මුද්‍රා තැබීමෙන් පසුව එහි තුළ ඇති බදුකරුට අයත් කවර හෝ දේපළක් විකිණීම සඳහා ක්‍රියා කරනු ලබන බවත් එසේ ක්‍රියා කරනු ලබන ඉදිරි දිනය කෙදිනක ද යන්නත් එකී දැන්වීමේ සඳහන් කර තිබිය යුතු ය.

*(ඈ)* (ඇ) ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ බදුකරුවෙකු විසින් තමාට ඒ දැන්වීම ලැබුණු දින සිට දින හතක් ඇතුළත එකී හිඟ බදු මුදල සහ ප්‍රමාද ගාස්තුව බදුල්ල මහා නගර සභාවට ගෙවීමට අපොහොසත් වන්නේ නම්, අදාළ කඩ කාමරය මුද්‍රා තැබීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

*(ඉ)* (ඈ) ඡේදයේ නියමයන් යටතේ ක්‍රියාකර එක් දිනක් ඉකුත් වීමෙන් පසුව හා දින හතක් ඉකුත් වීමට මත්තෙන් අදාළ බදුකරු හෝ ඔහුගෙන් ලියවිල්ලකින් බලය පවරන ලද වෙනත් කිසියම් අනුයෝජිතයෙකු එකී ස්ථානයට පැමිණ සිටී නම් ඔහු ඉදිරියේදී ද බදුකරු හෝ ඔහුගේ අනුයෝජිතයා පැමිණ නැත්නම් බදුල්ල මහා නගර සභාවේ වෙනත් යම් නිලධරයන් දෙදෙනෙකු ඉදිරිපිට දී එකී කඩ කාමරයේ දොරට හෝ දොරවල්වලට තබනු ලැබූ මුද්‍රා කඩා දොරවල් විවෘත කර එකී කඩ කාමරය ඇතුළත වූ බදුකරුට අයත් යම් දේපළක් ප්‍රසිද්ධියේ විකුණා එකී හිඟ බදු මුදල, ප්‍රමාද ගාස්තුව ද සහ කඩ කාමරය මුද්‍රා තැබීමට හා බදුකරුට අයත් යම් දේපළක් විකිණීමට වැය වූ කිසියම් මුදලක් අයකරගෙන බදුල්ල මහා නගර සභාවේ අරමුදලට බැර කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතුවාත් හැර එසේ කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(ඊ) *(ඈ)* ඡේදයේ සහ (ඉ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණද, එකී ඡේදවල සඳහන් ආකාරයෙන් ක්‍රියා කිරීමට සූදානම් වන කිසියම් අවස්ථාවක දී හෝ ඒ අවස්ථා දෙක අතරට යෙදෙන කවර හෝ අවස්ථාවක දී එකී හිඟ බදු මුදල, ප්‍රමාද ගාස්තුව සහ එසේ ක්‍රියා කිරීමට යාම නිසා ඒ වන විට බදුල්ල මහා නගර සභාවට දරන්නට සිදුවූ යම් මුදල් ප්‍රමාණයක් වේ නම් ඒ මුදල ද බදුල්ල මහා නගර සභාවට ගෙවා දැමීමෙන් (ඈ) ඡේදයේ හෝ (ඉ) ඡේදයේ සඳහන් යම් ආකාරයකින් ක්‍රියා කිරීම නතර කර ගැනීමට බදුකරුට හිමිකම තිබිය යුතුවාත් හැර එකී මුදල් සම්පූර්ණයෙන් ම අයකර ගැනීමෙන් පසුව එසේ ක්‍රියා කිරීමෙන් වැළකී සිටීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

*(උ)* මේ අතුරු ව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ සිට (ඊ) ඡේදය දක්වා වන කවර හෝ ඡේදයක් යටතේ හෝ ඉන් කිහිපයක් යටතේ හෝ ඒ ඡේද සියල්ලම යටතේ හෝ ක්‍රියා කිරීම හේතුවෙන් එකී කඩ කාමරය බදු දීමට අදාළව අත්සන් කළ ගිවිසුම අවලංගු වීම සිදුවී ඇති ලෙස තේරුම් නොගත යුතු ය.

(ඌ) (උ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද කිසියම් බදුකරුවෙකු විසින් යම් කඩ කාමරයක බදු මුදල් ගෙවීම පැහැර හරිනු ලැබීම හේතුවෙන් එක් වර්ෂයක් තුළදී (ඈ) ඡේදයේ නියම කළ ආකාරයෙන් එකී කඩ කාමරය මුද්‍රා තැබීම් අවස්ථා දෙකකට පසුව තවදුරටත් බදු මුදල් ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම්, නාගරික කොමසාරිස්වරයා විසින් ඒ පිළිබඳව එකී බදුකරුට ලියවිල්ලකින් දන්වා යැවීම කළ යුතුවාත් හැර එකී දැන්වීම බදුකරුට ලැබුණු දිනයේ සිට බදුල්ල මහා නගර සභාව සමග එකී බදුකරු විසින් අත්සන් කරනු ලැබූ ගිවිසුම අවලංගු විය යුතු ය.

43\. පොදු වෙළඳ පොළ ඇතුළත සෑම කඩ කාමරයක් වෙනුවෙන් ම ලබාගෙන ඇති ජල සම්බන්ධතාව සහ විදුලිය සම්බන්ධතාව මගින් කිසියම් බදුකරුවෙකු විසින් පරිභෝජනය කරනු ලබන ජල ඒකක ප්‍රමාණය සහ විදුලිය ඒකක ප්‍රමාණය වෙනුවෙන් මාසිකව ගෙවිය යුතු බිල්පත්වල වියදම එකී බදුකරු විසින් දැරිය යුතු ය.

44. පොදු වෙළඳ පොළ පරිශ්‍රයෙහි පොදු පරිභෝජනය සඳහා යොදවා ඇති කිසියම් විදුලි පරිපථයකින් හෝ පොදු ජල කරාමයකින් කවර හෝ කඩ කාමරයකට විදුලි සැපයුමක් හෝ ජල සැපයුමක් ලබා ගැනීම හෝ එසේ ලබා ගැනීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

45. පොදු වෙළඳ පොළෙහි කඩ කාමර හැර වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවශ්‍ය කරන යම් තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීමට හා එකී ටිකට් පත් සඳහා මුදල් අය කිරීමටත් නාගරික කොමසාරිස්වරයාගෙන් බලයලත් යම් නිලධාරියෙකු යොදවනු ලැබිය හැකි ය. එසේම යම් බලයලත් නිලධාරියෙකු විසින් එකී ටිකට් පත් නිකුත් කිරීමෙන් දිනපතා එකතු කරනු ලබන මුදල් එදින පස්වරු 3.00 පැයට පෙර බදුල්ල මහා නගර සභාවේ පොදු අරමුදලට බැර කිරීමට සැලැස්වීම එකී බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය. කිසියම් දිනයක එකී බලයලත් නිලධාරියා විසින් එකතු කරනු ලැබූ මුදල් බදුල්ල මහා නගර සභාවේ පොදු අරමුදලට බැර කිරීමෙන් පසුව, පොදු වෙළඳ පොළෙහි ටිකට් පත් නිකුත් කිරීමෙන් එකතු කරනු ලැබූ යම් මුදලක් වේ නම් එය අනුගාමී වැඩ කරන දිනයේ බදුල්ල මහා නගර සභාවේ පොදු අරමුදලට බැර කිරීම කළ යුතු ය.

46. පොදු වෙළෙඳ පොළෙහි කඩ කාමර හැර වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට යම් තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීම සහ ඒ සඳහා මුදල් එකතු කිරීම, 45 වැනි වගන්තියෙහි නියම කර ඇති ආකාරයෙන් නාගරික කොමසාරිස්වරයාගෙන් බලයලත් යම් නිලධාරියකු යෙදවීමට නොහැකි වන්නේ නම් එකී කාර්යය ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් තෝර ගනු ලබන (මෙහි මින් මතු "ගාස්තු එකතු කරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකුට පැවරීමට බදුල්ල මහා නගර සභාවට බලය තිබිය යුතු ය.

47. 46 වැනි වගන්තිය යටතේ තෝරා ගනු ලැබූ කිසියම් ගාස්තු එකතු කරන්නෙකුට එකී කාර්යය පැවරීම එක් වර්ෂයක් සඳහා පමණක් වලංගු විය යුතු අතර අනුගාමී වර්ෂය සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් මගින් ගාස්තු එකතු කරන්නෙකු තෝරා ගත යුතු ය. එසේ වුව ද කළින් වර්ෂය සඳහා තෝරා ගනු ලැබූ කිසියම් ගාස්තු එකතු කරන්නකුට අනුගාමී වර්ෂය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කිරීමටත් සහ එකී ටෙන්ඩර් අයදුම්පත්‍රය පිළිගැනීමට සභාව තීරණය කරන්නේ නම් ඔහු අනුගාමී වර්ෂය සඳහා ගාස්තු එකතු කරන්නා වශයෙන් තෝරා ගැනීමටත් මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් මගින් වළක්වා ඇති ලෙස තේරුම් නොගත යුතු ය.

48. (අ) 45 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ ගාස්තු එකතු කරන්නකු තෝරා ගනු ලැබූ විට ඔහු විසින් -

(i) එකී තෝරාගැනීම සඳහා ටෙන්ඩර් කැඳවන අවස්ථාව වන විට බදුල්ල මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති වටිනාකමින් යුතු හා ආපසු ගෙවනු ලැබිය හැකි ඇප තැන්පත් මුදලක් මහා නගර සභාවේ තැන්පත් කිරීමට,

(ii) එකී ටිකට් පත් නිකුත් කිරීම හා ගාස්තු එකතු කිරීම පිළිබඳව බදුල්ල මහා නගර සභාව සමග ගිවිසුමකට එළැඹීමට,

(iii) ඉහත (ii) වැනි ඡේදයේ නියමය යටතේ අත්සන් කරනු ලැබූ ගිවිසුමෙන් එකඟ වී ඇති වාර්ෂික ගාස්තුවෙන් තුනෙන් එකකට සමාන හෝ ඊට වැඩි තැන්පත් මුදලක් මහා නගර සභාවේ තැන්පත් කිරීමට,
ක්‍රියා කළ යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකුට බදුල්ල මහ නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් පොදු වෙළඳ පොළක වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීමට හා ඒ ටිකට් පත් වෙනුවෙන් මුදල් එකතු කිරීමට ඉඩ දීම නොකළ යුතු ය.

49. 29 වැනි වගන්තියෙහි නියමයන් යටතේ කිසියම් පොදු වෙළඳ පොළක වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට බදුල්ල මහ නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති ගාස්තුව ඉක්ම වූ ප්‍රමාණයක ගාස්තුවක් හෝ ගාස්තු අය කිරීම කවර හෝ ගාස්තු එකතු කරන්නකු විසින් නොකළ යුතු ය.

50. 48 වැනි අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ (II) වැනි අනුඡේදයේ නියමයට අනුව කිසියම් ගාස්තු එකතු කරන්නකු සමග බදුල්ල මහා නගර සභාව අත්සන් කරනු ලබන ගිවිසුමෙහි —

*(අ)* වෙළඳ මැහි පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා ටිකට් පත් නිකුත් කළ යුතු ආකාරය,

*(ආ)* එකී ටිකට් පත් සඳහා මුදල් අයකරන ආකාරය සහ අය කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය,

*(ඇ)* ගාස්තු එකතු කරන්නා විසින්, ගිවිසගන්නා වර්ෂය වෙනුවෙන් බදුල්ල මහ නගර සභාවට ගෙවිය යුතු සම්පූර්ණ මුදල,

*(ඈ)* එකී වාර්ෂික මුදල සමාන වාරික දොළහකින් මහ නගර සභාවට ගෙවිය යුතු බව සහ එක වාරිකයක වටිනාකම,

*(ඉ)* එක් එක් මාසය වෙනුවෙන් ගෙවිය යුතු මුදල බදුල්ල මහ නගර සභාවට ගෙවිය යුතු දිනය,

*(ඊ)* නියමිත දිනයේ දී මාසික මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් එකී මුදලේ ප්‍රමාණයෙන් සියයට දහයක ප්‍රමාණයකට සමාන මුදලක් සෑම මාසයක් හෝ ඉන් කොටසක් වෙනුවෙන් වූ ප්‍රමාද ගාස්තුවක් වශයෙන් බදුල්ල මහ නගර සභාවට ගෙවීමට එකතු කරන්නා යටත් වන බව,

(උ) බදුල්ල මහ නගර සභාවට ගෙවිය යුතු ගාස්තුව මාස තුනකට වඩා වැඩි කාලයක් ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් 51 වැනි වගන්තියෙහි නියමයන් අනුව ගිවිසුම අවලංගු කිරීමට යටත්වන බව සහ එකී ගිවිසුම අවලංගු කරන ලද බව නාගරික කොමසාරිස්වරයාගෙන් ලියවිල්ලකින් යුතු දැන්වීමක් ලැබුණු දිනයේ සිට එකී වෙළඳ පොළෙහි මැහි පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීමට තැනැත්තන්ට ටිකට් පත් නිකුත් කිරීම සහ ඒ ටිකට් පත් වෙනුවෙන් මුදල් අය කර ගැනීමට ගාස්තු එකතු කරන්නාට පැවරී තිබුණු බලය අවසන් වන බව, ගිවිසගත් කොන්දේසි වශයෙන් ඇතුළත් කිරීම බදුල්ල මහ නගර සභාවේ කාර්යය වන්නේ ය.

51. (අ) ගාස්තු එකතු කරන්නා විසින් මහ නගර සභාවට ගෙවිය යුතු වන මාසික ගාස්තුව නොගෙවා පැහැර හැර ඇති හා එකී හිඟ ගාස්තුව මාස තුනක ගාස්තුවට වඩා වැඩි වන යම් අවස්ථාවක, එකී හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තුව ගෙවන ලෙස ගාස්තු එකතු කරන්නාට ලියවිල්ලකින් වන දැන්වීමක් භාරදීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ ගාස්තු එකතු කරන්නෙකු විසින් තමාට ඒ දැන්වීම ලැබුණු දින සිට දින හතක් ඇතුළත එකී හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තුව බදුල්ල මහ නගර සභාවට ගෙවීමට අපොහොසත් වන්නේ නම්, එකී දැන්වීම ඔහුට ලැබුණු දිනෙන් දින හතක් ඉකුත් වූ දින සිට එකී ගාස්තු එකතු කරන්නා සමග බදුල්ල මහ නගර සභාව අත්සන් කළ ගිවිසුම අවලංගු විය යුතුවාත් හැර ඒ අවලංගු වීම නීත්‍යානුකූල වන්නේ ය. එසේම එකී ගිවිසුම අවලංගු වූ ලෙස සැලකෙන දිනයේ ම එකී ගාස්තු එකතු කරන්නා වෙත ඒ බව ලියවිල්ලකින් දන්වා යැවීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(ඇ) (ආ) ඡේදයේ නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව කවර හෝ අවස්ථාවක එකී ගිවිසුමේ පාර්ශ්වකරුවෙකු වන ගාස්තු එකතු කරන්නා විසින් එකී පොදු වෙළඳ පොළෙහි වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට කවර හෝ තැනැත්තෙකුට ටිකට් පතක් නිකුත් කරනු ලැබීම හෝ එකී ටිකට් පතක් නිකුත් කිරීම වෙනුවෙන් මුදල් එකතු කරනු ලැබීම හෝ නොකළ යුතු ය.

(ඈ) (ආ) ඡේදයේ නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව එළැඹෙන දිනයේ සිට එකී පොදු වෙළඳ පොළෙහි වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ටිකට් පත් නිකුත් කරනු ලැබීමට සහ එකී ටිකට් පත් වෙනුවෙන් මුදල් එකතු කරනු ලැබීමටත් බදුල්ල මහ නගර සභාවේ කිසියම් බලයලත් නිලධාරියෙකු යෙදවීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය. එසේම බලයලත් නිලධාරියෙකු ලවා එකී කාර්යය තව දුරටත් කරගෙන යාමට නොහැකි වන බව ලේකම්වරයාගේ මතය වන විට 46 වැනි වගන්තියෙහි සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම සඳහා තමාගේ මතය නාගරික කොමසාරිස්වරයා මගින් බදුල්ල මහ නගර සභාවට ඉදිරිපත් කළ යුතු ය. ඒ ආකාරයෙන් නාගරික කොමසාරිස්වරයාගේ මතය බදුල්ල මහ නගර සභාව වෙත වාර්තා වී ඇති අවස්ථාවක දී 46 වැනි වගන්තිය අනුව ක්‍රියා කිරීමට බදුල්ල මහ නගර සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ය.

(ඉ) (ඈ) ඡේදයේ සඳහන් ආකාරයෙන් 46 වැනි වගන්තිය අනුව ක්‍රියා කිරීමට මහ නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති යම් අවස්ථාවක, එකී ටෙන්ඩර් කැඳවීමට අනුව ටෙන්ඩර් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමට අවලංගු වී ඇති ගිවිසුමේ පාර්ශ්වකරු වූ ගාස්තු එකතු කරන්නාට හිමිකම නොතිබිය යුතු ය.

52. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ පෞද්ගලික වෙළඳ පොළක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

53. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වැනි දිනෙන් අවසන් විය යුතු ය.

54. 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පොදු වෙළඳ පොළකට අදාළ නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ පෞද්ගලික වෙළඳ පොළකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

55. කවර හෝ පෞද්ගලික වෙළඳ පොළක ඇතුළත කඩ කාමරවල සහ වෙළඳ මැහිවල වෙළෙඳාමේ යෙදෙන සෑම තැනැත්තෙකු ම 57 වැනි වගන්තියෙහි නියමයන්ට යටත් වූ වෙනස් කිරීම් සහිතව 2 වැනි වගන්තියෙහි සිට 21 වැනි වගන්තිය දක්වා වන වගන්තිවල නියමයන් පිළිපැදීම කළ යුතුවාත් හැර එකී තැනැත්තන් විසින් ඒ නියමයන් පිළිපදිනු ලබන බවට වගබලාගැනීම එකී වෙළඳ පොළෙහි බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

56. 64 වැනි වගන්තියෙහි නියමයන්ට යටත් වූ වෙනස් කිරීම් සහිතව 2 වැනි වගන්තියේ සිට 21 වැනි වගන්තිය දක්වා වන වගන්තිවල නියමයන් පිළිපැදීම සෑම පෞද්ගලික වෙළඳ පොළක ම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

57. කිසියම් පෞද්ගලික වෙළඳ පොළෙක් විවෘතව තබන දිනයන් සහ වේලාවන් කවරේද යන්න භාෂාත්‍රයෙන් ම වූ දැන්වීමක් හෝ දැන්වීම් ප්‍රකටව පෙනෙන ආකාරයෙන් එකී පෞද්ගලික වෙළෙඳ පොළට ඇතුල්වීමේ දොරටුව අසල ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

58. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් පොදු වෙළඳ පොළක හෝ පෞද්ගලික වෙළඳ පොළක විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ගබඩා කර ඇති කිසියම් ආහාර ද්‍රව්‍යයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ තැනැත්තෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

59. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට කිසියම් පොදු වෙළඳ පොළක් හෝ පෞද්ගලික වෙළඳ පොළක් වෙළෙඳාම් කටයුතු සඳහා විවෘත කර තබනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

60. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් පෞද්ගලික වෙළඳ පොළක් පවත්වාගෙන යනු ලබන ස්ථානය, 64 වැනි වගන්තිය සමග කියවිය යුතු 2 වැනි වගන්තියෙහි සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට හෝ නියමයන්ට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රලාභියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබීමට සලැස්විය යුතු ය.

61. 60 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

62. 61 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය නැතහොත් දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

63. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියෙකු, බදුකරුවකු හෝ පුද්ගලයකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහ නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ 03 වැනි උපවගන්තිය පරිදි,

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,

ii. දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද,

iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

64. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

*(අ)*" නාගරික කොමසාරිස්වරයා " හෝ "බදුල්ල මහ නගර සභාව" යන්න වෙනුවට එකී පෞද්ගලික වෙළඳ පොළෙහි බලපත්‍රලාභියා ද අදහස් විය යුතු අතර ඔහුගේ අනුයෝජිතයා හෝ ඒ අවස්ථාවේ එකී පෞද්ගලික වෙළඳ පොළෙහි බලපත්‍රලාභියාගේ කාර්යය හෝ කර්තව්‍ය භාරව සිටින යම් තැනැත්තෙකු ද, අදහස් විය යුතු ය.

*(ආ)* "බදුකරු" යන්න වෙනුවට එකී පෞද්ගලික වෙළඳ පොලෙහි කිසියම් කඩ කාමරයක වෙළෙඳාමේ යෙදෙන තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ ඒ අවස්ථාවේ එකි කඩ කාමරයේ පාලනය භාරව සිටින යම් තැනැත්තෙකු ද,

*(ඇ)* "පොදු වෙළඳ පොළ" යන්න වෙනුවට එකී පෞද්ගලික වෙළඳ පොළ ද,

*(ඈ)* "කලත්‍රයා" යන්නෙන්, කිසියම් බදුකරුවෙකුගේ නිත්‍යානුකූල භාර්යාව හෝ ස්වාමි පුරුෂයා ද,

*(ඉ)* "පොදු වෙළඳ පොළ" යන්නෙන්, වෙළඳාමක නියුක්ත වීම සඳහා ඉදිකළ කඩ කාමර හා තම තමන්ගේ ගෙවත්තේ හෝ නිවසෙහි නිෂ්පාදනය කරනු ලබන එළවළු හෝ පළතුරු ද ඇතුළු වෙනත් ද්‍රව්‍ය හෝ භාණ්ඩ විකිණීමට ස්ථාන ඇතිකර තිබෙන්නා වූ ද මහ නගර සභාව විසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන කිසියම් ස්ථානයක් අදහස් වන අතර කිසියම් නිෂ්පාදනයක් තොග වශයෙන් මිලදී ගැනීම හෝ විකිණීම කරනු ලබන ස්ථානයක් ද

*(ඊ)* "පෞද්ගලික වෙළඳ පොළ" යන්නෙන්, බදුල්ල මහ නගර සභාව නොවන වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් හෝ තැනැත්තන්ගේ මණ්ඩලයක් විසින් පොදු වෙළඳ පොළක කාර්යයට සමාන කාර්යයක් හෝ කාර්යයන් පවත්වාගෙන යනු ලබන කිසියම් ස්ථානයක් ද,

*(උ)* "ප්‍රධාන තක්සේරුකරු" යන්නෙන්, තක්සේරු, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු අදහස් වන අතර, බදුල්ල මහ නගර සභාව අයත් වන පරිපාලන දිස්ත්‍රික්කය වෙනුවෙන් එකී දෙපාර්තමේන්තුව විසින් පත් කරනු ලැබ ඇති යම් නිලධාරියෙකු ද,

(ඞ) "බදුකරු" යන්නෙන් බදුල්ල මහ නගර සභාව සමග ඇතිකර ගත් ගිවිසුමක් සහිතව කිසියම් පොදු වෙළඳ පොලක යම් කඩ කාමරයක් පවත්වාගෙන යනු ලබන තැනැත්තෙකු ද,

(ඹ) "වෙළෙඳ මැස්ස" යන්නෙන්, කිසියම් පොදු වෙළඳ පොලක කඩ කාමරවලින් වෙන් වූ හා එකී පොදු වෙළඳ පොළ ඇතුළත එදිනෙදා වෙළඳාම් කිරීම සඳහා ඉදි කරනු ලැබ ඇති කිසියම් බංකුවක් හෝ ලෑල්ලක් හෝ පෙට්ටියක් අදහස් වන අතර එකී පොදු වෙළඳ පොළෙහි පොළොව මත ඉරි සලකුණු ඇඳීමෙන් වෙළෙඳාම් කටයුතු සඳහා වෙන්කරනු ලැබ ඇති කවර හෝ ස්ථානයක් ද,

(ඕ) "බලපත්‍රධාරියෙකු" යනුවෙන් පෞද්ගලික වෙළඳපලක් පැවැත්වීම උදෙසා මහ නගර සභාවෙන් විධිමත් බලපත්‍රයක් ලබාගත් තැනැත්තෙකු ද.

අදහස් වන්නේය.

**පළමුවන උපලේඛනය**

27 වැනි වගන්තියෙහි (ආ) ඡේදය
(උප පත්‍රිකා පොතක් වශයෙන් සකසා ගත යුතු ය)

**බදුල්ල මහ නගර සභාව............................... පොදු වෙළඳ පොළ**
**වෙළඳ මැස්සක් පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීම සඳහා වන ටිකට් පත්‍රය**

ටිකට් පත හිමියාගේ නම : .................................
ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය : .................................
වෙන්කළ වෙළඳ මැස්සේ/ඉරි ඇඳි කොටසේ අංකය : .................................
වෙන්කර දෙනු ලැබූ කාලය : 20: .................................දින සිට 20 .................................දින දක්වා
වෙන් කළ දින ගණන: දින 01/දින 07/මාස 01 යි *
අයකර ගනු ලැබූ ගාස්තුව : රුපියල්.................................
නිකුත් කළ දිනය : .................................
*(අනවශ්‍ය වචන කපා හරින්න)

.................................
ගාස්තු එකතු කරන්නාගේ අත්සන.

**දෙවැනි උපලේඛනය**

29 වැනි අතුරු ව්‍යවස්ථාව

**පොදු වෙළඳ පොළක වෙළඳ මැස්සක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අයකරනු ලබන ගාස්තු චක්‍රය**

| *වෙළඳ මැස්සේ ස්වභාවය* | *දින 01 ක ගාස්තුව රු.* | *දින 07 ක ගාස්තුව රු.* | *මාසයක ගාස්තුව රු.* |
|---|---|---|---|
| පොළොවෙන් ඉහළට ඉදිකළ වෙළඳ මැස්ස | ...................... | ...................... | ...................... |
| පොළොව මත ඉරි සලකුණු යොදා වෙන්කළ කොටස | ...................... | ...................... | ...................... |

## XIII වැනි කොටස

### කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලූන් හල්

252 වැනි අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 14 වැනි උපවගන්තියට අනුව මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභාව විසින් බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලූන් හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන විධිමත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශයේ කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු හා සැලූන්හල් සහ හිසකෙස් සකස් කරන රූපලාවන්‍ය මධ්‍යස්ථාන විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින්, බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ කොණ්ඩා සැකසීමේ ස්ථානයක් හෝ බාබර් සාප්පුවක් හෝ සැලූන් හලක් හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වැනි දිනෙන් අවසන් විය යුතු ය.

4. *(අ)* මේ වගන්තියෙහි පහත සඳහන් (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් නියමයන් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසරිස්වරයා විසින් කවර හෝ කොණ්ඩා සැකසීමේ ස්ථානයක් හෝ බාබර් සාප්පුවක් හෝ සැලූන් හලක් හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

*(ආ)* කොණ්ඩා සැකසීමේ ස්ථානය හෝ බාබර් සාප්පුව හෝ සැලූන්හල හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට අදහස් කරන ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස -

(i) ශක්තිමත්ව නිමාකර තිබිය යුතු අතර එක් ගනුදෙනුකරුවෙකුට සේවා සැපයීම සඳහා වෙන්කරන ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර් 1.5කට නොඅඩු වනසේ එකවර සේවා සපයන ගනුදෙනුකරුවන් සංඛ්‍යාවට අනුරූපීව ප්‍රමාණවත් ඉඩකඩ සපයා තිබිය යුතු ය;

(ii) සේවා සපයා ගැනීමට බලාපොරොත්තුවෙන් පැමිණෙන කිසියම් ගනුදෙනුකරුවකුට, සේවා ලබාගන්නා ගනුදෙනුකරු ස්ථානගත කර ඇති ස්ථානයේ සිට අවම වශයෙන් මීටර් 1.5ක් දුරින් වනසේ පහසුවෙන් අසුන්ගෙන රැඳී සිටීමට ප්‍රමාණවත් ඉඩකඩ සපයා තිබිය යුතු ය;

(iii) ඇතුළත් වන බිත්ති ශක්තිමත් ද්‍රව්‍යවලින් තනා තිබිය යුතු අතර තීන්ත ආලේපකර තිබිය යුතු ය;

(iv) ඇතුළත් වන වහළය ලී හෝ වෙනත් ශක්තිමත් ද්‍රව්‍යයකින් තනා තිබිය යුතුවාත් හැර අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 2.25ක් උස සිවිලිමකින් යුක්ත විය යුතු ය. තව ද සිවිලිම සුදු පාටින් පින්තාරු කර තිබිය යුතු ය.

(v) ඇතුළත පොළොව සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු අතර බිත්තිය සහ පොළොව සම්බන්ධ වන ස්ථානය පිරිසිදු කිරීමට පහසු වන සේ වටකුරු හැඩයට සකස් කර තිබිය යුතු ය ;

(vi) ඇතුළත වායු සමීකරණය කර නොමැති ගොඩනැගිල්ලක් වන විට එහි භූමියේ වර්ග ප්‍රමාණයෙන් පහලොවෙන් එකකට නොඅඩු වා කවුළු සවිකර තිබිය යුතු අතර ප්‍රමාණවත් ආලෝකය ලැබීමට සලස්වා තිබිය යුතු ය ;

(vii) ඇතුළත වායු සමීකරණය කර ඇති ගොඩනැගිල්ලක් වන විට ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා තිබිය යුතු ය;

(viii) ගනුදෙනුකරුවන්ට සේවා සැපයීමේ දී සේදීම සඳහා ජලය භාවිත කරන්නේ නම් සෝදන බේසම් සවිකර තිබිය යුතු අතර පාවිච්චි කළ අප ජලය ගලායාමට ප්‍රමාණවත් නළ සවිකර තිබිය යුතු ය;

(ix) ඇතුළත භාවිත කර බැහැර කරන අප ජලය උරා ගැනීමේ වළකට ගලායාමට සලස්වා තිබිය යුතු අතර පොදු ජල මාර්ගයකට ගලායාමට සැලැස්වීම නොකළ යුතු ය ;

(x) ඇතුළත හෝ පරිශ්‍රය ඇතුළත ජලමුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු ය ;

(xi) ඇතුළත නිවාසයක කාර්යය සඳහා යොදා ගැනීම නොකළ යුතු අතර නිවාසය සඳහා යොදාගන්නා කොටසෙන් වෙන්කර තිබිය යුතු ය.

*(ඇ)* කොණ්ඩා සැකසීමේ ස්ථාන හෝ බාබර් සාප්පුව හෝ සැලුන්හල හෝ රූපලාවන්‍ය මධ්‍යස්ථාන -

(i) ගනුදෙනුකරුවන් සඳහා විවෘතව තබන සෑම අවස්ථාවක දී ම ප්‍රමාණවත් ජලසම්පාදනයක් ;

(ii) පවත්වාගෙන යාමේ දී පාවිච්චි කරන උපකරණ සහ මෙවලම් ජීවාණුහරණය සඳහා ප්‍රමාණවත් වන ජලය උතුරවන ක්‍රමයක් හෝ ජීවාණුහරණ ක්‍රමයක් සහ ජීවාණුහරණය සඳහා භාවිත කෙරෙන බඳුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ;

(iii) ඇතුළත සේවා සපයන්නන්ට ඔවුන්ගේ වැඩ කරගෙන යාමේ දී අත් සෝදා ගැනීමේ පහසුකම් සහිත බේසම් සහ සබන් හෝ සබන් දියර ;

(iv) ගනුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා සුදු පැහැයෙන් හෝ වෙනත් ලා පාටකින් යුක්ත වන එහෙත් තද පාටින් යුක්ත නොවන තුවා සහ උඩුකය ආවරණ වැස්ම ප්‍රමාණවත් සංඛ්‍යාවක් ;

(v) ස්ථානය තුළ කපන ලද කෙස් සහ වෙනත් අප ද්‍රව්‍ය දැමීම සඳහා හොඳින් වැසෙන පියනකින් යුත් එහා මෙහා ගෙන යා හැකි භාජනයක් ;

(vi) ස්ථානය තුළ විදුලියෙන් ක්‍රියාත්මක කරන උපකරණ යොදා ගන්නේ නම් එක් ගනුදෙනුකරුවෙකුගේ මේසයට අවම වශයෙන් එකක් බැගින් වනසේ ආරක්ෂිත විදුලි පේනු එකක් බැගින් ;

(vii) නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රමාණවත් ප්‍රථමාධාර උපකරණ හා ඖෂධ සහිත ප්‍රථමාධාර පෙට්ටියක්,

සපයා තිබිය යුතු ය.

5. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් සෑම ස්ථානයක ම සේවයේ යොදවා ඇති තැනැත්තෙකුට ම නාගරික කොමසාරිස්වරයා විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමාණයේ ප්‍රථමාධාර පුහුණුවක් හා අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් බැගින් වන ප්‍රථමාධාර පෙරහුරුවක් ලබා දී තිබිය යුතු ය.

6. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙකුම විසින් 4 වැනි වගන්තියේ (ආ) ජේදයේ සඳහන් ආකාරයට බලපත්‍රලත් ස්ථානයේ තීන්ත ආලේප කර තිබිය යුතු යයි නියම කර ඇති ස්ථාන අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතු ය.

7. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙකු ම විසින් බලපත්‍රලත් ස්ථානයේ ගෙබිම අවම වශයෙන් මාස තුනකට වරක් වත් විෂබීජනාශක යොදා සෝදා හැරීම කළ යුතු ය.

8. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුළත දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ නිදාගන්නා හෝ ආහාර ගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි නොකළ යුතු අතර වෙනත් යම් තැනැත්තෙකුට එසේ පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතු ය.

9. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුළත ආහාර පිසීම හෝ ආහාර විකිණීම හෝ විකිණීම සඳහා ආහාර ප්‍රදර්ශනය කිරීම හෝ නොකළ යුතු ය.

10.*(අ)* කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකු ට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස, කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

*(ආ)* හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. කවර හෝ ආකාරයක හෝ ආසාදන හෝ ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන නැතහොත් එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තෙකුට මෑතක දී උපස්ථාන කළ කිසියම් ගනුදෙනුකරුවෙකුට සේවා සැපයීමෙන් අනතුරුව -

*(අ)* එකී සේවා සැපයීම කළ තැනැත්තා යම් විෂබීජ නාශක ද්‍රව්‍යයක් යොදා තමාගේ දෑත් පිරිසිදු කරගෙන ඇත්තේ නම් මිස, වෙනත් යම් ගනුදෙනුකරුවෙකුට සේවය කිරීම හෝ සේවය කිරීමට ඉඩදීම හෝ නොකළ යුතු ය ;

(ආ) එකී ගනුදෙනුකරුවා සඳහා පාවිච්චි කළ කවර හෝ උපකරණයක් ජීවානුහරණය කර ඇත්තේ නම් මිස සහ පාවිච්චි කළ තුවා සහ උඩුකය ආවරණ වැස්ම විෂබීජ නාශක සහ සබන් යොදා සෝදා ඇත්තේ නම් මිස වෙනත් යම් ගනුදෙනුකරුවකු වෙනුවෙන් පාවිච්චි කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති සෑම සේවකයෙකු ම -

(අ) දිනපතා දිය නෑමෙන් හෝ ඇඟ සෝදා ගැනීමෙන් අනතුරුව පමණක් සේවයේ නියුක්ත වන බවට,
(ආ) අඳින ඇඳුම් හා පැළඳුම් පිරිසිදුව සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් වන බවට,
(ඇ) නියපොතු කොටට කපා කුණුවලින් තොරව තබා ගන්නා බවට, සහ
(ඈ) එක් එක් ගනුදෙනුකරු සඳහා සේවය කිරීමට පෙරාතුව සබන් ගා අත් සෝදා ගන්නා බවට,

සහතික වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

13. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා -

(අ) උපකරණ පාවිච්චි කරන එක් එක් වතාවට පසුව ජීවානුහරණය කිරීම ;
(ආ) බුරුසු සහ පනා සෑම දිනයකම පාවිච්චියට ගැනීමට පෙර හොඳින් සෝදා පිරිසිදු කර ජීවානුහරණය කිරීම ;
(ඇ) සියලුම පුතුරු, කෝප්ප සහ සබන් බුරුසු ඒවා ප්‍රයෝජනයට ගන්නා එක් එක් වතාවෙන් පසුව උණුවතුරෙහි ගිල්වා සෝදා හැරීම;

කරන බවට බලපත්‍රලාභියා සහතික විය යුතු ය.

14. බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබා ගන්නා එක් එක් ගනුදෙනුකරුගේ -

(අ) කොණ්ඩය හෝ රැවුල කැපීමෙන් සහ රූපලාවන්‍ය ක්‍රියාවකින් ඉවත් කරන කෙස් කැබලි හෝ වෙනත් අප ද්‍රව්‍ය අතු ගෑමෙන් හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන උරා ගන්නා යන්ත්‍රයක් මගින් හෝ එකතු කර, ඒ සඳහා වෙන්කළ භාජනයට දැමීම කරන බවට, සහ

(ආ) කොණ්ඩය හෝ රැවුල කැපීමට උපයෝගී කරගන්නා තල මාරු කළ හැකි දැළි පිහියේ තලය මාරු කරන බවට,

බලපත්‍රලාභියා සහතික විය යුතු ය.

15. දෛනික කටයුතු අවසානයේ හෝ අවශ්‍ය වන්නේ නම් දිනකට කිහිප වතාවක් බැගින් ඉවත් කරන කෙස් කැබලි ඇතුළත් බඳුනේ ඇති අප ද්‍රව්‍ය අවම වශයෙන් පොළොවෙන් මීටර් එකකට නොඅඩු ගැඹුරකින් වළ දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය. එසේ ම ඉවත දමන කෙස් කැබලි හෝ වෙනත් අප ද්‍රව්‍ය සුළඟේ ගසාගෙන යාම හෝ පරිශ්‍රය තුළ යම් පොදු ස්ථානයක විසිරී යාම වැලැක්වීමට ක්‍රියා කිරීම ද බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

16. බලපත්‍රලත් ස්ථානයේ රැස්කරන කෙස් කැබලි සහ වෙනත් අප ද්‍රව්‍ය 15 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයට බැහැර කිරීමට නොහැකි වන අවස්ථාවක දී බදුල්ල මහ නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල යටතේ නියම කරනු ලබන ආකාරයෙන් බදුල්ල මහ නගර සභාවේ කසළ රැස් කිරීමේ වාහනයකට භාර දීමට ක්‍රියා කළ යුතු ය.

17. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා අප ද්‍රව්‍ය රැස්කිරීමේ භාජනය හිස් කිරීමෙන් පසු පිරිසිදු කර විෂබීජ නාශක යෙදීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

18. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක -

(අ) කවර ආකාරයෙන් හෝ ලේ නවත්වන පැන්සල් වර්ගයක් හෝ පියරු මලක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් ; හෝ
(ආ) යම් ලේ ගැලීමක් නතර කිරීමේ කාර්යය සඳහා සීනක්කාරම් හෝ වෙනත් ද්‍රව්‍යයක්, එය කුඩු වශයෙන් හෝ ද්‍රව වශයෙන් ඇත්නම් මිස කිසිම ගනුදෙනුකරුවෙකු සඳහා පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩදීම හෝ; නොකළ යුතු ය.

19. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බලපත්‍රලාභියා විසින් පිරිසිදු තත්ත්වයෙන් නොමැති උඩු කය ආවරණ වැස්මක් හෝ සෝදනු ලැබීමෙන් පසු පළමුවරට පාවිච්චි කරන තුවායක් නොවන කිසියම් තුවායක් හෝ කවර හෝ ගනුදෙනුකරුවෙකුගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම නොකළ යුතු ය.

20. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් ස්ථානයකට නිකුත් කරන ලද බලපත්‍රයේ සඳහන් කාර්යයන් හැර වෙනත් කවර හෝ කාර්යයක් නාගරික කොමසාරිස්වරයාගේ ලිඛිත අවසරය ඇත්තේ නම් මිස නොකළ යුතු ය.

21. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට එකී ස්ථානයේ ගනුදෙනුකරුවන්ට සේවා සැපයීම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

22. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් ස්ථානයක් 4 වැනි වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක

නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැළැස්විය යුතු ය.

23. 22 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

24. 23 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

25. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංගනය කරන බලපත්‍රධාරියෙකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහ නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වැනි උපවගන්තිය පරිදි,

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,

ii. දෙවැනි වර කරන ලද වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකටද,

iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු.250 0 0) නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"උඩුකය ආවරණ වැස්ම" යන්නෙන්, බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබාගන්නා කිසියම් ගනුදෙනුකරුවෙකුගේ උඩුකය ආවරණය කිරීමට පාවිච්චි කරන කිසියම් ආවරණ රෙද්දක් අදහස් වේ.

## XIV වැනි කොටස

### අවමංගල්‍ය සේවා සැපයුම්

252 වැනි අධිකාරිය වන බදුල්ල මහ නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වැනි වගන්තියෙන් මහා නගර සභා ලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභා ප්‍රදේශයේ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහ නගර සභා ප්‍රදේශයේ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ ව වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාමේ කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්යය සඳහා අප්‍රසන්න හෝ අන්තරාදායක කර්මාන්තයක් හෝ වෙළඳ ව්‍යාපාරයක් ලෙස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

3. *(අ)* නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

*(ආ)* මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වැනි දිනෙන් අවසන් විය යුතු ය.

4. මේ වගන්තියෙහි සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය :-

(1) අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ඇතුළත මෘත දේහ සැකසීම පිණිස වෙන් වූ කාමරයක් තිබිය යුතු අතර එකී කාමරයේ එක් පුද්ගලයෙකුගේ මෘත දේහයක් සැකසීම සඳහා අවම වශයෙන් වර්ග මීටර් නවයකට නොඅඩු ඉඩකඩක් තිබිය යුතු ය එසේම එකී කාර්යය කිරීමට භාවිත කිරීමට ප්‍රමාණවත් කොන්ක්‍රීට් වේදිකාවක් තිබිය යුතු වන අතර එය පිඟන් ගඩොලින් බැඳ මනා නිමාවකින් පැවතිය යුතු ය ;

(2) මෘත දේහ සැකසීම කරනු ලබන කාමරය සෑම විටම අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් හෝ ශාලාවලින් වෙන්වී තිබිය යුතු අතර බාහිර පුද්ගලයන්ට අවසරයකින් තොරව ඇතුල්වීම වළක්වා තිබිය යුතු ය.

(3) මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයේ අභ්‍යන්තරයට පිරිසිදු වාතාශ්‍රය ලැබෙන පරිදි භාවිත කාමරයේ වර්ගඵලයෙන් හතෙන් එකකට නොඅඩු ප්‍රමාණයකට වූ වාතයට විවෘත වන කවුළු සකසා තිබිය යුතු අතර, ඒ පිළිබඳ කාර්යයන්හි නියුක්තවීම කිසිදු බාහිර පුද්ගලයකුට නොපෙනෙන ආකාරයෙන් තිබිය යුතු ය. එකී කවුළු අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය පිහිටි පරිශ්‍රයේ ආසන්න ඉඩම්වල ඇති නිවාස දෙසට එකඑල්ලේ විවෘත නොවී තිබිය යුතු ය;

(4) මෘත දේහයක් සැකසීම කිරීමේදී ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් තාවකාලිකව බහා ලීමට ප්‍රමාණවත් භාජන තිබිය යුතු අතර එකී කාර්යය කරන අවස්ථාවේදී මෘත ශරීරයෙන් බැහැරවන ලේ හෝ වෙනත් යම් දියර හෝ මෘත දේහය සේදීම කරනු ලබන්නේ නම් එකී අප ජලය රැස්කර ගැනීම සඳහා අපාරගම්‍ය හා මැස්සන්, මීයන් හෝ වෙනත් සතුන්ට ප්‍රවේශ විය නොහැකි වන සේ හොඳින් වසා තැබිය හැකි ආකාරයේ භාජන තබා තිබිය යුතුය ;

(5) බලපත්‍රලත් ස්ථානයේ මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමට ඉඩ සලසා ඇති විට කිසියම් මෘත දේහයකට අවසන් ගෞරව දැක්වීමට පැමිණෙන තැනැත්තන්ගේ පහසුව පිණිස ප්‍රමාණවත් ආසන සංඛ්‍යාවක් තැබීමට හා එසේ පැමිණෙන අයගේ වාහන නැවතීමට ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කර තිබිය යුතු ය :

(6) ගෞරවය සඳහා මෘත දේහයන් තැන්පත් කර තැබීමේ ස්ථානය, ඒ අවමංගල්‍යය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් හා මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයෙන් වෙන්කර තිබිය යුතු ය:

(7) මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල දෙවැනි උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් ලේඛනයක් තිබිය යුතු ය.

.5. අවමංගල්‍ය සේවා ස්ථානයක් සඳහා බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය සෑම තැනැත්තෙකු ම විසින් මේ කොටසේ පළමුවැනි උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කරගත් අයදුම්පත්‍රයක් නාගරික කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. මෘත දේහයක් සැකසීමේ දී ඉවත් කරනු ලබන හෝ ඉවත් වන මෘත ශරීර කොටස්, මහෙස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ විසින් ඒ පිළිබඳව ලබා දී ඇති නියෝගයක් නොමැති නම්, එකී කොටස් ඒ කාර්යය අවසන් වී පැය හයක් ගතවීමට මත්තෙන් පොළොවේ මතුපිට සිට මීටර් 1.5ක් ගැඹුරු වළක වල දමා මැනවින් වසා දැමිය යුතු ය.

7. මෘත දේහයක් සැකසීමේ දී ඉවත් කරනු ලබන හෝ ඉවත්වන මෘත ශරීර කොටස් පිළිබඳව මහෙස්ත්‍රාත්වරයකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු හෝ 'විසින් නියෝගයක් කර ඇති විටක, ඒ නියෝගයට අනුව ක්‍රියා කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

8.. 6 වැනි වගන්තියෙහි කාර්යයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ නොමැති විටක, සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසුව එකී කාර්යය බදුල්ල මහ නගර සභාවේ පොදු සුසාන භූමිය ඇතුළත, ඒ අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ගැඹුරක වළදමා වසා දැමිය යුතු ය.

9. මෘත දේහ සැකසීම කරන කාමරය නිරන්තරයෙන් විෂබීජ නාශක යොදා පිරිසිදුව පවත්වාගැනීම කළ යුතු ය. එසේ ම අවශ්‍ය අවස්ථාවක දී කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනයට ලබා ගත හැකි වන පරිදි එකී ස්ථානයේ ප්‍රමාණවත් ප්‍රථමාධාර හා වෙනත් අවශ්‍ය උපකරණ තිබිය යුතු ය.

10. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල සාමාජිකයන් පිළිබඳව වාර්තා පවත්වා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරවල වැඩ කරන සියලුම සේවකයන්ට නාගරික කොමසාරිස්වරයා විසින් නිර්දේශ කරනු ලබන ආකාරයේ ආරක්ෂිත ඇඳුම්, මුව වැසුම් හා අත් වැසුම් ලබාදීම සහ මෘත දේහ සැකසීම කරනු ලබන අවස්ථාවේ දී එකී සේවකයන් ඒ ඇඳුම්වලින් හා පැළඳුම්වලින් සැරසී අදාළ කාර්යයේ නියුක්ත වන බවට වග බලා ගැනීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයන් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

13. මෘත දේහ ප්‍රවාහනය කරනු ලබන රථය හෝ රථ ඇතුළත, අවම වශයෙන් එක් දිනකට එක් වතාවක් බැගින් රික්ත ශෝධක මගින් පිරිසිදු කර විෂබීජ නාශක යොදා තිබිය යුතු ය.

14. අධික වශයෙන් තුවාල හෝ හානි සිදුවීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා සැකසීම කළ නොහැකි අන්දමින් පවතින මෘත දේහ හැර වෙනත් මෘත දේහ තැන්පත් කරනු ලබන පෙට්ටියක ඇතුළත හෝ මෘත දේහය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් හෝ ආවරණය කිරීම පිණිස පොලිතීන් හෝ දිරාපත් නොවන වෙනයම් ද්‍රව්‍යයක් හෝ භාවිත නොකළ යුතු ය.

15. සෑම බලපත්‍රලාභියෙකු විසින් ම යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තෙකු හැර වෙනත් කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් මෘත දේහයක් සැකසීම හෝ මෘත දේහයක් ප්‍රවාහනය කිරීම හෝ නොකළ යුතු ය.

16. නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඔහු විසින් ඒ වෙනුවෙන් බලපත්‍රලාභියාට දෙන ලද ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස කොළරාව, මහාමාරිය, වසූරිය, කහ උණ හෝ ඒඩ්ස් රෝගයෙන් මියගොස් ඇති බවට සැලකෙන කිසියම් තැනැත්තෙකුගේ මෘත දේහයක් බලපත්‍රලත් ස්ථානය වෙත ගෙන ඒම හෝ ගෙන ඒමට ඉඩදීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

17. කිසියම් මෘත දේහයක් සැකසීමට සහ අවමංගල්‍ය කටයුතු සංවිධානය පිණිස භාර ගැනීමට පෙර එකී මරණය සම්බන්ධයෙන් මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබූ විධිමත් මරණ සහතිකයක් තමා වෙත ඉදිරිපත් කර ඇත්තේ නම් මිස එකී කාර්යයන් සඳහා මෘත දේහයක් භාර ගැනීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය.

18. කිසියම් මෘත ශරීරයකට අදාළ මරණය හදිසි මරණයක් වන විටක හෝ එකී මරණය සැක සහිත වන විටක මහෙස්ත්‍රාත්වරයෙකු විසින් හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව නිකුත් කරනු ලැබූ වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ නම් මිස එකී මෘත ශරීරය සැකසීම හෝ සැකසීම සඳහා භාරගැනීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

19. මහෙස්ත්‍රාත්වරයෙකු විසින් හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු විසින් කරනු ලැබූ හදිසි මරණ පරීක්ෂණයකින් අනතුරුව නිකුත් කරනු ලැබූ වාර්තාවක් මඟින් එකී මෘත දේහයේ අවසන් කටයුතු සම්බන්ධයෙන් දෙනු ලැබ ඇති කිසියම් නියෝගයක් වේ නම් බලපත්‍රලාභියා විසින් එකී නියෝගයේ විධිවිධාන පිළිපදිනු ලැබිය යුතු ය.

20. බලපත්‍රලත් ස්ථානයේ දී හෝ වෙනත් කිසියම් බාහිර ස්ථානයක දී හෝ සිදුකරනු ලබන සෑම මෘත දේහ සැකසීමක් ම සහ අවමංගල්‍ය සේවා සැපයීමක් ම පිළිබඳව මේ කොටසේ දෙවැනි උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කර ගත් ලේඛනයක් පවත්වාගෙන යාම සහ එකී ලේඛනය නාගරික කොමසාරිස්වරයා විසින් හෝ බලයලත් නිලධාරියෙකු විසින් හෝ කිසියම් පොලිස් නිලධාරියෙකු විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

21. මහජන ගෞරවය පිණිස මෘත දේහ තබා ගැනීමේ සේවාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් සම්බන්ධයෙන් වන විට එකී ස්ථානයේ තැන්පත් කර තබන කිසියම් මෘත දේහයකට සහ එකී මෘත දේහයේ භාරකරුවන්ට නිසි ගෞරව ලැබෙන අයුරින් එකී මෘත දේහය ප්‍රදර්ශනය කිරීම කළ යුතු ය.

22. මහජන ගෞරවය පිණිස මෘත දේහයක් තබනු ලබන ස්ථානය පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

23. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය ආසන්නයේ පදිංචිකරුවන්ට කරදරකාරී වන්නා වූ හෝ පීඩාකාරී වන්නා වූ හෝ කවර හෝ කාර්යයක් අවමංගල්‍ය සේවා ස්ථානයේ පරිශ්‍රය තුළ දී සිදුකිරීම හෝ එසේ කිරීමට ඉඩදීම හෝ කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

24. *(අ)* බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) අන්තරායකර අපද්‍රව්‍ය

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් වන අපද්‍රව්‍ය යන්නට කිසියම් මෘත ශරීර කොටස් ඇතුළත් නොවිය යුතු අතර, මෘත දේහයෙන් ඉවත් කරනු ලබන කිසියම් මෘත ශරීර කොටසක් හෝ කොටස් අවස්ථාවෝචිත පරිදි 6 වන වගන්තියේ හෝ 7 වන වගන්තියේ සඳහන් ආකාරයට බැහැර කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ඇ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය නගර සභාවේ අපද්‍රව්‍ය බදුල්ල මහ නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

25. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට බලපත්‍රලත් ස්ථානයේ මෘත දේහ සැකසීම කරනු ලබන හෝ කිසියම් මෘත ශරීරයක් මහජන ගෞරවය පිණිස තබා ඇති ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

26. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වැනි වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට හෝ නියමයන්ට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ කරන ලෙසට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රලාභියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

27. 26 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියාකළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

28. 27 වැනි අතුරු වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

29. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහානගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

30. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

I. "බලපත්‍රධාරියෙකු" යනුවෙන් හඳුන්වනු ලබන්නේ අවමංගල්‍ය සේවා සැපයුම් අයිතිකරු ද,

II. "අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය" යන්නෙන්, කිසියම් මෘත ශරීරයක් කල් තබා ගත හැකි වන පරිදි සැකසීම කරනු ලබන හෝ මෘත ශරීරයක් අවසන් කටයුතු සඳහා සැකසීම කරනු ලබන හෝ අවසන් කටයුතු කිරීමට සුසාන භූමියක් දක්වා ගෙන යනු ලබන තෙක් කිසියම් මුදලක් අයකර මහජන ගෞරවය පිණිස තබා තිබෙන ස්ථානයක් ද,

III. "මෘත දේහ සැකසීම" යන්නෙන්, මියගිය පුද්ගලයෙකුගේ මෘත දේහයක් අවසන් ගෞරව පිණිස කල් තබා ගත හැකිවන ආකාරයට පිළියෙල කිරීම, එකී මෘත දේහයට ඇඳුම් ඇන්දවීම, මෘත දේහය යම් පෙට්ටියක තැන්පත් කිරීම හා එකී කාර්යය සඳහා අවශ්‍යවන වෙනත් ඕනෑම කාර්යයක් සිදු කිරීම ද,

IV. "මෘත ශරීර කොටස් " යන්නෙන්, මියගිය පුද්ගලයකුගේ මෘත දේහයෙන් ඉවත් කරනු ලබන යම් ශරීර අවයවයක් හෝ ඉන් කොටසක් හෝ අභ්‍යන්තර කොටසක් හෝ මෘත ශරීරයෙන් බැහැරවන හෝ බැහැර කරන ලේ හෝ වෙනත් යම් දියරක් හෝ මියගිය අය ඒ අවස්ථාවේ දී හැඳ සිටි යම් ඇඳුමක් හෝ ඇඳුම් හෝ ඉන් කොටසක් හෝ මියගිය අයගේ ශරීරයේ තිබූ කිසියම් තුවාලයක හෝ වෙනයම් හේතුවක් නිසා ඔහුගේ ශරීර අභ්‍යන්තරයේ තිබූ හෝ තිබෙන වෙලුම්පටි, පුළුන් හෝ වෙන යම් ද්‍රව්‍යයක් ද,

අදහස් වේ.

***පළමු වැනි උපලේඛනය***

*5 වන වගන්තිය*

අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලීම

01. අයදුම්කරුගේ නම :......................................................................................................................................................

02. ලිපිනය :.........................................................................................................................................................

03. ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය:.................................................................................................................................

04. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ ව්‍යාපාරික නාමය සහ එකී ස්ථානයේ ලිපිනය:....................................................................

05. එක් වරක දී සැකසීම පිණිස තබා ගත හැකි මෘත දේහ සංඛ්‍යාව :..............................................................................................

06. ආයතනය සතු අවමංගල රථ සංඛ්‍යාව :...............................................................................................................................

07. මෘත දේහ සැකසීමට පෙර ප්‍රවාහනය පිණිස යොදවා ඇති වාහන සංඛ්‍යාව:................................................................................

08. ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් අපහරණය කරනු ලබන ආකාරය :...............................................................................

09. ගෞරව දැක්වීම පිණිස මෘත දේහ තැන්පත් කර තැබීම භාරගනු ලබන්නේ නම් -

(i) එකවර තැන්පත් කර තැබිය හැකි මෘත දේහ සංඛ්‍යාව :..................................................

(ii) ගෞරව දැක්වීමට පැමිණෙන අයගේ වාහන කොපමණ ප්‍රමාණයක් එකවර නවතා තැබිය හැකි ද ?:..................................................

10. ස්වාභාවික මල් තබා ගැනීම හා විකිණීම කරනු ලබන්නේ ද ? ඔව්/නැත

11. ඉවතලන ස්වාභාවික මල් හෝ ශාක කොටස් ඉවත් කරනු ලැබීමට අපේක්ෂා කරන ආකාරය:..................................................

12. ආයතනයේ සේවය කරන සේවක සංඛ්‍යාව:..................................................

13. කළමනාකරුවෙකු පත්කර ඇත්නම් ඔහුගේ -

(i) නම :..................................................

(ii) ජාතික හැඳුනුම්පත් අංකය:..................................................

14. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන ඒ අයුරින්ම පිළිපැදීමටත් හා කලින් කල නගර සභාව විසින් නියම කරනු ලබන වෙනත් සෞඛ්‍යාරක්ෂක නියමයන් පිළිපැදීමටත් එකඟ වන බව මෙහි පහත අත්සන් කිරීමෙන්ම පිළිගනිමි.

..................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය:..................................

දෙවන උපලේඛනය

20 වන වගන්තිය

අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ හෝ වෙනත් යම් බාහිර ස්ථානයක සැකසීම කරනු මෘත දේහ පිළිබඳ විස්තර ලේඛනය

අවමංගල්‍ය සේවා සැපයුම් ආයතනයේ නම :
ලිපිනය :

| අනු අංකය | මියගිය අයගේ නම | ජා. හැ. ප. අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | මියගිය දිනය | මරණ සහතිකය ලියාපදිංචි කළ | | මෘත දේහය භාරගත් | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අංකය | දිනය | දිනය | වේලාව |
| 01. | | | | | | | | |
| 02. | | | | | | | | |

(සැ. යු. මෙම කොටස ලේඛනයේ වම් පසට ගන්න. පහතින් දැක්වෙන කොටස ලේඛනයේ දකුණු පසට ගන්න)

| මෘතදේහය භාරකරුගේ | | | | හදිසි මරණ පරීක්ෂක/ මහෙස්ත්‍රාත් නියෝගයේ | | භාරකරුගේ අත්සන |
|---|---|---|---|---|---|---|
| නම | මරණකරුට ඇති නෑකම | ලිපිනය | ජා. හැ. ප. අංකය | යොමු අංකය | දිනය | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

## XV වැනි කොටස

### ගවයන් සහ එළුවන් සඳහා අංගන

252 වන අධිකාරිය වන බදුල්ල මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තියෙන් මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභා ප්‍රදේශයේ ගවයන් සහ එළුවන් සඳහා අංගන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ ගවයන්, බැටළුවන් හෝ එළුවන් විකිණීම හෝ ඇති කිරීම සඳහා පවත්වා ගනු ලබන අංගන හෝ එකී සතුන් ඇති කරන ස්ථාන විධිමත් කිරීම, හෝ පාලනය කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. ගවයන්, බැටළුවන් හෝ එළුවන් සඳහා අංගන හෝ එකී සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාමේ කර්මාන්ත හෝ ව්‍යාපාර මහ නගර සභා ආඥා පනතේ 147 වැනි වගන්තිය යටතේ කාර්යයන් සඳහා අප්‍රසන්න හෝ අන්තරාදායක කර්මාන්තයක් හෝ වෙළඳ ව්‍යාපාරයක් ලෙස මෙයින් ප්‍රකාශ කරන ලදී.

3. මහා නගර සභා බල ප්‍රදේශය තුළ කවර හෝ ස්ථානයක, එනම්, ගවමඩු හෝ ගවයන්, බැටළුවන් හෝ එළුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකට තබා ගන්නා හෝ එකට සිටීමට ඉඩ හරිනු ලබන අංගන යන මෙයින් කුමක් හෝ අයිතිකරු හෝ පරිහරණය කරන්නාවිසින්, ඉහත කී යම් කාර්යයන් සඳහා ඒ ස්ථානය පාවිච්චි කිරීමට වාර්ෂික බලපත්‍රයක් ලබා ගැනීම සඳහා නාගරික කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කළ යුතුය.

4. එක් එක් බැටළුවකු හෝ එළුවෙකු සඳහා සහ වයස එක් අවුරුද්දකට වැඩි, බර අදින ගවයන් හැර එක් එක් ගවයකු සඳහා සභාව විසින් කලින් කල නියම කරනු ලබන ගාස්තුව ගෙවූ විට, බැටළුවන් හෝ එළුවන් තුන් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් හෝ තබා ගැනීම සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් බලපත්‍රයක් දිය හැකිය. එවැනි බලපත්‍රයක් එය නිකුත් කරනු ලබන වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනෙන් පසු බලාත්මක නොවිය යුතුය.

5. නාගරික කොමසාරිස්වරයා විසින්, ඔහුගේ අභිමතය පරිදි සහ සුදුසු යයි ඔහු කල්පනා කරන සීමා කිරීම්වලට සහ නියෝගවලට යටත්ව ඒ බලපත්‍රයක් ප්‍රදානය කිරීම හෝ ප්‍රදානය කිරීමට ප්‍රතික්ෂේප කිරීම හෝ කළ හැකි අතර, කවර වේලාවක වුව ද, ඒ බලපත්‍රයක් අවලංගු කිරීම හෝ තාවකාලික අත්හිටුවීම කළ හැකිය. එවැනි බලපත්‍රයක් ප්‍රදානය කිරීම, ප්‍රතික්ෂේප කරන, අවලංගු කරන හෝ තාවකාලිකව අත්හිටුවන සෑම නියමයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එයට හේතුව එහි ප්‍රකාශ විය යුතුය.

6. එවැනි බලපත්‍රයක් නොමැතිව හෝ නාගරික කොමසාරිස්වරයා විසින් බලපත්‍රය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන්, අවලංගු කිරීමෙන් හෝ තාවකාලිකව අත්හිටුවීමෙන් පසුව හෝ කිසිම තැනැත්තෙකු විසින් එකී කවර හෝ කාර්යයක් සඳහා, යම් ස්ථානයක් පාවිච්චි කිරීම හෝ ඒ බලපත්‍රය ප්‍රදානය කර ඇත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි කිසිවක් කඩ කිරීම හෝ නොකළ යුතු ය.

7. එසේ වුවද, රජය විසින් හෝ පළාත් සභාව විසින් පරිහරණය කරනු ලබන හෝ රජය විසින් හෝ පළාත් සභාවේ පාලනය යටතේ පවත්නා ඉහත සඳහන් කවර හෝ ස්ථානයකට මේ වගන්තිය අදාළ නොවිය යුතු ය.

8. ගවයන් හෝ වෙනත් සිවුපා සතුන් විකිණීම හෝ කුලියට දීම සඳහා හෝ ඒ සතුන් විකිණීම සඳහා හෝ තබා ගැනීමේ කාර්යය සඳහා, යම් ස්ථානයක් පාවිච්චි කිරීම පිණිස නාගරික කොමසාරිස්වරයාගෙන් බලපත්‍රයක් ලබාගෙන ඇති සෑම තැනැත්තෙකුම තත් කාලයඑකී ස්ථානයෙහි තබාගෙන ඇති යම් ගවයින් හෝ වෙනත් සිවුපා සතුන්ගේ අයිතිකරුවන් වන එක් එක් තැනැත්තාගේ නම සහ ඔහුට හෝ ඔවුන්ට අයිති සතුන් සංඛ්‍යාව හෝ පිළිවෙලින් එක් එක් වර්ගයේ සතුන් සංඛ්‍යාව ඇතුළත් ලිඛිත ප්‍රකාශයක් කලින් කල නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබූ අවස්ථාවක සැපයිය යුතු ය.

9. බලපත්‍රධාරියා විසින් එකී ස්ථානයෙහි තබාගෙන සිටින යම් ගවයින්ගේ හෝ වෙනත් සිවුපා සතුන්ගේ වසුරු, යම් කිරි දෙනුන්ගේ හෝ වෙනත් සිවුපා සතුන්ගේ හෝ කිරි පට්ටියක හෝ ප්‍රයෝජනය සඳහා, පාවිච්චි කරන නැතහොත් පාවිච්චි කිරීමට ඇති භාජන පිරිසිදු කිරීම හෝ සේදීම සඳහා හෝ ප්‍රයෝජන ගැනීමට සපයා ඇති හෝ ප්‍රයෝජන ගන්නා හෝ ප්‍රයෝජන ගැනීමට ඉඩ ඇති ජලය අපවිත්‍ර හැකි ස්ථානයක හෝ අපවිත්‍ර විය හැකි ආකාරයට තැන්පත් කිරීමට සැලැස්වීම හෝ ඉඩ හැරීම හෝ නොකළ යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයට බලපත්‍රධාරියා විසින් එම ස්ථානයේ රඳවාගෙන ඇති සතුන්ගේ ප්‍රයෝජනය සඳහා බීමට සුදුසු පිරිසිදු ජලය සපයා තිබිය යුතුය. එසේම, රෝග වළක්වා ගැනීම සඳහා, එන්නත් හෝ ඖෂධ ලබා දීමේ දී නාගරික පශු වෛද්‍යවරයාගේ නිර්දේශය මත එය කළ යුතු ය.

11. සතුන් ගාල් කිරීම සඳහා පාවිච්චි කරන හෝ පාවිච්චි කිරීමට ඇති සෑම ගොඩනැගිල්ලක්ම බිම ඒ සතුන්ගේ මුත්‍රා හෝ වෙනත් අපද්‍රව්‍ය දෑ පොළවට උරාගැනීම වළක්වනු පිණිස නාගරික කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි බෑස්මක් ඇතිව ගල් අතුරා හෝ වෙනත් යෝග්‍යද්‍රව්‍යයකින් සාදා ජල අපවහනය වන සේ බලපත්‍රධාරියා විසින් සකස් කළ යුතු ය.

12. (i) එවැනි යම් ගවයින් හෝ වෙනත් සිවුපා සතුන් එම ස්ථානයේ ඉහත කී පරිදි තබා ගැනීමේ දී කලින් කල එකතු වන වසුරු පොහොර කුණු කසළ අපවිත්‍ර දෑ හෝ වෙනත් පීඩාකාරී හෝ හානිකර ද්‍රව්‍ය සඳහා එකී ස්ථානයට ආසන්න තැනක තනනු ලබන යෝග්‍ය ග්‍රාහකයන් හෝ ග්‍රාහක ඔහු විසින් නාගරික කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි සැපයිය යුතු ය.

(ii) බලපත්‍රධාරියා විසින් එම ග්‍රාහකයා හා ග්‍රාහක තැනීම, ඒවායේ අඩිය හෝ පතුළ කිසිම විටක යාව ඇති බිමෙහි මතුපිට මට්ටමට පහත් නොවන ආකාරයට සිදු කරවිය යුතු ය.

(iii) එම ග්‍රාහකවල ඇති ද්‍රව්‍ය පිට නොවන පරිදි ඒවායින් පොළොවට හෝ යම් ගොඩනැගිල්ලක බිත්තිවලට උරාගැනීමක් සිදු නොවන පරිදි ද වන ආකාරයකින් සහ ද්‍රව්‍යවලින් එම ග්‍රාහකයා හෝ ග්‍රාහක තැනීමට ද එවැනි තත්ත්වයකින් ඒවා සෑම විටම නඩත්තු කිරීමට ද බලපත්‍රධාරියා විසින් සැලැස්විය යුතු ය.

(iv) බලපත්‍රධාරියා විසින් ඒ ග්‍රාහකයට හෝ ග්‍රාහකවලට සුදුසු වැස්මක් සැපයීමට සැලැස්විය යුතු ය.

13. එකී ස්ථාන හෝ අශ්වයින් හෝ ගවයින් තබාගැනීම සඳහා පාවිච්චි කරන්නේ නම් ඔහු විසින් එම ස්ථානයෙහි හෝ ඊට සම්බන්ධ ඒ අශ්වයින් හෝ ගවයින් සේදීමට හැකි ගල් ඇතිරූ ඉඩකඩක් නාගරික කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි සැපයිය යුතු ය.

14. බලපත්‍රධාරියා විසින් එකී ස්ථානයෙහි හෝ ඊට සම්බන්ධව ඇති සෑම කාණුවක්ම ජල අපවහ ක්‍රමයක්ම සෑම විටම නාගරික කොමසාරිස්වරයා සෑහීමට පත්වන පරිදි මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සහ කාර්යක්ෂමව ක්‍රියාකාරිත්වයෙන් නඩත්තු කිරීමට සැලැස්විය යුතු ය.

15. බලපත්‍රධාරියා විසින් සෑම දිනකම යටත් පිරිසෙයින් එක් වරක් එම ස්ථානය ඉතා හොඳින් පවිත්‍ර කොට සෝදා හැරීමට සැලැස්විය යුතු අතර, එකී ස්ථාන ඇතුළත හෝ මත එකතු වී 11 වැනි වගන්තියේ නියමයන්ට අනුකූලව සපයා ඇති ග්‍රාහකයට හෝ ග්‍රාහකවලට දමා එක්කාසු වී ඇති සියලුම ගොම පොහොර, කුණු කසළ, අපවිත්‍ර දෑ, මුත්‍රා හෝ වෙනත් පීඩාකාරී හෝ හානිකර ද්‍රව්‍ය ඒ ග්‍රාහකයන්ගේ හෝ ග්‍රාහකවලින් ඉවත් කොට නාගරික කොමසාරිස්වරයා විසින් කලින් කල විධානය කරනු ලැබිය හැකි ස්ථානයක තැන්පත් කිරීමට සැලැස්විය යුතු ය.

16. (i) ගවයින් සඳහා වන ගාල්, බිම් මට්ටමේ සිට යට ලීයේ උඩ මට්ටමට උස හෝ පියැසි වහලක් සම්බන්ධයෙන් වන විට පහත යටලීයේ උස බිම සිට උස මීටර් තුනකට නොඅඩුව ද බිම් මට්ටමේ සිට මුදුන් යටලීයේ උඩ මට්ටමට උස හෝ පියැසි වහලක් සම්බන්ධයෙන් වන විට උඩ යටලීයේ උස මට්ටමට උස මීටර් 3.6කට නොඅඩුව විය යුතු ය. එක් එක් ගවයෙකු හෝ මී ගවයෙකු සඳහා මීටර් 06ක් දිග සහ මීටර් 3ක් පළල අවම බිම් ප්‍රමාණයක් තිබිය යුතු ය.

(ii) එසේ වුව ද කිරි පට්ටිවල ගව මඩු සම්බන්ධයෙන් වන විට කිරි දෙනෙකු සඳහා සැපයෙන ඉඩ ප්‍රමාණය වර්ග මීටර් 3ක් ද, මීදෙනෙකු සඳහා ඉඩ ප්‍රමාණය වර්ග මීටර් 4ක් ද විය යුතු ය. තව ද කිරි වැරූ දෙනුන් සඳහා වෙනම මඩුවක් තබා ගන්නා විට ඒ මඩුවෙහි පාර්ශ්වික ඉඩ ප්‍රමාණය යටත් පිරිසෙයින් වර්ග මීටර් 9ක් විය යුතු ය.

17. ගවයන් සහ එළුවන් සඳහා අංගන ආදිය තබා ගැනීම සඳහා ඇති අතුරු ව්‍යවස්ථාවල විධිවිධානයෙන් උල්ලංඝනය කිරීමක් සිදු වූ විට දී, එසේ සිදු කිරීම නවතා මෙම අතුරු ව්‍යවස්ථා විධිමත්ව පවත්වාගෙන යා යුතු යැයි නාගරික කොමසාරිස් විසින් දෙනු ලබන උපදෙස් කිසිවකු විසින් පැහැර හරින්නේ නම්, එම බලපත්‍රය අවලංගු කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇත.

18. යම් පුද්ගලයෙකු මෙම අතුරු ව්‍යවස්ථාවලින් කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝණය කිරීම දඬුවම් ලැබිය යුතු වරදක් වන අතර, බදුල්ල මහ නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති අධිකරණයක නඩු පවරනු ලැබීමකින් පසුව වරදකරු බවට පත් වන්නේ නම්,

පළමුවර කරන ලද වරදක් සම්බන්ධයෙන් රුපියල් එක් දහසක් (රු.1,000), නොඉක්මවන දඩයකට ද ;

දෙවැනි වරට කරනු ලබන වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු. 2,000 00) ක් නොඉක්මවන දඩයකට ද;

නොකඩවා කරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව කඩකිරීම සම්බන්ධයෙන් අවධාරනය යොමු කරමින් නාගරික කොමසාරිස්වරයා විසින් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසුව වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු.250 0) නොඉක්මවන අතිරේක දඩයකට ද

යටත් වන්නේය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ ,

(i) "සතුන්" යන්නෙන් ගවයන්, බැටලුවන් හෝ එවැනි අදහස් කෙරේ ;
(ii) "අංගන" යන්නෙන් විකිණීම හෝ ඇති කිරීම සඳහා සතුන් තබා ගන්නා ඕනෑම ස්ථානයක් අදහස් වේ.

## XVI වැනි කොටස

### පීඩාකාරී හෝ අන්තරායදායක කර්මාන්ත හෝ ව්‍යාපාර

252 වැනි අධිකාරය වන බදුල්ල මහ නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තියෙන් කියැවෙන 15 වන උපවගන්තියෙන් මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභා ප්‍රදේශයේ පීඩාකාරී හෝ අන්තරායදායක කර්මාන්ත හෝ ව්‍යාපාර ස්ථාන විධිමත් කිරීම, අධීක්‍ෂණය කිරීම හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පීඩාකාරී හෝ අන්තරායදායක කර්මාන්ත හෝ ව්‍යාපාර හා අප්‍රසන්න හෝ අන්තරායදායක ව්‍යාපාර විධිමත් කිරීම, අධීක්‍ෂණය කිරීම හා පාලනය පිළිබඳ ව වූ ව්‍යවස්ථාවයි.

2. මෙහි 03 වන වගන්තිය යටතේ සඳහන් කරන කර්මාන්ත හෝ ව්‍යාපාර මහා නගර සභා ආඥා පතේ 147 වන වගන්තියේ කාර්යය සඳහා අප්‍රසන්න හෝ අන්තරායදායක කර්මාන්ත හෝ වෙළෙඳ ව්‍යාපාර ලෙස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

3. බදුල්ල මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර කිසිම තැනැත්තකු මහ නගර සභා බල ප්‍රදේශය තුළ, මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමුවැනි, උපලේඛණයේ දැක්වෙන පීඩාකාරී හෝ අන්තරායදායක කර්මාන්තයක් සහ වෙළෙඳ ව්‍යාපාරයක් හෝ පීඩාකාරී යෝ අන්තරායදායක කර්මාන්ත සහ වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

4. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහා ද, එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වලංගු වන්නේය.

5. ව්‍යාපාර පරිශ්‍රය සහ එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ගොඩනැගිල්ලක් වේ නම් ගොඩනැගිල්ල පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙක් පීඩාකාරී හෝ අන්තරායදායක කර්මාන්ත සහ වෙළෙඳ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බපලත්‍රයක් ලබාගැනීමට හිමිකම් නොලබන්නේය :-

*(අ)* පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින්, මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස්කර තිබිය යුතු අතර, සෑම කාමරයක්ම විවෘත කළ විට ගෙබිමේ ප්‍රමාණයෙන් 1/15 (පහලොවෙන් පංගුවකට) නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතු ය;.

*(ආ)* සෑම කාමරයක්ම බිත්තවල සෑම කොටසකම උස මීටර් 2.14ට නොඅඩු විය යුතු අතර, ගඩොල් කළුගල්, කබොක් ගල්, හෝ සිමෙන්ති ගල්වලින් සාදා තිබිය යුතු ය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිම සිට මීටර් 02ක් උසට සිමෙන්ති බදාම කපරාරු කොට තිබිය යුතු අතර, ඉතිරි හුණු බදාම යොදා කපරාරු කොට වර්ණ ආලේප කර තිබිය යුතු ය;

*(ඇ)* සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 02ට වැඩි උසකින් තිබිය යුතුය ;

*(ඈ)* වහලය යම් ස්ථිර ද්‍රව්‍යකින් සාදා තිබිය යුතු ය;

*(ඉ)* දැව කර්මාන්ත සියල්ල තෙල් සායම් හුණු ආලේපකර තිබිය යුතු ය;

*(ඊ)* සම්පූර්ණ ගෙබිම සිමෙන්තියෙන් තනා තිබිය යුතු ය;

(උ) පරිශ්‍රය ප්‍රමාණවත් ජල වහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතු ය;

(ඌ) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසල භාජන හා ප්‍රමාණවත් වැසිකිළි සහ කැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු ය;

(ඔ) ප්‍රමාණවත් පරිදි ගිනි නිවීමේ උපකරණ සවිකර තිබිය යුතු ය;

(ඕ) හදිසි දොරටු සවිකර තිබිය යුතු ය;

6. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාර කර ගෙන යාම සඳහා අවශ්‍ය වන සියළු ද්‍රව්‍ය දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

7. බලපත්‍රධාරියෙකු විසින් පීඩා ඇති වීමට හෝ දුගඳ හැමීමට ඉඩ ඇති ද්‍රව්‍ය, පොදු ස්ථානයක හෝ මංමාවතක් ඔස්සේ රැගෙන යාමේ දී කිසිදු පීඩාවක් ඇති නොවන සේ ආවරණය කරන ලද උරා නොගන්නා භාජනවල දමා රැගෙන යා යුතු ය.

8. සෑම බලධාරියෙකුම, යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදු, විමෝදනය වන පීඩාකාරී ශබ්ද, වාෂ්ප හෝ වායු, ඒවා විහිදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායු ගෝලයට මුදා හැරීම කළ යුතු ය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයක් තුළින් පිටවිය යුතු ය.

9. සෑම බලධාරියකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතු ය.

10. සෑම බලධාරියකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන පරිශ්‍රයේ ගෙබිම, යම් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ඉදිකර තිබිය යුතු අතර, හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතු ය.

11. සෑම බලධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යන කාලයේ දී වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතු ය.

12. සෑම බලධාරියෙකුම, ව්‍යාපාර කටයුතුවල දී, භාවිත කරනු ලබන උපකරණ සහ භාජන ඇතුළු සියළු ආම්පන්න පිරිසිදු කර තබාගත යුතු ය.

13. සෑම බලධාරියෙකුම, ව්‍යාපාර කරගෙන යනු ලබන පරිශ්‍රයේ කසල, අතු ගා එකතු කරනු ලබන බොල්, රොඩු සමඟ අපතේ යන ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතුවලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා දිනපතා බදුල්ල මහ නගර සභාවේ නියමයන් පරිදි ඉවත් කළ යුතු ය.

14. සෑම බලධාරියෙකුම, හම් හෝ වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිත කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතු ය.

15. සෑම බලධාරියෙකුම යම් ගංගාවක්, දිය පහරක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් හෝ යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැළැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංගාවක්, දියපාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ විවෘත ජල ප්‍රදේශයක් අපවිත්‍ර කිරීම නොකළ යුතු ය.

16. නගරාධිපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද බදුල්ල මහ නගර සභාවේ යම් නිලධාරියෙකු විසින් රාජකාරි වේලාවන් තුල දී, පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරායදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාරයක් කරගෙන යනු ලබන පරිශ්‍රයට ඇතුලුවී පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේය. තව ද, බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

17. බලපත්‍රලත් පරිශ්‍රයක් අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධානවලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ යථොක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළ යුතු කාර්යයක්, නියමිත කාලයක් ඇතුළත දී ඉටු කරන ලෙස බලධාරියාට ලිඛිතව දැන්වීම නගරාධිපතිවරයාට බලය ඇත්තේ තවත් යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියාකළ යුතු අතර, එසේ ක්‍රියා නොකරන්නේ නම් එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට නගරාධිපතිවරයාට බලය ඇත්තේය.

18. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කිසියම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින 30ක් ඇතුළත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවට අනුකූල වන්නේ නම් බලපත්‍ර නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම නගරාධිපතිවරයාගේ කාර්යය වන්නේය.

19. සෑම බලපත්‍රලාභියෙකු විසින්ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාල කර්මාන්ත ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල සහ දෙමළ භාෂාවලින් දක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක එල්ලා තැබීමට සැළැස්විය යුතු ය.

20. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථාවෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාරදිය යුතු ය. එවැන්නකු නොමැති වීමට බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි එල්ලා තැබිය යුතු ය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරු හෝ පරිහරණය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතු ය.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ 03 වැනි වගන්තිය පරිදි බලපත්‍රයක් අයදුම් කරන්නකු විසින් මහ නගර සභාව විසින් කලින් කල තීරණය කොට රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශන බලපත්‍ර ගාස්තුවක් සභාවට ගෙවිය යුතු ය.

22. මහ නගර සභා ආඥාපනතේ 247 අ(1) වැනි වගන්තිය යටතේ බලපත්‍රයක් අවශ්‍ය වන්නාවූ කර්මාන්ත හෝ ව්‍යාපාර කීපයක් එකම ස්ථානයක පවත්වාගෙන යන්නාවූ අවස්ථාවක ඒ එක් එක් කර්මාන්තය හෝ ව්‍යාපාරය සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව එකී කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ පාවිච්චි කරන නැතහොත් වෙන්කර ඇති භූමි වර්ග ප්‍රමාණ අනුව බලපත්‍ර ගාස්තු වෙන් වශයෙන් අයකළ යුතු ය.

23. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීමක් හෝ උල්ලංගනය කිරීම වරදක් වන අතර, නිසි බලයක් ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩයක් සහ එය කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් නගරාධිපතිවරයා විසින් බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තව දුරටත් නොඩකවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම නියම කළ හැකි අතිරේක දඩයේ උපරිමය පිළිවෙලින් මහ නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ (2) උපවගන්තියේ 03 වැනි උපවගන්තියේ නියමකර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම්, මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ,

(i) "බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.
(ii) "තැනැත්තා" යන්නට සංස්ථා ගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද අයත් වේ.
(iii) "පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමනාකරුවෙක්, හෝ යම් තැනැත්තෙකු වෙනුවෙන් යම් ව්‍යාපාර සංවිධානයක, පාලනය හෝ කළමනාකරණය හෝ යම් තැනැත්තෙක් වෙනුවෙන් යම් ව්‍යාපාර සංවිධානය, පාලනය හෝ කළමනාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

### පළමුවැනි උපලේඛනය

### අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් හෝ ව්‍යාපාර

01. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
02. සම් පදම් කිරීම.
03. සම් විකිණීම.
04. සත්ත්ව පානය (මස්, කිරි සහ බිත්තර).
05. ඡායාරූප ශාලාවක් පැවැත්වීම.
06. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම.
07. විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.
08. කරවල, ලුණු, මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 වැඩි ප්‍රමාණයක් තබා ගැනීම.
09. පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
10. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
11. සත්ත්ව ආහාර ගබඩා කිරීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම.
12. පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
13. සබන් නිෂ්පාදනය කිරීම.
14. සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම.
15. අළුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.
16. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
17. ගෘහ භාණ්ඩ හෝ දැව භාණ්ඩ හා උපාංග ගබඩාකර තබා ගැනීම.
18. වේවැල් භාණ්ඩ නිපදවීම.
19. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම.
20. සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම.
21. රසකැවිලි වර්ග නිපදවීම.
22. පොල් ලෙලි පෙඟවීම හෝ පල් කිරීම.
23. දත් බුරුසු වර්ග නිපදවීම.
24. අයිස් කර්මාන්ත ශාලා පැවැත්වීම.
25. රා එකතු කිරීම.
26. විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම.
27. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම.
28. පින්තාරු තීන්ත වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම.
29. සෝඩා නිපදවීම.
30. සම්භාණ්ඩ නිපදවීම.
31. පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇහිරීම.
32. මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාංශ භෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම.
33. ඉටිපන්දම් නිපදවීම.
34. කපුරු නිපදවීම.
35. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
36. රෙදි සෝදන නිල් නිපදවීම.
37. ලාකඩ නිපදවීම.
38. සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
39. පාසල් රටහුණු නිපදවීම
40. ටයර් හෝ ටියුබ් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
41. ටයර් නැවත පිරවීම.
42. ටයර්, ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම.
43. සිමෙන්ති කිලෝග්‍රෑම් 1,000ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
44. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
45. ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
46. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම.
47. පොහොර හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම.
48. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම.
49. ධාන්‍ය හෝ මාංශ භෝග කිලෝග්‍රෑම් 250ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
50. තොග වශයෙන් විකිණීම සඳහා පිටි ලුණු හෝ කිලෝග්‍රෑම් 750ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
51. මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම.
52. මුද්‍රණාලයක් පැවැත්වීම.
53. කුකුළන් 100ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුළන් ගාල්කර හෝ කුකුල් කොටුවක් පැවැත්වීම.
54. එළුවන්, ගවයන්, ඌරන්, බැටළුවන් හෝ සඳහා ගාල්කර හෝ අංගන පැවැත්වීම.
55. ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම.
56. දර ගබඩාවක් පැවැත්වීම.
57. කළුගල් කැනීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්
58. සිසිල්බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100ට වැඩි ප්‍රමානයක් ගබඩා කිරීම.

59. අයිස්ක්‍රීම් නිෂ්පාදනය.
60. පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම.
61. ගිණි පෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම. වැඩි
62. කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම.
63. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.
64. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
65. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
66. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම.
67. රබර් නිවාරණය කිරීම.
68. පොහොර, හුණු හෝ මිනිරන් බහා තැබූ ගෝනි මළු ගබඩා කිරීම, කුඩු පිස දැමීම, ශුද්ධ කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
69. තලාතු මිනිරන් නිවාරණය කිරීම.
70. හුණු ගබඩා කිරීම.
71. කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් පොල්කටු අඟුරු ගබඩා කිරීම.
72. ගෙන්දගම් දුම් භාවිතකරමින් කුරුඳු, කරදමුංගු හො 'කෙඳි නිවාරණය කිරීම.
73. ඔට්ටපාලු ඇඹරීම හෝ වේලීම.
74. බැටරි චාර්ජ් කරනු ලබන හෝ ගබඩා කරනු ලබන, යාන්ත්‍රික බලය භාවිතයට ගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
75. ටියුබ් හෝ ටයර් වෝල්කනයිස් කරන, යාන්ත්‍රික බලය යොදා නොගන්නා ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
76. කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් කුරුඳු ගබඩා කිරීම.
77. කිලෝග්‍රෑම් 500ට වැඩියෙන් කොකෝවා ගබඩා කිරීම.
78. මිනී පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම නැතහොත් මිනී පෙට්ටි නිෂ්පාදනය හා ගබඩා කිරීම.
79. දැව භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම නැතහොත් නිෂ්පාදනය හා ගබඩා කිරීම.
80. බලපත්‍රලත් වෙළෙන්දන් විසින් රබර් ගබඩා කිරීම.
81. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම නැතහොත් නිෂ්පාදනය හා ගබඩා කිරීම.
82. යාන්ත්‍රික බලය භාවිත කරන්නා වූ රෙදි වියන කම්හලක් පවත්වාගෙන යාම.
83. පිටි හෝ තුනපහ වර්ග කෙටීම.
84. රබර් බඩු නිෂ්පාදනය කිරීම.
85. දුම්, ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව හෝ ලී ඉරීම.
86. කොප්පරා ගබඩාවක් පවත්වාගෙන යාම.
87. යන්ත්‍රානුසාරයෙන් පොල් නිෂ්පාදනය.
88. යන්ත්‍රානුසාරයෙන් තල තෙල් නිෂ්පාදනය.
89. තෙල් හිඳීම සඳහා සෙක්කුවක් හෝ අතින් ක්‍රියාකරන මෝලක් පවත්වාගෙන යාම.
90. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම නැතහොත් කෙඳි නිෂ්පාදන හා ගබඩා කිරීම.
91. ගිනි පෙට්ටි නිෂ්පාදනය.
92. පුළුන් ගබඩා කිරීම.
93. ලීටර් 227 1/2ට වැඩියෙන් පොල්තෙල් ගබඩා කිරීම.
94. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩා කිරීම.
95. ඇසිටිලින් නිෂ්පාදනය.
96. සිගරට් නිෂ්පාදනය.
97. බීඩි නිෂ්පාදනය.
98. කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් තීන්ත වර්ග හෝ වාර්නිෂ් ගබඩා කිරීම.
99. කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් ලී පෙට්ටි ගබඩා කිරීම.
100. කොහු නිෂ්පාදනය.
101. රස කැවිලි නිෂ්පාදනය.
102. පොහොර, හුණු හෝ මිනිරන් දමා තිබූ ගෝනි මළු හැර කිලෝග්‍රෑම් 100ට වැඩියෙන් වෙනත් ගෝනි මළු ගබඩා කිරීම.
103. පාවිච්චි කළ රබර් ටයර් හෝ ටියුබ් 150ට වැඩියෙන් ගබඩා කිරීම.
104. පොල්කටු අඟුරු හැර වෙනත් අඟුරු කිලෝග්‍රෑම් 50ට වැඩියෙන් ගබඩා කිරීම.
105. ලී පෙට්ටි නිෂ්පාදනය.
106. යාන්ත්‍රික බලය පාවිච්චි කරන ඔක්සිජන් හා වෙල්ඩින් වැඩ කරන හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
107. යාන්ත්‍රික බලය පාවිච්චි කරන්නා වූ යකඩ හෝ ලෝහ වැඩකරන හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
108. යාන්ත්‍රික බලය පාවිච්චි කරන මෝටර් වාහන අලුත්වැඩියා කරන හෝ සර්විස් කරන නැතහොත් මෝටර් වාහන අලුත්වැඩියා කරන හා සර්විස් කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
109. යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් මෝටර් වාහන සර්විස් කරන මෝටර් රථ අලුත්වැඩියා කරන ගරාජයක් හැර වෙනත් ස්ථානයක් පවත්වාගනෙ යාම.
110. යාන්ත්‍රික බලය පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
111. අත් යන්ත්‍ර හෝ පාගන යන්ත්‍ර පාවිච්චි කරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.
112. පරණ ඇඳුම් ගබඩා කිරීම.
113. ලීටර් 54ට වැඩියෙන් පොල් තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ගබඩාකිරීම පිණිස අංගනයක් ගබඩාවක් පවත්වාගෙන යාම.
114. ඇඳුම් ඩ්‍රයික්ලීන් කරන ආයතනයක් පවත්වාගෙන යාම.
115. යාන්ත්‍රික බලය පාවිච්චියට නොගෙන විද්‍යුත් ලෝහාලේප කිරීම, ක්‍රෝමියම් ආලේපනය කිරීම, රන් ආලේපනය කිරීම, රිදී ආලේපනය කිරීම හෝ තඹ ආලේපනය කිරීම කරන්නාවූ ආලේපනයක් පවත්වාගෙන යාම.
116. යාන්ත්‍රික බලය පාවිච්චි කරමින් විද්‍යුත් ලෝහාලේපනය කරන ගරාජයක් හැර වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම.
117. මෝටර් වාහන අලුත්වැඩියා කරන ගරාජ් සහ ආර්ක් වෙල්ඩින් වැඩ.
118. කවර හෝ වර්ගයක උපකරණයක් ක්‍රියාකරවීම සඳහා විදුලි බලය හෝ යාන්ත්‍රික බලය භාවිතා කෙරෙන යම් ස්ථානයක්.
119. කිලෝ ග්‍රෑම් 50ට වැඩියෙන් ඕනෑ වර්ගයක ප්ලාස්ටික් බඩු තබා ගැනීම.
120. සියළු වර්ගයේ ප්ලාස්ටික් බඩු නිෂ්පාදනය.
121. කිලෝ ග්‍රෑම් 50ට වැඩියෙන් කවර වර්ගයක පොලිතින් බඩු තබා ගැනීම.
122. සියලු වර්ගවල පොලිතීන් බඩු නිෂ්පාදනය.
123. කොහු නිෂ්පාදනය හා තබාගැනීම.
124. කිලෝග්‍රෑම් 1000ට වැඩියෙන් තේ කොළ තබා ගැනීම.
125. කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් කඩදාසි හා/හෝ කවර වර්ගයක හෝ කඩදාසි බඩු තබා ගැනීම.
126. ඇඟලුම් නිෂ්පාදනය.
127. බත් කඩ.
128. රසායන ද්‍රව්‍ය.
129. කිලෝග්‍රෑම් 50ට වැඩි සියලු වර්ගවල ගිණිකෙළි භාණ්ඩ තබා ගැනීම.
130. කිලෝ ග්‍රෑම් 150ට වැඩියෙන් එල්පීජී සිලින්ඩර් ගබඩා කිරීම
131. හිස් වැසුම් හා තොප්පි නිෂ්පාදනය.
132. කිලෝ ග්‍රෑම් 100ට වැඩියෙන් රබර් බඩු (සියළු වර්ගවල) ගබඩා කිරීම.
133. කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් කපාපු පොල් ගබඩා කිරීම.
134. කිලෝග්‍රෑම් 250ට වැඩියෙන් රබර් ඇට ගබඩා කිරීම.
135. ලීටර් 91ට වැඩියෙන් ඇසිඩ්.
136. එක් වරකට සේවා නියුක්තයන් 25ට වැඩියෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් කර්මාන්ත ශාලාවක්.
137. ද්‍රව ඛණිජ තෙල් ගෑස් ඇතුළුව ඛණිජ තෙල් නිෂ්පාදනය හා ගබඩා කිරීම.
138. පතරොම් සහ වෙඩි බෙහෙත්.

## XVII වැනි කොටස

### අයිස් කර්මාන්ත ශාලා

252 වැනි අධිකාරය වන බදුල්ල මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වැනි වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ලබන අයිස් කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගරසභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන අයිස් කර්මාන්ත ශාලා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ ව වූ ව්‍යවස්ථාවයි.

2. අයිස් කර්මාන්තශාලා පවත්වාගෙන යාමේ කර්මාන්තය හෝ ව්‍යාපාරය මහා නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්යය සඳහා අප්‍රසන්න හෝ අන්තරාදායක කර්මාන්තයක් හෝ වෙළඳ ව්‍යාපාරයක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

3. (අ) නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම්, මිස කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(ආ) මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වැනි දිනෙන් අවසන් විය යුතු ය.

4. මේ වගන්තියෙහි පහත සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ අයිස් කර්මාන්ත ශාලාවකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(අ) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පැවතිය යුතු ය.

(ආ) කර්මාන්ත ශාලාවේ සෑම සංවෘත ගොඩනැගිල්ලකම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර, එකී ජනේල විවෘත කළ විට ජනෙල්වල ක්ෂේත්‍රඵලය කාමරයේ මතුපිට බිම් ප්‍රමාණයත් පහලොවෙන් එක් පංගුවකට නොඅඩු විය යුතු ය.

(ආ) කර්මාන්ත ශාලාවේ අයිස් නිෂ්පාදන යන්ත්‍ර සවිකර ඇති සෑම කාමරයකම බිත්ති උසින් මීටර් තුනකට නොඅඩු විය යුතු අතර ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් තනා ඇතුල් පැත්තේ කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. නැතහොත් ශක්තිමත් තහඩු යොදා තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(ඇ) පියසි කෙලවරවල් පොළොව මට්ටමේ සිට යටත් පිරිසෙයින් මීටර් 2.8 ක් උසින් තිබිය යුතු ය.

(ඈ) වහලය යම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය.

(ඉ) ලී වලින් තැනූ කොටස්වල තෙල් සායම් ආලේප කර හෝ ඔප දමා තිබිය යුතු ය.

(ඊ) ගෙබිම සෑම තැනම සිමෙන්ති දමා තිබිය යුතු ය.

(ඌ) අයිස් නිෂ්පාදනය සඳහා වෙන්කර ඇති කාමරය වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීම නොකළ යුතු ය.

(එ) අයිස් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය අයිස් නිෂ්පාදනය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(ඒ) අයිස් කර්මාන්තයට සහ ඒ හා සම්බන්ධ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(ඔ) බලපත්‍රලත් ස්ථානයේ ජනනය වන කසළ බැහැර කිරීම සඳහා 11 වැනි වගත්තියේ සඳහන් නියමයන්ට අනුව බැහැර කිරීමට හැකි වන ආකාරයෙන් ක්‍රියාකර තිබිය යුතු ය.

(ඕ) කර්මාන්ත ශාලාව තුළ ජනනය වන අප ජලය බැහැර කිරීම සඳහා ප්‍රමාණවත් උරාගන්නා වළක් සකස් කර තිබිය යුතු ය.

(ක) බලපත්‍රලත් ස්ථානයේ ඉදිකර තිබෙන කිසියම් වැසිකිළියක්, කසළ වලක් හෝ විවෘත කසළ කාණුවක් හෝ උරාගන්නා වළක්, අයිස් නිෂ්පාදනය කරන කාමරය සහ නිපදවන ලද අයිස් බැහැරට නිකුත් කරන ස්ථානයට යටත් පිරිසෙයින් මීටර් 16 කට අඩු දුරකින් ඉදිකිරීම නොකළ යුතු ය.

(ග) ඉන්ධන ගබඩා කිරීම සඳහා වෙනම කාමරයක් හෝ ස්ථානයක් තිබිය යුතු අතර, අයිස් ගබඩා කරන හෝ අයිස් බැහැරට නිකුත් කරන කාමර ඇතුළතින් ඉන්ධන එහා මෙහා ගෙන යාම නොකළ යුතු ය.

(ඩ) සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සහ විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

5. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සෑම කොටසක ම යටත් පිරිසෙයින් වර්ෂයකට එක් වතාවක් බැගින් තීන්ත ආලේප කිරීම කිරීමට සැලැස්විය යුතු ය.

6. අයිස් නිෂ්පාදනය කරන කොටස සහ අයිස් බැහැරට නිකුත් කරන ස්ථානය අවම වශයෙන් දිනකට වරක් බැගින් ජලයෙන් සෝදා හැරීමට සැලැස්විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානය සම්පූර්ණයෙන් ම සහ භාවිතාකරන උපකරණ ද දිනපතා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු අතර මනා අලුත්වැඩියා තත්ත්වයෙන් පවත්වාගෙන තිබිය යුතු ය.

8. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

9. අයිස් නිෂ්පාදනයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම් අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් අයිස් නිෂ්පාදන කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

10. අයිස් නිෂ්පාදනය සඳහා යොදා ගන්නා රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා අපාරගම්‍ය හා පහසුවෙන් පිරිසිදු කළ හැකි භාජන යොදා ගත යුතු අතර එකී ද්‍රව්‍ය අයිස් නිෂ්පාදනය සඳහා, අයිස් නිෂ්පාදන කාමරයේ තබා ගන්නේ නම් මිස ඒවා ගබඩා ස්ථානයෙන් පිටත තබා ගැනීම නොකළ යුතු ය.

11. (අ) බලපත්‍ර ලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

(i) ජෛවහායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,
(vii) අන්තරාදායක අප ද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(අ) බලපත්‍රලත් ස්ථානයෙන් බැහැර කරන අප ජලය උරාගන්නා වළට බාධාවකින් තොරව ගලා යාමට සැලැස්විය යුතු ය.

(ආ) ඉහත (අ) ජේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අප ද්‍රව්‍ය නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

12. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ අයිස් නිෂ්පාදන කටයුතු කරනු ලබන හෝ අයිස් බැහැරට නිකුත් කරන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

13. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් අයිස් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කෙරෙන හෝ විකිණීමට තබා ඇති යම් අයිස් කැටයක ජල සාම්පලයක් ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී සාම්පල ලබා ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම හෝ නොකළ යුතු ය.

14. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

15. 14 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

16. 15 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවංලගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

17. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියෙකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහ නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ 03 වැනි උපවගන්තිය මගින් නියමකර ඇති පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවැනි වරට කරනු ලබන වරදක් සම්බන්ධයෙන් දිනකට රු. 2,000 0 නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදු කරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේ ය.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"අයිස් කර්මාන්ත ශාලාව" යන්නෙන් වාණිජමය පදනමෙන් පරිභෝජනය සඳහා යාන්ත්‍රික ක්‍රමයට ජලය මිදීමට සලස්වනු ලබන කර්මාන්ත ශාලාවක් අදහස් වේ.

## XVIII වැනි කොටස

### බිත්තර සහ මස් පිණිස කුකුළන් ඇති කිරීම

252 වන අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වැනි වගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභා ප්‍රදේශයේ බිත්තර සහ මස් පිණිස කුකුළන් ඇති කිරීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන බිත්තර සහ මස් පිණිස කුකුළන් ඇති කිරීම සම්බන්ධ පාලනය විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ ව වූ ව්‍යවස්ථාවයි.

2. බිත්තර සහ මස් පිණිස කුකුළන් ඇති කිරීමේ කර්මාන්තය හෝ ව්‍යාපාරය මහ නගර සභා ආඥාපනතේ 147 වැනි වගන්තියේ කාර්යය සඳහා අප්‍රසන්න හෝ අන්තරාදායක කර්මාන්තයක් හෝ වෙළඳ ව්‍යාපාරයක් ලෙස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

3. *(අ)* නාගරික කොමසාරිස් විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද වාර්ෂික බලපත්‍රයක් දරන්නේ නම් මිස, කිසිම තැනැත්තෙකු විසින් මහ නගර සභා බල ප්‍රදේශය තුළ කුකුළන් ලඟ තබා ගැනීම හෝ ඇති කිරීම නොකළ යුතුය.

*(ආ)* මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි කලින් අවලංගු නොකළහොත් එය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද එම වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක (31) දිනෙන් බලපත්‍රයේ වලංගුභාවය අහෝසි වන්නේ ය.

4. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන කිසිදු බලපත්‍රයක් අන්සතු කිරීම සපුරා තහනම් වන්නේ ය.

5. කිසියම් ස්ථානයක සහ එහි තබා ගැනීමට අදහස් කරන කුකුළු කොටුව හෝ කුකුළු කොටු මතු දැක්වෙන නියමයන්ට අනුකූල වන්නේ නම් මිස එම ස්ථානය සඳහා බලපත්‍ර නිකුත් කරනු නොලැබිය හැකිය.

*(අ)* නාගරික කොමසාරිස්වරයා විසින් ස්ථානය අනුමත කර තිබිය යුතුය.

*(ආ)* නිසි පරිදි සහ ප්‍රමාණවත් ලෙස ඉඩකඩ සහිත කාමර සහ බිත්තර දැමීම සඳහා වෙන්වූ ඉඩක් සහිත කුකුල් කොටු තනා තිබිය යුතු ය.

*(ඇ)* බිමට සිමෙන්ති දමා හෝ ජලය උරා නොගන්නා වෙනත් ද්‍රව්‍ය යොදා පොළොව සකස් කළ යුතු අතර යටත් පිරිසයෙන් මීටර් 1.75ක් පමණ උස් බිත්තිවලින් වටකොට එම බිත්ති සිමෙන්ති හෝ වෙනත් ද්‍රව්‍යයකින් කපරාරු කර තිබිය යුතු ය.

(ඈ) කුකුල් කොටුව හෝ කුකුල් කොටු කවර හෝ නිවසකට හෝ වීදියකට යටත් පිරිසෙයින් මීටර් 20ත් 25ත් අතර දුරකින් පිහිටා තිබිය යුතු අතර එම ස්ථානයෙහි එකතුවන අපද්‍රව්‍ය දිනපතා වල දැමීම හෝ ජීව වායු ස්ථානයකට දැමිය යුතු ය. එසේම ඒවා බැහැර කිරීම සඳහා ප්‍රමාණවත් විධිවිධාන සලසා ගත යුතු ය.

(ඉ) කුකුළන් තබාගැනීමෙන් හටගැනෙන වෙනත් අප්‍රසන්න හෝ අහිතකර ද්‍රව්‍ය දැමීම සඳහා මැස්සන්ට ඇතුළු විය නොහැකි වන පරිදි බාල්දි තනා වසා තැබිය යුතු ය.

(ඊ) අවට නිවැසියන්ට සහ ඉඩම්වල වගාවන්ට හානිදායක වන අයුරින් කුකුළන් ඉබාගාතේ යා නොහැකි වන පරිදි කොටුකර තිබිය යුතු .

(උ) සෑම කුකුල් ගොවිපල හිමියකුම පාරිසරික ආරක්‍ෂණ බලපත්‍රයක් ලබා ගන්නේ නම් මිස, නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා බලපත්‍රයක් ලබා නොදිය යුතු ය.

6. නාගරික කොමසාරිස්වරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලබන කවර හෝ ලියවිල්ලකින් බලය පවරා ඇති සභාවේ කවර හෝ නිළධාරියෙකු විසින් ඉර උදාවත්, ඉර බැසීමත් අතර කවර හෝ යුක්ති සහගත වේලාවක දී බලපත්‍රලත් ස්ථානයකට ඇතුලුවීමත්, එම ස්ථානය පරීක්‍ෂා කිරීම නීත්‍යානුකූල වන අතර ඒ සඳහා සෑම බලපත්‍රධාරියකුම අවසරය ලබාදිය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානය, බලපත්‍ර නිකුත් කිරීම සඳහා ඉටු වී තිබිය යුතු සේ අතුරු ව්‍යවස්ථාවලින් නියමිත කොන්දේසිවලට කිසියම් විටක හානිදායක වී තිබුණහොත් එම ස්ථාන එම කොන්දේසිවලට අනුකූල තත්වයට යළි පත් කිරීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග, කොමසාරිස්වරයා විසින් බලපත්‍රධාරියා වෙත යවනු ලබන ලිඛිත නිවේදනයක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

8. කිසියම් හේතුවක් නිසා මෙහි 7 වැනි වගන්තියෙහි සඳහන් නිවේදනයක් බලපත්‍රධාරියා වෙත පෞද්ගලිකව භාර කරවිය නොහැකි වුවහොත් මෙම නිවේදනය ඔහු අන්තිමයට පදිංචිව සිටි ස්ථානය දන්නා ස්ථානයෙහි තබා ඒම හෝ බලපත්‍රලත් ස්ථානයේ ප්‍රකටව පෙනෙන කිසියම් දෙයක නැතහොත් කිසියම් ප්‍රකට තැනක අලවා තැබීම හෝ එය ඔහුට විධි වූ පරිදි භාරදීමක් ලෙස සැලකිය යුතු ය.

9. සෑම බලපත්‍රලාභියකුම බලපත්‍ර ලත් ස්ථානය පවිත්‍රව සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් තබා ගත යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ තබා සිටින කුකුළන්ට කිසියම් රෝගයක් හෝ ආසාදනයක් සෑදුනහොත් ඔවුන් අතර යම් සතෙකු මරණයට පත් වුවහොත් හෝ බලපත්‍රධාරියා විසින් නාගරික බල ප්‍රදේශය භාර පශු වෛද්‍යවරයා වෙත හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත හෝ නොපමාව දැනුම් දිය යුතුය.

11. බලපත්‍ර ලකත් ස්ථානයේ තබා සිටින කුකුළන් කිසියම් රෝගයකින් හෝ ආසාදනයකින් මරණයට පත් වුවහොත් හෝ බලපත්‍රධාරියා විසින් නාගරික බල ප්‍රදේශය භාර පශු වෛද්‍යවරයා වෙත හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත නොපමාව දැනුම් දිය යුතුය. තව ද පශු වෛද්‍යවරයාගේ හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ අනුමැතිය ඇතිව මළකුණ වළලා දැමීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම සිදුකළ යුතු ය.

12. අසල්වාසීන්ට දුර්ගන්ධය මගින් පීඩාවක් ඇති නොවන පරිදි දිනපතා බීම සහ උපකරණ හා අනෙකුත් ආම්පන්න සෝදා පවිත්‍ර කළ යුතු ය.

13. කුකුල් ගොවිපොළේ සේවයේ යොදන සෑම අයකුටම ආරක්ෂිත ඇඳුම් සහ උපකරණ සපයා අදිය යුතු අතර, අත් ආවරණ, ගම් බූට්ස්, මුඛ වාඩම් සපයා තිබිය යුතු ය.

14. එම සේවකයින් සඳහා ප්‍රමාණවත් ලෙස නෑමට සහ රෙදි සේදීමේ පහසුකම් සෑම කුකුල් ගොවිපලකට තිබිය යුතුය.

15. කුකුල් අපද්‍රව්‍ය ඉවත් කර වෙනම ගබඩා කිරීම සඳහා පහසුකම් සපයා තිබිය යුතු අතර ඒවා මගින් දුර්ගන්ධය ඇතිවීම වැලැක්වීමට ප්‍රමාණවත් ආවරණ යෙදිය යුතු ය.

16. කුකුල් මස් පිණිස සතුන් ඝාතනය කරන්නේ නම් ඒ සඳහා වෙනම පහසුකම් හා ඝාතන ස්ථානයක් තනා තිබිය යුතු ය.

17. ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 18 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ක්‍රියාකල හැකි ආකාරයේ විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

18. බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා පහත සඳහන් නියමයන් අනුගමනය කර තිබිය යුතු ය.

(අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය;
(ii) වීදුරු;
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය;
(iv) පොලිතීන් හෝ ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය;
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්;
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමුද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන සහ අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;
(vii) අන්තරායක අපද්‍රව්‍ය, යන වර්ගය යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහා ලීමට වෙන් කර ඇති භාජනවලට හෝ ටැංකිවලට දැමීම බලපත්‍රලාභියාගේ වගකීම වන්නේ ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය බදුල්ල මහා නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස, කොමසාරිස්වරයා විසින් නියම කරන ආකාරයෙන් අවසන් බැහැරලීම සිදුකළ යුතු ය.

19. නාගරික කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දී ඇති ඕනෑම තැනැත්තෙකු විසින් බලපත්‍ර ලත් ස්ථානයෙන් බැහැරවී යන ඕනෑම කුකුළකු අල්ලා ගැනීම හෝ අල්ලා ගැනීමට සැලැස්වීම නීත්‍යානුකූල විය යුතු ය.

20. කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් සම්බන්ධයෙන් කෙරෙන කවර හෝ උල්ලංඝනයක්ම වරදක් වන අතර විනිසුරුවරයෙකු ඉදිරියේ නඩු පවරනු ලැබීමට ද යටත් විය යුතු ය.

21. කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝණය සම්බන්ධයෙන් අධිකරණය විසින් දෙවන වරට හෝ තදනන්තරව බලපත්‍රධාරියකු වරදකරු කරනු ලබන විටක දී ඒ උල්ලංඝනය සම්බන්ධයෙන් නීත්‍යානුකූලව නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දඬුවමකට හානියක් නොමැතිව නාගරික කොමසාරිස්වරයා විසින් ඒ බලපත්‍රධාරියාගේ බලපත්‍රය අවලංගු කිරීමට ද බලය ඇත්තේය. එසේ අවලංගු කිරීමේ දී බලපත්‍රධාරියාට කිසිම වන්දියක් ඉල්ලීමට හෝ ලබාගැනීමට අයිතිවාසිකමක් නොමැත්තේ ය.

22. සෑම කුකුල් ගොවිපලකින් බිත්තර වෙළඳපලට ගෙන යාමේ දී බිත්තරවල මතුපිට හොඳින් පිරිසිදුකර අලෙවි කිරීම කළ යුතු ය.

23. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද විධිමත් බලපත්‍රයක් නොමැතිව පළමු වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ව්‍යාපාරයක නිරත වන කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරන අතර ඒ පුද්ගලයා හෝ පුද්ගලයන්ට විරුද්ධව බදුල්ල මහා නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කරනු ලැබුවහොත් පහත සඳහන් පරිදි -

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවැනි වරට කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට වෙනුවෙන් දිනකට රුපියල් දෙදහසක් (රු. 2,000 0) ක් නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමයකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු. 250 0) නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේ ය.

## IXX වන කොටස

### මුදල් මාරුකරන්නෝ

252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 වන වගන්තිය සහ 272 වන වගන්තිය සමඟ කියවිය යුතු 16 වන උපවගන්තියට අනුව මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ලබන මුදල් මාරු කරන ස්ථාන විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභාවේ මුදල් මාරු කරන ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අතුරු ව්‍යවස්ථාව ලෙස හැඳින්වේ.

2. නාගරික කොමසාරිස් විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද වාර්ෂික බලපත්‍රය යටතේ හැර කිසිම තැනැත්තෙකු විසින් බදුල්ල මහා නගර සභා සීමාව ඇතුළත මුදල් මාරු කරන්නෙකු ලෙස හෝ ව්‍යාපාරික කටයුතුවල යෙදීම තහනම් වන්නේ ය.

3. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම එය නිකුත් කර ඇත්තේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ දෙසැම්බර් 31 (තිස්එක්) වැනි දිනෙන් වලංගු කාලය අවසන් වන්නේය.

4. සභාව විසින් කලින් කල අනුමත කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයක් සභාවට ගෙවූ විටකදී හැර කිසිම තැනැත්තෙකුට මේ කොටස යටතේ කිසිම බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

5. අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් නොමැතිව පළමු වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ව්‍යාපාරයක නිරත වන කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරන අතර ඒ පුද්ගලයා හෝ පුද්ගලයින්ට විරුද්ධව බදුල්ල මහා නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති නිසි අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කරනු ලැබුවහොත් පහත සඳහන් දඬුවම්වලට,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවැනි වර කරනු ලබන වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු. 2,000 ) ක් නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමයකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු. 250 ) නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේය.

6. අර්ථ නිරූපනය

1. "මුදල් මාරු කිරීම" යන්නෙන් විදේශීය රටවල පරිහරණය කරන ලද මුදල් මාරු කිරීම, සංචාරක චෙක්පත් මාරු කිරීම, විනිමය බිල්පත් මාරු කිරීම, පොරොන්දු නෝට්ටු මාරු කිරීම සහ දේශීය චෙක්පත් මාරු කිරීම ලෙස අදහස් වේ.

## XX වැනි කොටස

### ගණකාධිකාරී සහ විගණකවරු

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 වන වගන්තිය සහ 272 වන වගන්තිය සමඟ කියවිය යුතු 17 වන උපවගන්තියට අනුව මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ලබන මුදල් ගණකාධිකාරී සහ විගණන ස්ථාන විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. නාගරික කොමසාරිස් විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද වාර්ෂික බලපත්‍රය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් බදුල්ල මහා නගර සභා සීමාව ඇතුලත 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ගණකාධිකාරීවරයෙකු ලෙස හෝ විගණකවරයෙවකු ලෙස හෝ වෘත්තියේ යෙදීම තහනම් වන්නේය.

2. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම එය නිකුත් කර ඇත්තේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ දෙසැම්බර් 31 (තිස්එක) වැනි දිනෙන් වලංගු කාලය අවසන් වන්නේය.

3. සභාව විසින් කලින් කල අනුමත කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයක් සභාවට ගෙවූ විටකදී හැර කිසිම තැනැත්තකුට මේ කොටස යටතේ කිසිම බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

4. අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් නොමැතිව පළමු වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ව්‍යාපාරයක නිරත වන කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන්, දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරන අතර ඒ පුද්ගලයා හෝ පුද්ගලයින්ට විරුද්ධව බදුල්ල මහා නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කරනු ලැබුවහොත් පහත සඳහන් දඬුවම්වලට :-

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවැනි වරට කරනු ලබන වරදක් සම්බන්ධයෙන් රුපියල් දෙදහසක් (රු. 2,000 0) ක් නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු. 250 ) නොඉක්මවන අතිරේක දඩයකට ද, යටත් වන්නේය.

## XXI වැනි කොටස

### මාළු වෙළෙඳාම

252 වන අධිකාරිය වන බදුල්ල මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තියෙන් මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන මාළු විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ ව වූ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලබයි.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන මාළු විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. කවර හෝ තැනැත්තෙකු විසින් වෙළෙඳ පොළක් නොවන වෙනත් කිසියම් ස්ථානයක නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මාළු විකිණීමේ කාර්යය සඳහා ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය.

3. බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කරන වෙළෙඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මාළු වෙළඳ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(අ) විකිණීම සඳහා මාළු ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් හෝ කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතු ය.

(ආ) මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(ඇ) අප ජලය ගලා යාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු තිබිය යුතු ය.

(ඈ) විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන කවර හෝ මාළු වර්ගයක් කෙලින්ම හිරු එළිය නොවැටෙන සේ ප්‍රදර්ශනය කිරීම කළ යුතුය.

(ඉ) ඉහත (ඇ) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලා යන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලා යාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර එකී අප ජලය උරා ගන්නා වලකට ගලා යාමට ඉඩ සලස්වා තිබිය යුතු ය.

(ඊ) අප ජලය ගලා යාමට සලස්වන ලද උරා ගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතු ය.

(උ) මාළු වෙළෙඳ ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවභායන අපද්‍රව්‍ය බහාලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර දෛනික වෙළඳාම් කටයුතු අවසානයේ එකී අපද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර් 1.5 ක් ගැඹුරෙන් වළ දැමීම හෝ බදුල්ල මහා නගර සභාව විසින් කලින් කළ තීරණය කර නියම කරනු ලබන නියමයන් ට අනුකූලව මහා නගර සභාවේ කසළ රැස් කිරීමේ වාහනයකට භාර දිය යුතු ය.

(ඌ) ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර, වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතු ය.

4. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළෙඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිමද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද, මාළු කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණ ද, මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

5. මැස්සන් හෝ කෘමීන් හෝ වෙනත් කවර හෝ සතෙකුට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි රථයක හෝ පෙට්ටියක හෝ වෙනත් යම් භාජනයක හෝ ආවරණය කර ප්‍රවාහනය කරන්නේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් කවර හෝ මාළු වර්ගයක් ප්‍රවාහනය නොකළ යුතුවාක් හැර එකී මාළු ප්‍රවාහනය කිරීමෙන් පසුව ඒ මාළු ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කළ රථය හෝ පෙට්ටිය හෝ වෙනත් භාජනය විෂබීජ නාශක යොදා හොඳින් සෝදා හැරීම කළ යුතු ය.

6. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළෙඳ ස්ථානයක සහ එහි අවට ඇති කාණු ද, මාළු ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මාළු අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මාළු වෙළෙඳසැල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවතී තිබුණේ නම් මිස ශේෂවන කවර හෝ මාළු වර්ගයක් ඊළඟ දිනයේ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයෙහි මාළු දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

9. බලපත්‍රලත් කවර හෝ මාළු වෙළඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන් හෝ කෘමීන්ගෙන් තොරව තබා ගත යුතු ය.

10 (අ) කිසියම් ආසාදන ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මාළු වෙළඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළඳාමෙහි හෝ එසේ වෙළඳාමෙහි නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මාළු වෙළෙඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) මාළු වෙළඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

11. මාළු වෙළෙඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මාලු වෙළෙඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකු ම විසින් ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට මාළු වෙළඳ ස්ථානයේ මාළු වෙළඳාම් කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

14 (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්,
(vii) අන්තරායකර අප ද්‍රව්‍ය යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අප ද්‍රව්‍ය මහා නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

15. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මාළු වෙළෙඳ ස්ථානයෙහි විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මාළු වර්ගයකින්, සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිල දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

16. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මාළු විකිණීමේ ස්ථානයක් පවත්වගෙන යනු ලබන ස්ථානය 3 වැනි වගන්තියෙහි සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

17. 16 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

18. 17 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

19. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියෙකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය පරිදි :-

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකටද,
(ii) දෙවැනි වර හෝ තදනන්තර වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකටද,
(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

## XXII වැනි කොටස

### මස් විකිණීම

252 වන අධිකාරිය වන බදුල්ල මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තියෙන් මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන මස් විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ ව වූ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභා විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන මස් විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාවයි.

2. කවර හෝ තැනැත්තෙකු විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ පොදු වෙළෙඳ පොළක් නොවන වෙනත් කවර හෝ ස්ථානයක නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව මස් විකිණීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි නොකළ යුතු ය.

3. බලපත්‍රය ලබා ගැනීමට ඉල්ලුම් කරන වෙළෙඳ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ තැනැත්තෙකුට මස් වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

*(අ)* විකිණීම සඳහා මස් ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිඟන් ගඩොල් හෝ කපරාරු කළ සිමෙන්ති හෝ මළ නොබැඳෙන ලෝහ තහඩු හෝ යොදා තිබිය යුතු ය.

*(ආ)* මස් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානයේ බිම සහ ගබඩා කිරීමේ ස්ථානයේ බිම සිමෙන්ති බදාමයෙන් මැදීම කර හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

*(ඇ)* අප ජලය ගලායාම පහසු කිරීම සඳහා අවශ්‍ය බෑවුමක් සහිතව සිමෙන්තියෙන් මැදීම කරනු ලැබූ හෝ පිඟන් ගඩොල් ඇල්ලූ කාණු තිබිය යුතු ය.

*(ඈ)* ඉහත (ඇ) ඡේදයේ සඳහන් කාණු තුළින් ගලායන අප ජලය කිසියම් පොදු ජල මාර්ගයකට ගලායාමට වැළැක්වීමට ප්‍රමාණවත් විධිවිධාන සලස්වා තිබිය යුතු අතර එකී අප ජලය උරා ගන්නා වලකට ගලායාමට ඉඩ සලස්වා තිබිය යුතු ය.

*(ඉ)* අප ජලය ගලා යාමට සලස්වන ලද උරා ගන්නා වල වාතයට නිරාවරණය නොකළ යුතු ය.

*(ඊ)* මස් වෙළෙඳ ස්ථානයෙන් බැහැර කරනු ලබන ජෛවහායන අප ද්‍රව්‍ය බහා ලීමට ප්‍රමාණවත් භාජන තබා තිබිය යුතු අතර දෛනික වෙළෙඳාම් කටයුතු අවසානයේ එකී අප ද්‍රව්‍ය පොළොව මට්ටමෙන් අවම වශයෙන් මීටර්1.5 ක් ගැඹුරෙන් වළ දැමීම හෝ බදුල්ල මහා නගර සභාව විසින් කලින් කළ තීරණය කර නියම කරනු ලබන නියමයන්ට අනුකූලව මහා නගර සභාවේ කසළ රැස් කිරීමේ වාහනයකට භාර දිය යුතු ය.

*(උ)* ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රමාණවත් ජල මුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතු අතර වැසිකිළි භාවිතයෙන් අනතුරුව පාවිච්චි කිරීමට සුදුසු සනීපාරක්ෂක ක්‍රම හා ද්‍රව්‍ය සපයා තිබිය යුතු ය.

4. ගෝඝාතක ආඥාපනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබා ඇති ගෝඝාතකාගාරයක දී මරනු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස කවර හෝ මස් වෙළෙඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ කවර තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

5. මැස්සන් හෝ කෘමීන් හෝ වෙනත් කවර හෝ සතෙකුට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබිය හැකි රථයක හෝ පෙට්ටියක හෝ වෙනත් යම් භාජනයක හෝ ආවරණය කර ප්‍රවාහනය කරන්නේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් කවර හෝ මස් වර්ගයක් ප්‍රවාහනය නොකළ යුතුවාක් හැර එකී මස් ප්‍රවාහනය කිරීමෙන් පසුව, ඒ මස් ප්‍රවහනය කිරීම සඳහා පාවිච්චි කළ රථය හෝ පෙට්ටිය හෝ වෙනත් භාජනය විෂබීජ නාශක යොදා හොඳින් සෝදා හැරීම කළ යුතු ය.

6. බලපත්‍රලත් කවර හෝ මස් වෙළෙඳ ස්ථානයක දෛනික කටයුතු අවසානයේ එකී ස්ථානයේ බිම ද, බිත්තිවල පිඟන් ගඩොල් ඇල්ලූ හෝ සිමෙන්ති කපරාරු කළ කොටස් ද, මස් කැපීම සඳහා ගන්නා කොට ද, උපකරණ ද, මස් විකිණීම සඳහා ප්‍රදර්ශනයට තබන ස්ථාන ද, විෂ බීජ නාශක දියර යොදා සෝදා පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

7. බලපත්‍රලත් කවර හෝ මස් වෙළෙඳ ස්ථානයක සහ එහි අවට ඇති කාණු ද, මස් ගබඩා කිරීම, සකස් කිරීම හෝ විකිණීම හා සම්බන්ධව පාවිච්චි කරන සියලු භාජන සහ උපකරණ ද මනා අලුත්වැඩියාවෙන් යුතුව සහ දුර්ගන්ධයකින් තොරව තබා ගැනීමට සැලැස්විය යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයේ දෛනික වෙළෙඳාම් කටයුතු අවසන් වීමෙන් අනතුරුව විකුණා ගැනීමට නොහැකිව ශේෂ වන මස් අධි ශීතකරණයක ගබඩා කරනු ලැබ ඇත්තේ නම් හා එසේ ගබඩා කළ අවස්ථාවේ සිට ඊළඟ දිනයේ මස් වෙළෙඳ සල විවෘත කරන අවස්ථාව දක්වා එකී අධිශීතකරණය නිසි ආකාරයෙන් ක්‍රියාත්මකව පැවතී තිබුනේ නම් මිස ශේෂවන කවර හෝ මසක් ඊළඟ දිනයේ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ අධි ශීතකරණයේ හෝ බලපත්‍රලත් ස්ථානයේ තබා ගැනීම හෝ නොකළ යුතු ය.

9. කවර හෝ ගෝ ඝාතකාගාරයක් තුළ කිසියම් දිනයක දී මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝ ඝාතක ආඥාපනතේ 17 වැනි වගන්තියේ බලතල ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක, කවර හෝ මස් කඩයක වෙළෙඳාම් පිණිස මස් තබා ගැනීම හෝ වෙළෙඳාම පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

10. බලපත්‍රලත් කවර හෝ මස් වෙළෙඳ ස්ථානයක බල්ලන්, බළලුන්, මීයන්, කෘමීන් හෝ වෙනත් කවර හෝ සතුන්ගෙන් තොරව තබා ගත යුතු ය.

11. බලපත්‍රලත් ස්ථානයෙහි මස් දමා තැබීමට හෝ සකස් කිරීමට හෝ විකිණීමට පාවිච්චි කරන උපකරණ හෝ භාජන හැර කිසිම භාණ්ඩයක් හෝ ඇඳුමක් හෝ නිදාගන්නා පැදුරක් හෝ වෙනත් කවර හෝ දෙයක් තබා ගැනීම නොකළ යුතු ය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවය කරන තැනැත්තන්ගේ පාවිච්චියට ගැනීම සඳහා බීමට සුදුසු ජලය ප්‍රමාණවත් ප්‍රමාණයක් තබා ගැනීම කළ යුතු ය.

13 *(අ)* කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකු ට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ මස් වෙළෙඳ ස්ථානයක කවර හෝ ආකාරයක වෙළෙඳාමෙහි හෝ එසේ වෙළෙඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

*(ආ)* හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මස් වෙළෙඳ ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

*(ඇ)* මස් වෙළෙඳ ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

14. මස් වෙළෙඳ ස්ථානයෙහි සේවයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් මස් වෙළෙඳ ස්ථානයෙහි සේවයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකු ම විසින් ප්‍රයෝජනයට ගැනීම පිණිස සබන් හෝ සබන් දියර තබා තිබීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

16. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් මස් වෙළෙඳ ස්ථානයක විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ඇතුළත ගබඩා කර ඇති යම් මස් වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිල දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

17. *(අ)* බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස, එකී අපද්‍රව්‍ය -

(i) ජෛවහායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස්,

(vii) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය බදුල්ල මහ නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

18. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට බදුල්ල මහා නගරාධිපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට මස් වෙළෙඳ ස්ථානයේ මස් වෙළෙඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

19. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 3 වැනි වගන්තියෙහි සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

20. 19 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

21. 20 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමාසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

22. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියෙකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහ නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ 03 වැනි උපවගන්තිය පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවැනිවර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

## XXIII වැනි කොටස

### සිසිල් බීම කර්මාන්ත ශාලා

252 වන අධිකාරය වන බදුල්ල මහ නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වැනි වගන්තියෙන් මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන සිසිල්බීම කර්මාන්ත ශාලා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ ව වූ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන සිසිල්බීම කර්මාන්තශාලා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. නාගරික කෙමාසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු බලපත්‍රයක් ලබාගෙන ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මහ නගර සභා බල ප්‍රදේශය තුළ සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක්ම මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින තෙක් වලංගු විය යුතු ය.

4. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් නියමයන් සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ සිසිල් බීම කර්මාන්ත ශාලාවකට බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(1) කර්මාන්තශාලා ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන තිබිය යුතු ය.

(2) කර්මාන්ත ශාලාවේ සෑම ගොඩනැගිල්ලකට ම මනා වාතාශ්‍රයක් හා අලෝකය ලැබෙන ආකාරයෙන් පැවතිය යුතු ය. සෑම කාමරයකට ම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර, විවෘත කළ විට ඒ ජනේලවල වර්ග ප්‍රමාණය, ඒ කාමරයේ මතුපිට බිම් ප්‍රදේශයේ වර්ගඵලයෙන් පහලොවෙන් එක් පංගුවකට වඩා අඩු නොවිය යුතු ය.

(3) සෑම කාමරයක ම බිත්තිවල අවම උස මීටර් 2.14ට අඩු නොවිය යුතු අතර, එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ ඇති අවස්ථාවක, ඒවා බදාම යොදා කපරාරු කර ඇතුල් පැත්තේ තීන්ත ආලේපකර තිබිය යුතු ය. නැතහොත් ඇළුමිනියම් හෝ වෙනත් ලෝහ ද්‍රව්‍යයක් සමග ලෑලි යෙදූ බිත්ති නිමකර ඇති අවස්ථාවක ලෑලි මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(4) වහලය ස්ථිර ද්‍රව්‍ය යොදා සකස්කර සෙවිලිකර තිබිය යුතු අතර, පියසි කෙලවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2ක් උසින් තිබිය යුතුවාත් හැර අගුවාසිය අවම වශයෙන් මීටර් එකක් විය යුතු ය.

(5) වහළයට යොදන ලද යකඩ, වෙනත් වානේ හෝ ලී මතුපිට තෙල් සායම් හෝ තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(6) ගෙබිම සිමෙන්ති දමා සිමෙන්තියෙන් මැද තිබීම හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(7) සිසිල් බීම නිෂ්පාදනය සඳහා යොදාගන්නා කාමරවලින්, හිස් බෝතල සේදීමේ දී සහ සේවකයන්ගේ නාන කාමරවලින් බැහැර කෙරෙන අපජලය අවහිරයකින් තොරව ගලා යාමට ප්‍රමාණවත් ජලාපවහන ක්‍රමයක් ඇතිකර තිබිය යුතු ය.

(8) සිසිල්බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සිරප් වර්ග, වෙනත් රසායනික ද්‍රව්‍ය, සිසිල් බීම ඇසිරීම සඳහා යොදා ගන්නා බෝතල් හෝ වෙනත් යම් ඇසුරුම් ද්‍රව්‍ය ගබඩාකර තැබීම සඳහා අවම වශයෙන් එක් කාමරයක්වත් වෙනම සපයා තිබිය යුතු අතර එකී කාමරය මීයන්ගෙන් සහ වෙනත් කෘමි සතුන්ගෙන් තොරව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ආරක්ෂිත විධිවිධාන සලසා තිබිය යුතු ය.

(9) සිසිල්බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය සිසිල්බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(10) සිසිල් බීම කර්මාන්තයට සහ ඒ හා සම්බන්ධ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩාකර තබන්නේ නම් එසේ ගබඩාකර තබන ජලය අපවිත්‍රවීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(11) හිස් බෝතල සේදීම සඳහා වන ස්ථානය සිසිල් බීම නිෂ්පාදනය කරන කාමරවලින් වෙන් ව ස්ථානගත කර තිබිය යුතු අතර ඉහත (9) ඡේදයේ සඳහන් ආකාරයෙන් තත්ත්ව සහතිකයක් නිකුත් කරනු ලැබූ ජලය පමණක් ඒ සඳහා යොදාගත යුතු ය.

(12) සිසිල් බීම කර්මාන්ත ශාලාවේ කාර්යයන් හේතුවෙන් ජනනය වන අපද්‍රව්‍ය 14 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට වර්ගකර බැහැර කළ හැකි ආකාරයෙන් වෙන්කළ භාජන හෝ ටැංකි තිබිය යුතු ය.

(13) සිසිල් බීම කර්මාන්ත ශාලාවේ සේවකයන් සඳහා යටත් පිරිසෙයින් සෑම දස දෙනෙකු වෙනුවෙන් එකක් බැගින් වන සේ වැසිකිළි සකස්කර තිබිය යුතුවාත් හැර කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙන ම වැසිකිළි තිබිය යුතු ය. එසේ ම එකී වැසිකිළි සිසිල්බීම නිෂ්පාදන කාමරවල සිට අවම වශයෙන් මීටර් 15ක් දුරින් ස්ථානගත කර තිබිය යුතු ය.

(14) සිසිල් බීම නිෂ්පාදනය කරන කිසියම් කාමරයක හෝ ඒ කාර්යය සඳහා යොදා ගන්නා ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ස්ථානවල සිට මීටර් 18කට අඩු දුරකින් කසළවලක් හෝ පෝරවලක් හෝ අළුවලක් හෝ ස්ථානගත කර නොතිබිය යුතු ය.

5. 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ (3) වැනි සහ (5) වැනි ඡේදවල දැක්වෙන ආකාරයෙන් තීන්ත ආලේප කිරීමට නියම කර ඇති කොටස් අවම වශයෙන් සෑම වර්ෂයකට ම එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීම කළ යුතු ය.

6. සිසිල්බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සෑම කාමරයක ම ගෙබිම, යටත් පිරිසෙයින් සෑම දිනයකම එක් වරක්වත් සේදීමට සැලැස්විය යුතු ය.

7. සිසිල් බීම නිෂ්පාදනය කරන සෑම කාමරයක් ම සහ එහි වටපිටාව ද කාණු, ලී බඩු හා උපකරණ ද පිරිසිදුව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගත යුතු ය.

8. සිසිල් බීම කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කරන සිසිල් බීම වර්ග ඇසිරීමට යොදා ගන්නා බෝතල් පිරිසිදු කිරීමේ දී -

(අ) එකී බෝතල්වල කලින් අලවා තිබෙන ලේබල් ඉවත් කිරීමට හා මූලික වටයේ පිරිසිදු කිරීම සඳහා එක් ටැංකියක් ද; සහ

(ආ) එකී බෝතල් අවසාන පිරිසිදු කිරීම සඳහා තවත් ටැංකියක් ද, යනුවෙන් අවම වශයෙන් ටැංකි දෙකක් භාවිතා කළ යුතු අතර එකී අවසාන පිරිසිදු කිරීම ගලායන ජලය මගින් පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

9. සිසිල් බීම ඇසිරීම සඳහා වීදුරුවලින් නිපදවන ලද බෝතල් හැර වෙනත් කිසියම් ඇසුරුම් වර්ගයක් හෝ ඇසුරුම් වර්ග යොදා ගනු ලබන අවස්ථාවක, එකී ඇසුරුම් එක්වරක් පමණක් භාවිතයට ගනු ලැබිය යුතුවාත් හැර සෞඛ්‍යාරක්ෂිත ද්‍රව්‍යවලින් නිපදවා ඇති ඇසුරුම් බවට තහවුරු කිරීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය. මේ කාර්යයේ දී එකී ඇසුරුම් ද්‍රව්‍ය නිෂ්පාදකයා විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් දෙනු ලබන ලිඛිත සහතිකයක් ප්‍රමාණවත් ලෙස සැලකිය යුතු ය.

10. සිසිල් බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සිරප් වර්ග සහ වෙනත් රසායනික ද්‍රව්‍ය කල්ඉකුත් වීමේ දිනය ප්‍රමාණවත් කාලයක් ඉදිරියට පවතින්නේ නම් මිස කවර හෝ අවස්ථාවක එකී ද්‍රව්‍ය සිසිල් බීම නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීම නොකළ යුතු ය.

11. (අ) කිසියම් අසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ සිසිල් බීම කර්මාන්ත ශාලාවක සේවයේ නියුක්ත වීම හෝ එසේ සේවයේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් සිසිල් බීම කර්මාන්ත ශාලාවක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්තවීම හෝ නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) සිසිල් බීම කර්මාන්ත ශාලාවේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

12. සිසිල් බීම නිෂ්පාදනයේ යෙදෙන සෑම සේවකයෙකු වෙත ම ආරක්ෂිත මුව වැසුම්, අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් සිසිල් බීම නිෂ්පාදන කාර්යයයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. සිසිල් බීම නිෂ්පාදනය සඳහා යොදා ගන්නා සිරප් සහ අනෙකුත් රසායන ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා අපාරගම්‍ය හා පහසුවෙන් පිරිසිදු කළ හැකි භාජන යොදා ගත යුතු අතර එකී ද්‍රව්‍ය සිසිල් බීම නිෂ්පාදනය සඳහා සිසිල් බීම නිෂ්පාදන කාමරයේ තබා ගන්නේ නම් මිස ඒවා ගබඩා ස්ථානයෙන් පිටත තබා ගැනීම නොකළ යුතු ය.

14. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය —

(i) ජෛවහායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතින් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,
(vii) අන්තරාදායක අපද්‍රව්‍ය යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහ නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

15. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

16. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් සිසිල් බීම නිෂ්පාදන කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කෙරෙන හෝ විකිණීමට තබා ඇති යම් සිසිල් බීම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබාගැනීම නිත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිල දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

17. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක,නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී

ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීවමට සැළැස්විය යුතු ය.

18. 17 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

19. 18 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නිත්‍යානුකූල විය යුතු ය.

20. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංගනය කරන බලපත්‍රධාරියෙකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහ නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය පරිදි,

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,
ii. දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද,
iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

21. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"සිසිල් බීම' යන්නෙන් පළතුරු, එසන්ස්, සිරප් යන සියල්ලම හෝ එක් වර්ගයක් උපයෝගී කර ගෙන නිෂ්පාදනය කරනු ලබන හා බෝතල්වල හෝ වෙනත් යම් ආකාරයක ඇසුරුමක අසුරනු ලබන බීම වර්ග අදහස් වන අතර සෝඩා බීම ද ඊට ඇතුළත් විය යුතු ය.

## XXIV වැනි කොටස

### සංචාරක වෙළෙඳුන්

252 වන අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තිය සමඟ කියවිය යුතු 20 වැනි උපවගන්තියේ (අ) ඡේදයට අනුව මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභාවේ පවත්වාගෙන යනු ලබන සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම්කිරීම විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය , පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ වෙළඳාම් පවත්වාගෙන යනු ලබන සංචාරක වෙළඳුන් විසින් කරනු ලබන ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳ ව වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් මහ නගර සභා ප්‍රදේශය තුළ ඇති හෝටලයක, සාප්පුවක හෝ වෙළෙඳ පොළක නොවන වෙනත් කවර හෝ ස්ථානයක ආහාර පාන ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම නොකළ යුතු ය.

3. *(අ)* මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

*(ආ)* (අ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද මහජනතාව රැස්වන කවර හෝ ආකාරයක උත්සවයක් හෝ රැස්වීමක් හෝ පෙරහැරක් හෝ වෙනත් යම් ආකාරයක මහජන ඒකරාශීවීමක් මහ නගර සභා ප්‍රදේශය ඇතුළත පවත්වනු ලබන කාලයක දී සංචාරක වෙළෙඳාම සඳහා නාගරික කොමසාරිස්වරයා විසින් තාවකාලික බලපත්‍රයක් නිකුත් කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතුය. එසේම එකී බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ කිනම් දිනයක් සඳහා ද එ දිනෙන් පසුව ඒ බලපත්‍රය අවසන් විය යුතු ය.

4. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ සංචාරක වෙළෙන්දෙකුට ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

*(අ)* විකිණීම සඳහා තබා ගනු ලබන ආහාර, හෝ පාන වර්ග මැස්සන්ගෙන්, කෘමීන්ගෙන්, දූවිල්ලෙන් හෝ ජලයෙන් දූෂණය නොවන ආකාරයට සංවෘත භාජනයක් හෝ පෙට්ටියක් පාවිච්චියට ගැනීමට සූදානම් කර තිබිය යුතු ය.

*(ආ)* ආහාර විකිණීමේ දී ගණුදෙනුකරුවන්ට පිරිනැමීම සඳහා පාවිච්චි කිරීමට මළ නොබැඳෙන ලෝහයෙන් තැනූ අල්ලුවක් තිබිය යුතුය.

*(ඇ)* ගණුදෙනුකරුවන්ට ඒ අවස්ථාවේ දී ම පරිභෝජනය කිරීමට ආහාර හෝ පාන වර්ග පිරිනැමීම කරනු ලබන්නේ නම් ඒ සඳහා ම වෙන් වූ භාජන තබාගෙන තිබිය යුතු ය.

*(ඇ)* ගනුදෙනුකරුවන් විසින් පරිභෝජනයෙන් පසුව ඉතිරි කරනු ලබන ආහාර කොටස් බහාලීම සඳහා වෙනම භාජනයක් ද, ඉතිරි කරන පාන වර්ග ශේෂය බහාලීම සඳහා වෙනම භාජනයක් ද බැගින් තබාගෙන තිබිය යුතු අතර එකී භාජන හොඳින් වසා තැබිය හැකි පියනකින් යුක්ත විය යුතුය.

5. සංචාරක වෙළඳාමේ යෙදෙන කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් මං මාවතක හෝ මාර්ගයක ධාවනය කෙරෙන වාහනවලට හෝ ගමන් කරන පදිකයන්ට හෝ කිසියම් පොදු ස්ථානයක ගැවසෙන ජනතාවට බාධාවක් හෝ අනතුරක් සිදුනොවන ආකාරයෙන් තම වෙළඳාම කරගෙන යනු ලබන්නේ නම් මිස කවර හෝ පොදු ස්ථානයක සංචාරක වෙළඳාම නොකළ යුතු ය.

6. සංචාරක වෙළඳාමේ යෙදෙන අවස්ථාවේදී ජනනය වන සියලුම අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය, බදුල්ල මහ නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල යටතේ නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් බැහැරලීම කළ යුතු ය.

7. *(අ)* ස්පර්ශයෙන් බෝවෙන රෝගයක් හෝ උදරාශ්‍රිත රෝග තත්ත්වයක් හෝ බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ පැතිරෙන බවට හෝ එවැනි රෝග තත්ත්වයක් පැතිරීමේ අවදානමක් පවතින බවට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් නාගරික කොමසාරිස්වරයාට කරුණු වාර්තා කර ඇති යම් අවස්ථාවක -

(i) ඒ පිළිබඳව ලිඛිතව කරුණු සඳහන් කරමින් මේ කොටසේ නියමයන් යටතේ නිකුත් කළ කිසියම් බලපත්‍රයක් තාවකාලිකව අත්හිටුවීමට,
(ii) බදුල්ල මහ නගර සභා ප්‍රදේශයේ කිසියම් කොටසක සංචාරක වෙළඳාම තහනම් කිරීමට,
(iii) ඉහත (i) ඡේදය යටතේ තාවකාලිකව අත්හිටුවනු ලැබූ බලපත්‍රය, එසේ අත්හිටුවනු ලැබූ කාලය ඇතුළත නාගරික කොමසාරිස්වරයාගේ භාරයට ගනු ලැබීමට, සහ
(iv) බලපත්‍රය අත්හිටුවීමක් සිදු කරනු නොලැබුවේ නම්, එකී බලපත්‍රයේ වලංගු කාලය ඉකුත් වීමට නියමිත දිනට පෙර එකී රෝග පැතිරීමේ අවදානම අවසන් වී ඇති බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් නාගරික කොමසාරිස්වරයාට කරුණු වාර්තා කරනු ලැබ ඇත්නම් අත්හිටුවනු ලැබූ බලපත්‍රය ප්‍රතිසාධනය කිරීමටත් ,

නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතුය.

*(ආ)* ඉහත (අ) ඡේදය යටතේ කිසියම් බලපත්‍රයක් තාවකාලිකව අත්හිටුවීම නිසා බලපත්‍ර ලාභියාට සිදුවන යම් පාඩුවක් හෝ හානියක් සම්බන්ධයෙන් බදුල්ල මහ නගර සභාව, නාගරික කොමසාරිස්වරයා , බලයලත් නිලධාරියා හෝ සෞඛ්‍ය වෛද්‍යවරයා වගකීමට යටත් නොවනු ඇත.

*(ඇ)* ඉහත (අ) ඡේදයේ (ii) අනුඡේදය යටතේ මහ නගර සභා ප්‍රදේශයේ කිසියම් කොටසක සංචාරක වෙළඳාම තහනම් කිරීමට හේතු වූ අවදානම අවසන් වී ඇති බව සෞඛ්‍ය වෛද්‍යවරයා විසින් නාගරික කොමසාරිස්වරයාට කරුණු වාර්තා කරනු ලැබ ඇත්නම් එකී කොටසේ සංචාරක වෙළඳාම සඳහා නැවත අවසර දෙනු ලබන බව බලපත්‍රලාභීන්ට දැන්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

8. 7 වන වගන්තිය යටතේ නාගරික කොමසාරිස්වරයා විසින් මහ නගර සභා ප්‍රදේශයේ කිසියම් කොටසක සංචාරක වෙළඳාම තහනම් කරනු ලැබ ඇති විටක, කවර හෝ තැනැත්තෙකු විසින් එකී කොටසේ සංචාරක වෙළඳාම නොකළ යුතු ය.

9. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලබා ඇත්තේ වුව ද කිසියම් අසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස සංචාරක වෙළඳාමේ යෙදීම නොකළ යුතු ය.

10. සෑම බලපත්‍රලාභියෙකුම සංචාරක වෙළඳාමේ නියුක්ත වන සෑම අවස්ථාවකදී ම මේ කොටසේ නියමයන් යටතේ ලබාගෙන ඇති බලපත්‍රය තමා සන්තකයේ තබාගත යුතුවාක් හැර නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු ඉල්ලා සිටි විටක පරීක්ෂා කිරීම පිණිස ඉදිරිපත් කළ යුතු ය.

11. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට යම් සංචාරක වෙළෙන්දෙකු සංචාරක වෙළෙඳාම කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

12. කිසියම් සංචාරක වෙළෙන්දෙකු විසින් වෙළෙඳාම් කරනු ලබන කවර හෝ ආහාර හෝ පාන වර්ගයක සාම්පලයක්, නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් එහි මිල ගෙවා ලබා ගැනීම නිත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිළදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

13. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් සංචාරක වෙළඳාමක් 4 වන වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක බලපත්‍රලාභියා වෙත ලිඛිතව කරනු ලබන දැන්වීමක් භාර දීමෙන් අනතුරුව බලපත්‍රලාභියාට සංචාරක වෙළඳාම සඳහා නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නිත්‍යානුකූල විය යුතු ය.

14. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියෙකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකටද,
(ii) දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකටද,
(iii). තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"සංචාරක වෙළඳාම" යන්නෙන්, භාජනයක හෝ පෙට්ටියක හෝ වෙනත් යම් ආකාරයක ආධාරකයක හෝ කිසියම් වාහනයක හෝ පා පැදියක හෝ කරත්තයක හෝ අත් කරත්තයක හෝ තබාගෙන මහජනතාවගේ පරිභෝජය සඳහා විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ එසේ ප්‍රදර්ශනය කරමින් විකිණීම හෝ කරනු ලබන ආහාර වර්ග හෝ පාන වර්ග වෙළඳාමක් අදහස් වන අතර ඒ ආකාරයෙන් තැනින් තැනට ගෙන යමින් හෝ කිසියම් තැනක නතර වී හෝ කරනු ලබන වෙළඳාමක් ද ඊට ඇතුළත් විය යුතු ය.

## XXV වැනි කොටස

### ලොන්ඩරි

252 වන අධිකාරිය වන බදුල්ල මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තියේ 21 වැනි උපවගන්තියෙන් මහා නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන ලොන්ඩරි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම පිළිබඳ ව වූ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ පවත්වාගෙන යන ලොන්ඩරි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථාවයි.

2. නාගරික කොමසාරිස්වරයා විසින් නිකුත් කළ වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත කවර හෝ ස්ථානයක ලොන්ඩරියක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3. බලපත්‍රය ලබා ගැනීමට අදහස් කරන්නේ යම් ස්ථානයක් සඳහා ද, ඒ ස්ථානය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් ලොන්ඩරියක් සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(i) ලොන්ඩරිය සඳහා භාවිතා කරන ගොඩනැගිල්ලේ සෑම කාමරයකට ම විවෘත කළ හැකි කවුළු සවිකර තිබිය යුතු අතර එකී කවුළු, එක් එක් කාමරයේ ගෙබිමේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට අඩු නොවිය යුතු ය.

(ii) සෑම කාමරයක ම බිත්තිවල උස ප්‍රමාණය මීටර් 2.14කට නොඅඩු විය යුතු ය.

(iii) කිළිටි රෙදි සහ සේදූ රෙදි සඳහා වෙන වෙන ම කාමර සපයා තිබිය යුතු ය.

(iv) ලොන්ඩරියෙහි සේවයෙහි නියුක්තව සිටින තැනැත්තන් සෑම දස දෙනෙකුට ම යටත් පිරිසෙයින් එක් වැසිකිළියක් බැගින් වන වැසිකිළි සංඛ්‍යාවක් ඉදිකර තිබිය යුතු ය.

(v) නාගරික කොමසාරිස්වරයා විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමිතියකට අනුව පවිත්‍රකරණය කිරීමක් කරන්නේ නම් මිස රෙදි සේදීමෙන් පසු බැහැර කරන අප ජලය පොදු ජල මාර්ගයකට මුදා හැරීම නොකළ යුතු ය.

(vi) රෙදි සේදීමෙන් පසු බැහැර කරන අප ජලය පවිත්‍රකරණයට ලක් කිරීමට නොහැකි වන අවස්ථාවක, එකී අප ජලය, උරා ගන්නා වළකට ගලා යාම ට සැලැස්විය යුතු ය. එසේ ම එකී උරා ගන්නා වල වාතයට නිරාවරණය කර නොතිබිය යුතු අතර ආසන්නයේ ඉදිකර ඇති ළිඳක සිට මීටර් පහළොවකට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතු ය.

(vii) ලොන්ඩරිය සඳහා භාවිතා කරන ගොඩනැගිල්ල ඇතුළත හා පිටත ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ වැඩ පිළිවෙලක් ඇතිකර තිබිය යුතු ය.

4. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම, එය කළින් අවලංගු කරනු ලැබුවහොත් මිස එය නිකුත් කර ඇත්තේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන් විය යුතු ය.

5. බලපත්‍ර ලත් සෑම ලොන්ඩරියක් ම සඳහා භාවිත කරන ස්ථානය ඇතුළත -

(i) මනා අලුත්වැඩියාවෙන් යුතුව පවත්වාගෙන යා යුතු ය ;

(ii) කවර හෝ අවස්ථාවක ගෘහ කාර්යය සඳහා භාවිතා නොකළ යුතු ය ;

(iii) කවර හෝ සතෙකු තබා ගැනීම හෝ එසේ කිරීමට ඉඩදීම නොකළ යුතු ය ;

(iv) කිළිටි රෙදි සහ සේදූ රෙදි එකට තැබීම හෝ තබන්නට සැලැස්වීම නොකළ යුතු ය;

(v) රෙදි මැදීමේ කාර්යය සඳහා අඟුරු භාවිත කරනු ලබන්නේ නම් බැහැර කරනු ලබන ශේෂ කොටස් ජලය යොදා නිවා දැමීමෙන් අනතුරුව වෙනම භාජනයක තැබීමට සැලැස්විය යුතු අතර බලපත්‍රලත් ස්ථානය ඇතුළත අඟුරු කැට නිපදවීම සඳහා පොල් කටු හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් පිළිස්සීම නොකළ යුතු ය;

(vi) දෛනික කටයුතු අවසානයේ ලොන්ඩරියේ දල්වන ලද ගින්දර නිවා දැමීමට ක්‍රියා කළ යුතු ය.

6. කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තකුගේ සහායකයකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

7. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියෙකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

(i) බලපත්‍රධාරියෙකු යන්නෙන් හඳුන්වනු ලබන්නේ ලොන්ඩරියේ අයිතිකරු වන්නේය.

(ii) "ලොන්ඩරිය" යන්නෙන්, රෙදි ශෝධකයකු ලෙස ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තකු විසින් රෙදි සේදීම, වියලීම, වියලීම මගින් පිරිසිදු කිරීම හෝ මැදීම හෝ යන කිසියම් කාර්යයක් හෝ කාර්යයන් කිහිපයක් සඳහා පාවිච්චි කරන කවර හෝ වර්ගයක ගොඩනැගිල්ලක් හෝ යම් ඉඩමක් හෝ ස්ථානයක් හෝ පරිශ්‍රයක් හෝ අදහස් වන අතර, එවැනි යම් රෙදි ගබඩා කිරීම සඳහා පාවිච්චි කරන යම් ගොඩනැගිල්ලක් ද එවැනි තැනැත්තකු විසින් හෝ ඔහුගේ ව්‍යාපාරයේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා යම් ළිඳක්, ටැංකියක් හෝ ජලය ලබා ගන්නා වෙනත් ප්‍රභවයක් ඊට ඇතුළත් විය යුතු ය.

XXVI වැනි කොටස

**හෝටල්**

252 වන අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තියේ 19 වැනි උපවගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යන හෝටල් විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම පිළිබඳ ව වූ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ හෝටල් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ හෝටලයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වැනි දිනෙන් අවසන් විය යුතු ය.

4. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ හෝටලයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(2) ස්ථානයේ සෑම කාමරයක ම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ගඩොලෙන්, සිමෙන්ති ගලෙන් හේ කබොක් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුව ද මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූලවන ලෙස සැලකිය යුතු ය.

(3) ස්ථානයේ සෑම කාමරයක ම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5 කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(4) සෑම කාමරයකට ම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ගඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුව ද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාළ නොවිය යුතු ය.

(5) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය.

(6) පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2කට උසින් පිහිටා තිබිය යුතු අතර අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය.

(7) සෑම කාමරයක ම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(8) ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර මුළුතැන්ගෙය තුළ තබන කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(9) ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 17 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(10) ස්ථානයේ මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන සෑම මේසයක් ම -

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(11) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති සෑම මේසයක් ම -

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර එකී මේසය මතුපිට වීදුරු තහඩුවකින් හෝ ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර වීදුරු තහඩුවකින් හෝ මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(12.) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(13) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(14) ගණුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(15) ගණුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතු ය.

(16) සෑම වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් කබුක් ගලෙන් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේ ම තවදුරටත් ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තැනූ බිත්ති වන විට ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(17) ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර (15) වැනි ඡේදයේ සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්තිවලට අදාළ විය යුතු ය.

(18) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ ගනුදෙනුකරුවන්ගේ අත් සේදීමට මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්លූ බේසම් තනා තිබිය යුතු ය.

(19) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය.

(20) බදුල්ල මහ නගර සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් ස්ථානයෙන් බැහැර කරන අප ජලය මහ නගර සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී ජලාපවහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර එසේ නොවන අවස්ථාවක එකී අප ජලය උරා ගන්නා වළකට ගලා යාමට සලස්වා තිබි යුතු ය.

(21) ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර ස්ථානයට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

(22) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතු ය.

(23) ස්ථානයේ ගනුදෙනුකරුවන්ට හා සේවකයන්ට නිදාගැනීමට වෙන්කළ නිදන කාමරවල එක් තැනැත්තෙකුට නිදා ගැනීමට වෙන්කළ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් මීටර් හතරකට නොඅඩු විය යුතු ය.

5. තීන්ත ආලේප කර තිබිය යුතු යයි සහ 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

6. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර අප ජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානයෙහි නිදන කාමර වශයෙන් නිශ්චිතව වෙන් කර ඇති කාමරයක හැර වෙනත් කිසියම් කාමරයක කවර හෝ තැනැත්තෙකුට නිදාගැනීමට ඉඩ දීම නොකළ යුතු ය.

8. 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ (23) වැනි ඡේදයේ සඳහන් අවම ඉඩ ප්‍රමාණයට නොසැසඳෙන තැනැත්තන් සංඛ්‍යාවක් යම් නිදන කාමරයක නිදා ගැනීමට බලපත්‍රලාභියා විසින් ඉඩ දීම නොකළ යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයෙහි රාත්‍රිය නතර වී සිටීමට පැමිණෙන එක් එක් තැනැත්තාගේ නම, ලිපිනය හා අනන්‍යතාව සටහන් කරන ලේඛනයක් සෑම බලපත්‍රලත් ස්ථානයකම පවත්වා ගත යුතු අතර නාගරික කොමසාරිස්වරයා, බලයලත් නිලධාරියා හෝ කිසියම් පොලිස් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටින අවස්ථාවක දී එකී ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩ දීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයේ සෑම නිදන කාමරයක ම එක් ගණුදෙනුකරුවකු විසින් පාවිච්චි කරනු ලැබීමෙන් අනතුරුව තවත් ගනුදෙනුකරුවකුගේ පාවිච්චියට ඉඩදීමට පෙර එකී නිදන කාමරයේ ඇඳ ඇතිරිලි, කොට්ට උර, පොරෝනා, තුවා සහ පාවිච්චි කළ වෙනත් රෙදි සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව මිස අනෙක් ගණුදෙනුකරුවකුගේ පාවිච්චියට සැලැස්වීම නොකළ යුතුවාත් හැර පසුව පැමිණෙන ගනුදෙනුකරුවාට එකී කාමරය පාවිච්චි කිරීමට ඉඩ දීමට පෙර එකී කාමරයේ ජනේල අවම වශයෙන් පැය හතරක් වත් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සැලැස්විය යුතු ය.

11. සෑම බලපත්‍රලත් ස්ථානයකම සෑම කාමරයක්, හිණිපෙලක්, ආලින්දයක්, කාණුවක් සහ එකී ස්ථානයට අයත් ඉඩම ද සෑම දිනක ම මධ්‍යාහ්නයට පෙර අතු ගෑමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

12. බලපත්‍රලත් ස්ථානයේ කිසියම් නිදන කාමරයක, ආහාර පිළියෙල කරනු ලබන ස්ථානයක හෝ ආහාර ගැනීමට වෙන්කළ කිසියම් කොටසක කවර හෝ සත්ත්වයකු තබා ගැනීම නොකළ යුතු ය.

13. බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර, දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය. එසේ වුව ද ගනුදෙනුකරුවන් නවාතැන් ගන්නා කිසියම් කාමරයක වැසිකිළි දිනකට එක් වරක් පිරිසිදු කිරීම ප්‍රමාණවත් ලෙස සැලකිය හැකි ය.

14. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට සහ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක් ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර, පාවිච්චි කිරීමෙන් පසුව සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ 19 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යයකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එකී කසල අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර, එකී භාජනවලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේ දී හැර අන් සියලු වේලාවන් වල දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

16. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

17. *(අ)* බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය ;
(ii) වීදුරු ;
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය ;
(iv) පොලිතින් හා ප්ලාස්ටික් හෝ පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;
(vii) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර , ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහ නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

18. සෑම බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගතයුතු අතර , එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

19. ගණුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේ දී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර, එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගැරුප්පුවක් හෝ වෙනත් ආකාරයක උපකරණයක් යොදා ගත යුතු ය.

20. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බාල කළ කිරි කිසිවක් තබා ගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා බාල කළ කිරි යන්නෙන් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කළ කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 85 කට අඩු හෝ කිරි මේද සියයට 35කට අඩු එළකිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 9 ක හෝ කිරි මේද සියයට 7 කට අඩු මී කිරි අදහස් වේ.

21. *(අ)* කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක

කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තකුගේ සහායකයකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය ;

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය;

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

22. බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයකු වෙත ම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

23. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු, පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

24. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

25. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී මිල දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

26. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් හෝටලයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය, ඒ නියමයට අනුකූල තත්ත්වයකට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

27. 26 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

28. 27 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

29. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි -

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද;

ii. දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද;

iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේ ය.

30. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"හෝටලය" යන්නෙන්, විකිණීම සඳහා පිසූ බත් සහ ව්‍යාංජන පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් ආහාර වේලක් සඳහා කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙල කළ ආහාර වර්ගයක් හෝ කිසියම් කෙටි ආහාර වර්ගයක් විකිණීම සඳහා පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් හෝ එකී කාර්යයන් සමග ගනුදෙනුකරුවන් නවාතැන් ගැනීමට ඉඩකඩ සලස්වා ඇති ස්ථානයක් අදහස් වේ.

XXVII වන කොටස

**බත්කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ**

252 වන අධිකාරිය වන මහා නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තිය සමග කියවිය යුතු 19 සහ 22 වැනි උපවගන්තිවලට අනුව මහ නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභාවේ පවත්වාගෙන යනු ලබන බත්කඩ,ත ආපනශාලා, සහ තේ හෝ කෝපි කඩ විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම, පිළිබඳ ව වූ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහා නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ බත් කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථායි.

2. නාගරික කොමසාරිස්වරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් බදුල්ල මහා නගර සභා ප්‍රදේශය තුළ බත්කඩයක්, ආපනශාලාවක්, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

4. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ බත්කඩයකට, ආපනශාලාවකට, තේ හෝ කෝපි කඩයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය,

(2) ස්ථානයේ සෑම කාමරයක ම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තබා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුව ද මුළුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූලවන ලෙස සැලකිය යුතු ය.

(3) ස්ථානයේ සෑම කාමරයක ම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එකී සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(4) සෑම කාමරයකට ම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුව ද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාළ නොවිය යුතු ය.

(5) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය.

(6) පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2 කට උසින් පිහිටා තිබිය යුතු අතර අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය.

(7) සෑම කාමරයකම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය.

(8) ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර මුළුතැන්ගෙය තුළ තබන කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.

(9) ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 11 වන වගන්තියෙහි නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(10) ස්ථානයේ මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන සෑම මේසයක් ම -

*(අ)* ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර එකී මේසය මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

*(ආ)* යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා අති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(11) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති සෑම මේසයක් ම -

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර එකී මේසය මතුපිට වීදුරු තහඩුවකින් හෝ ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර වීදුරු තහඩුවකින් හෝ මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය.

(12) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(13) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම් එසේ ගබඩාකර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(14) ගණුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(15) ගනුදෙනුකරුවන්ගේ සහ සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුට එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වන වැසිකිළි හා කැසිකිළි තනා තිබිය යුතු ය.

(16) සෑම වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන්, කබුක් ගලෙන් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේ ම තවදුරටත් ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තැනූ බිත්ති වන විට ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය.

(17) ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාන කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර (15) වන ඡේදයේ සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්තිවලට අදාළ විය යුතු ය.

(18) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ ගනුදෙනුකරුවන්ගේ අත් සේදීමට මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්лූ බේසම් තනා තිබිය යුතු ය.

(19) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය.

(20) මහ නගර සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් ස්ථානයෙන් බැහැර කරන අප ජලය මහ නගර සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී ජලාපවහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර එසේ නොවන අවස්ථාවක එකී අප ජලය උරා ගන්නා වළකට ගලා යාමට සලස්වා තිබිය යුතු ය.

(21) ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර ස්ථානයට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය.

(22) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යකින් ආවරණය කර තිබිය යුතු ය.

5. තීන්ත ආලේප කර තිබිය යුතු යයි සහ 4 වන වගන්තියේ නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

6. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර අප ජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජ නාශක යෙදීම කළ යුතු අතර දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වා ගත යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට සහ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක් ම ඒවා පාවිච්චියට ගැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර පාවිච්චි කිරීමෙන් පසුව සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

9. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ 11 වැනි වගන්තියේ නියම කර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එකී කසළ අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර, එකී භාජනවලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේ දී හැර අන් සියලු වේලාවන් වලදී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

10. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

11. *(අ)* බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

(i) ජෛවහායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,
(vii) අන්තරායකර අප ද්‍රව්‍ය.

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අප ද්‍රව්‍ය මහ නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

12. සෑම බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගත යුතු අතර , එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

13. ගනුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේ දී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගෑරුප්පුවක් හෝ වෙනත් ආකාරයක උපකරණයක් යොදා ගත යුතු ය.

14. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බාල කළ කිරි කිසිවක් තබා ගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා බාල කළ කිරි යන්නෙන් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කළ කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 85 කට අඩු හෝ කිරි මේද සියයට 35කට අඩු එළකිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 9 ක හෝ කිරි මේද සියයට 7 කට අඩු මී කිරි අදහස් වේ.

15. *(අ)* කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

*(ආ)* හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

*(ඇ)* බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියා ගේ කාර්යය විය යුතු ය.

16. බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයෙකු වෙත ම පිළිවැසුම් සපයා තිබීමත්, එකී සේවකයන් කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්ය විය යුතු ය.

17. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

18. කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානය ඇතුළත දුම්බීම හෝ බුලත් සැපීම නොකළ යුතු ය.

19. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

20. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක්, එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිල දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

21. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් බත්කඩයක්, ආපනශාලාවක්, තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වැනි වගන්තියේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයකට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

22. 21 වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

23. 22වැනි වගන්තියේ සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

24. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියෙකු යම් හෙයකින් වරදකරුවෙකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,
(ii) දෙවැනිවර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද,
(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේ ය.

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

I."ආපන ශාලාව හෝ බත් කඩය" යන්නෙන්, විකිණීම සඳහා පිසූ බත් සහ ව්‍යාංජන පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් අදහස් වන අතර ආහාර වේලක් සඳහා කෑමට සුදුසු වෙනත් කවර හෝ පිළියෙල කළ ආහාර වර්ගයක් හෝ කිසියම් කෙටි ආහාර වර්ගයක් විකිණීම සඳහා පිළියෙල කරන හෝ තබා ගන්නා හෝ ප්‍රදර්ශනය කරන ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

II."තේ හෝ කෝපි කඩය" යන්නෙන්, බේකරි නිෂ්පාදන හෝ වෙනත් කෙටි ආහාර සමග තේ හෝ කෝපි විකිණීම සඳහා පවත්වාගෙන යනු ලබන ස්ථානයක්, අදහස් වේ.

## XXVIII වැනි කොටස

### නවාතැන් පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථා

252 වන අධිකාරය වන මහ නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 267 සහ 272 වන වගන්තිය සමග කියවිය යුතු 22 වැනි උපවගන්තිවලට අනුව මහ නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහා නගර සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන නවාතැන් පොළවල් හෝටල් විධිමත් කිරීම, පාලනය කිරීම සහ අධීක්ෂණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ නවාතැන් පොළවල් සහ නවාතැන් ගෙවල් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳව අතුරු ව්‍යවස්ථායි.

2. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ නවාතැන් පොළක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

4. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ හෝටලයකට බලපත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(1) ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(2) ස්ථානයේ සෑම කාමරයකම බිත්ති මීටර් 2.5කට නොඅඩු උසකින් යුක්ත විය යුතු අතර එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් තනා තිබිය යුතු අතර දෙපැත්ත ම කපරාරු කර තීන්ත ආලේප කර තිබිය යුතු ය. එසේ වුව ද මුලුතැන්ගේ හැර වෙනත් කාමර ලීයෙන් හෝ කිසියම් ලෝහ තහඩු වර්ගයකින් හෝ ලී හා කිසියම් ලෝහ තහඩු වර්ගයකින් තනා තීන්ත ආලේප කර තිබීම මේ නියමයට අනුකූලවන ලෙස සැලකිය යුතු ය.

(3) ස්ථානයේ සෑම කාමරයක ම සීලිමක් බැගින් සවිකර තිබිය යුතු අතර එහි සීලිම පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2.5කට නොඅඩු උසකින් තිබිය යුතු ය.

(4) සෑම කාමරයකටම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර, ඒ එක් එක් කාමරයේ ජනේල විවෘත කළ විට ඒ ජනේලවල කවුළුවල වර්ගඵලය කාමරයේ බිම වර්ග ඵලයෙන් පහළොවෙන් එකකට නොඅඩු විය යුතු ය. එසේ වුව ද කිසියම් කාමරයක් වායු සමනය කර ඇති අවස්ථාවක දී මේ නියමය අදාළ නොවිය යුතු ය,

(5) වහළය කිසියම් ස්ථිර ද්‍රව්‍යයකින් තනා තිබිය යුතු ය,

(6) පියසි කෙළවරවල් පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2කට උසින් පිහිටා තිබිය යුතු අතර, අගු වාසිය අවම වශයෙන් මීටර් 1.5ක් විය යුතු ය,

(7) සෑම කාමරයකම බිම සිමෙන්ති දමා කපරාරු කර සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය,

(8) ස්ථානය තුළ ජනනය වන කසළ රැස්කිරීම සඳහා කසළ භාජන තබා තිබිය යුතු අතර, මුළුතැන්ගෙය තුළ තබන කසළ භාජන මැස්සන් හෝ වෙනත් කෘමි සතුන්ට ඇතුල්විය නොහැකි වන ආකාරයෙන් වසා තැබිය හැකි පියන් තිබිය යුතු ය.,

(9) ස්ථානය තුළ ජනනය වන කසළ අපහරණය කිරීම සඳහා 21 වැනි අතුරු ව්‍යවස්ථාවේ නියමයන් අනුව ක්‍රියා කළ හැකි ආකාරයට අවශ්‍ය විධිවිධාන සලස්වා තිබිය යුතු ය,

(10) ස්ථානයේ මුළුතැන්ගෙය තුළ පාවිච්චියට ගනු ලබන සෑම මේසයක් ම -

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර, මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

(11) ස්ථානයේ ගනුදෙනුකරුවන්ගේ පාවිච්චියට තබා ඇති සෑම මේසයක් ම -

(අ) ලීයෙන් තනා ඇති විට එහි පාද ඔපදමා තීන්ත ආලේපකර තිබිය යුතු අතර, එකී මේසය මතුපිට වීදුරු තහඩුවකින් හෝ ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

(ආ) යකඩ හෝ වානේ හෝ වෙනත් කිසියම් ලෝහයකින් තනා ඇති විට එහි පාද තීන්ත ආලේප කර තිබිය යුතු අතර, වීදුරු තහඩුවකින් හෝ මතුපිට ඔප දැමූ අපාරගම්‍ය ද්‍රව්‍යයකින් හෝ මළ නොබැඳෙන හා පිරිද්දුම් නැති ලෝහ තහඩුවකින් ආවරණය කර තිබිය යුතු ය,

(12) ස්ථානයේ පාවිච්චියට ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය ස්ථානයේ පාවිච්චිය සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(13) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩාකර තබන්නේ නම් එසේ ගබඩාකර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය.

(14) ගනුදෙනුකරුවන් විසින් පාවිච්චියට ගනු ලැබූ භාජන සේදීම සඳහා වෙනම කොටසක් ස්ථානයේ පවත්වාගෙන යා යුතු ය.

(15) සේවකයන්ගේ පාවිච්චිය සඳහා අවම වශයෙන් සෑම දහදෙනෙකුටම එකක් බැගින් වනසේ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වූ වැසිකිළි හා කැසිකිළි ද ගනුදෙනුකරුවන්ගේ පොදු පරිහරණයට වෙන් කළ ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් වශයෙන් වූ වැසිකිළි හා කැසිකිළි එකක් තනා තිබිය යුතු ය.

(16) සෑම වැසිකිළියක හා කැසිකිළියක ම බිත්ති ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් කබුක් ගලෙන් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තනා බිම සිමෙන්තියෙන් කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. එසේ ම තවදුරටත් ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් තැනූ බිත්ති වන විට ඒවා කපරාරු කර සිමෙන්තියෙන් ඔප දමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු වන අතර, මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් තැනූ බිත්ති වනවිට ඒවා මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය,

(17) ස්ථානයේ සේවයේ නියුක්ත තැනැත්තන්ගේ පාවිච්චිය සඳහා නාම කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර, (15) වැනි ඡේදයේ සඳහන් වැසිකිළිවලට අදාළ නියමයන් එකී නාන කාමරවල බිමට සහ බිත්තිවලට අදාළ විය යුතු ය,

(18) ස්ථානයේ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට වෙන්කළ කොටස තුළ ගණුදෙනුකරුවන්ගේ අත් සේදීමට මළ නොබැඳෙන ලෝහ තහඩුවලින් හෝ පිඟන් මැටියෙන් තනා ඔපදැමූ හෝ ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් බැඳ පිඟන් ගඩොල් ඇල්ලූ බේසම් තනා තිබිය යුතු ය,

(19) ස්ථානයේ කවර හෝ කොටසක පාවිච්චියෙන් පසු බැහැර කරන අපජලය අවහිරයකින් තොරව ගලා යාමට සුදුසු කාණු පද්ධතියක් ඇතිකර තිබිය යුතු ය,

(20) බදුල්ල මහා නගර සභාව විසින් ජලාපවහන පද්ධතියක් පවත්වාගෙන යනු ලබන්නේ නම් ස්ථානයෙන් බැහැර කරන අපජලය මහ නගර සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් එකී ජලාපවහන පද්ධතියට ගලා යාමට සැලැස්විය හැකි අතර, එසේ නොවන අවස්ථාවක එකී අපජලය උරා ගන්නා වළකට ගලායාමට සලස්වා තිබිය යුතු ය,

(21) ස්ථානයේ සාමාන්‍ය ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු අතර, ස්ථානයට විදුලිය සම්බන්ධතාව ලබාගෙන ඇත්නම් අතිරේක වශයෙන් විදුලි ගිනි නිවීමේ උපකරණ සපයා තිබිය යුතු ය,

(22) ස්ථානයේ තේ, කෝපි හෝ කිරි පිළියෙල කරනු ලබන කොටස පිරිද්දුම් නැති මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් හෝ පිඟන් ගඩොල් අල්ලා හෝ වෙනත් අපාරගම්‍ය ද්‍රව්‍යයකින් ආවරණය කර තිබිය යුතු ය,

(23) ස්ථානයේ ගණුදෙනුකරුවන්ට හා සේවකයන්ට නිදාගැනීමට වෙන්කළ නිදන කාමරවල එක් තැනැත්තෙකුට නිදා ගැනීමට වෙන්කළ ඉඩ ප්‍රමාණය අවම වශයෙන් මීටර් හතරකට නොඅඩු විය යුතු අතර, සෑම නිදන කාමරයකම ඇඳක්, ඇඳුම් තැබීමට අල්මාරියක් හෝ කැබිනෙට්ටුවක්, තුවා රාක්කයක් නවාතැන්කරුගේ හෝ නවාතැන්කරුවන්ගේ භාණ්ඩ තැබීමට මේසයක් හා වැසිකිළියක් සහිත නාන කාමරයක් තිබිය යුතු ය.

(24) කිසියම් බලපත්‍රලත් ස්ථානයක ඇති නිදන කාමර ඇතුළත කවර හෝ අවස්ථාවක -

*(අ)* තනි කාමරයක එක් ඇඳකට වැඩියෙන් ද,
*(ආ)* යුගල කාමරයක ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකකට වැඩියෙන් ද,
*(ඇ)* ත්‍රිත්ව කාමරයක ද්විත්ව ඇඳක් හා තනි ඇඳකට හෝ තනි ඇඳන් තුනකට වැඩියෙන් ද,
*(ඈ)* පවුල් කාමරයක ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳක් හෝ ද්විත්ව ඇඳන් එකක් හා තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් පහකට වැඩියෙන් ද, තැබීම නොකළ යුතු ය.
*(ඉ)* නවාතැන් පොලෙහි ඇති තනි කාමර, යුගල කාමර, ත්‍රිත්ව කාමර, සහ පවුල් කාමර සංඛ්‍යාව සහ එක් එක් කාමරවල නවාතැන් පහසුව සැපයිය හැකි පුද්ගල සංඛ්‍යාව අයදුම්පත්‍රයේ සඳහන් විය යුතු ය.

5. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ බලපත්‍රයක් ඉල්ලා සිටින කවර හෝ තැනැත්තෙකු විසින් මේ කොටසේ උපලේඛනයේ සඳහන් ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් නාගරික සැලැස්ම සමඟ නාගරික කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

6. තීන්ත ආලේප කර තිබිය යුතු යැයි සහ 4 වැනි අතුරු වගන්තියෙහි නියම කර ඇති සෑම කොටසක ම අවම වශයෙන් අවුරුද්දකට එක් වරක් බැගින් තීන්ත ආලේප කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

7. බලපත්‍රලත් ස්ථානය අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් ඇමදීම කළ යුතු අතර, අපජලය බැසයන කාණු අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදුකර ජලයෙන් සෝදා හැරීම කළ යුතු ය.

8. බලපත්‍රලත් ස්ථානයෙහි නිදන කාමර වශයෙන් නිශ්චිතව වෙන් කර ඇති කාමරයක හැර වෙනත් කිසියම් කාමරයක කවර හෝ තැනැත්තෙකුට නිදාගැනීමට ඉඩදීම නොකළ යුතු ය.

9. 4 වැනි අතුරු වගන්තියේ (23) වැනි ඡේදයේ සඳහන් අවම ඉඩ ප්‍රමාණයට නොසැසඳෙන තැනැත්තන් සංඛ්‍යාවක් යම් නිදන කාමරයක නිදා ගැනීමට ඉඩ දීම නොකළ යුතු ය.

10. කිසියම් නවාතැන් පොළක තනි කාමරයක එක් තැනැත්තෙකුට වැඩියෙන් හෝ යුගල කාමරයක දෙදෙනෙකුට වැඩියෙන් හෝ ත්‍රිත්ව කාමරයක තුන් දෙනෙකුට වැඩියෙන් හෝ නිදාගැනීමට ඉඩදීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය. එසේ වුව ද මේ කිසියම් කාමරයක නිදා ගන්නා යම් තැනැත්තෙකු වයස අවුරුදු 12 ට අඩු අයෙකු වන විට මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා ඔහු එක් අයෙකු ලෙස සැලකීම නොකළ යුතු ය.

11. බලපත්‍රලත් ස්ථානයෙහි රාත්‍රිය නතර වී සිටීමට හෝ එහි කාමරවල පදිංචියට පැමිණෙන එක් එක් තැනැත්තාගේ නම, ලිපිනය හා අනන්‍යතාව සටහන් කරන ලේඛනයක් සෑම බලපත්‍රලත් ස්ථානයක ම පවත්වා ගත යුතු අතර, නාගරික කොමසාරිස්වරයා, බලයලත් නිලධාරියා හෝ කිසියම් පොලිස් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීමට ඉල්ලා සිටින අවස්ථාවක දී එකී ලේඛනය පරීක්ෂා කිරීමට ඉඩදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

12. කිසියම් නවාතැන් පොළක රාත්‍රී නවාතැන් ගන්නා සහ එහි පදිංචිය සඳහා පරිහරණය කරන සෑම තැනැත්තෙකු ම තම අනන්‍යතාව බලපත්‍රලාභියා වෙත ඉදිරිපත් කළ යුතු අතර, නවාතැන් පොළෙහි පවත්වාගෙන යනු ලබන අමුත්තන්ගේ ලේඛනයෙහි තමාගේ තොරතුරු ඇතුළත් කරන තීරුවේ තම නම අත්සන් කළ යුතු ය. එසේ ම තම අනන්‍යතාව ඉදිරිපත් නොකරන හෝ අමුත්තන්ගේ ලේඛනයෙහි තම අනන්‍යතාව පිළිබඳ තොරතුරු ඇතුළත් තීරුවේ නම අත්සන් කිරීම නොකරන කවර හෝ තැනැත්තෙකුට බලපත්‍රලත් ස්ථානයේ කවර හෝ කොටසක රාත්‍රී කාලයේ නවාතැන් ගැනීමට සැලැස්වීම බලපත්‍රලාභියා විසින් නොකළ යුතු ය.

13. කවර හෝ නවාතැන් පොළක සදාචාර විරෝධී කාර්යයන් සඳහා යොදා ගැනීමට ඉඩනොදීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු අතර කවර හෝ තැනැත්තෙකු විසින් නවාතැන් පොළෙහි වෙනත් නවාතැන්කරුවන්ගේ හෝ නවාතැන් පොළ ආසන්නයේ පදිංචිකරුවන්ට බාධාවක් වන ආකාරයෙන් ගීත ගායනා කිරීම හෝ තැටි වාදන යන්ත්‍ර ක්‍රියා කරවීම හෝ අනවශ්‍ය ආකාරයේ ශබ්ද ඇති කිරීම හෝ නොකළ යුතු ය.

14. බලපත්‍රලත් ස්ථානයේ සෑම නිදන කාමරයක ම එක් ගණුදෙනුකරුවෙකු විසින් පාවිච්චි කරනු ලැබීමෙන් අනතුරුව තවත් ගණුදෙනුකරුවෙකුගේ පාවිච්චියට ඉඩදීමට පෙර එකී නිදන කාමරයේ ඇඳ ඇතිරිලි, කොට්ට උර, පොරෝනා, තුවා සහ පාවිච්චි කළ වෙනත් රෙදි සෝදා පිරිසිදු කිරීමෙන් අනතුරුව මිස අනෙක් ගණුදෙනුකරුවෙකුගේ පාවිච්චියට සැලැස්වීම නොකළ යුතුවාත් හැර පසුව පැමිණෙන ගණුදෙනුකරුවාට එකී කාමරය පාවිච්චි කිරීමට ඉඩදීමට පෙර හෝ සෑම දිනයකම දිවා කාලයෙහි එකී කාමරයේ ජනේල අවම වශයෙන් පැය හතරක් වත් සම්පූර්ණයෙන් විවෘත කර තැබීමට සැලැස්විය යුතු ය.

15. සෑම බලපත්‍රලත් ස්ථානයකම සෑම කාමරයක්, හිණිපෙලක් , ආලින්දයක්, කාණුවක් සහ එකී ස්ථානයට අයත් ඉඩම ද සෑම දිනකම මධ්‍යාහ්නයට පෙර අතු ගෑමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

16. බලපත්‍රලත් ස්ථානයේ කිසියම් නිදන කාමරයක, ආහාර පිළියෙල කරනු ලබන ස්ථානයක හෝ ආහාර ගැනීමට වෙන්කළ කිසියම් කොටසක කවර හෝ සත්ත්වයෙකු තබා ගැනීම නොකළ යුතු ය.

17. බලපත්‍රලත් ස්ථානයේ ඇති වැසිකිළි සහ කැසිකිළි අවම වශයෙන් දිනකට දෙවරක් බැගින් පිරිසිදු කර විෂබීජනාශක යෙදීම කළ යුතු අතර දුර්ගන්ධය වහනය වීමෙන් තොරව පවත්වාගත යුතු ය. එසේ වුව ද ගණුදෙනුකරුවන් නවාතැන් ගන්නා කිසියම් කාමරයක වැසිකිළි දිනකට එක් වරක් පිරිසිදු කිරීම ප්‍රමාණවත් ලෙස සැලකිය හැකි ය.

18. බලපත්‍රලත් ස්ථානයේ ආහාර පාන පිළියෙල කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට, සහ ගණුදෙනුකරුවන්ගේ පාවිච්චියට ගනු ලබන භාණ්ඩ, භාජන හා උපකරණ සෑම එකක් ම ඒවා පාවිච්චියට ග ැනීමට පෙර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතු අතර පාවිච්චි කිරීමෙන් පසු ව සෝදා පිරිසිදු කිරීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

19. බලපත්‍රලත් ස්ථානයේ ඒ ඒ කොටසේ එකතු වන සියලුම කසළ 21 වැනි වගන්තියෙහි නියමකර ඇති ආකාරයෙන් වර්ග කර අපාරගම්‍ය ද්‍රව්‍යයකින් තැනූ භාජනයකට වහාම දැමීමට සැලැස්විය යුතු අතර, එකී කසළ අවම වශයෙන් එක් වරක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් ඒ ස්ථානයේ ඉවත් කිරීමට සැලැස්විය යුතු අතර එකී භාජනවලට කසළ බහාලන අවස්ථාවේ දී හා ඉවත් කිරීමේ දී හැර අන් සියලු වේලාවන්වල දී එම භාජනය හොඳින් වසා තැබිය යුතු ය.

20. බලපත්‍රලත් ස්ථානයෙන් ඉවත දමන කසළ කවර හෝ අවස්ථාවක ස්ථානයේ බිම හෝ තැනින් තැන දැමීම නොකළ යුතු ය.

21. *(අ)* බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අපද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය,
(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස්,
(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ,
(vii) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ගකර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අපද්‍රව්‍ය මහ නගර සභාවේ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැරලීම කළ යුතු ය.

22. සෑම බලපත්‍රලත් ස්ථානයක් ම මීයන්ගෙන්, මැස්සන්ගෙන් හෝ වෙනත් කෘමීන්ගෙන් තොරව පවත්වා ගත යුතු අතර එකී ස්ථානයේ තබා ගන්නා ආහාර හෝ පාන පිළියෙල කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය හා පිළියෙල කළ ආහාර හෝ පාන එකී සතුන්ගෙන් දූෂණය වීම වැළැක්වීමට අවශ්‍ය සියලුම විධිවිධාන සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

23. ගණුදෙනුකරුවන්ට ආහාර පිළිගැන්වීමේ දී ඒවා අතින් ඇල්ලීම නොකළ යුතු අතර එකී ආහාර පිළිගැන්වීම සඳහා හැන්දක් හෝ ගැරුප්පුවක් හෝ වෙනත් ආකාරයක උපකරණයක් යොදා ගත යුතු ය.

24. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක බාලකළ කිරි කිසිවක් තබා ගැනීම හෝ විකිණීම හෝ නොකළ යුතු ය. මේ අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා බාලකළ කිරි යන්නෙන් ජලය හෝ වෙනත් බාහිර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයන් එකතු කළ කිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 85කට අඩු හෝ කිරිමේද සියයට 35කට අඩු එළකිරි හෝ මේද නොවන කිරි ඝන ද්‍රව්‍ය සියයට 9 ක හෝ කිරි මේද සියයට 7 කට අඩු මී කිරි අදහස් වේ.

25. (අ) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකු ට මෑතකදී සාත්තු කිරීමෙ හි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්තවීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් බලපත්‍රලත් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

26. බලපත්‍රලත් ස්ථානයේ ආහාර හෝ පාන පිළියෙල කිරීමේ නියුක්ත සෑම සේවකයෙකු වෙත ම පිළිවැසුම් සපයා තිබීමත් එකී සේවකයන් කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී පිළිවැසුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

27. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත සෑම සේවකයෙකු සඳහා ම පිරිසිදු ජලය, පිරිසිදු තුවා, නියපොතු පිරිසිදු කිරීමට ඇති බුරුසු සහ සබන් හෝ සබන් දියර සපයා තිබිය යුතු ය.

28. බලපත්‍ර ලබාගන්නා ස්ථානය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හෝ ඔහුගේ නියෝජිතයෙකු පරීක්ෂා කර බලා සනීපාරක්ෂාව පිළිබඳ සහතික කරන තුරු ව්‍යාපාරික කටයුතු සඳහා 02 වැනි වගන්තියෙහි සඳහන් බලපත්‍රය නිකුත් නොකළ යුතුය.

29. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

30. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් බලපත්‍රලත් ස්ථානයක පිළියෙල කරන හෝ විකිණීමට තබා ඇති යම් කෑම වර්ගයකින් සාම්පලයක් එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාත් හැර කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී මිල දී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

31. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් හෝටලයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැලැස්විය යුතු ය.

32. 31 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

33. 32 වැනි වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියෙකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

34. මේ අතුරු ව්‍යවස්ථාවලින් කවර හෝ අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝනය කරන ලද කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකරන අතර ඒ පුද්ගලයා හෝ පුද්ගලයින්ට විරුද්ධව බදුල්ල මහ නගර සභා සීමාව තුළ අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරියේ නඩු පවරා වරදකරු කරනු ලැබුවහොත්,

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද,
(ii) දෙවැනි වර හෝ තදනන්තරව වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද,
(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

35. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල —

"පවුල් කාමරය'' යන්නෙන්, එකවර තැනැත්තන් තුන් දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳන් දෙකක් හා තනි ඇඳක් හෝ ද්විත්ව ඇඳන් එකක් හා තනි ඇඳන් තුනක් හෝ තනි ඇඳන් පහක් සහිත කාමරයක් ද,

"තනි ඇඳ" යන්නෙන් අවම වශයෙන් දිග සෙන්ටිමීටර් 200ක් හා පළල සෙන්ටිමීටර් 95ක් වූ මෙට්ටයක් සහිත ඇඳක් ද ;

"තනි කාමරය" යන්නෙන්, එක් තැනැත්තෙකුට පමණක් නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ තනි ඇඳක් සහිත කාමරයක් ද ;

"ත්‍රිත්ව කාමරය" යන්නෙන් එකවර තැනැත්තන් තුන් දෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳක් හා තනි ඇඳක් හෝ තනි ඇඳන් තුනක් සහිත කාමරයක් ද ;

"යුගල ඇඳ" යන්නෙන්, අවම වශයෙන් දිග සෙන්ටිමීටර් 200ක් හා පළල සෙන්ටිමීටර් 125ක් වූ මෙට්ටයක් සහිත ඇඳක් ද ;

"යුගල කාමරය" යන්නෙන්, එකවර තැනැත්තන් දෙදෙනෙකුට නවාතැන් ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩක් සහ ද්විත්ව ඇඳක් හෝ තනි ඇඳන් දෙකක් සහිත කාමරයක් ද,

"නවාතැන් පොළ" "නවාතැන් ගෙය""ලැගුම් නිවාස" යන්නෙන්, මුදල් ගෙවා ආහාර සහිතව හෝ රහිතව නිදා ගැනීමේ පහසුකම් සපයන හෝ එකම පවුලේ සාමාජිකයන් නොවන පස් දෙනෙකු හෝ ඊට නොඅඩු සංඛ්‍යාවකට මුදල් අයකර ලැගුම් හෝ පදිංචි පහසුකම් සපයන ගෙයක් හෝ කොටසක් අදහස් වන අතර අධ්‍යාපන ව්‍යාපෘති පුහුණු, වෛද්‍ය හෝ පුණ්‍ය ස්ථානවල නිවාස එයට ඇතුළත් නොවේ.

**උපලේඛනය**

(5 වන වගන්තිය)

***නවාතැන් පොළක් , නවාතැන් ගෙයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය***

01. ඉල්ලුම්කරුගේ නම : .........................
ලිපිනය : .........................
ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය : .........................

02. නවාතැන්පොළෙහි නම : .........................
ලිපිනය :.........................

කළමනාකරුගේ/භාරකරුගේ නම :.........................
දුරකථන අංකය :.........................

03. බලපත්‍රය ඉල්ලා සිටින වර්ෂය : .........................

04. නවාතැන් පොළෙහි :—
(i) තනි කාමර සංඛ්‍යාව :.........................
(ii) යුගල කාමර සංඛ්‍යාව :.........................
(iii) ත්‍රිත්ව කාමර සංඛ්‍යාව :.........................
(iv) පවුල් කාමර සංඛ්‍යාව :.........................
(v) එකවර නවාතැන් ගත හැකි සම්පූර්ණ සංඛ්‍යාව :.........................

05. නවාතැන් පොළෙහි නියුක්ත සේවක සංඛ්‍යාව (කළමනාකරු ද සමග) :.........................

05. වැසිකිළි -
(i) පිරිමි සේවක වැසිකිළි සංඛ්‍යාව :.........................
(ii) පිරිමි සේවක කැසිකිළි සංඛ්‍යාව :.........................
(iii) කාන්තා සේවක වැසිකිළි සංඛ්‍යාව :.........................
(iv) ගණුදෙනුකාර පිරිමි වැසිකිළි සංඛ්‍යාව :.........................
(v) ගණුදෙනුකාර පිරිමි කැසිකිළි සංඛ්‍යාව :.........................
(vi) ගණුදෙනුකාර කාන්තා වැසිකිළි සංඛ්‍යාව :.........................

06. නාන කාමර -

(i) පිරිමි නාන කාමර සංඛ්‍යාව :.........................
(ii) කාන්තා නාන කාමර සංඛ්‍යාව :.........................

07. මුළුතැන් ගෙවල් සංඛ්‍යාව :.........................
08. ජල සම්පාදන ප්‍රභවය :.........................
09. ඝන අපද්‍රව්‍ය, අවසන් බැහැර කිරීම සිදුකරන ක්‍රමවේදය :.........................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. නවාතැන් පොළ විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පිළිපැදීමට එකඟ වෙමි. එකී අතුරු ව්‍යවස්ථා යටතේ ඉහත නම් සඳහන් නවාතැන්පොළ පවත්වාගෙන යාම සඳහා 20 ............... වර්ෂය වෙනුවෙන් බලපත්‍රයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

.................................
අයිතිකරු/කළමනාකරු/භාරකරුගේ අත්සන.

20.................................. දින.

IXXX වැනි කොටස

**වාහන නතර කිරීම හා වාහන හැසිරවීම**

252 වන අධිකාරිය වන මහ නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තිය සමග කියවිය යුතු 32 වැනි උපවගන්තිවලට අනුව මහ නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශයේ වාහන නතර කිරීම හා වාහන හැසිරවීම විධිමත් කිරීම, පිළිබඳ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභා විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශයේ මාර්ගවල රථ වාහන නතර කිරීම හා එකී මාර්ගවල රථ වාහන හැසිරවීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ වූ අතුරු ව්‍යවස්ථායි.

2. (අ) බදුල්ල මහ නගර සභා ප්‍රදේශයේ කිසියම් වීථියක හෝ මාර්ගයක කවර වූ හෝ කොටසක —

(i) රථවාහන නවතා තැබීම තහනම් කිරීම;
(ii) සීමා කිරීම;
(iii) එක් පැත්තක පමණක් වාහන නවතා තැබීමට ඉඩ දීම;
(iv) බඩු බෑම හෝ පැටවීම තහනම් කිරීම හෝ සීමා කිරීම;
(v) මගීන් බැස්සවීම හෝ නැග්ගවීම තහනම් කිරීම;
(vi) බස් නැවතුම් ස්ථාන නම් කිරීම;
(vii) තනි අතට පමණක් වාහන ධාවනය කරන වීථි හෝ මාර්ග නම් කර ගමන් කළ හැකි දිසාව තීරණය කිරීම.

සඳහා නගර සභාවට බලය තිබිය යුතු ය.

*(ආ)* බදුල්ල මහ නගර සභාව විසින් (අ) ඡේදය යටතේ වන කිසියම් සීමා කිරීමක් කරනු ලැබීමෙන් අනතුරුව එකී සීමා කිරීම පිළිබඳ මාර්ග සංඥා අදාල ස්ථානයේ සවිකිරීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය. එකී සීමා කිරීම් පිළිබඳ මාර්ග සංඥා, මෝටර් වාහන පනතේ 164 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 1987 මාර්තු මස 13 වන දිනැති අංක 444/18 දරන 1 වන කොටස 1 වන ඡේදය අති විශෙෂ *ගැසට්* පත්‍රයේ ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති නියෝගවලට අනුව විය යුතුවාක් හැර එකී නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට යටත් විය යුතු ය.

3. බදුල්ල මහ නගර සභා ප්‍රදේශය ඇතුළත මහ නගර සභා ප්‍රාදේශය හරහා වැටී ඇති කිසියම් වීථියක හෝ මාර්ගයක ධාවනය කරන ඕනෑම වාහනයක රියැදුරෙකු විසින් 2 වන වගන්තියේ (ආ) ඡේදයේ නියමයන් යටතේ සවිකරනු ලැබ ඇති මාර්ග සංඥාවකින් හෝ සංඥාවලින් නිරූපණය කෙරෙන නියමයන් පිළිපැදීම කරනු ලැබිය යුතු ය.

4.. 3 වන වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද 2 වන වගන්තියේ විධිවිධාන යටතේ බදුල්ල මහ නගර සභාව විසින් තීරණය කරනු ලැබ සවිකරනු ලැබූ කිසියම් මාර්ග සංඥාවක් මගින් නියම කරනු ලැබ ඇති සීමාවන් —

*(අ)* එකී වීථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ආසන්නයේ ඇති කිසියම් ගොඩනැගිල්ලක හෝ ඒ ආසන්නයේ ඇතිවන යම් ගින්නක් හෝ වෙනත් යම් ආපදාවක් මැඩ පැවැත්වීමේ කාර්යය සඳහා යොදා ගන්නා බදුල්ල මහ නගර සභාවේ ගිනි නිවන රථයක් හෝ වෙනත් කවර වූ හෝ වාහනයක් සඳහා ;

*(ආ)* එකී වීථියේ හෝ මාර්ගයේ කිසියම් කොටසක හෝ බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ වෙනත් කවර හෝ වීථියක හෝ මාර්ගයක ඇතිවන වාහන තදබදයක් මඟ හැරවීම සඳහා හෝ බදුල්ල මහ නගර සභා ප්‍රදේශය ඇතුළත ඇති වන වෙනත් කිසියම් අනපේක්ෂිත තත්ත්වයක් පාලනය කිරීම සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් අවස්ථාවෝචිත පරිදි කරනු ලබන විධානයක් අනුව ක්‍රියා කිරීම සඳහා ;

එකී 3 වන වගන්තියේ නියමයන් උල්ලංඝනය කිරීමක් ලෙස සැලකීම නොකළ යුතු ය.

5. *(අ)* බදුල්ල මහා නගර සහා ප්‍රදේශය තුළ, මෙහි මින් මතු "රථ ගාල" යනුවෙන් හඳුන්වනු ලබන මෝටර් වාහන නවතා තැබීමේ කාර්යය සඳහා —

(i) බදුල්ල මහ නගර සභාව සතු කිසියම් ඉඩමක්, හෝ

(ii) වෙනත් කිසියම් අධිකාරයක් සමග ඇතිකර ගනු ලබන ගිවිසුමක් අනුව එකී අධිකාරය සතු කිසියම් ඉඩමක්, හෝ වෙන් කිරීමට, බදුල්ල මහ නගර සභාවට බලය තිබිය යුතු ය.

*(ආ)* කිසියම් රථ ගාලක නවතා තැබිය හැකි වාහන වර්ගය හා එකවර නවතා තැබිය හැකි උපරිම වාහන සංඛ්‍යාව කොපමණ ද යන්න කලින් කල තීරණය කිරීම බදුල්ල මහා නගර සභාව විසින් කරනු ලැබිය හැකි ය.

6. සෑම රථ ගාලක ම අවම වශයෙන් වාහන ඇතුල් කිරීම සඳහා එක් දොරටුවක් සහ පිටවීම සඳහා එක් දොරටුවක් ද බැගින් දොරටු දෙකක් වෙන් කර තිබිය යුතු ය. එසේ වුව ද, රථ ගාල ඇතුළත වාහන හැරවීම සඳහා ම වෙන් වූ කොටසක් ඇති කර තබන්නේ නම් හා එකවර වාහන දෙකක් දෙපසට ගමන් කළ හැකි ද්විත්ව ධාවන මං තීරු හා දොරටුවේ ඉඩකඩ සලස්වා ඇති අවස්ථාවක වාහන ඇතුල්වීම සහ පිටවීම සඳහා එක් දොරටුවක් පමණක් තිබීමට සැලැස්විය හැකි ය.

7. සෑම රථ ගාලක ම නවතා තැබීමට පැමිණෙන වාහන ඇතුල් කිරීමේ දොරටුව හා පිටවීමේ දොරටුව පහසුවෙන් කියවීමට හැකිවන ආකාරයෙන් භාෂාත්‍රයෙන් දැන්වීමක් සවිකර තිබිය යුතු අතර, එකී ස්ථානය ඇතුළත වාහන නවතා තැබීමට පැමිණීමේ දී සහ ඉන් පිටතට ගැනීමේ දී ධාවනය කළ යුතු දිසාව පහසුවෙන් හඳුනාගැනීමට හැකිවන ආකාරයෙන් සෙන්ටිමීටර් 20ක පළලින් යුතු සුදු පාට රේඛාවක් සහිත ඊතල සලකුණු කර තිබිය යුතු ය.

8. සෑම රථ ගාලකම බිම තාර දමා හෝ කොන්ක්‍රීට් දමා තිබිය යුතු අතර, එකී රථ ගාල පරිහරණය කරන්නන්ගේ පාවිච්චිය සඳහා ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශ්වයට වෙන් වෙන් වූ වැසිකිළි තනා තිබිය යුතු ය. එසේම ස්ථානය තුළ රැස්වන ජලය පහසුවෙන් ගලා යාමට ප්‍රමාණවත් කාණු තනා තිබිය යුතු ය.

9. සෑම රථ ගාලක ම පරිශ්‍රය තුළ එකතු වන කසළ දිනපතා බැහැර කිරීමට සහ එකී ස්ථානයේ පවත්නා වැසිකිළි දිනපතා විෂබීජ නාශක යොදා පිරිසිදු කිරීමටත් සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

10. සෑම රථගාලක ම වාහන නවතා තැබීමට ඉඩකඩ වෙන් කිරීමේ දී රථ ගාල ඇතුළට පැමිණෙන සහ ඉන් පිටවන වාහනවලට ගමන් කිරීම සඳහා ප්‍රමාණවත් ධාවන මං තීරු ඇතිකර තිබිය යුතු ය.

11. කිසියම් වාහනයක් රථ ගාල ඇතුළත ධාවනය කිරීමේ දී හා ගාල් කිරීමේ දී , ඒ තුළ ගාල් කර ඇති වෙනත් යම් වාහනයකට බාධාවක් නොවන පරිදි එක් එක් වාහනය නවතා තැබීමට රථ ගාල ඇතුළත ප්‍රමාණවත් ඉඩ කඩ වෙන් කර තිබිය යුතු අතර, එක් එක් වාහනය සඳහා වෙන් කර ඇති සීමාව පෙන්නුම් කෙරෙන සෙන්ටි මීටර් 10ක පළලින් යුතු සුදුපාට රේඛාවකින් සලකුණු කර තිබිය යුතු ය.

12. කිසියම් රථ ගාලක් ඇතුළත වාහන නවතා තැබීම වෙනුවෙන් බදුල්ල මහ නගර සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයේ ගාස්තුවක් අය කළ හැකි ය. එසේම කිසියම් රථ ගාලක නවතා තබන යම් වර්ගයක වාහනයක් නවතා තැබීම වෙනුවෙන් අය කිරීමට බදුල්ල මහ නගර සභාව තීරණය කළ ගාස්තු ප්‍රමාණය එකී රථ ගාලේ ඇතුල්වීමේ දොරටුවේ ප්‍රකටව පෙනෙන පරිදි භාෂාත්‍රයෙන් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

13. *(අ)* කිසියම් රථ ගාලක නවතා තබන වාහනවලින් ගාස්තු අය කිරීම සඳහා මෙහි මින් මතු "රථ ගාල භාරකරු" යනුවෙන් හඳුන්වනු ලබන -

(i) බදුල්ල මහ නගර සභාවේ සේවයේ නියුක්ත කවර හෝ සේවකයෙකු, හෝ

(ii) බදුල්ල මහ නගර සභාව විසින් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් තෝරාගනු ලැබූ කිසියම් තැනැත්තෙකු හෝ ඔහු විසින් නම් කරනු ලැබූ ඔහුගේ අනුයෝජිතයෙකු

යෙදවීම කළ හැකි ය.

*(ආ)* එසේ වුව ද කිසියම් රථ ගාලක වාහන නවතා තැබීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව 12 වන වගන්තියේ සඳහන් ආකාරයට බදුල්ල මහ නගර සභාව විසින් තීරණය කරනු ලැබූ ගාස්තුවේ ප්‍රමාණය නොඉක්මවිය යුතුවාක් හැර එක් එක් වාහනය නවතා තැබීම වෙනුවෙන් අයකළ ගාස්තු ප්‍රමාණය මේ කොටසේ පළමුවන උපලේඛනයට සාරානුකූලව පිළියෙළ කරගත් කුවිතාන්සියක සටහන් කර වාහනයේ රියදුරා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

14. සෑම රථ ගාල භාරකරුවෙකු ම ඒ කාර්යයේ නියුක්ත වන කාලය ඇතුළත බදුල්ල මහ නගර සභාව විසින් තීරණය කරනු ලබන හා රථ ගාල භාරකරු පහසුවෙන් හඳුනා ගැනීමට හැකිවන ආකාරයේ ඇඳුමකින් සැරසී සිටීමට සැලැස්වීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

15. *(අ)* 5 වැනි වගන්තියේ (ආ) ඡේදය යටතේ නවතා තැබීමට ඉඩදෙනු ලැබීමට තීරණය කර ඇති කිසියම් වර්ගයක රථයක් නවතා තැබීමට රථ ගාලට ඇතුල් කරන අවස්ථාවේ දී එකී රථ ගාලේ ඇතුල්වීමේ දොරටුව ළඟ දී එකී වාහනයේ රියැදුරා වෙත මේ කොටසේ දෙවැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ඇතුල්වීමේ අවසරය දැක්වෙන ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රයක් නිකුත් කිරීම රථ ගාල භාරකරුගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඇතුල්වීමේ අවසරපත්‍රයක් සහිත සෑම වාහනයක් ම රථ ගාලෙන් පිටත්ව යාමට පෙර —

(i) *(අ)* ඡේදයේ සඳහන් කාඩ් පත්‍රය රථ ගාල භාරකරුට ආපසු භාරදීම,

(ii) 12 වන වගන්තියේ සඳහන් ආකාරයට බදුලල් මහ නගර සභාව විසින් තීරණය කරනු ලැබූ ප්‍රමාණයන්ට ගැලපෙන වාහන නවතා තැබීමේ ගාස්තුව රථ ගාල භාරකරුට ගෙවීම, සහ

(iii) ගෙවන ලද ගාස්තුවට ගැලපෙන 13 වැනි වගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කුවිතාන්සියක් ලබා ගැනීම එකී වාහනයේ රියැදුරාගේ කාර්යය විය යුතු ය.

16. *(අ)* කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තැබීමට ඉඩ දීමට බදුල්ල මහ නගර සභාව තීරණය කර ඇති වර්ගයක වාහනයක් වන්නේ නම් මිස, වෙනත් කවර වූ වාහනයක් හෝ මෝටර් වාහනයක් නොවන කවර වූ වාහනයක් රථ ගාලක නවතා තැබීම හෝ රථ ගාලකට ඇතුල් කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කරනු නොලැබිය යුතු ය.

*(ආ)* රථ ගාලක නවතා තිබෙන කිසියම් වාහනයක් එකී රථ ගාලෙන් ඉවතට ගැනීම සඳහා එකී වාහනය පනගැන්වීමට නොහැකි වන අවස්ථාවක දී, එකී වාහනය ඇදගෙන යාම සඳහා රථ ගාල තුළට පැමිණෙන කිසියම් වෙනත් යම් වාහනයක් එකී රථ ගාලට ඇතුල් කිරීමට ප්‍රමාණවත් ඉඩකඩක් ඇත්තේ නම් එසේ පැමිණෙන වෙනත් වාහනයකට (අ) ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුව ද එකී වාහනය ඇදගෙන යාමේ දී රථ ගාලේ නවතා තිබෙන වෙනත් වාහනවලට කවර හෝ බාධාවක් හෝ හානියක් වන ආකාරයෙන් ඇදගෙන යාම නොකළ යුතු ය.

17. කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් රථ ගාලක ඇතුළත —

*(අ)* වාහන සේදීම හෝ එසේ කිරීමට සැලැස්වීම;

*(ආ)* යම් වාහනයක් ඉවත් කර ගැනීමේ කාර්යය සඳහා එකී වාහනය පන ගැන්වීමට අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවක් හෝ රෝදයක් මාරු කිරීමේ කාර්යයක් හෝ නොවන වෙනත් කවර හෝ අලුත්වැඩියාවක් කිරීම;

*(ඇ)* (ආ) ඡේදයේ සඳහන් කිසියම් අලුත්වැඩියා කිරීමක දී අවස්ථාවෝචිත කරුණු පිළිබඳ සැලකිල්ලට ගැනීමේ දී හැර අනවශ්‍ය වන්නාවූ හෝ බාධාකාරී වන්නාවූ හෝ කිසියම් ශබ්දයක් හෝ ශබ්ද ඇති කිරීම;

*(ඈ)* එකී රථ ගාල භාරකරුගේ අවසරයක් නොමැතිව වාහනය නවතා ඇති ස්ථානයක සිට එම රථ ගාලේම වෙනත් ස්ථානයකට ගෙන ගොස් නැවතීම;

*(ඉ)* එකී රථ ගාලේ ධාවන මං තීරු හෝ ඇතුල්වීමේ හා පිටවීමේ දොරටු අවහිර වන සේ වාහන නවතා තැබීම;

*(ඊ)* අනතුරක් වැළැක්වීම හෝ වාහනයේ හෝ එහි රැඳී සිටින්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමේ හෝ කාර්යය සඳහා හැර යම් වාහනයක සවිකර ඇති අනතුරු ඇඟවීමේ උපකරණ නාද කිරීම;

*(උ)* ගාල් කර ඇති හෝ එකී රථ ගාලට ඇතුල්වන හෝ ඉන් පිටවන කිසියම් වාහනයක නලාව හැඬවීම;

*(ඌ)* මත්පැන් පානය කිරීම හෝ බුලත් කෙළ ගැසීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ කල කෝලාහල කිරීම හෝ සදාචාරාත්මක නොවන ක්‍රියාවක යෙදීම; හෝ

නොකළ යුතු ය.

18. කිසියම් රථ ගාලක නවතා තබන කවර හෝ වාහනයක ආරක්ෂාව පිළිබඳ වගකීම එකී වාහනය රථ ගාල තුළ නවතා තබන තැනැත්තා වෙත තිබිය යුතුවාක් හැර යම් වාහනයකට රථ ගාල ඇතුළත දී සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ සම්බන්ධයෙන් බදුල්ල මහ නගර සභාව හෝ නාගරික කොමසාරිස්වරයා හෝ රථ ගාල භාරකරු හෝ වගකීමට යටත් නොවිය යුතු ය.

19. නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථ ගාල භාරකරු හෝ යම් පොලිස් නිලධාරියෙකු විසින් කිසියම් රථ ගාලක නවතා තිබෙන යම් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියැදුරුගෙන් වාහනය සඳහා නිකුත් කළ ඇතුල්වීමේ අවසර කාඩ් පත පරීක්ෂා කිරීම සඳහා ඉල්ලා සිටි අවස්ථාවක එය පරීක්ෂා කිරීම සඳහා ලබාදීම එකී වාහනයේ අයිතිකරුගේ හෝ රියැදුරුගේ කාර්යය විය යුතු ය.

20. 7 වැනි වගන්තියේ සඳහන් ආකාරයෙන් කිසියම් රථ ගාලක් ඇතුළත පිහිටි ධාවන මං තීරුවක වාහන ධාවනය කළ යුතු දිසාව පෙන්වන සලකුණු කර ඇති දිසාවට පටහැනි දිසාවට කවර හෝ අවස්ථාවක කිසියම් වාහනයක් ධාවනය කිරීම නොකළ යුතු ය.

21. කිසියම් රථ ගාලක කර ඇති යම් ඉදිකිරීමකට හෝ ඒ තුළ පවත්නා යම් උපකරණයකට හෝ හානි කිරීම හෝ විකෘති කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

22. බදුල්ල මහ නගර සභා ප්‍රදේශය ඇතුළත පිහිටුවා තිබෙන යම් රථගාලක් ඇතුළත නවතා තබන —

*(අ)* රජයේ වාහනවලට ;
*(ආ)* පළාත් සභාවේ වාහනවලට ;
*(ඇ)* පළාත තුළ සංස්ථාපනය කර ඇති කිසියම් පළාත් පාලන අයාතනයක වාහනවලට ;

මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අදාළ නොවිය යුතු ය. එසේ වුව ද කිසියම් රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යස්ථාපිත මණ්ඩලයක යම් වාහනයකට එකී විධිවිධාන මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල සඳහන් ආකාරයෙන් ම අදාළ විය යුතු ය.

23. කිසියම් රථ ගාලක ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රයක් නොමැතිව නවතා තබා ඇති කිසියම් වාහනයක් එකී රථ ගාලෙන් ඉවත් කිරීමට නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ රථගාල භාරකරු හෝ ක්‍රියා කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

24. බදුල්ල මහා නගර සභා බලප්‍රදේශයේ කිසියම් වීදියක, මංමාවතක, මංසන්දියක හෝ මාවතක වෙනත් ස්ථානයක වාහනයක් යම් අනතුරකට පත්වීමෙන් හැර කිසිදු අවස්ථාවක වාහනයක් අලුත්වැඩියා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වන්නේය.

25. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්, මහා නගර සභා ආඥාපනතේ 267 වැනි වගන්තියේ 03 වැනි උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි —

(i) පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000ක් නොඉක්මවන දඩයකට ද,

(ii) දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000ක් නොඉක්මවන දඩයකට ද,

(iii) තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩ කිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පනහක් (රු.250) නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේය.

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යස්ථාවල —

(i) "මාර්ගය " යන්නෙන්, බදුල්ල මහ නගර සභාව සතු හෝ මහා නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි කිසියම් මං මාවතක්, මාර්ගයක් , මහා මාර්ගයක්, පටුමගක්, වීථියක්, දෙවැටක්, පඩි පෙළක්, ඒ දණ්ඩක් හෝ මගී පාලමක් අදහස් වන අතර බදුලල් මහා නගර සභාව සතු කිසියම් මං මාවතකට, මාර්ගයකට, මහා මාර්ගයකට, පටුමගකට, වීථියකට , දෙවැටකට , පඩි පෙළකට සම්බන්ධව සවිකර හෝ සිටුවා ඇති කිසියම් දුර පෙන්වන සලකුණක්, මායිම් ගලක්, මායිම් කණුවක්, පහන් කණුවක්, පාලමක්, කවර හෝ ආකාරයක් බෝක්කුවක්, දිය පැන්නුමක්, තාප්පයක් , ආරුක්කුවක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, ආධාරක බැම්මක්, අත්වැලක් , දම්වැලක්, වැටක්, සංඥා පුවරුවක්, මාර්ග නාම පුවරුවක් හෝ මාර්ගයට යාබද පදිකවේදිකාවක් ද ඊට ඇතුළත් විය යුතු ය .

II."වාහනය" යන්නෙන්, මෝටර් වාහන පනතේ කිසියම් මෝටර් වාහනයක් සඳහා දෙන ලද අර්ථ නිරූපණයට ගැලපෙන කිසියම් මෝටර් වාහනයක් අදහස් විය යුතු ය.

**පළමුවන උපලේඛනය**

13 වැනි වගන්ති (ආ) ඡේදය

බදුල්ල මහ නගර සභාව
.................................................................... රථ ගාල
*වාහන නවතා තැබීමේ ගාස්තු*

ලදුපත් අංකය : ................................................................

වාහනයේ අංකය : ......................................................
දිනය : 20......................................................
පැමිණි වේලාව : පෙ. ව. /ප. ව. : ......................................................
පිටවූ වේලාව : පෙ. ව. / ප. ව. : ......................................................
අය කළ ගාස්තුව : රුපියල් : ......................................................

**දෙවන උපලේඛනය**

15 වන වගන්තිය (අ) ඡේදය

*කාඩ් පත්‍රයේ ඉදිරිපස*

.බදුල්ල මහ නගර සභාව

....................................................................... රථ ගාල

ඇතුල්වීමේ අවසර කාඩ් පත්‍රය

*කාඩ් පත්‍රයේ පිටුපස*

මෙම කාඩ් පත්‍රය අන්සතු නොකළ යුතු ය

රථ ගාලෙන් පිටවන අවස්ථාවේ දී ආපසු භාරදිය යුතු ය.

XXX වන කොටස

**කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

252 වන අධිකාරිය වන බදුල්ල මහ නගර සභා ආඥා පනතේ 1979 අංක 42 දරන සංශෝධනයේ 272 වන වගන්තියෙන් මහ නගර සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාරව, බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙනයන කර්මාන්ත ශාලා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම පිළිබඳ ව වූ අතුරු ව්‍යවස්ථාව බදුල්ල මහ නගර සභාව විසින් පනවනු ලැබේ.

1. බදුල්ල මහ නගර සභා බල ප්‍රදේශයේ කර්මාන්තශාලා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථායි.

2. නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තකු විසින් බදුල්ල මහ නගර සභා ප්‍රදේශය තුළ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

3. මේ අතුරු කොටසේ ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම, කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, ඒ බලපත්‍රය නිකුත් කරන ලද්දේ කිනම් වර්ෂයක් සඳහා ද, ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනෙන් අවසන් විය යුතු ය.

4. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස, නාගරික කොමසාරිස්වරයා විසින් කවර හෝ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයකට බලපත්‍රයක් නිකුත් කළ යුතු ය -

(1) කර්මාන්ත ශාලා ස්ථානය මනා අලුත්වැඩියා තත්ත්වයකින් පවත්වාගෙන තිබිය යුතු ය ;

(2) කර්මාන්ත ශාලාවේ සෑම ගොඩනැගිල්ලකට ම මනා වාතාශ්‍රයක් හා ආලෝකය ලැබෙන ආකාරයෙන් පැවතිය යුතු ය. සෑම කාමරයකට ම විවෘත කළ හැකි ජනේල සවිකර තිබිය යුතු අතර, විවෘත කළ විට ඒ ජනේලවල වර්ග ප්‍රමාණය ඒ කාමරයේ මතුපිට බිම් ප්‍රදේශයක් වර්ගඵලයෙන් පහළොවෙන් එක් පංගුවකට වඩා අඩු නොවිය යුතු ය. කෙසේ වුව ද කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යයන් සංවෘත ගොඩනැගිල්ලක් නොවන ගොඩනැගිල්ලක පවත්වාගෙන යාම කළ නොහැකි වන

අවස්ථාවක හෝ කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල වායු සමනය කර ඇති අවස්ථාවක මේ ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය;

(3) සෑම කාමරයක ම බිත්තිවල අවම උස මීටර් 2.14 ට අඩු නොවිය යුතු අතර, එකී බිත්ති ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබුක් ගලෙන් බැඳ ඇති අවස්ථාවක, ඒවා බදාම යොදා කපරාරු කර ඇතුල් පැත්තේ තීන්ත ආලේප කර තිබිය යුතු ය. නැතහොත් ඇළුමිනියම් හෝ වෙනත් ලෝහ ද්‍රව්‍යයක් සමග ලෑලි යෙදූ බිත්ති නිමකර ඇති අවස්ථාවක ලෑලි මතුපිට තීන්ත ආලේප කර තිබිය යුතු ය;

(4) වහළය ස්ථිර ද්‍රව්‍ය යොදා සකස් කර සෙවිලි කර තිබිය යුතු අතර, පියසි කෙළවර පොළොව මට්ටමේ සිට අවම වශයෙන් මීටර් 2ක් උසින් තිබිය යුතුවාත් හැර අගු වාසිය මීටර් අවම වශයෙන් මීටර් එකක් විය යුතු ය ;

(5) වහළයට යොදන ලද යකඩ, වෙනත් වානේ හෝ ලී මතුපිට තෙල් සායම් හෝ තීන්ත ආලේප කර තිබිය යුතු ය;

(6) ගෙබිම සිමෙන්ති දමා සිමෙන්තියෙන් මැද තිබීම හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය ;

(7) කර්මාන්ත ශාලාවෙහි සේවයෙහි නියුක්තව සිටින තැනැත්තන් සෑම දස දෙනකුට ම, යටත් පිරිසෙයින් එක් වැසිකිළියක් බැගින් ස්ත්‍රී හා පුරුෂ දෙපක්ෂයට වෙන් වෙන් ව වන වැසිකිළි සංඛ්‍යාවක් ඉදිකර තිබිය යුතු ය;

(8) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමිතියකට අනුව පවිත්‍රකරණය කිරීමක් කරන්නේ නම් මිස, කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතුවලින් පසුව බැහැර කරන අප ජලය පොදු ජල මාර්ගයකට මුදා හැරීම නොකළ යුතු ය ;

(9) නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමෙන් පසුව බැහැර කරන අප ජලය පවිත්‍රකරණයට ලක් කිරීමට නොහැකි වන අවස්ථාවක, එකී අප ජලය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා හෝ මධ්‍යම පරිසර අධිකාරියේ නාගරික කොමසාරිස්වරයා විසින් නිර්දේශ කරනු ලබන ආකාරයෙන් උරා ගන්නා වළකට ගලා යාමට සැලැස්විය යුතු ය. එසේ ම එකී උරා ගන්නා වල වාතයට නිරාවරණය කර නොතිබිය යුතු අතර, ආසන්නයේ ඇති පොදු ජල මාර්ගයක සිට හෝ ඉදිකර ඇති ළිඳක සිට මීටර් පනහකට නොඅඩු දුරකින් පිහිටා තිබිය යුතු ය;

(10) කර්මාන්ත ශාලාව සඳහා භාවිත කරන ගොඩනැගිල්ල ඇතුළත හා පිටත ප්‍රමාණවත් ගිනි ආරක්ෂණ වැඩ පිළිවෙලක් ඇතිකර තිබිය යුතු ය ;

(11) කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යය සඳහා පාවිච්චි කරන කාමරවලින්, කලින් පාවිච්චි කළ ඇසුරුම් හෝ වෙනත් ද්‍රව්‍යයන් නැවත පාවිච්චියට ගැනීම සඳහා සේදීමේ දී සහ සේවකයන්ගේ නාන කාමරවලින් බැහැර කෙරෙන අප ජලය අවහිරයකින් තොරව ගලා යාමට ප්‍රමාණවත් ජලාපවහන ක්‍රමයක් ඇතිකර තිබිය යුතු ය ;

(12) නිෂ්පාදනය සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය, වෙනත් රසායනික ද්‍රව්‍ය, කිසියම් නිෂ්පාදනයක් ඇසිරීම සඳහා යොදාගන්නා බෝතල් හෝ වෙනත් යම් ඇසුරුම් ද්‍රව්‍ය ගබඩා කර තැබීම සඳහා අවම වශයෙන් එක් කාමරයක්වත් වෙන ම සපයා තිබිය යුතු අතර, එකී කාමරය මීයන්ගෙන් සහ වෙනත් කෘමි සතුන්ගෙන් තොරව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ආරක්ෂිත විධිවිධාන සලසා තිබිය යුතු ය ;

(13) කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරන නිෂ්පාදන මිනිස් පරිභෝජනය හෝ සත්ව පරිභෝජනය හෝ සඳහා වන ආහාර හෝ පාන වර්ගයක් වන විට ඒ සඳහා යොදා ගන්නා ජලය මනුෂ්‍ය පරිභෝජනය සඳහා සුදුසු වන බවට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ තත්ත්ව සහතිකයක් ලබාගෙන තිබිය යුතුවාත් හැර අවම වශයෙන් සෑම මාස හයකට වරක් බැගින් මේ තත්ත්ව සහතිකය ලබා ගැනීම කළ යුතු ය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය එකී නිෂ්පාදන සඳහා යොදා ගන්නේ නම් එකී තත්ත්ව සහතිකය ලැබී ඇති සේ සලකනු ලැබිය යුතු ය;

(14) කර්මාන්ත ශාලාවේ පාවිච්චියට ගන්නා ජලය ගබඩා කර තබන්නේ නම්, එසේ ගබඩා කර තබන ජලය අපවිත්‍ර වීමෙන් සහ මදුරුවන් හෝ වෙනත් කීටයන් බෝවීම වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු අතර, එකී ජලය, භූගත ජල ටැංකියක ගබඩා කර තබන්නේ නම් එකී ස්ථානවල සිට මීටර් 18කට අඩු දුරකින් කසළ වලක් හෝ පෝර වලක් හෝ අපද්‍රව්‍ය වලක් හෝ ස්ථානගත කර නොතිබිය යුතු ය;

(15) කලින් පාවිච්චි කළ ඇසුරුම් සේදීම සඳහා යොදාගන්නා ස්ථානය කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කර්යය කරන කාමරවලින් වෙන් ව ස්ථානගත කර තිබිය යුතු අතර, ඉහත (13) ඡේදයේ සඳහන් ආකාරයෙන් තත්ත්ව සහතිකයක් නිකුත් කරනු ලැබූ ජලය පමණක් ඒ සඳහා යොදා ගත යුතු ය;

(16) කර්මාන්ත ශාලාවේ කාර්යයන් හේතුවෙන් ජනනය වන අප ද්‍රව්‍ය 16 වන වගන්තියෙහි සඳහන් ආකාරයට වර්ග කර බැහැර කළ හැකි ආකාරයෙන් වෙන් කළ භාජන හෝ ටැංකි තිබිය යුතු ය.

5. කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයේ සෑම කොටසක් ම කටු පඳුරු හෝ වල් පඳුරුවලින් තොරව පවත්වා ගැනීම සහ මදුරුවන් හෝ වෙනත් කීටයන් බෝවන ආකාරයෙන් ජලය රැඳී තිබීම වැළැක්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

6. දුර්ගන්ධය හෝ විෂ සහිත කිසියම් වායු වර්ගයක් බැහැරට විසිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය පූර්වෝපායයන් සලසා ඇත්තේ නම් මිස කිසියම් වසුරු, ඇට කුඩු පෝර, යම් විෂ සහිත හෝ පීඩාකාරී දුර්ගන්ධයක් මතුවන කිසියම් ද්‍රව්‍යයක් කර්මාන්ත ශාලා පරිශ්‍රයක් තුළ ගබඩා කිරීම හෝ පාවිච්චියට ගැනීම හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කවර හෝ තැනැත්තකු විසින් නොකළ යුතු ය.

7. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වන වගන්තිය යටතේ පරිසර විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ හා ඒ නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට අනුව ශබ්ද දූෂණයක් විය හැකි සීමාවට වඩා අඩු සීමාවක ශබ්ද පාලනයක් පවත්වාගෙන ඇත්තේ නම් මිස කවර හෝ කර්මාන්ත ශාලාවක ශබ්ද නිපදවීමක් ඇති වන කිසියම් යන්ත්‍ර සූත්‍ර හෝ වාෂ්ප බොයිලේරු හෝ ක්‍රියාත්මක කිරීමේ දී ශබ්ද උපදවන වෙනත් යම් ආකාරයක යන්ත්‍රයක් පාවිච්චි නොකළ යුතු ය.

8. යම් උඳුනකින් උත්පාදනය වන දුම් පිටකිරීම සඳහා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 වන වගන්තිය යටතේ පරිසර විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ හා ඒ නියෝගවලට කලින් කල කරනු ලබන සංශෝධනයන්ට අනුව, දුම් කවුළුවක් තනා ඇත්තේ නම් මිස, කවර හෝ කර්මාන්ත ශාලාවක දුම් උත්පාදනය කෙරෙන යම් උඳුනක් පාවිච්චියට ගැනීම නොකළ යුතු ය.

9. කවර හෝ කර්මාන්ත ශාලාවක හෝ වෙනත් කවර හෝ ස්ථානයක කම්කරුවන් හෝ සේවා නියුක්තිකයන් කැඳවීමේ, කාර්යයන් ආරම්භ කිරීමේ හෝ කාර්යයන් අවසන් කිරීමේ සංඥා කිරීමක් හෝ වෙනත් කිසියම් කරුණක් සඳහා යම් වාෂ්ප නලාවක් හෝ වාෂ්ප කාහලයක් හෝ සයිරන් නලාවක් හෝ භාවිත කිරීම හෝ පාවිච්චි කිරීම නොකළ යුතු ය. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන ක්‍රියාත්මක වීම ආරම්භ වන දින වන විටත්, ඒ ආකාරයේ වාෂ්ප නලාවක් හෝ වාෂ්ප කාහලයක් හෝ සයිරන් නලාවක් පාවිච්චි කරනු ලබන කිසියම් කර්මාන්ත ශාලාවක් වන විට එකී කර්මාන්ත ශාලාවේ පාවිච්චි කරනු ලබන එකී කැඳවීම් සංඥා මේ අතුරු ව්‍යස්ථා නියමයන් අනුව නිවැරදි කිරීමට එකී දින සිට මාස තුනක කාලයක් හිමි වන අතර, එදිනෙන් පසුව එකී කැඳවීම් සංඥා පාවිච්චි කිරීම නොකළ යුතු ය.

10. කවර හෝ කර්මාන්ත ශාලාවක පාවිච්චියෙන් පසු බැහැර කරන අප ජලය කවර හෝ අවස්ථාවක පොදු ජල මාර්ගයකට මුදා හැරීම නොකළ යුතු ය.

11. 4 වන අතුරු ව්‍යවස්ථාවේ දැක්වෙන ආකාරයෙන් තීන්ත ආලේප කිරීමට නියම කර ඇති කොටස් අවම වශයෙන් සෑම වර්ෂයකටම එක් වරක් බැගින් තීන්ත අලේප කිරීම කළ යුතු ය.

12. කර්මාන්ත ශාලාවේ සෑම කාමරයක් ම සහ එහි වටපිටාව ද, කාණු ලී බඩු හා උපකරණ ද පිරිසිදු ව හා මනා අලුත්වැඩියා තත්ත්වයකින් තබා ගත යුතු ය.

13. පාවිච්චි කළ ඇසුරුම් පිරිසිදු කර නැවත පාවිච්චි කරමින් නිෂ්පාදන වර්ග ඇසිරීම සඳහා එකී ඇසුරුම් යොදා ගන්නා කිසියම් කර්මාන්ත ශාලාවක එකී පාවිච්චි කළ ඇසුරුම් පිරිසිදු කිරීමේ දී -

(අ) එකී ඇසුරුම්වල කලින් අලවා තිබෙන ලේබල් ඉවත් කිරීමට හා මූලික වටයේ පිරිසිදු කිරීම සඳහා එක් ටැංකියක් ද, සහ

(ආ) එකී ඇසුරුම් අවසාන වටයේ පිරිසිදු කිරීම සඳහා තවත් ටැංකියක් ද,

යනුවෙන් අවම වශයෙන් ටැංකි දෙකක් භාවිත කළ යුතු අතර, එකී අවසාන පිරිසිදු කිරීම ගලා යන ජලය මගින් පිරිසිදු කිරීමට සැලැස්විය යුතු ය.

14 (අ) කිසියම් අසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තකුට මෑතක දී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස කවර හෝ කර්මාන්ත ශාලාවක නිෂ්පාදන ආශ්‍රිත කාර්යයන්හි යොදවා ගැනීම නොකළ යුතු ය.

(ආ) සෑම කර්මාන්ත ශාලාවක ම සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

15. කර්මාන්ත ශාලාවේ යෙදෙන සෑම සේවකයකු වෙත ම ආරක්ෂිත මුව වැසුම් අත් වැසුම් හා අවශ්‍ය කරන වෙනත් ආරක්ෂිත පැළඳුම් සපයා තිබීමත්, එකී සේවකයන් කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කාර්යයේ නියුක්ත වන සෑම අවස්ථාවක ම එකී ආරක්ෂිත පැළඳුම් පැළඳ සිටින බවට සහතික වීමත් බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

16. (අ) බලපත්‍රලත් ස්ථානය තුළ ජනනය වන සියලුම අප ද්‍රව්‍ය නැවත භාවිතයට ගන්නේ නම් මිස එකී අප ද්‍රව්‍ය -

(i) ජෛවභායන අපද්‍රව්‍ය,
(ii) වීදුරු,
(iii) කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,

(iv) පොලිතීන් හා ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය ;

(v) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ කොටස් ;

(vi) නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන වෙනත් අමු ද්‍රව්‍යවලින් ඉතිරිවන කොටස් හෝ නිෂ්පාදනයේ දී ලැබෙන හා අතුරු නිෂ්පාදන ද්‍රව්‍ය හෝ කොටස් ;

(vii) අන්තරායකර අප ද්‍රව්‍ය;

යන වර්ග යටතේ වර්ග කිරීමට සැලැස්විය යුතු අතර, ඒ එක් එක් වර්ගයේ අප ද්‍රව්‍ය බහාලීමට පිළියෙල කර ඇති වෙන් වෙන් වූ භාජනවලට හෝ ටැංකිවලට දැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයට වර්ග කර භාජනවල හෝ ටැංකිවල දමා ඇති අප ද්‍රව්‍ය බදුල්ල මහා නගර සභාවේ අප ද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල යටතේ බැහැර කරන්නේ නම් මිස නාගරික කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් අවසන් බැහැර ලීම කළ යුතු ය.

17. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට නාගරික කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

18. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති කිසියම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානය 4 වන වගන්තියෙහි සඳහන් කවර හෝ නියමයකට අනුකූලව පැවතීම අවසාන වුවහොත් හෝ මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල වෙනත් කිසියම් අතුරු ව්‍යවස්ථාවක නියමයන්ට පටහැනි වන අවස්ථාවක, නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයකට පෙර එකී ස්ථානය, ඒ නියමයට අනුකූල තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය සියලු දේ ඉටු කරන ලෙසට බලපත්‍රධාරියාට නියම කෙරෙන දැන්වීමක් නාගරික කොමසාරිස්වරයා විසින් එකී බලපත්‍රධාරියා වෙත භාරදෙනු ලැබීමට සැළැස්විය යුතු ය.

19. 18 වන වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබුණු කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයට ක්‍රියා කළ යුතු ය. පිළිගත හැකි ආකාරයේ කරුණු ලිඛිතව ඉදිරිපත් කිරීමක් කර ඇති යම් අවස්ථාවක, එකී දැන්වීමෙහි නිශ්චිතව සඳහන් දිනය දීර්ඝ කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය තිබිය යුතු ය. එසේ වුව ද ඒ ආකාරයෙන් දීර්ඝ කරනු ලබන කාලය දින දහ හතරකට නොවැඩි විය යුතු ය.

20. 19 වන වගන්තියෙහි සඳහන් ආකාරයේ දැන්වීමක් ලැබූ කවර හෝ බලපත්‍රලාභියකු විසින් එකී දැන්වීමේ නිශ්චිතව නියම කර ඇති දිනය හෝ දීර්ඝ කරනු ලැබූ දිනයට පෙර ඒ දැන්වීමේ නියම කර ඇති ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හැර ඇති අවස්ථාවක, ඒ ස්ථානය වෙත නිකුත් කරනු ලැබූ බලපත්‍රය නාගරික කොමසාරිස්වරයා විසින් අවලංගු කරනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය.

21. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් උල්ලංඝනය කරන බලපත්‍රධාරියකු යම් හෙයකින් වරදකරුවකු වන්නේ නම්, මහා නගර සභා ආඥා පනතේ 267 වැනි වගන්තියේ 03 වන උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි —

i. පළමුවර කරනු ලබන වරදක් වන්නේ නම්, රු. 1,000 කට නොඉක්මවන දඩයකට ද ;

ii. දෙවැනි වර කරනු ලබන වරදක් වෙනුවෙන් දිනකට රු. 2,000 කට නොඉක්මවන දඩයකට ද;

iii. තදනන්තරව සිදුකරන වරදක් සම්බන්ධයෙන් වන විට වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩකිරීම සම්බන්ධයෙන් අවධාරණය යොමු කරමින් ගරු නගරාධිපතිවරයාගෙන් ලිඛිත දැන්වීමක් බාරදීමෙන් පසු හෝ වරද නොඩකවා කෙරෙන සෑම දිනයක් සඳහාම රුපියල් දෙසිය පනහක් (රු.250 0) නොඉක්මවන අතිරේක දඩයකට ද යටත් වන්නේ ය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"කර්මාන්ත ශාලාව" යන්නෙන්, කිසියම් අමු ද්‍රව්‍ය වර්ගයක් යොදාගෙන භාණ්ඩයක් හෝ වෙනත් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන හෝ වෙනත් කර්මාන්ත ශාලාවකින් නිෂ්පාදනය කරනු ලැබූ යම් නිෂ්පාදනයක් යොදාගෙන වෙනත් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් නිෂ්පාදනය කරන කිසියම් ස්ථානයක් හෝ අමුද්‍රව්‍ය සැකසීම හෝ ඇසිරීම කරන කිසියම් ස්ථානයක් ද අදහස් වේ.

03-735

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.